
ශ්‍රී ලංකා
රක්ෂණ
නියාමන
කොමිෂන් සභාව

# සංවර්ධනය • අධීක්ෂණය •
# නියාමනය



වාර්ෂික වාර්තාව
2019



# පටුන


දැක්ම, මෙහෙවර ........ 5
වසරේ වැදගත් සිදුවීම් ........ 6
සභාපතිතුමා ගේ පණිවිඩය ........ 8
අධ්‍යක්ෂ ජෙනරාල්වරියගේ සමාලෝචනය ........ 11
කොමිෂන් සභාවේ සාමාජිකයින් ........ 16
කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව........ 17
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම ........ 19
කාර්ය මණ්ඩලය ........ 20
සමාලෝචන
පොදු සමාලෝචනය ........ 24
සංඛ්‍යානමය සමාලෝචනය ........ 28
මෙහෙයුම් සමාලෝචනය
- අධීක්ෂණ සමාලෝචනය ........ 67
- නියාමන සමාලෝචනය ........ 71
- විමර්ශන සමාලෝචනය ........ 74
- වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා සමාලෝචනය ........ 77
- පරිපාලනමය සමාලෝචනය ........ 79
- මූල්‍ය සමාලෝචනය ........ 80
මූල්‍ය තොරතුරු
- මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ........ 83
- මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය ........ 84
- ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශනය ........ 85
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ........ 86
- රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ........ 87
- ගිණුම්කරණ ප්‍රතිපත්ති ........ 88
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ........ 91
විගණකාධිපති වාර්තාව ........ 99
විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම ........105
පරිශිෂ්ඨය I ........107
පරිශිෂ්ඨය II ........108
පරිශිෂ්ඨය III ........110
පාරිභාෂික ශබ්ද මාලාව ........111



# සංවර්ධනය. අධීක්ෂණය. නියාමනය

රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ඥාණාන්විත අධීක්ෂණය හරහා රක්ෂණ අංශයේ සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම සිදු කරයි. පුද්ගලයන්ගේ ජීවිත කාලය පුරා ඕනෑම අවස්ථාවක ඔවුන්ට සහාය අවශ්‍ය වූ විට එම සහාය ලබා දීම සඳහා රක්ෂණ කර්මාන්තයේ ධාරිතා සංවර්ධනය තහවුරු කිරීම හා පුද්ගලයන්ට විශ්වාස කළ හැකි අයුරින් රක්ෂණ අංශයේ ස්ථාවර බව තහවුරු කිරීම අපගේ කාර්යයයි.

අප විසින් රක්ෂණ කර්මාන්තයේ ස්ථායී බව සහ රක්ෂණ ඔප්පු හිමියන්ගේ බැඳියාවන් සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් වන එහි වගකීම් තහවුරු කිරීම සඳහා ඉඩ සලසන ප්‍රතිපත්ති හා නීති පිළිබඳ රජයට උපදෙස් ලබා දෙනු ලැබේ. යහපත් හෙටක් උදෙසා අපි අද අපගේ ජනතාව සහ රට සමග සිටින්නෙමු.


ශ්‍රී ලංකා
රක්ෂණ
නියාමන
කොමිෂන් සභාව

# දැක්ම

ආසියාවේ රක්ෂණ නියාමනයේ මිනුම් ලකුණ බවට පත්වීම.

# මෙහෙවර

රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම සහ අභිවෘද්ධිය සඳහා පහසුකම් සැලසීම සිදුකරලමින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත සුරැකීම.

# වසරේ වැදගත් සිදුවීම්

- රක්ෂණ සමාගම් - 28
- රක්ෂණ තැරැව්කාර සමාගම් - 68
- රක්ෂණ සමාගම් නියෝජනය කරන රක්ෂණ නියෝජිතයින් - 45,567
- රක්ෂණ තැරැව්කාර සමාගම් සමඟ ලියාපදිංචි රක්ෂණ නියෝජිතයින් - 617

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක ග්‍රාම නිළධාරී කොට්ඨාශ 471 ක් වෙත ලබාදුන් රක්ෂණ දැනුවත්භාවය

### රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

| | 2019 | 2018 | වෙනස % |
|---|---|---|---|
| දළ ලිඛිත වාරික ආදායම (රු. මිලියන) | 196,513 | 180,880 | 8.64% |
| මුළු වත්කම් (රු. මිලියන) | 696,283 | 630,447 | 10.44% |
| දළ දේශීය නිෂ්පාදනයේ % ලෙස ව්‍යාප්තිය | 1.31 | 1.26 | 3.94% |
| රක්ෂණ ඝණත්වය (රු.) | 9,013 | 8,347 | 7.98% |

### කොමිෂන් සභාවේ කාර්යසාධනය

| | 2019 | 2018 | වෙනස % |
|---|---|---|---|
| ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල (රු. මිලියන) | 6,252.96 | 5,042.80 | 24% |
| සෙස් ආදායම (රු. මිලියන) | 493.07 | 479.09 | 2.92% |
| වාර්ෂික ගාස්තුව (රු. මිලියන) | 224.43 | 168.50 | 33.19% |

**රු. මිලියන 696,283**

රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම්

**රු. මිලියන 196,513**

රක්ෂණ කර්මාන්තයේ දළ ලිඛිත වාරික ආදායම



# කළමනාකරණ තොරතුරු

# සභාපතිතුමාගේ පණිවිඩය



**රසික් සරුක්**
ජනාධිපති නීතිඥ
සභාපති

**“ 2019 වසර තුළ රක්ෂණ ඝණත්වය 2018 වසරේ දී වාර්තා වූ රු.මි. 8,347ට සාපේක්ෂව 7.98%කින් ඉහළ ගිය අතර එය රු.මි. 9,013ක් විය. තවද, පසුගිය වසර පහ තුළ මුළු ජනගහන වර්ධනය මගින් ශ්‍රී ලංකාව තුළ රක්ෂණයේ සංවර්ධනය සඳහා ධනාත්මක දර්ශකයන් පෙන්නුම් කෙරේ. ”**

# සභාපතිතුමා ගේ පණිවිඩය

පාස්කු ප්‍රහාරය මෙන්ම දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් අපගේ ආර්ථිකය සැලකිය යුතු අන්දමින් දුර්වල වීමත් සමග 2019 වසර අප රටට අභියෝගාත්මක වසරක් විය. මා 2019 වසර සඳහා වන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන්නේ මෙවන් පසුබිමක් තුළයි.

## කර්මාන්තයේ කාර්යසාධනය

2019 වසර තුළ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය 2.3% දක්වා පහත වැටිණි.

අයහපත් ව්‍යාපාර පරිසරයක් පැවතිය ද 2019 වසර තුළ දිගුකාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අංශයන්ට අදාළව සමස්ථ දළ ලිඛිත වාරිකයේ 8.64%ක වර්ධනයක් ළඟා කර ගැනීමට ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සමත් විය. පසුගිය වසරට සාපේක්ෂව දිගුකාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අංශ පිළිවෙලින් 10.57% හා 7.10%ක වර්ධනයක් වාර්තා කළේය. 2019 වසර තුළ ඇති වූ අයහපත් කාලගුණික තත්වය හා පාස්කු ප්‍රහාරය හේතුවෙන් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ හිමිකම් පෑම් ඉහළ ගියේය. කර්මාන්තයේ මුළු වත්කම් ප්‍රමාණය සමාලෝචිත වසර තුළ 10.44%ක් වැනි සාමාන්‍ය මට්ටමකින් ඉහළ ගියේය.

මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා රක්ෂණ සමාගම් විසින් හඳුන්වා දෙන ලද උසස් තත්වයේ සේවාවන් හා නිපැයුම් සංවර්ධනයන් හේතුවෙන් පසුගිය වසර කිහිපය තුළ රක්ෂණය පිළිබඳ පාරිභෝගික විශ්වාසය හා රක්ෂණ නිපැයුම් මිළදී ගැනීම සඳහා වන චර්යාත්මක අපේක්ෂාව ක්‍රමයෙන් ඉහළ ගොස් ඇත. එබැවින්, 2019 වසර තුළ රක්ෂණ ව්‍යාප්තිය තරමක් ඉහළ ගොස් ඇති අතර එය වාර්තා වූයේ 1.31%ක් (කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව හා සමාජ ආරක්ෂණ මණ්ඩලය හැර) ලෙසයි. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි ව්‍යාප්තිය 0.59% ක් වූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ එම අගය 0.72%ක් විය. මෙමගින් පෙනී යන්නේ පූර්ණ ශක්‍යතාව ළඟා කර ගැනීමට තව බොහෝ කලක් යනු ඇති බවත් ශ්‍රී ලංකාව තුළ රක්ෂණ කර්මාන්තයට තවදුරටත් වර්ධනය වීමේ හැකියාව පවතින බවත්ය.

2019 වසර තුළ රක්ෂණ ඝණත්වය 2018 වසරේ දී වාර්තා වූ රු.මි. 8,347ට සාපේක්ෂව 7.98%කින් ඉහළ ගිය අතර එය රු.මි. 9,013ක් විය. තවද, පසුගිය වසර පහ තුළ මුළු ජනගහන වර්ධනය මගින් ශ්‍රී ලංකාව තුළ රක්ෂණයේ සංවර්ධනය සඳහා ධනාත්මක දර්ශකයන් පෙන්නුම් කෙරේ.

## ජයග්‍රහණ

2019 වසර තුළ කොමිෂන් සභාව විසින් ඇතැම් නීති, රෙගුලාසි හා නිශ්චයන් සංශෝධනය කරන ලද අතර රක්ෂණ කර්මාන්තය සඳහා යහපත් නියාමන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා නව විධාන නිකුත් කරන ලදී.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විදේශ අරමුදල් සැපයෙන ව්‍යාපෘති දෙකක ප්‍රතිලාභියෙකු වේ. එනම් ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළඳපළ සංවර්ධන වැඩසටහන සහ ලෝක බැංකුවේ මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය වේ. රක්ෂණ නිපැයුම් පිළිබඳ මූල්‍ය ශාක්ෂරතාව ඉහළ නැංවීම හා ජාත්‍යන්තර මට්ටමේ හොඳම භාවිතාවන්ට අනුකූලව පරිපූර්ණ ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව මගින් තාක්ෂණික සහාය ලබා දෙනු ලබන අතර මෙම කාර්යය 2022 වසර අවසාන වන විට සම්පූර්ණ කිරීමට නියමිතය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නියාමන ධාරිතාව ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ලෝක බැංකු ව්‍යාපෘතිය මගින් මූල්‍ය හා තාක්ෂණික සහාය සපයනු ලැබේ. මෙම ව්‍යාපෘති දෙකෙහි ප්‍රතිඵල ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයෙහි සංවර්ධනය සඳහා විශාල වශයෙන් වාසිදායක වන අතරම එමගින් රක්ෂණ ව්‍යාප්තිය ඉහළ යනු ඇතැයි අපි විශ්වාස කරමු.

සමාලෝචිත කාල සීමාව තුළ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් ක්‍රියාවට නංවන ලද වෙළඳපළ සංවර්ධන ක්‍රියාකාරකම් සහ පරිපූර්ණ දැනුවත් කිරීමේ වැඩසටහන් හා රක්ෂණකරුවන්ගේ නිර්මානශීලී අලෙවිකරණ ව්‍යාපාරයන් මගින් මහජනතාව රක්ෂණ සංකල්පය පිළිබඳ මනාව දැනුවත් විය. ශ්‍රී ලංකාවේ පළමු ඩිජිටල් රක්ෂණ මිළ ගණන් සැසඳිය හැකි වෙබ් වේදිකාව (Web platform) සහ පළමු අන්තර්ජාලය මත පදනම් වූ තැරැව්කරුවා (internet based broker) ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයෙහි ඩිජිටල් සංක්‍රාන්තිය කරා මග පාදන ලදී. 2019 වසර තුළ රක්ෂණ කර්මාන්තයේ සිදු වූ සංවර්ධනයන් මෙරට ක්‍රියාත්මක වන රක්ෂණකරුවන් අතර වඩාත් තරඟකාරී පරිසරයක් ඇති කිරීමට දායක වූ අතර එමගින් මෙරට ධනාත්මක නැඹුරුවක් පෙන්නුම් කෙරේ.

## ඉදිරි ගමන

2019 වසර තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය දුර්වල කාර්යසාධනයක් පෙන්නුම් කළ ද 2020 වසර ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ තීරණාත්මක කාල පරිච්ඡේදයක් වනු ඇතැයි යන්න මාගේ විශ්වාසයයි. කොවිඩ් - 19 වසංගතය තවමත් ගෝලීය වශයෙන් ජීවිත හා ජීවනෝපායන් කෙරෙහි තර්ජනයක් එල්ල කරයි. පෙර නොවූ විරූ ආකාරයේ රාජ්‍ය මූල්‍ය, මුදල් හා නියාමන ප්‍රතිපත්ති මගින් ලැබෙන සහායෙන් අයහපත් ආර්ථික ප්‍රතිඵල අවම කරගත හැකි වනු ඇති අතර රැකියා අහිමි වීම් වැළැක්විය නොහැක. බාහිර පරිසරයෙන් එල්ල වන බලපෑම් පාලනය කිරීමට අපට නොහැකි බව පැහැදිලිය. කෙසේ වුවද, වඩාත් ශක්තිමත් හා දුෂ්කර අවස්ථාවන්ට ඔරොත්තු දීමට හැකි වන පරිදි හැඩ ගැසීමට අපට කළ හැකි දේ බොහෝය. රක්ෂණ කර්මාන්තයට අදාළව මෙම තත්වය වඩාත් හොඳින් විශ්ලේෂණය කර වර්ධනය සඳහා වන අවස්ථාවන් ග්‍රහණය කරගත යුතුය.

රක්ෂණකරුවන් විසින් පහළ හා මැදි ආදායම් ලබන කාණ්ඩයන් වෙත වැඩි අවධානයක් යොමු කරමින් මහජනයා වෙත නව්‍ය රක්ෂණ නිපැයුම්, බෙදාහැරීමේ මාර්ග හඳුන්වා දීම මගින් නව සංවර්ධනයන් හඹා යමින් අඛණ්ඩව වර්ධනය වනු ඇතැයි අපි අපේක්ෂා කරමු. තවද, ක්ෂුද්‍ර රක්ෂණ කාණ්ඩය සංවර්ධනය කිරීම ද රක්ෂණ කර්මාන්තයේ අනාගත වර්ධනයට ඉවහල් වනු ඇත.


# සභාපතිතුමා ගේ පණිවිඩය

### ස්තූතිය

අවසාන වශයෙන් කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීම කෙරෙහි සිය දායකත්වය සහ සහයෝගය ලබා දුන් කොමිෂන් සභාවේ සාමාජිකයින් අගය කිරීමට මෙය අවස්ථාවක් කොට ගනිමි.

එසේම, සිය අඛණ්ඩ සහයෝගය සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමග අඛණ්ඩව පවත්වාගෙන යන මිත්‍රශීලී සබඳතාව සම්බන්ධයෙන් සියළුම ලියාපදිංචි රක්ෂණ සමාගම්, තැරැව්කරුවන් හා බලයලත් අතරමැදියන්, ශ්‍රී ලංකා රක්ෂණ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය සහ රක්ෂණ ඔම්බුඩ්ස්මන් වෙත මාගේ ස්තූතිය පළ කිරීමට කැමැත්තෙමි.

අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මූලික වූ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම හා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහාය වෙනුවෙන් විශේෂ ස්තූතිය පුද කරනු කැමැත්තෙමි. වර්තමාන ගෝලීය මූල්‍ය හා සෞඛ්‍ය අභියෝග මධ්‍යයේ ඉදිරියට ගමන් කිරීමේ දී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වශයෙන් අපගේ දැක්ම වන "රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනය නියාමනය කරමින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ බැඳියාවන් ආරක්ෂා කිරීම" කෙරෙහි අප කණ්ඩායම අඛණ්ඩව උපාය මාර්ග ක්‍රියාවට නංවනු ඇතැයි මම විශ්වාස කරමි.



**රසික් සරූක්**
ජනාධිපති නීතිඥ
සභාපති

# අධ්‍යක්ෂ ජෙනරාල්වරියගේ සමාලෝචනය



**දමයන්ති ප්‍රනාන්දු**
අධ්‍යක්ෂ ජෙනරාල්

"මුළු දළ ලිඛිත වාරිකය රු.මි. 196,513ක් ලෙස වාර්තා විය. වාරිකයෙහි වර්ධනය ප්‍රධාන වශයෙන් සිදු වූයේ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය තුළ වන අතර ඊළඟ වැඩිම වර්ධනය වාර්තා කර ඇත්තේ සාමාන්‍ය රක්ෂණ හා ප්‍රතිරක්ෂණ ව්‍යාපාර මගිනි. එම ප්‍රතිශතයන් පිළිවෙලින් 10.57%, 7.10% හා 2.9% විය."

# අධ්‍යක්ෂ ජෙනරාල්වරියගේ සමාලෝචනය

2019 වසර සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ජයග්‍රහණ පිළිබඳ වාර්තා කිරීම මාහට ගෞරවයක් කොට සලකමි.

මෙම වසර ද පෙර වසරවල් සේම අභියෝගාත්මක වසරක් විය. ඒ අනුව රක්ෂණ ඔප්පු හිමියන්ගේ හිමිකම් සුරැකීමට වගබලා ගනිමින් එම අභියෝගවලට මුහුණ දිය හැකි ආකාරයට අපගේ නියාමන කටයුතු ක්‍රියාශීලී හා අනාගතයට ගැලපෙන පරිදි සිදුකෙරිණි. නියාමකයා ලෙස අපගේ ප්‍රතිසංස්කරණ මගින් රක්ෂණ කර්මාන්තයේ වර්ධනයට බාධාවක් නොවන බවට වගබලා ගනිමින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ හිමිකම් සුරැකීම පිළිබඳ වන අපගේ පරම යුතුකම සපුරාලීම සඳහා අප විසින් නියාමන ව්‍යුහයෙහි සමබරතාවක් ඇති කළ යුතුය.

මෙම වසරේ දී කොමිෂන් සභාව විසින් වෙනස් වන පරිසරයට ගැලපෙන පරිදි ඇතැම් යල්පැන ගිය භාවිතාවන් හා ප්‍රතිපත්ති නැවත සකස් කිරීම සඳහා අපට මග පෙන්වනු දක්නට ලැබිණි. වසර පුරා තම සේවය සැපයූ කොමිෂන් සභා සාමාජිකයින්හට අප ස්තූතිවන්ත වන අතර ඔවුන්ගේ මග පෙන්වීම හා උපදෙස් මිළ කළ නොහැක. සියල්ලටම වඩා වැදගත් කරුණ වන්නේ කොමිෂන් සභාව තම කාර්ය මණ්ඩලයේ උනන්දුව හා කැපවීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ අතර කොමිෂන් සභාවේ අදහස වූයේ එහි දිගුකාලීනව රැඳී සිටින කාර්ය මණ්ඩලය තවදුරටත් රඳවා ගැනීම සඳහා යෝග්‍ය අගය කිරීමේ ක්‍රමයක් ඇති කළ යුතු බවයි.

## ප්‍රධාන නියාමන මුලපිරීම්

2019 වසරේ දී කොමිෂන් සභාව විසින් යම් යම් නියාමන ප්‍රතිසංස්කරණ සිදු කරන ලද අතර ඒවායෙහි ප්‍රධාන ලක්ෂණ මෙම වාර්තාවෙහි පොදු සමාලෝචනයෙහි ඇතුළත් වේ. මේ අතරින් ප්‍රධාන නියාමන ප්‍රතිසංස්කරණ වන්නේ නියෝග අංක 18 හා 19 නිකුත් කිරීමයි.

### අංක 18 දරණ විධානය

නිකුත් කරන ලද රක්ෂණ ඔප්පුවලට අදාළව ලබා නොගත් රක්ෂණ ප්‍රතිලාභ වේ නම් ඒවා දිගු කලක් පුරාවට හිඟව පවතින බැවින් ඒවා දිගුකාලීන රක්ෂණකරුවන් විසින් කොටස් හිමිකරුවන්හට ලබා දීම වැළැක්වීම සඳහා මෙම නියෝගය නිකුත් කෙරිණි. මෙය රක්ෂණ ඔප්පු හිමියන්ගේ හෝ ඔවුන්ගේ ප්‍රතිලාභීන්ගේ යහපත උදෙසා වන ක්‍රියාවක් නොවන බව හඳුනා ගත් කොමිෂන් සභාව එවැනි ගෙවීම්වලට අදාළව සීමාවන් පැනවීය. කොමිෂන් සභාව විසින් එවැනි ප්‍රතිලාභ සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ සකස් කරන තෙක් මෙම සීමාව අදාළ වනු ඇත. එවැනි ලබා නොගත් ප්‍රතිලාභ දිගුකාලීන රක්ෂණ අරමුදල් ශේෂ පත්‍රයෙහි "හිමිකම් නොපෑ ප්‍රතිලාභ" යනුවෙන් වගකීමක් ලෙස වාර්තා කළ යුතු බව ද මෙම සීමාව මගින් දැක්වේ. මෙම විධානය 2018 දෙසැම්බර් 31 දින සිට අදාළ වේ.

### අංක 19 දරණ විධානය

මෙම නියෝගය නිකුත් කරන ලද්දේ අවශ්‍ය අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවය වන රු.මි. 2.5ක ප්‍රමාණය පවත්වා ගැනීමට බොහොමයක් රක්ෂණ තැරැව්කරුවන් අපොහොසත් වන බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලද බැවිණි. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන තැරැව්කරුවන් විසින් අදාළ කරගත යුතු ක්‍රියාපරිපාටියක් මෙම නියෝගය මගින් දක්වන අතර අඛණ්ඩ උල්ලංඝණයන් සඳහා බලපත්‍රය අවලංගු කිරීම දක්වා වන බලාත්මක කිරීමේ ක්‍රියාපරිපාටිය ද දක්වා ඇත.

## රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

### දළ ලිඛිත වාරිකය හා ව්‍යාප්තිය

ශ්‍රී ලංකාව 2019 ජූලි මස සිට ඉහළ මධ්‍ය ආදායම් ආර්ථිකයක් අත් කර ගැනීමෙන් 2019 දී එහි ආර්ථිකයේ සන්ධිස්ථානයකට ළඟා විය. මෙය රක්ෂණ අංශයේ වර්ධනය කෙරෙහි ද සාධනීය අයුරින් බලපෑවේය. මන්ද යත් රටක ආර්ථික දියුණුව එහි පුරවැසියන්ගේ ආර්ථික මට්ටම ඉහළ යාම කෙරෙහි බලපාන අතර ම එමගින් ඔවුන්ගේ අවධානය කර්මාන්තයේ පවතින සුදුසු අවදානම් අවම කිරීමේ යාන්ත්‍රණයන් වෙත යොමු කරන බැවිණි. කෙසේ වුවද, මෙම වර්ධනය පාස්කු ප්‍රහාරය මගින් දැඩි ලෙස බලපෑමට ලක් වූ අතර රක්ෂණ කර්මාන්තය ඇතුළු සේවා අංශ රැසක් බලපෑමට ලක් කරමින් මෙරට ආර්ථිකයට හානි සිදු විය. ඒ අනුව 2001න් පසුව වාර්තා වූ අඩුම දළ දේශීය නිෂ්පාදිතය වන 2.3% අපට දක්නට ලැබිණි. මෙමගින් රක්ෂණ කර්මාන්තයේ වර්ධනයට ද බලපෑම් එල්ල වූ අතර 2015න් පසුව වාර්තා වූ අඩුම වර්ධන අනුපාතය වන 8.64% මෙහිදී වාර්තා විය. මුළු දළ ලිඛිත වාරිකය රු.මි. 196,513ක් ලෙස වාර්තා විය. වාරිකයෙහි වර්ධනය ප්‍රධාන වශයෙන් සිදු වූයේ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය තුළ වන අතර ඊළඟ වැඩිම වර්ධනය වාර්තා කර ඇත්තේ සාමාන්‍ය රක්ෂණ හා ප්‍රතිරක්ෂණ ව්‍යාපාර මගිනි. එම ප්‍රතිශතයන් පිළිවෙලින් 10.57%, 7.10% හා 2.9% විය.

මෙරට රක්ෂණ ව්‍යාප්තියේ මට්ටම් කලාපයේ අනෙක් රටවල්වලට සාපේක්ෂව අඩු වන නමුත් පසුගිය වසර පහ තුළ රක්ෂණ ව්‍යාප්තිය 2015 වසරේ 1.12% සිට 2019 වසරේ 1.31% දක්වා වන ලෙස සුළු වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2018 වසරේ දී වාර්තා වූ ව්‍යාප්තියේ මට්ටම 1.26%ක් වූ අතර 2019 වසරේ එය 1.31% ලෙස ඉහළ ගියේය.

2019 වසරේ දී දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි ව්‍යාප්තියේ මට්ටම 0.56% සිට 0.59% දක්වා ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි ව්‍යාප්තියේ මට්ටම 0.70% සිට 0.72% දක්වා ද ඉහළ ගොස් ඇත. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් වාර්තා කළ රක්ෂණ ව්‍යාප්තියේ මට්ටමට ජීවිත හා සාමාන්‍ය රක්ෂණය යන අංශ දෙකෙහි රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් අලෙවි කරන විදේශ සෞඛ්‍ය රක්ෂණාවරණවල වාරික එකතු කිරීම, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා ඇතැම් මූල්‍ය ආයතන මගින් සපයන ණය රක්ෂණාවරණවලට අදාළ වාරික එකතු කිරීම, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවෙහි වාරික එකතු කිරීම සහ කෘෂිකර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාරික සලකා බලා නැත. මන්ද යත්, එවැනි ආයතන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ පාලනය නොවන බැවිණි.

දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව දළ ලිඛිත වාරිකයෙහි ප්‍රතිශතයක් ලෙස ව්‍යාප්තියේ මට්ටම සැසඳීමේ දී එය සාපේක්ෂව අඩු වුවද 2019 වසරේ දී ක්‍රියාත්මක තත්වයේ පවතින ජීවිත රක්ෂණ ඔප්පු ගණන මුළු ජනගහනයෙන් 15.61%ක් වූ අතර එය 2015 වසරේ සිට වාර්ෂික ඉහළ යාමකි. 2015 වසරේ සිට ක්‍රියාත්මක තත්වයේ පවතින ජීවිත රක්ෂණ ඔප්පු ගණන ශ්‍රම බලකායෙහි ප්‍රතිශතයක් ලෙස 41.59%ක් වූ අතර එමගින් ජීවිත රක්ෂණ අංශය කෙරෙහි වන විශ්වාසය හා ධනාත්මක හැඟීම ඉහළ මට්ටමක පවතින බව පෙන්නුම් කෙරේ. ජීවිත රක්ෂණ අංශය සඳහා වන උපනති රේඛාව කර්මාන්තය සඳහා සාධනීය වන අතර එමගින් කර්මාන්තය පුළුල් කිරීමේ හැකියාව පෙන්නුම් කෙරේ.

සාමාන්‍ය රක්ෂණ අංශයට අදාළව රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී 3.64% කින් එනම් 6,728,073ක් දක්වා ඉහළ ගියේය. 2015 වසරේ සිට ක්‍රමානුකූල ඉහළ යාමක් සිදු වී ඇත.

### දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි කාර්යසාධනය

මෙම අංශයෙහි වාර්තා වූ වාර්ධන අනුපාතය 2018 වසරට සාපේක්ෂව 10.57%ක් විය. කෙසේ වුවද, එය 2015 වසරේ සිට වාර්තා වූ වර්ධන අනුපාතයන්ට සාපේක්ෂව අඩු වර්ධන අනුපාතයක් වන අතර එය වසර තුළ පැවති අවිනිශ්චිතතාවෙහි ප්‍රතිඵලයකි.

ජීවිත දළ ලිඛිත වාරිකය කෙරෙහි වැඩිම දායකත්වයක් දැක්වූ රක්ෂණ සමාගම් පහ මුළු ජීවිත දළ ලිඛිත වාරිකයෙන් 80.60% ක් සඳහා දායක වී ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා සොෆ්ට්ලොජික් ලයිෆ් හැර අනෙක් සමාගම් තුනෙහි වෙළඳපළ

# අධ්‍යක්ෂ ජෙනරාල්වරියගේ සමාලෝචනය

කොටස වසර තුළ ඉතා සුළු වශයෙන් පහත වැටී ඇත. ඉතිරි ජීවිත රක්ෂණ සමාගම් දහය මුළු ජීවිත දළ ලිඛිත වාරිකයෙන් 19.40%ක් දැරූ අතර එය 2018 වසරට සාපේක්ෂව 19.04%ක ඉහළ යාමකි. 2015 වසරේ සොෆ්ට්ලොජික් ලයිෆ්හි වෙළඳපළ කොටස වූ 7.62%ට සාපේක්ෂව 2019 වසරේ එහි කොටස 14.11% ක් වූ අතර එය කැපී පෙනෙන ඉහළ යාමකි.

ආයෝජන සම්බන්ධිත රක්ෂණ ව්‍යාපාර, පූර්ණ ජීවිත රක්ෂණ ව්‍යාපාර, කාලීන රක්ෂණ හා අනුරක්ෂණ නිපැයුම්වලට අදාළව පහත වැටීමක් ද සර්වත්‍ර ජීවිත රක්ෂණ නිපැයුම්වලට අදාළව වර්ධනයක් ද පෙන්නුම් කළ අතර එමගින් රක්ෂණ ඔප්පු හිමියන් අතර සාම්ප්‍රදායක ජීවිත රක්ෂණ නිපැයුම්වලට වඩා ආයෝජන සහ ආරක්ෂණ නිපැයුම් වෙත වැඩි ඉල්ලුමක් පවතින බව පෙන්නුම් කෙරේ.

ජීවිත රක්ෂණ අංශයෙහි නුබුන්වත් තත්වය ස්ථාවරව පැවති අතර එක් සමාගමක් පමණක් බලාත්මක මට්ටම වන 160% වඩා අඩු ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාතයක් වාර්තා කළ නමුත් අවම මට්ටම වන 120% ට අනුකූල විය. අනුකූල විය යුතු තවත් සංරචකයක් වන පවත්නා මුළු ප්‍රාග්ධනය එක් රක්ෂණකරුවෙකු හැර සියළු රක්ෂණකරුවන් විසින් සපුරන ලදී.

වසර අවසානය වන විට ක්‍රියාත්මකව පැවති මුළු ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2018 සාපේක්ෂව 6.35%කින් ඉහළ ගොස් තිබූ අතර එය රක්ෂණ ඔප්පු 3,199,354 ක් විය. වසර තුළ ජීවිත රක්ෂණ අංශය මගින් නව ජීවිත රක්ෂණ ඔප්පු 736,961ක් නිකුත් කර ඇති අතර එය 2018 වසරේ දී නිකුත් කළ නව ජීවිත රක්ෂණ ඔප්පු 711,126ට සාපේක්ෂව 3.63%ක ඉහළ යාමකි.

අනෙක් අතට මුළු ජීවිත රක්ෂණ කල් ඉකුත් වීම් ප්‍රමාණය ක්‍රියාත්මකව පවතින මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 2018 වසරේ වාර්තා වූ 8.39% සිට 7.34% දක්වා අඩු වී ඇත. තවද, නව රක්ෂණ ඔප්පු කල් ඉකුත් වීම් ප්‍රමාණය නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පුවල ප්‍රතිශතයක් ලෙස ගත් කල 2018 වසරේ වාර්තා වූ 12.16%ට සාපේක්ෂව 2019 වසරේ 11.69%ක් විය.

2019 වසර තුළ මුළු හිමිකම් පෑම් ප්‍රමාණය රු.මි. 36,079ක් වූ අතර එය 2018 වසරට සාපේක්ෂව 4.83%ක ඉහළ යාමකි. ලබාදෙන ලද මුළු හිමිකම් පෑම් ප්‍රමාණයෙන් වැඩිම ප්‍රතිශතය වූයේ කල් පිරීමේ දී ලබා දෙන ප්‍රතිලාභ වන අතර එය මුළු හිමිකම් පෑම් අතුරින් 52.25%ක් වූ අතර රු.මි. 18,852ක් විය.

කෙසේ වුවද, කර්මාන්තය විසින් සැලකිල්ලට ගත යුතු වැදගත් සාධකයන් වන්නේ වටිනාකම (රු.මි.7,070ක්) හා ප්‍රමාණය (76,630ක්) පවාරණ හිමිකම් පෑම් ඉහළ යාමයි. එමගින් කර්මාන්තයෙහි සෘණාත්මක තත්වයක් පෙන්නුම් කෙරෙන අතර ඒ සඳහා විසඳුම් ලබා දීමට කර්මාන්තය තුළ ඉක්මන් ක්‍රියාමාර්ග ගත යුතුය.

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි කාර්යසාධනය

2018 වසරට සාපේක්ෂව සාමාන්‍ය රක්ෂණ අංශයෙහි වර්ධන අනුපාතය තවදුරටත් පහළ වැටුණු අතර එය 7.10%ක් විය. 2017 සිට 2018 දක්වා වර්ධන අනුපාතය 17.34% සිට 7.71% දක්වා සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කර ඇත. මෙය ප්‍රධාන වශයෙන් වසර තුළ පැවති අවිනිශ්චිතතාව හේතුවෙන් ව්‍යාපාර පිළිබඳ වන විශ්වාසය කෙරෙහි එල්ල වූ බලපෑම නිසා ඇති වූවකි.

සමාගම් පහක් ප්‍රමුඛස්ථානය ගන්නා සාමාන්‍ය රක්ෂණ අංශය වෙළඳපළ කොටසින් 73.58%ක් සඳහා දායක වූ අතර ඉතිරි සමාගම් නවය වෙළඳපළ කොටසින් 26.42%ක් සඳහා දායක විය (2018 වසරේ දී වාර්තා වූ එම අගය 25.77%කි). සමාගම් නවයෙන් හතක් වෙළඳපළ කොටසේ ඉහළ යාමට දායක වී ඇති අතර එමගින් සාමාන්‍ය රක්ෂණ අංශයෙහි පවතින දැඩි තරඟකාරීත්වය විදහා දක්වයි. ප්‍රධාන සමාගම් පහ අතරින් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි වෙළඳපළ කොටස පමණක් රජයේ ව්‍යාපාර දායකත්වය හේතුවෙන් ඉහළ ගොස් ඇත.

සාමාන්‍ය රක්ෂණ අංශයෙහි ප්‍රධාන උප අංශය වන මෝටර් රථ රක්ෂණය පෙර වසර හතරට සාපේක්ෂව මෙම වසර තුළ දළ ලිඛිත වාරිකයෙහි අඩුම වර්ධන අනුපාතය 2.20%ක් ලෙසත් සාමාන්‍ය රක්ෂණයෙහි ප්‍රතිශතය 59.16%ක් ලෙසත් පෙන්නුම් කළේය. මෙම තත්වය වසර තුළ අඩු පුද්ගලික වාහන ආනයනය හා ඉහළ බදු අනුපාතයන් පැනවීම මත සිදු විය.

ඊට වෙනස්ව, පුද්ගලික අනතුරු රක්ෂණය, කොන්ත්‍රාත්කරුවන්ගේ සියලු අවදානම් රක්ෂණය, ගුවන් යානා රක්ෂණය, ජාතික ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය (එන්එන්ඩීඑස්) යනාදියෙන් සමන්විත විවිධ රක්ෂණ ව්‍යාපාර 26.69% ක සැලකිය යුතු වර්ධන වේගයක් පෙන්නුම් කර ඇති අතර එය 2015න් පසු වාර්තා වූ ඉහළම අගයයි. මෙයට හේතුව ස්වාභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමයෙහි වාරිකය රු.මි. 500 සිට රු.මි. 1,500 දක්වා වැඩිවීම සහ කොන්ත්‍රාත්කරුවන්ගේ සියලු අවදානම් රක්ෂණය රු.මි. 467 සිට රු.මි. 1,694 දක්වා වැඩි වීමයි. කෙසේ වෙතත්, මෙම උප පංතියේ ප්‍රතිශත කොටස සමස්ත දළ ලිඛිත වාරිකයට සාපේක්ෂව සුළු අගයකි (9.71%).

සුරක්ෂා රක්ෂණ යෝජනා ක්‍රමයෙන් (පාසැල් යන දරුවන්ගේ සෞඛ්‍යයට අදාළ වියදම් පියවා ගැනීම සඳහා රජය විසින් මිලදී ගත් රක්ෂණ ආවරණයක්) සහ අග්‍රහාර රක්ෂණය යෝජනා ක්‍රමය (රජයේ සහ රාජ්‍ය අංශයේ සේවකයින්ගේ දායක සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක්) හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව සෞඛ්‍ය රක්ෂණ වාරිකය ද 17.07% ක සැලකිය යුතු වර්ධන වේගයක් පෙන්නුම් කර ඇත.

පාස්කු ප්‍රහාරය හේතුවෙන් වැඩ වර්ජනය, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් රක්ෂණාවරණය මගින් තම දේපළ ආවරණය කිරීමට මහජනතාව පෙළඹීම නිසා එම රක්ෂණය ද 2018 ට සාපේක්ෂව 37.67% ක වර්ධනයක් පෙන්නුම් කර තිබේ.

අනුපිළිවෙලින් 7.68% සහ 2.21%ක අඩු දළ ලිඛිත වාරිකයන් නියෝජනය කරන ගිනි රක්ෂණය සහ සමුද්‍ර රක්ෂණය, 2018 වසරට සාපේක්ෂව 2019 වර්ෂය තුළ සෘණාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි. විශේෂයෙන් ස්වාභාවික විපත් වැනි අනෙකුත් උපද්‍රව ද ආවරණය වන ගිනි රක්ෂණය ආදිය පිළිබඳ මහජනයා දැනුවත් කිරීම වැදගත්ය. සමුද්‍ර රක්ෂණය යනු ශ්‍රී ලංකාවේ සිදුවන සංවර්ධනයන්ගෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට කර්මාන්තයට අවශ්‍ය ධාරිතාවය වර්ධනය කළ යුතු තවත් වැදගත් අංශයකි.

අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට අදාළව අමානා ජෙනරල් සහ ජාතික රක්ෂණ භාර අරමුදල හැර අනෙක් සියලුම දෙනා මෙම වසර තුළ සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු අඩු රක්ෂණ වාරික වර්ධන අනුපාතයන් සමග වුවද ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය නීතිවලට අනුකූල බව පෙන්නුම් කර ඇත.

මෙම වසර තුළ සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රයේ ශුද්ධ හිමිකම් පෑම් ප්‍රමාණය රුපියල් මිලියන 58,436 කි. ඒ අතරින් රු.මි. 34,703ක් මෝටර් රථ රක්ෂණ ක්ෂේත්‍රයට අදාළ විය. ශුද්ධ හිමිකම් පෑම්වල වර්ධන වේගය 2018 වසරට සාපේක්ෂව 11% කි. ශුද්ධ හිමිකම් පෑම්වල වර්ධන වේගය පෙර වසරට සාපේක්ෂව 19.5% (2016), 18% (2017), 9.8% (2018) වේ. 2015 සිට 2019 වර්ෂය දක්වා වාර්තා වූ දළ ලිඛිත වාරිකය සලකා බැලීමේදී, සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් දරනු ලබන ශුද්ධ හිමිකම් පෑම් දළ වශයෙන් 50% කි.

## ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයෙහි කාර්යසාධනය

2008 වර්ෂයේ සිට සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් අනිවාර්යයෙන් සිදු කළ යුතු පවරා දීමක් ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය

# අධ්‍යක්ෂ ජෙනරාල්වරියගේ සමාලෝචනය

පවත්වාගෙන යනු ලැබේ. ශ්‍රී ලංකාව තුළ පිළිගත හැකි අවදානමක් රඳවා ගැනීම සහ දේශීය වෙළඳපොළට ප්‍රතිරක්ෂණ සහාය ලබා දීම සඳහා මෙරට ශක්තිමත් ප්‍රතිරක්ෂණ අංශයක් සංවර්ධනය කිරීමේ අරමුණින් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි විෂය පථය සංශෝධනය කරන ලදී.

2019 වර්ෂය තුළ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ වාරිකය 2018 වසරට සාපේක්ෂව 2.89% කින් ඉහළ ගොස් තිබේ. 2019 වර්ෂය සඳහා වාර්තා කරන ලද ප්‍රතිරක්ෂණ වාරිකය රු.මි. 4,174 ක් වන අතර, එයින් රු.මි. 449 ක් ප්‍රතිරක්ෂණ වාරික ලෙස ප්‍රතිරක්ෂණකරුවන්ට පවරා ඇති අතර එය 2018 වසරට සාපේක්ෂව 22.23% ක අඩු වීමකි.

කෙසේ වෙතත්, 2019 වර්ෂයේදී හිමිකම් පෑම් රු.මි. 3,560 ක් වූ අතර එය 2018 වසරට සාපේක්ෂව 137% ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. වසර තුළ දරණ ලද හිමිකම් පෑම් අතුරින් රු.මි. 498ක් ප්‍රතිරක්ෂණ යටතේ වූ හිමිකම් පෑම් වන අතර 2018 සහ 2017 වර්ෂය සඳහා කිසිදු ප්‍රතිරක්ෂණ හිමිකම් පෑමක් සිදු නොවීය. එයින් පෙනී යන්නේ 2018 වසරට සාපේක්ෂව පිළිවෙලින් රු.මි. 763 සහ රු.මි. 662 ක් වූ ප්‍රතිරක්ෂණ අලාභ හා ශුද්ධ බදු පෙර අලාභ ඇති කරමින් ජාතික රක්ෂණ භාර අරමුදල ඉහළ අවදානමන් රඳවාගෙන ඇති බවයි.

## ලාභදායීබව

පාස්කු ඉරිදා ප්‍රහාරයන් මගින් ඇති කරන ලද ඍණාත්මක බලපෑම් කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය අඩාල කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2018 වසරට සාපේක්ෂව ලාභදායීතාවය 22.35% කින් අඩු විය. බලපෑමට ලක් වූ ප්‍රධාන පංතිය වූයේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය වන අතර එහි ලාභය 25% කින් පහත වැටුණි. මෙයට ප්‍රධානතම හේතුව වන්නේ ජීවිත රක්ෂණ සමාගමක විශාල සාමාන්‍ය රක්ෂණ අනුබද්ධිත ආයතනයක් ඈවර කිරීමෙන් පෙර වර්ෂවල උපයා ඇති සැලකිය යුතු ලාභයයි. කෙසේ වෙතත්, 2018 වර්ෂයේ ලාභයේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ද පාසැල් යන ළමුන් ආවරණය කරන සුරක්ෂා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ගෙවා ඇති විශාල හිමිකම් පෑම් ප්‍රමාණය හේතුවෙන් ලාභයේ අඩුවීමක් පෙන්නුම් කරයි.

## සිදු කෙරෙන ප්‍රධාන නියාමන ප්‍රතිසංස්කරණ

මූල්‍ය අංශයේ වර්ධනය සඳහා වන කාර්යක්ෂමතාව සහ රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂාව ඉහළ නැංවීමේ අරමුණින් අභ්‍යන්තරව ලබා ගත නොහැකි විශේෂඥ දැනුම ලබා ගැනීම සඳහා කොමිෂන් සභාව මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතියට ක්‍රියාකාරීව සහභාගී වේ. මෙම ව්‍යාපෘතිය යටතේ රක්ෂණ කර්මාන්තයේ කාර්යක්ෂම නියාමනය සහ අධීක්ෂණය සඳහා නියාමන හා අධීක්ෂණ රාමුව නවීකරණය කිරීම සඳහා කොමිෂන් සභාව වෙත භාණ්ඩාගාරයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 9 ක් වෙන් කර ඇත. රජය විසින් හඳුනාගෙන ඇති ප්‍රධාන ප්‍රතිග්‍රාහක නියාමන ආයතන වනනේ කොමිෂන් සභාව, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ මහ බැංකුවයි. ව්‍යාපෘතිය 2022 වසර අවසානය දක්වා ක්‍රියාත්මක වනු ඇත.

කොමිෂන් සභාව විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂාව සඳහා අවදානම් පාදක ප්‍රාග්ධන රීතිය හා අවදානම් පාදක අධීක්ෂණ රාමුව ප්‍රතිසංස්කරණය සහ බොහෝ නීති ප්‍රතිසංස්කරණ සිදු කරනු ඇත.

## ස්තුතිය

බොහෝ ප්‍රතිපත්තිමය මුලපිරීම් වලදී අපව නිවැරදි දිශාවට මෙහෙයවීම පිළිබඳව සභාපතිවරයාට සහ කොමිෂන් සභාවේ සාමාජිකයින්ට මාගේ ස්තුතිය පිරිනමමි. තවද ප්‍රතිසංස්කරණ පිළිබඳ ඵලදායී ප්‍රතිපෝෂණ සැපයීම, කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අඛණ්ඩව සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් රක්ෂණ කර්මාන්තයේ සමාගම්වලට සහ අවසාන වශයෙන් රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහයෝගය ලබා දෙන රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ උත්සාහය බෙහෙවින් අගය කරමි.

Damayanthi Fernando

**දමයන්ති ප්‍රනාන්දු**
අධ්‍යක්ෂ ජෙනරාල්



# කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ කාර්ය මණ්ඩලය



**හරිස් සල්පිටිකෝරාල මහතා**
*සාමාජික*

**ඉන්ද්‍රා බදුගේ මෙනෙවිය**
*සාමාජික*

**පී. අල්ගම මහතා**
*නිල බලයෙන් පත්වන සාමාජික*
*(භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්)*

**රාජා ගුණරත්න මහතා**
*සාමාජික*

**ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා**
*නිල බලයෙන් පත්වන සාමාජික*
*(සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්)*

**එච්.ඒ. කරුණාරත්න මහතා**
*නිල බලයෙන් පත්වන සාමාජික*
*(ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති)*

**රසික් සරූක් මහතා**
**සභාපති**

# කොමිෂන් සභාවේ සාමාජිකයින්

# කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව

**රසික් සරූක් මහතා**
*ජනාධිපති නීතීඥ*
*සභාපති*

රාජතාන්ත්‍රිකයෙකු හා රාජ්‍ය සංස්ථා රැසක හිටපු සභාපති වන රසික් සරූක් මහතා ජ්‍යේෂ්ඨ නීතීඥයෙකි.

ඔහු සතොස ආයතනයේ සභාපති ධූරය දැරූ අතර ඔහුගේ සේවා කාලය තුළ එනම් 1978 සිට 1989 දක්වා වූ කාලය තුළ සතොස ආයතනය ලාභ ලබන හා ශක්‍යතාවයෙන් යුතු ආයතනයක් බවට පත් කළ අතර ඉඩම් සංවර්ධනය හා සීමාසහිත සතොස මෝටර්ස් හා සීමාසහිත ලංකා මිල්ක් ෆුඩ් වැනි ලැයිස්තුගත පොදු සමාගම් ගණනාවක් ස්ථාපනය කරමින් දේපළ රැසක් අත්පත් කර ගැනීමට ඔහුගේ මූලිකත්වය යටතේ මෙම ආයතනයට හැකි විය. ඔහු කෘෂිකාර්මික සංවර්ධන අධිකාරිය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන අධිකාරිය සහ ලංකා බැංකුව යන ආයතනවල සභාපති ධූරය ද දැරීය.

ඔහු එවකට යුගෝස්ලෝවියානු ෆෙඩරල් ජනරජයේ තානාපති ලෙසත් ඉන් පසුව හංගේරියාවේ පළමු තානාපති ලෙසත් තානාපති සේවයෙහි කටයුතු කළේය. ඉන් පසුව, ඔහු සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් ලෙස පත් කෙරිණි.

ඔහු මාතර සර්වේෂස් විද්‍යාලයේ හා කොළඹ සහිරා විද්‍යාලයේ ආදි සිසුවෙකි.

**පී. අල්ගම මහතා**

යෝග්‍ය අයුරින් ආර්ථික හා සමාජීය සංවර්ධනය ළඟා කරගැනීමට සහාය වීම සඳහා රාජ්‍ය අංශ සංවිධානවල කාලය සහ හිඟ සම්පත් ඉතිරි කරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ පද්ධති, ක්‍රියාවලි, ක්‍රියාපරිපාටීන් හා භාවිතාවන් අඛණ්ඩව සංවර්ධනය කිරීම කෙරෙහි ඇල්මක් දක්වන එම ක්ෂේත්‍රය තුළ ශාස්ත්‍රීය හා වෘත්තීමය වශයෙන් නිපුණ වූ වෘත්තිකයෙකි.

වෘත්තියෙන් ගණකාධිකාරීවරයෙකු වන ඔහු ඒ ආශ්‍රිත විෂයන් වන රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය ප්‍රසම්පාදනය, වත්කම් කළමනාකරණය වැනි විෂයන් රැසක් පිළිබඳ දැනුම හා මෙම ක්ෂේත්‍රයන්හි කාර්ය මණ්ඩල පුහුණු කිරීම සහ සංවර්ධනය පිළිබඳ දැනුමින් ද පිරිපුන් පුද්ගලයෙකි.

අල්ගම මහතා සිංගප්පූරුවේ නැන්යැංග් තාක්ෂණික විශ්ව විද්‍යාලයේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ බොස්ටන්හි ස්ලෝආන් කළමනාකරණ පාසලෙහි මැසචුසෙට් තාක්ෂණික ආයතනය (එම්අයිටී) වෙතින් පිරිනැමෙන ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හා කැළණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී උපාධියක් ලබා ගෙන ඇත. ඔහු වරලත් රාජ්‍ය මූල්‍ය සහ ගණකාධිකරණ ආයතනය සහ සීපීඒ ඔස්ට්‍රේලියාහි ආශ්‍රිත සාමාජිකයෙක් ද වේ.

ඔහු 1987 දී රාජ්‍ය සේවයට එක් වූ අතර 1991 සිට මහා භාණ්ඩාගාරයෙහි සේවය කළ අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව යන ආයතනවල තනතුරු ගණනාවක් හෙබවීය. භාණ්ඩාගාරයෙහි නියෝජ්‍ය ලේකම් ලෙස රාජකාරි භාර ගැනීමට පෙර ඔහු විසින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස වසර හතක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද අතර රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත, රාජ්‍ය ප්‍රසම්පාදන වැනි රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ සහ රාජ්‍ය අංශය සඳහා ඊ- ජීපී පද්ධතිය හඳුන්වා දීම ආදී කටයුතුවලට සම්බන්ධව ක්‍රියා කළේය.

**ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා**

ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් ද ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීතිය පිළිබඳ උපාධියක්ද එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලය වෙතින් තොරතුරු තාක්ෂණය හා බුද්ධිමය දේපළ සහිතව ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්ද ලබා ගෙන ඇත. ඔහු වෘත්තියෙන් නීතීඥවරයෙකි. සිරිවර්ධන මහතා 1988 දී සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමග එක් විය. දැනට ඔහු සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් ලෙස සේවය කරයි. සිරිවර්ධන මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව යන ආයතනවල නිල බලය සහිත සාමාජිකයෙකි.

**එච්.ඒ. කරුණාරත්න මහතා**

එච්.ඒ. කරුණාරත්න මහතා දැනට මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථාවරත්වය අධීක්ෂණය කරමින් එහි නියෝජ්‍ය අධිපති ලෙස කටයුතු කරන අතර ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි මූල්‍ය සේවා අංශයේ අත්දැකීම් බොහෝමයක් ඔහු සතු වේ. ඔහු මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයෙකු වන අතර මූල්‍ය පද්ධති ස්ථාවරත්වය පිළිබඳ කමිටුව, ජාතික ගෙවීම් කවුන්සිලය හා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් ආයෝජන අධීක්ෂණ කමිටුව යන කමිටුවල සභාපති ලෙස ද කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යාංශයේ, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ හා වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගමේ සභාපති ලෙස සේවය කරයි. මීට අමතරව, ඔහු සුරැකුම් පත් හා විනිමය කොමිෂන් සභාව සහ කලම්බු ඩොක්යාඩ් යන ආයතනවල මණ්ඩල සාමාජිකයකු වේ. ඔහු මහ බැංකුවෙහි සේවය කළ වසර තිස් හතරක් වූ කාලය තුළ ඔහු දැරූ ප්‍රධාන තනතුරු කිහිපයක් නම් මුදල් මණ්ඩලයේ සහකාර අධිපති, මුදල් මණ්ඩලයේ ලේකම්, විගණන කමිටුවේ ලේකම්, ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධිමය ඒකකයේ අධ්‍යක්ෂ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණුදෙනුකරු යනාදිය වේ.

කරුණාරත්න මහතා රේෆ්කෝ සිංගපෝර් පුද්ගලික සමාගමේ ස්ථිර ආදායම් දෙපාර්තමේන්තුවේ හි උප සභාපති හා සිංගප්පූරුවේ ප්‍රයිම් රිස්ක් මොනිටරින් මෑන් ෆයිනෑන්ෂල් (පුද්) සමාගමෙ හි උප සභාපති ලෙසත් සේවය කළ අතර එම කාල සීමාව තුළ ඔහු අනාගත විකල්පයන් සහ වෙනත් විවිධාංගීකරණ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා සිංගප්පූරුවේ මූල්‍ය අධිකාරිය වෙතින් බලපත්‍රය ලබා ගත්තේය.

කරුණාරත්න මහතා 2009 මැයි සිට 2015 ඔක්තෝම්බර් දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත කළමනාකරණ කමිටුව හා වෙළඳපළ මෙහෙයුම් කමිටුව යන කමිටුවල සාමාජිකයෙකු විය. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය වෙතින් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ද ඇමරිකාවේ ඔහියෝ විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ගෙන ඇත. තවද ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙහි අධි සාමාජිකයෙකු ද වේ.

කරුණාරත්න මහතා සංචිත හා කළඹ කළමනාකරණය පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර සංසදවල නිරන්තරයෙන් දේශන පවත්වන්නෙකු ද වේ.

# කොමිෂන් සභාවේ සාමාජිකයින් පිළිබඳව

### හරිස් සල්පිටිකෝරාල මහතා

හරිස් සල්පිටිකෝරාල මහතා බ්‍රිතාන්‍යයේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ හා ඇමරිකා එක්සත් ජනපදයේ ජීවිත කළමනාකරණ ආයතනය යන ආයතනවල අධි සාමාජිකයෙකි. ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයෙහි වසර 30ට වැඩි පළපුරුද්දක් ඔහු සතු වන අතර බෲනායි, සිංගප්පූරුව හා ශ්‍රී ලංකාව යන රටවල රක්ෂණ සමාගම්හි උපදේශකයෙකු ලෙස සේවය කර ඇත.

### රාජා ගුණරත්න මහතා

නීතීඥවරයෙකු වන රාජා ගුණරත්න මහතා ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්ව විද්‍යාලයෙන් වාණිජ නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. දැනට ඔහු රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරයි. ගුණරත්න මහතා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ නීති අධ්‍යයනයන් පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ද වේ.

ඔහු ජාතික ඖෂධ නියාමන කොමිෂන් සභාව හා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යන ආයතනවල සාමාජිකයෙකු ලෙස රාජ්‍ය සේවය සඳහා දායකත්වය ලබා දෙයි.

ගුණරත්න මහතා ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ යාවජීව සාමාජිකයෙක් ද බංග්ලාදේශයේ ජෛව වෛද්‍ය සංගමයේ සහ ශ්‍රී ලංකා වෛද්‍ය නීති සංගමයේ සාමාජිකයෙක් ද වේ.

තවද, ඔහු හිටපු ජාතික නිවාස කොමසාරිස්, ජාතික නිවාස අධිකාරියේ අධ්‍යක්ෂ හා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ වේ. ඔහු විවෘත විශ්ව විද්‍යාලයේ නීති අධ්‍යයන අංශ ප්‍රධානී හා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ වැඩ බලන පීඨාධිපති ආදී වශයෙන් විශ්ව විද්‍යාල පද්ධතිය තුළ තනතුරු රැසක් දරා ඇත.

### ඉන්ද්‍රා බදුගේ මෙනෙවිය

නීතීඥවරියක වන ඉන්ද්‍රා බදුගේ මෙනෙවිය නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. රාජ්‍ය හා පුද්ගලික අංශයේ වසර 26ක සේවා පළපුරුද්දක් ඇය සතුවේ. මෙම කාල සීමාව තුළ ඇය මහා මාර්ග අමාත්‍යංශයේ නීති උපදේශිකාව හා ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ ප්‍රධාන නීති නිලධාරිණිය ආදී ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු හොබවා ඇත.

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



**වමේ සිට අසුන්ගෙන:**

ප්‍රභාෂිණී සමරකෝන් මහත්මිය (අධ්‍යක්ෂ විමර්ශන)

සතීෂ් කුමාර් මහතා (අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන)

දමයන්ති ප්‍රනාන්දු මහත්මිය (අධ්‍යක්ෂ ජෙනරාල්)

චමරි ඒකනායක මහත්මිය (අධ්‍යක්ෂ අධීක්ෂණ)

**වමේ සිට සිටගෙන:**

රාජන් නිරූබසිංහම් මහතා (සහකාර අධ්‍යක්ෂ නීති)

සාරිකා වත්තුහේවා මහත්මිය (සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ)

බිම්සර විජේසිංහ මහතා (සහකාර අධ්‍යක්ෂ වෙළඳපොල සංවර්ධන හා බාහිර සබඳතා)

# කාර්ය මණ්ඩලය




1 භානුක ගමගේ මහතා
2 රොෂාන් ද කොස්තා මහතා
3 කෞෂාලි දයාරත්න මහත්මිය
4 පවිත්‍රා පුංචිහේවා මහත්මිය
5 උපේන්ද්‍රා සෙනවිරත්න මහත්මිය
6 ප්‍රසාදි නාඔටුන්න මහත්මිය
7 සුපුන් විජයබණ්ඩාර මහතා
8 චතුනි තල්පාවිල මෙනවිය
9 මල්හාරි වික්‍රමසිංහ මහත්මිය
10 තුෂාරි විජේගුණවර්ධන මහත්මිය
11 ඒතිරාජ් ශ්‍රීකාන්තන් මහතා
12 හර්ෂණී පෙරේරා මහත්මිය
13 නලීන් තලගල මහතා
14 රුවිනි ලියනගේ මහත්මිය
15 චරිත වික්‍රමසිංහ මහතා
16 ලසන්ති තොටහේවා මහත්මිය
17 ලක්ෂ්මන් විජේසිංහ මහතා
18 සුජීවා රණසිංහ මහත්මිය
19 ලක්මිණ පතිරාජ මහතා
20 ජයනි රාජපතිරණ මෙනවිය

# කාර්ය මණ්ඩලය




21 සමන් සේනාධීර මහතා
22 ප්‍රියංගි ද සිල්වා මහත්මිය
23 චමින්ද ලාල් කුමාර මහතා
24 වීනා සෙනෙවිරත්න මහත්මිය
25 කෝකිලා සිරිවර්ධන මහත්මිය
26 අනුෂ්ක බණ්ඩාර මහතා
27 සඳමාලි කරුණාතිස්ස මෙනවිය
28 චන්දිමා කඹුරුගමුව මහත්මිය
29 නිලංකා වලිසුන්දර මහත්මිය
30 ඩෙසිකා රත්නායක මහත්මිය
31 කලන පුෂ්පකුමාර මහතා
32 වින්ද්‍යානි තුලපිටිය මහත්මිය
33 කුමාරි ධර්මසේන මෙනවිය
34 නයන රවීන්ද්‍ර මහතා
35 ඩී.ඩබ්.එස්.එස්.සුපුලී මහත්මිය
36 ශානිකා නානායක්කාර මහත්මිය
37 උපලක්ෂි රණසිංහ මෙනවිය
38 ශෂිනි ප්‍රේමලාල් මහත්මිය
39 ශ්‍යාමලී අත්තනායක මහත්මිය
40 සනත් උදයංග මහතා



# සමාලෝචන


පොදු සමාලෝචනය 24

සංඛ්‍යානමය සමාලෝචනය 28

මෙහෙයුම් සමාලෝචනය 67

# පොදු සමාලෝචනය

### පනත ක්‍රියාත්මක කිරීම සහ නියාමන ප්‍රතිසංස්කරණ

#### නීති සම්පාදනය

රක්ෂණ ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය සද්භාවයෙන්ද වෘත්තීමය හා විචක්ෂණභාවයෙන්ද යුතුව කරගෙන යනු ලබන බවට සහතික කිරීම (මෙහි මින් මතු කොමිෂන් සභාව යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ පරමාර්ථය හා වගකීම වේ.

රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කාර සමාගම් රක්ෂණ නියෝජිතයන් හා අලාභ ගලපන්නන් නියාමනය හා අධීක්ෂණය සඳහා අවශ්‍ය නෛතික රාමුව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (මෙහි මින්මතු පනත යනුවෙන් සඳහන් කරනු ලබන) මගින් සලසා ඇත.

මෙම පනත 2007 අංක 27, 2011 අංක 3 සහ 2017 අංක 23 දරන කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් වලින් සංශෝධනය වී ඇත.

#### නියාමන ප්‍රතිසංස්කරණ

#### පනතේ 96 (අ) වගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයන්

**i) විධාන # 17 - රක්ෂණ සමාගම් සඳහා සංස්ථානික පාලනය**

රක්ෂණ සමාගම් වල කටයුතු පවත්වා ගෙන යන ආකාරය පිළිබඳ මනා විනිවිද භාවයක් ඇති කරනු සඳහා කොමිෂන් සභාව විසින් විධාන # 17 නිකුත් කරන ලදී.

රක්ෂණ කර්මාන්තයෙන් කරන ලද ඉල්ලීම් සලකා බැලීමෙන් පසු කොමිෂන් සභාව විසින් ඊට අනුගත වීම සඳහා වූ කාල සීමාව 2019 ජුනි 30 දක්වා දීර්ඝ කරන ලදී.

මෙම විධානය 2019 ජුලි 01 දා සිට බලාත්මක විය.

**ii) විධාන # 18 - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි හිමිකම් නොකී ප්‍රතිලාභ**

කොමිෂන් සභාව විසින් විධාන # 18 දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි නියුතු සියළුම රක්ෂණකරුවන් වෙත නිකුත් කරමින් 2018 දෙසැම්බර් 31 දායින් අවසන් වන මුදල් වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි හිමිකම් නොකී යම් ප්‍රතිලාභ කොටස්හිමියන් වෙත පැවරීම තහනම් කරන ලදී. තවද එකී අගයන් දීර්ඝ කාලීන අරමුදලේ ශේෂ පත්‍රයෙහි වගකීමක් ලෙස සටහන් කරන ලෙස ද දක්වන ලදී. මෙම විධානය 2019 පෙබරවාරි 22 දා සිට බලාත්මක විය.

**iii) විධාන # 19 - රක්ෂණ තැරැව්කරුවන් අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවය සමග අනුකූලතාවය දැක්වීම**

රක්ෂණ තැරැව්කරුවන් අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවය වන රුපියල් මිලියන 2.5 සමග අනුකූලතාවය නොදැක්වීම සැලකිල්ලට ගැනීමෙන් පසුව කොමිෂන් සභාව විසින් පනතේ 96 (අ) වගන්තිය යටතේ පහත විධානය නිකුත් කරන ලදී.

1. රක්ෂණ තැරැව්කරුවකු යම් කාර්තුවක දී ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවය සමග අනුකූලතාවය නොදැක්වුවහොත් මසක් ඇතුලත දී ඊට අනුකූලතාවය පෙන්නුම් කරමින් මූල්‍ය වාර්තා පෝරම 6 (ප්‍රාග්ධනය ආවලයනය කර ඇති සහ බැංකු වාර්තා) ඉදිරිපත් කළ යුතුයි; සහ

2. එකී සමාගම ඉහත ආකාරයට අනුකූලතාවය පෙන්නුම් නොකළහොත් (අදාල ලිපි ලේඛන ඉදිරිපත් නොකිරීමෙන් හා/හෝ ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාව සම්පූර්ණ නොකිරීමෙන්) කොමිෂන් සභාව විසින් පනතේ විධිවිධාන ප්‍රකාරව එකී සමාගමේ බලපත්‍රය අත්හිටුවනු ලබයි

එකී අනානුකූලතාවය දිගටම පවතිනම් හෝ නැවත සිද්ධ වන්නේ නම් කොමිෂන් සභාව විසින් එහි බලපත්‍රය අවලංගු කරනු ලැබේ. මෙම විධානය 2019 ජූලි 24 සිට බලාත්මක විය.

**iv) විධාන # 20 - සංකේත නාම හා /හෝ වෙළඳ ලකුණු භාවිතා කිරීම වෙනුවෙන් රක්ෂණ සමාගමක් විසින් තම මව් සමාගම්, ආශ්‍රිත සහ ආශ්‍රිත නොවන සමාගම් වෙත ගාස්තු ගෙවීම වාරණය කිරීම**

එක් රක්ෂණකරුවෙකු විසින් තම මව් සමාගමේ සංකේතය හා/හෝ වෙළඳ ලකුණ යොදා ගැනීම වෙනුවෙන් එම මව් සමාගමට ගාස්තු ගෙවීමක් සිදුකරනු ලැබුවේ එය ''හිමිකාර භාගය' ගෙවීමක් ලෙස වර්ග කිරීමෙනි. කොමිෂන් සභාව විසින් මෙය සැලකිල්ලට ගෙන පනතේ 96 (අ) වගන්තිය යටතේ- සියලුම රක්ෂණ තැරැව්කරුවන්ට විධාන # 20 නිකුත් කරමින් තම මව් සමාගමේ සංකේත නාමය හා/හෝ වෙළඳ ලකුණු යොදා ගැනීම වෙනුවෙන් තම මව් සමාගමට, ආශ්‍රිත හා/හෝ ආශ්‍රිත නොවන සමාගම් වලට ගාස්තු ගෙවීම තහනම් කරන ලදී.

මෙම විධානය 2019 සැප්තැම්බර් 20 දා සිට බලාත්මක විය.

### වර්ෂය තුළ නිකුත් කරන ලද චක්‍රලේඛ

#### චක්‍රලේඛ අංක 40 - දීර්ඝ කාලීන රක්ෂණ සමාගම් විසින් සිදු කරනු ලබන සෞඛ්‍ය රක්ෂණ කටයුතු

දීර්ඝ කාලීන රක්ෂණ සමාගම් තනි සෞඛ්‍ය රක්ෂණ ඔප්පු නිකුත් කිරීම නිරීක්ෂණය කිරීමෙන් පසු 2019 පෙබරවාරි 25 දින සිට බලපැවැත්වෙන පරිදි චක්‍රලේඛ අංක 40 නිකුත් කරන ලදී.

**චක්‍රලේඛ අංක 41** - කොමිෂන් සභාව සඳහා බලාත්මක කිරීමේ ක්‍රියාපටිපාටිය

කොමිෂන් සභාව විසින් වාර්තා කිරීමේ අවශ්‍යතා සපුරාලීමේදී සිදු කරනු ලබන සහ වෙනත් අනනුකූල ක්‍රියාවන් සහ වෙනත් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස නිකුත් කරන ලදී. 2019 නොවැම්බර් 04 වන දින සිට බලපැවැත්වෙන පරිදි චක්‍රලේඛ අංක 41 නිකුත් කරන ලදී.

### වෙළඳ පොල ව්‍යුහය


#### රක්ෂණ සමාගම්

පනතේ 12 වන වගන්තියට අනුව, පනතේ විධිවිධාන වලට යටත්ව, යම් තැනැත්තෙකු ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කරගෙනයාමට මේ පනත යටතේ තත් කාලයේ ලියාපදිංචි වී ඇත්නම් හෝ ලියාපදිංචි කර ඇතැයි සලකනු ලබන්නේ නම් මිස, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කරගෙන යනු නොලැබිය යුතුය.

පනතේ 13 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන්නට උනන්දුවක් දක්වන තැනැත්තෙකු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් වශයෙන් සංස්ථාපනය විය යුතු අතර පනතෙන් නිශ්චිතව දක්වා ඇති අනෙකුත් සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලීමෙන් අනතුරුව පනත යටතේ ලියාපදිංචි වී රක්ෂකයෙක් වශයෙන් බලපත්‍රය ලබා ගත යුතුය.

රක්ෂණ ව්‍යාපාර සමාගම් මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන් රූප සටහන 1 මගින් දැක්වේ. වසර අවසාන වන විට සමාගම් 27 ක් රක්ෂකයන් ලෙස ක්‍රියාකාරීව පැවැතුණි. දීර්ඝකාලීන සහ සාමාන්‍ය යන දෙආකාරයෙන්ම රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යන සංයුක්ත රක්ෂණ සමාගම් 02, දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතු පමණක් කරගෙන යන රක්ෂණ සමාගම් 13, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු පමණක් කරගෙන යන රක්ෂණ සමාගම් 12 මීට ඇතුලත් වුනි.

### රූප සටහන 1 - රක්ෂණ සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාර පන්තීන්





### රක්ෂණ තැරැව්කරුවන්

රක්ෂණ තැරැව්කරුවන් යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද හා රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයෙහි යෙදීම සඳහා පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වේ. රක්ෂණ තැරැව්කරුවන් යනු තැරැව්කාර ගාස්තු හෝ කොමිස් මුදල් අපේක්ෂාවෙන් රක්ෂණ සමාගමක් හෝ ප්‍රතිරක්ෂණ සමාග මක් සමඟ හෝ ඔවුන් වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ඇති කිරීම සඳහා රක්ෂණ සමාගම් හෝ රක්ෂණ සහතික දරන්නන් හෝ ප්‍රතිරක්ෂණ සඳහා යෝජනා කරන්නන් අතර අතරමැදියන් ලෙස කටයුතු කරන්නන් අදහස් කෙරේ.

වසර අවසානයේ දී සමාගම් 68 ක් රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර ලෙස ලියාපදිංචි වී තිබුණි. එම සමාගම් අතරින් සමාගම් 48 ක් දිගුකාලීන හා සාමාන්‍ය රක්ෂණ තැරැ ව්කාර ව්‍යාපාර යන දෙකෙහිම ලියාපදිංචි වී සිටි අතර සමාගම් 20 ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල පමණක් යෙදී සිටියේය.

පහත 2 වන රූප සටහන මගින් රක්ෂණ තැරැව්කාර සමාගම් ව්‍යාපාර මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන් දැක්වේ.

### රූප සටහන 2
### රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්තීන්




### රක්ෂණ නියෝජිතයන්

පනත යටතේ රක්ෂණ සමාගමක් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක් සමඟ ලියාපදිංචි වී සිටින සහ එම රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා රක්ෂණ ව්‍යාපාර සොයා දීම වෙනුවෙන් ප්‍රතිශ්ඨාව ලෙස කොමිස් ලබා ගන්නා පුද්ගලයින් රක්ෂණ නියෝජිතයින් වේ. එලෙස ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇත.


පනතේ 34 වන වගන්තිය අනුව රක්ෂණ නියෝජිතයින් රක්ෂණ සමාගම් වලට රක්ෂණ ව්‍යාපාර සොයා දෙනු ලබන වැදගත් ප්‍රවාහයන්ගෙන් එකක් වේ. රක්ෂණ සමාගම් විසින් සපයා ඇති තොරතුරු වලට අනුව, වසර තුළ දී රක්ෂණ නියෝජිතයින් වශයෙන් බඳවා ගෙන ඇති මුළු තනි පුද්ගලයින් සංඛ්‍යාව 16,101 පමණ වන අතර එය පසුගිය වසරේ 15,798 සිට 8.24% ඉහළ යාමකි.

වසර අවසානය වන විට රක්ෂණ සමාගම් නියෝජනය කරමින් සිටි මුළු තනි රක්ෂණ නියෝජිතයින් සංඛ්‍යාව 45,567 ක් පමණ වූ අතර එය පසුගිය වසරේ 44,919 සිට 1.44% ඉහළ යාමකි.

3 වන රූප සටහන මගින් රක්ෂණ සමාගම් සමඟ ලියාපදිංචි වී සිටින තනි රක්ෂණ නියෝජිතයින් පෙන්නුම් කරයි.

### 3 වන රූප සටහන

### 2019.12.31 දිනට මුළු රක්ෂණ නියෝජිතයින්




රක්ෂණ නියෝජිතයන් වශයෙන් තනි පුද්ගලයන් 617 රක්ෂණ තැරැව්කාර සමාගම් සමඟ වසර අවසාන වන විට ලියාපදිංචි වී ඇත.

### අලාභ ගැලපුම්කරුවන්

තනි පුද්ගල අලාභ ගැලපුම්කරුවන් 16, වසර අවසානය වන විට ලියාපදිංචි වී තිබුණි.

අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචිවීම පිළිබඳ රීති 2017 ජූලි 5 දිනැති අංක 2026/27 අති විශේෂ ගැසට් පත්‍රයේ පල කර ඇත.

2011 වසරේදී 2011 අංක 3 දරන සංශෝධන පනත මගින් සංශෝධනය වූ පරිදි යම් තැනැත්තෙකු කොමිසම සමඟ ලියාපදිංචි වීමෙන් තොරව අලාභ ගැලපුම්කරුවකු (පනතේ 114(1) යටතේ අර්ථ නිරූපනය කර ඇති පරිදි) ලෙස පෙනී සිටීම හා කටයුතු කිරීම තහනම් කරන ලදී. සීමිත ව්‍යතිරේඛයන් 89අ (2) වගන්තියේ සඳහන් කර ඇත.

පනතේ 89ආ වගන්තිය යටතේ අලාභ ගැලපුම්කරුවන්ගේ ලියාපදිංචිවීමට අදාල සුදුසුකම් හා පලපුරුද්ද සඳහන් කරමින් රීති සාදනු ලැබේ. පනතේ 89ඇ (1) වගන්තිය අනුව අවශ්‍ය තොරතුරු, ලේඛණ සහ ලියාපදිංචි කිරීමේ ගාස්තු නිශ්චය කරමින් රීති සාදනු ලැබේ.


ඒ අනුව කොමිෂන් සභාව විසින් යම් තැනැත්තෙකු අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපංදිචිවීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා පලපුරුද්ද නිශ්චය කරමින් රීති නිකුත් කර ඇත.

### සමාගම්වල තත්ත්වය සහ ප්‍රාග්ධන වෙනස්කම්

කොමිෂන් සභාවේ ලියාපදිංචි රක්ෂණ සමාගම් අතරින් රක්ෂණ සමාගම් 8ක් වර්ෂ 2019 දෙසැම්බර් 31 දිනට, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කොට ඇත. නම් වශයෙන් ඒවා යුනියන් ඇෂුවරන්ස් පී එල් සී, සොෆ්ට්ලොජික් ලයිෆ් ඇෂුවරන්ස් පී එල් සී, එච්එන්බී ඇෂුවරන්ස් පී එල්සී, අමානා තකාෆුල් පී එල් සී, අමානා තකාෆුල් ලයිෆ් පී එල් සී, ජනශක්ති ඉන්ෂුවරන්ස් පී එල් සී, ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පී එල් සී සහ පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්. සී. වේ.

ලයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ රක්ෂණ සමාගම්වල ප්‍රතිශතය 4 වන රූප සටහනේ දැක්වේ.

### රූපසටහන 4
### ලැයිස්තුගත කරන ලද/ලැයිස්තුගත නොකරන ලද රක්ෂණ සමාගම්වල තත්ත්වය



2011 අංක 03 දරණ සංශෝධිත පනතින්, සියලු රක්ෂණ සමාගම්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගතව තිබීම අවශ්‍ය කරයි. සංයුක්ත රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ඒවායේ ව්‍යාපාර කටයුතු වෙන් වෙන් සමාගම් දෙකකට වෙන් කිරීමට සහ 2016 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ලැයිස්තු ගත කිරීමට ද අවශ්‍ය වේ.

2011 අංක 3 දරණ සංශෝධිත පණත බලාත්මකවුවායින් පසුව ලියාපදිංචිය ලැබූ නව රක්ෂණ සමාගමක්, කොමිෂන් සභාව මගින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් පසුව වසර තුනක කාලයක් ඇතුලත දී, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතු බවට දක්වා ඇත.

2011 ජූනි මාසයට පෙරාතුව ලියාපදිංචිය ලද රක්ෂණ සමාගම්, 2015 පෙබරවාරි මාසය වන විට හෝ එදිනට පෙර එක් ව්‍යාපාර පන්තියක් සඳහා තමන්ගේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රු.මිලියන 500ක අවමයක් දක්වා වැඩිකළ යුතු බවට කොමිෂන් සභාව නියම කර ඇත.

2011 ජූනි මාසයට පසුව ලියාපදිංචි වූ රක්ෂණ සමාගම්වලට රු. මිලියන 500කට නොඅඩු ගෙවා නිමි ප්‍රාග්ධනයක් ඇත.

### රක්ෂණ සමාගම්වලින් සෙස් බද්දක් අයකිරීම

පනතේ 7 වන වගන්තිය යටතේ ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා සෙස් බද්දක් අයකිරීමේ නියෝගයක් පනවන ලදී. 2002 ජූලි 9 වන දින අංක 1244/5 දරන ගැසට් නිවේදනය මගින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයක සමස්ත ශුද්ධ වාරිකයෙන් 0.2% ක්ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක සමස්ත ශුද්ධ වාරිකයෙන් 0.4% ක්ද වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කල යුතු බවට පැහැදිලි කොට ඇත.

රක්ෂකයන්ගෙන් සෙස් බදු එකතු කිරීම 2003 ජනවාරියේ සිට ක්‍රියාත්මක වූ අතර 2019 වසරේ එසේ එකතු කරන ලද මුදල රු. මිලියන 493 කි.

### ඔප්පු හිමයන්ගේ ආරක්ෂණ අරමුදල

පනතේ 103 වන වගන්තිය ප්‍රකාර ස්ථාපනය කෙරුණු ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට රක්ෂකයන්ගෙන් එකතු කළ සෙස් බද්ද තැන්පත් කරනු ලැබේ. වර්තමාන මෙන්ම අනාගත ඔප්පු හිමියන්ගේ ද යහපත උදෙසා මෙම අරමුදල පහත දැක්වෙන කාර්යයන් සඳහා යොදා ගනු ලැබේ.

අ) රක්ෂණ කර්මාන්තය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ දීත්, රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීමේ කටයුතුවලදීත් සිදුවන වියදම් පියවාලීම සහ

ආ) කොමිෂන් සභාව එහි බලතල, වගකීම් හා මෙහෙයුම් ක්‍රියාවට නැංවීමේදී දරනු ලබන වියදම් පියවා ගැනීම.

ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ඇති වත්කම් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කෙරේ.

2019 දෙසැම්බර් 31 වන දිනට එම අරමුදලේ සංචිතය රු. මිලියන 6,253 ක් විය. මෙය පසුගිය වසරට වඩා (රු. මිලියන 5,043) 23.99% ක වර්ධනයකි.


මණ්ඩලය පනත යටතේ සමාජික සමාජ රජක්ෂණ මණ්ඩලය ආදියට පනතේ 12 (3) වන වගන්තිය ප්‍රකාරව පනතෙන් පැනවෙන නීති රීති අදාළ නොවේ

### ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය, 2011 අංක 3 දරන සංශෝධන පනත මගින් කොමිෂන් සභාවේ විෂය පථය තුළට ග්‍රහණය කරනු ලැබ ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව මුදල් අමාත්‍යංශය විසින් පවත්වාගෙන යනු ලැබූ වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අරමුදල ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ කටයුතු කරන සමාගම් ඒ සඳහා අයකර ගන්නා වාරික මුදල් ජාතික රක්ෂණ භාර අරමුදලට බැර කළ යුතුය.

**රූප සටහන 5 - සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල**




### රක්ෂණ බදු

සාමාන්‍ය රක්ෂණ කටයුතුවල කිසිදු පන්තියක් සඳහා වන බදු කිසිවක් දැනට ක්‍රියාත්මක නැත. 2002, 2005 හා 2007 යන වර්ෂවල ජනවාරි 1 වැනි දින සිට අනුපිළිවෙලින් ක්‍රියාත්වක වන පරිදි මෝටර් රථ රක්ෂණය, ගිනි රක්ෂණය සහ කම්කරු වන්දි රක්ෂණය මත ක්‍රියාත්මක වූ බදු අහෝසි කරන ලදී.

### පනතේ බලපෑමෙන් නිදහස්වීම

1999 අංක 20 දරන කෘෂි හා වගා රක්ෂණ මණ්ඩල පනත මගින් ස්ථාපනය කරන ලද කෘෂි හා වගා රක්ෂණ මණ්ඩලය, 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා අපනයනය ණය රක්ෂණ සංස්ථාව සහ 1996 අංක 17 දරන සමාජ රක්ෂණ

2007 අංක 27 දරණ සංශෝධන පනත අනුව සියලු ලියාපදිංචි රක්ෂණ සමාගම්, ගැසට්පත්‍රයේ පලකරන ලද,අමාත්‍යවරයාගේ නියෝගය ප්‍රකාර ව, සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන් 50% නොඉක්මවන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබාදිය යුතුය. අංක 1791/4 දරණ ගැසට් පත්‍රය ප්‍රකාරව,සියළු රක්ෂණ සමාගම් 2013 ජනවාරි 01 වැනි සිට සියලුම සාමාන්‍ය ප්‍රතිරක්ෂණ ඔප්පු වලින් පැන නගින සම්පූර්ණ වගකීමෙන් 30% ක ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට දායක කළ යුතු බවට දන්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20%ක් විය. සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන් 50% ක් නොඉක්මවන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබාදිය යුතුය. මේ සම්බන්ධයෙන් අංක 1791/4 දරන 2012 දෙසැම්බර් 31 දිනැති ගැසට් නිවේදනය

මගින් මුදල් අමාත්‍යවරයා විසින් සියලු රක්ෂණ සමාගම් වෙත නියෝගයක්, පනවමින් 2013 ජනවාරි මස 01 වැනි දින සිට සියලුම වර්ගයේ ප්‍රතිරක්ෂණ සම්මුතීන් සහ වෛකල්පිත ප්‍රතිරක්ෂණ සැලසුම් සඳහා 30% ක් ජාතික රක්ෂණ භාර අරමුදලට දායක කළයුතු බවට දක්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20% ක් විය.

### මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS)

මෝටර් රථවාහන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නම් වූ ආයතනය ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතී.

මෝටර් රථවාහන රක්ෂණ ආවරණ ලබාදෙන රක්ෂකයින් සෑම කෙනෙකුම තෙවන පාර්ශ්වික රක්ෂණ ආවරණයකින් 1%ක් මාර්ග ආරක්ෂණ අරමුදලට දායක කළ යුතුය. මෙම ජාතික සභාවේ පාලක සභාවෙහි ද රක්ෂණ කොමිෂන් සභාවට නියෝජනයක් ඇත.

මෙම දායක මුදල් මගින් හඳුනා නොගත් මෝටර් වාහනවලින් සිදුවන අනතුරුවල වින්දිතයන් සඳහා වන්දි ලබා දීම සිදු කරනු ලැබේ.

### අන්තර් නියාමන ආයතන සභාව (FSOC)

අන්තර් නියාමන ආයතන සභාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලද්දකි. ඉහළ මට්ටමේ කමිටුවක් වන මෙහි ප්‍රධානත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් උසුලනු ලබන අතර මෙය පිහිටුවීමේ අරමුණ වූයේ මූල්‍ය වෙළඳපොළෙහි ක්‍රමානුකූල වර්ධනය සඳහා අවශ්‍ය නිසි ප්‍රතිපත්ති සම්පාදනය හා සමස්ථ මූල්‍ය පද්ධතියේම අභිවෘද්ධිය උදෙසා සියලු නියාමන නියෝජිතයින් සම්බන්ධීකරණය කරමින් තොරතුරු හුවමාරු කර ගැනීමයි. රක්ෂණ කොමිෂන් සභාව අන්තර් නියාමන සභාවේ ද නියෝජනය වෙයි.

### ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL)

1989 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකත්වය පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති සෑම රක්ෂණ සමාගමකටම ලබා ගත හැකිය. ජාතික රක්ෂණ භාර අරමුදල හැර අනෙක් සියලු රක්ෂණ සමාගම් මෙම සංගමයේ සාමාජිකයෝය. සියලු රක්ෂණ සමාගම්හි ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් සමන්විත විධායක කමිටුව සමස්ත කළමනාකරණය පිළිබඳ වගකීම දරයි.

- ජීවිත රක්ෂණ සංසදය
- සාමාන්‍ය රක්ෂණ සංසදය
- මූල්‍ය තාක්ෂණ අනුකමිටුව
- නීති උපදේශන සංසදය
- මානව සම්පත් අනුකමිටුව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ අනු කමිටුව
- අලෙවිකරණය හා විකුණුම් සංසදය
- ජීවගණක අනු කමිටුව

යන කමිටු විසින් විධායක කමිටුවට සහය වෙමින් ස්වකීය වගකීම් හා අදාල වන්නාවූ විෂය ක්ෂේත්‍ර පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කෙරේ.

### ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA)

ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය නියෝජනය කරනු ලබන්නේ රක්ෂණ කොමිෂන් සභාව සමග ලියාපදිංචි වූ රක්ෂණ තැරැව්කාර සමාගම්ය. රක්ෂණ තැරැව්කාර සමාගම් වල සුබසිද්ධිය සඳහා මෙම සංගමය පිහිටුවන ලදි.

### ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII)

1982 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලාභ නොලබන සංවිධානයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරයෙහි නියුක්තවන්නන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. ආයතනය අරමුදල් සපයා ගන්නේ රක්ෂණ සමාගම් වලින් පිරිනමන දායකත්වය තුළින් හා සාමාජිකයන්ගේ වාර්ෂික සාමාජික මුදල් වලිනි.

මෙම ආයතනය ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයට අනුබද්ධව ඇති අතර ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනය, ඉන්දියාවේ රක්ෂණ ආයතනය සහ ඉන්දියාවේ ජීවගණක සංගමය වැනි වෘත්තීය ආයතනවල විභාග ද මෙහෙයවනු ලබයි. රක්ෂණ කර්මාන්තයෙහි නියැලෙන්නන් සඳහා සංගමය විසින් කෙටි කාලීන රක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා ද පවත්වනු ලැබේ. රක්ෂණ නියෝජිතයින් ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අය සඳහා පූර්ව බඳවා ගැනීම් පරීක්ෂණ සිදු කිරීමේ වගකීම කොමිෂන් සභාව විසින් මෙම ආයතනයට පවරා ඇත. රක්ෂණ ක්ෂේත්‍රයෙහි සාමාන්‍ය හා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර පන්ති දෙවර්ගය සඳහාම ආයතනය විසින් පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණ පවත්වනු ලැබේ.

### රක්ෂණ ඔම්බුඩ්ස්මන්

ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් 2019 පෙබරවාරි මස, රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා ලෙස ආචාර්ය රංජිත් රණරාජා මහතා පත් කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංගමය හා රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුම අනුව රක්ෂණ ඔප්පු හිමියන් විසින් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ආරවුල් නිරාකරණය හා සමථ කිරීම සඳහා එකී පාර්ශ්වයන් දෙක විසින් තමන්ගේ උපරිමයෙන් කටයුතු කරනු ලැබේ.

### රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS)

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකයෙක් වශයෙන් ඔවුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන මෙන්ම ප්‍රධාන රක්ෂණ ක්‍රියාපිළිවෙත් සහ සංගමයේ ක්‍රියාකාරකම් ආදිය පිළිබඳ තොරතුරු නිතිපතා කොමිෂන් සභාවට ලැබේ. එම සංගමය විසින් නිර්දේශ කරනු ලබන සමහර ප්‍රධාන රක්ෂණ ක්‍රියා පිළිවෙත් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය ඵලදායී ලෙස අධීක්ෂණය කරනු හා මෙහෙයවනු පිණිස කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

### රක්ෂණ නියාමකයන්ගේ ආසියාතික සංසදය (AFIR)

රක්ෂණ නියාමකයින්ගේ ආසියානු සංසදය 2006 දී ආරම්භ කරන ලදි. චීන රක්ෂණ නියාමන කොමිෂන් සභාව මේ සඳහා මුල් පුරන ලදි. කොමිෂන් සභාව මෙහි දායකත්වය දරයි.

ආසියාතික රක්ෂණ නියාමකයින්ගේ රට රටවල් අතර අධීක්ෂණ කටයුතු සඳහා ශක්තිමත් පදනමක් සපයයි.

රක්ෂණ නියාමකයින් අතර නියාමන තොරතුරු තාක්ෂණය සහ නියාමන අත්දැකීම් හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සහ රක්ෂණ කර්මාන්තයේ වෘතිකයන් හුවමාරු කර ගැනීම රට රටවල් අතර පවතින නියාමනය කිරීමේ අවධානම අඩු කරමින්ද සහයෝගිතාව වැඩි දියුණු කරමින්ද රක්ෂණ කටයුතු නියාමනය කිරීමේ හා ශක්‍යතාවය වැඩි දියුණු කිරීම් තුළින් ගෝලීය රක්ෂණ නියාමනයේ වඩාත් ක්‍රියාකාරී දායකත්වයක් ලබාදීම මෙහි අරමුණ වේ.

# සංඛ්‍යානමය සමාලෝචනය

### රක්ෂණ සමාගම් සඳහා කෙටි යෙදුම්

| | රක්ෂණ සමාගම | කෙටි යෙදුම |
|---|---|---|
| 1 | ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී | ඒඅයිඒ ලයිෆ් |
| 2 | ඒඅයිඑ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | ඒඅයිඒ ජෙනරල් |
| 3 | ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ඒඅයිජී |
| 4 | අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | එලයනස් ජෙනරල් |
| 5 | අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | එලයන්ස් ලයිෆ් |
| 6 | අමානා තකාෆුල් පීඑල්සී | අමානා ජෙනරල් |
| 7 | අමානා තකාෆුල් ලයිෆ් පීඑල්සී | අමානා ලයිෆ් |
| 8 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී | ආර්පිකෝ |
| 9 | සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සෙලින්කෝ ජෙනරල් |
| 10 | සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සෙලින්කෝ ලයිෆ් |
| 11 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | කොන්ටිනෙන්ටල් |
| 12 | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් | කෝපරේටිව් ජෙනරල් |
| 13 | කෝප්ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | කෝප්ලයිෆ් |
| 14 | ෆෙයාෆර්ස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ෆෙයාෆර්ස්ට් |
| 15 | එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී | එච්එන්බී ලයිෆ් |
| 16 | එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | එච්එන්බී ජෙනරල් |
| 17 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | ජනශක්ති ලයිෆ් |
| 18 | ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ජනශක්ති ජෙනරල් |
| 19 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | එල්අයිසී |
| 20 | එල්ඕඑල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | එල්ඕඑල්සී ජෙනරල් |
| 21 | එල්ඕඑල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ් | එල්ඕඑල්සී ලයිෆ් |
| 22 | එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් | එම්බීඑස්එල් |
| 23 | ජාතික රක්ෂණ භාර අරමුදල | එන්අයිටීඑෆ් |
| 24 | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | ඔරියන්ට් |
| 25 | පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | පීපල්ස් |
| 26 | සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් | සණස ලයිෆ් |
| 27 | සණස ජෙනරල් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් | සණස ජෙනරල් |
| 28 | සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී | සොෆ්ට්ලොජික් ලයිෆ් |
| 29 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | එස්එල්අයිසී |
| 30 | යුනියන් ඇෂුවරන්ස් පීඑල්සී | යුනියන් ලයිෆ් |

සංඛ්‍යා ලේඛනමය සමාලෝචනයෙහි වගු හා ප්‍රස්තාරවල දත්ත අර්ථ දැක්වීමේ දී පහත දැක්වෙන පොදු සටහන් උපණපූර්ණයක් වේ:

1. මෙම වාර්තාවෙහි දක්වා ඇති වගු හා ප්‍රස්තාර රක්ෂණ සමාගම් හා රක්ෂණ තරැව්කාර සමාගම් මගින් සපයන ලද සංඛ්‍යා ලේඛන මත පදනම් වේ.
2. ඒඅයිඒ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සහ ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් 2016 දී ඒකාබද්ධ කරන ලද අතර "ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්" ලෙස හැඳින්වේ.
3. 2018 දී අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් මගින් ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් අත්පත් කර ගන්නා ලද අතර 2018 සැප්තැම්බර් 28 දින ඒකාබද්ධ කෙරිණි. එය "අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්" ලෙස හැඳින්වේ.
4. 2016 ට පෙර සොෆ්ට්ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී හඳුන්වනු ලැබුවේ ඒෂියන් අලියාන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී ලෙසයි.
5. 2015 වර්ෂයේ දී ෆෙයාර්ෆැක්ස් ඒෂියා ලිමිටඩ් මගින් ඒෂියන් අලියාන්ස් ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් අත්පත් කර ගන්නා ලද අතර එය "ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්" ලෙස හැඳින්වේ.
6. 2017 පෙබරවාරි 28 දින සිට යූනියන් ජෙනරල් ලිමිටඩ් හා ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් ඒකාබද්ධ කෙරිණි. එය "ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්" ලෙස හඳුන්වනු ලැබේ.
7. 2014 දී ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවලින් ඉවත් වී ඇති අතර එය ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතුවලින් ඉවත් වීමේ කටයුතු සිදු කෙරෙමින් පවතියි. ඒ අනුව 2016-2019 දක්වා වන කාල සීමාව සඳහා ඒඅයිජී හි සංඛ්‍යා ලේඛන සැලකිල්ලට නොගන්නා ලදී.
8. සීමාසහිත සණස රක්ෂණ සමාගම විසින් 2019 ජූලි 1 දින සිට එහි දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙන් කරන ලදී. ඒ අනුව "සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්" හා "සණස ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්" මගින් පිළිවෙලින් දිගුකාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර පවත්වාගෙන යනු ලැබේ.
9. ජාතික රක්ෂණ භාර අරමුදල මගින් විවිධ රක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳ කටයුතු කරන බැවින් සංසන්ද්‍යතාව පවත්වා ගැනීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල මගින් අවදානම් පාදක ප්‍රාග්ධනයට අදාළව ඉදිරිපත් කරන ලද දත්ත සැලකිල්ලට ගෙන නොමැත.
10. ජාතික රක්ෂණ භාර අරමුදලෙහි වගා හා ණය ආරක්ෂණ යෝජනා ක්‍රමයේ මූල්‍ය දත්ත 2014 සිට සංඛ්‍යලේඛන වලින් ඉවත් කරන ලදී. මන්ද යත්, එකී කාර්යය "රක්ෂණය" ලෙස නොසලකනු ලැබූ බැවිණි.
11. ඇතැම් වගුවල සංඛ්‍යා ආසන්නතම සංඛ්‍යාංකයට වටයන ලදී. ඒ අනුව දක්වා ඇති එකතුව හා එහි සංරචකයන්ගේ එකතුව අතර යම් වෙනසක් පැවතිය හැකිය.
12. මින් පෙර ප්‍රකාශයට පත් කරන ලද සංඛ්‍යා සමග සැසඳීමේ දී වෙනස්කම් පසුව සංශෝධනය වී ඇත.
13. වරහන් තුළ දක්වා ඇති අගයන් ඍණ අගයන් වේ.
14. පහත සංකේත වාර්තාව පුරා භාවිතා කර ඇත:

(අ) = ප්‍රතිස්ථාපිත හා විගණිත සංඛ්‍යා
(ආ) = තාවකාලික සංඛ්‍යා
(ඇ) = ශූන්‍ය

## ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණය

### ගෝලීය රක්ෂණ වෙළඳපොළ පිළිබඳ සැකෙවින්

2019 වසර තුළ මූර්ත අගය 3% පමණ වාරික වර්ධනයක් වාර්තා කිරීම මගින් ගෝලීය රක්ෂණ ක්ෂේත්‍රයෙහි ධනාත්මක ආර්ථික ගම්‍යතාවක් සහිතව ස්ථාවර වර්ධනයක් වාර්තා කර ඇත. මෙයට හේතු වී ඇත්තේ විශේෂයෙන් ආසියාවේ නැගී එන වෙළඳපළවල තිරසර වර්ධනයයි. 2018 දී නිකුත් කරන ලද දැඩි රෙගුලාසි හේතුවෙන් ජීවිත රක්ෂණ වාරික අඩු වීමෙන් බලපෑමට ලක් වූ චීනය විසින් එහි වර්ධන හැකියාව යළි ලබා ගන්නා ලදී. Swiss Re ප්‍රකාශනයන්ට අනුව සෞඛ්‍ය, වගකීම් හා කෘෂිකර්මාන්ත අවරණයන් සාමාන්‍ය රක්ෂණ වාරික ඉහළ යාමට ප්‍රධාන හේතුව විය. නමුත් පසුගිය වසර කිහිපය තුළ සිදු වූ ස්වභාවික විපත් ගණනාවක් හේතුවෙන් මෙම කාල සීමාව තුළ ඉහළ ගිය ඉඩකඩම් මිළ ගණන් හැර සාමාන්‍ය රක්ෂණ වෙළදපළ මිළ ගණන් උච්චාවචනය වූයේ කුඩා පරාසයක් තුළය.

දීර්ඝ කාලයක් තිස්සේ පැවති අඩු පොළී අනුපාත ලොව පුරා රක්ෂකයන්ගේ ලාභදායීතාව කෙරෙහි බලපා ඇත. අඩු පොළී අනුපාත හේතුවෙන් සහ රක්ෂණ ඔප්පු හිමියන් විසින් වෙනත් හිතකර වෙළපළ සහ ඉහළ ආදායම් ලැබෙන අවදානම් පැතිකඩවල (risk profiles) තම ඉතුරුම් යෙදවීමට පෙළඹී හේතුවෙන් බොහෝ රටවල ස්ථාවර ඇපකර අනුපාත තහවුරු කෙරෙන සාම්ප්‍රදායක ජීවිත රක්ෂණයන් වර්ධනය වීමට දැඩි උත්සාහයක් දරනු ලැබීය.

නිරතන්තර ස්වභාවික විපත් මගින් සාමාන්‍ය රක්ෂණ ලාභදායීතාව මත පීඩනයක් එල්ල කෙරෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ආදායමෙන් ප්‍රාග්ධන පිරිවැය ආවරණය කිරීම පවා දුෂ්කර විය. Swiss Re විසින් ප්‍රකාශයට පත් කරන ලද සිග්මා වාර්තාවෙහි පැහැදිලි කර ඇති ආකාරයට 2019 විපත්වලදී ඇති වූ ගෝලීය රක්ෂණ අලාභය ඇ.ඩො.බි. 60ක් පමණ වූ අතර ඒ අතරින් ජපානයේ Hagibis හා Faxai නම් වූ ටයිපූන්, බහාමාස්හි Dorian නම් සුළි කුණාටුව සහ මොසැම්බික්හි ෂ්‍රස නම් වූ සුළි සුළඟ වැනි ස්වභාවික ව්‍යසන හේතුවෙන් සිදු වූ අලාභය ඇ.ඩො.බි. 52කි. එසේ වුවත් පසුගිය වසර 10 තුළ සිදු වූ සාමාන්‍ය වාර්ෂික අලාභයට වඩා මෙය මදක් අඩු වුවද 2019 අග භාගය දක්වා පැවති ඕස්ට්‍රේලියාවේ ලැව්ගිනි හේතුවෙන් රක්ෂණ අලාභය තවදුරටත් ඉහළ යනු ඇත. ඒ අනුව, ඉහළ යමින් පවතින කාලගුණික අවදානම් තත්වය හමුවේ, පෙර නොවූ පරිදි රක්ෂකයන් සහ නියාමකයන් විසින් ස්වභාවික විපත් ආරක්ෂණ පරතරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට මෙවලම් සංවර්ධනය කිරීමට පෙළඹී ඇත.

එසේම රක්ෂණ ක්ෂේත්‍රයේ විශ්ලේෂකයන්ගේ අනාවැකි පරිදි ඉදිරිවසර 10 තුලදී රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන ස්ථානයක් හිමිකර ගෙන සිටින මෝටර් රථ පන්තියෙහි වාරික පහත යමින් රක්ෂණ ව්‍යාපාරයේ ව්‍යුහාත්මක වෙනසක් සිදු වනු ඇත. මෙයට ප්‍රධානම හේතුව වනුයේ හිමිකම් පෑම් අඩු සහ අඩු වාරික සහිත අපේක්ෂිත රියදුරු සහායක පද්ධති සහ රියදුරෙකු නොමැතිව ධාවනය කළ හැකි මෝටර් රථ තාක්ෂණ වර්ධනය වීමයි.

උක්ත අභියෝග මධ්‍යයේ මේ වන විට සමස්ථ ලෝකයටම ප්‍රබල තර්ජනයක් එල්ල කර ඇති කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් රක්ෂණ කර්මාන්තයට ද පෙර නොවූවිරූ බලපෑම්වලට මුහුණ දීමට සිදු වී ඇත. ලොව බලවත් හා ධනවත් රටවල්වල පවා සෞඛ්‍ය අංශය මෙම තත්වය දරා ගැනීමට දැඩි වෙහෙසක් දරමින් සිටියි. රටවල් හා කලාප රැසක් මාස ගණනාවක් පුරාවට වසා දමා තිබීම හේතුවෙන් ආර්ථිකයන් කෙරෙහි එල්ල වන අහිතකර බලපෑම් වඩාත් ඉහළ යමින් පවතියි.

වසංගත තත්වය හේතුවෙන් කොටස් වෙළඳපළ ගනුදෙනු වලට එල්ල වූ බාධාවන් හා ඒ තුළ සිදු වූ උච්චාවචනයන් රක්ෂණ සමාගම්හි උපකරණවල මිළ ගණන් හා ආයෝජන ආදායම් කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇත. මරණ ප්‍රතිලාභ හා රෝහල් ප්‍රතිලාභ දිගුකාලීන රක්ෂණ සමාගම්වලට මුහුණ දීමට සිදු වන ප්‍රධාන ගැටළුවක් වනු ඇති අතර සාමාන්‍ය රක්ෂකයන්ට ප්‍රධාන වශයෙන් චාරිකා, සේවක වගකීම, ව්‍යාපාර කෙරෙහි බාධා එල්ල වීම හා සෞඛ්‍ය රක්ෂණ ඔප්පු හේතුවෙන් අලාභ සිදු වනු ඇත. ඒ අනුව, ලොව පුරා රක්ෂකයන් සිය අයවැය හා ක්‍රියාත්මක කිරීමේ සැලසුම් වෙනස් කළ යුතු අතර මෙම තත්වයට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් සංචිත සහ ප්‍රාග්ධන තත්වයන් පවත්වා ගැනීම ඉතා වැදගත් වන බැවින් ලාභාංශ බෙදාහැරීම පවා සීමා කළ යුතුය.

### ශ්‍රී ලංකාවේ ආර්ථිකය සැකෙවින්

ශ්‍රී ලංකාවේ ණය මට්ටම් ඉහළ යාම, ස්වභාවික විපත්වල බලපෑම්, විදේශ මුදල්වලට සාපේක්ෂව රුපියලේ අගය අඛණ්ඩව අඩු වීම සමග මෑතදී මෙරට ආර්ථිකය අභියෝගාත්මක කාල සීමාවකට මුහුණ දුණි. මෙය 2017 හා 2018 වසරවලදී වාර්තා වූ අඩු ආර්ථික පිළිවෙලින් 3.6% හා 3.3% වර්ධන අනුපාත මගින් පෙනී යයි.

ඉහත දැක්වූ දුෂ්කරතා මධ්‍යයේ වුව ද 2019 දී 3.7%ක් වන කාර්තුමය දළ දේශීය නිෂ්පාදිතයක් වාර්තා කරමින් 2019 පළමු කාර්තුව තුළ ආර්ථික ප්‍රගතියක් කරා ගමන් කරමින් තිබිණි. කෙසේ වුවද, 2009 සිවිල් යුද්ධය අවසන් වූවාට පසුව අප රට මුහුණ දුන් දරුණුතම අර්බුදය වන පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය හේතුවෙන් රටේ සංවර්ධන අපේක්ෂාවන් විනාශ වී ගියේය. මෙම ප්‍රහාරයන් හේතුවෙන් සංචාරක කර්මාන්තය කඩා වැටුණු අතර වර්ෂය තුළ සේවා අංශ වර්ධනය 2.3%ක් තරම් අඩු මට්ටමකට ගෙන එමින් විදේශ ආයෝජන කෙරෙහි දැඩි බලපෑමක් එල්ල විය. 2019 දී අහිතකර කාලගුණ තත්වයන් හේතුවෙන් කෘෂිකාර්මික අංශයට බලපෑම් එල්ල වූ අතර එමගින් 0.6% ක අඩු වර්ධනයක් පෙන්නුම් කෙරිණි. 2019 හතර වන කාර්තුවේ දී වී වගාවට අදාළ ක්‍රියාකාරකම් අඩු වීම හා ප්‍රධාන වශයෙන් වේතනයට අදාළ වෘත්තීය ගැටළු හේතුවෙන් තේ නිෂ්පාදනය අඩු වීම මගින් කෘෂිකාර්මික වර්ධනය තවදුරටත් අඩු විය. සේවා අංශයේ හා කෘෂිකාර්මික අංශයේ වර්ධන වේගය අඩු වීමට සමගාමීව 2019 දී මෙරට මුළු දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 15,016ක් විය. ඒ අනුව, සමස්ථ දළ දේශීය නිෂ්පාදිතය 2.3% දක්වා අඩු වූ අතර 2001න් පසු රට අත්දකින ලද අඩුම දළ දේශීය නිෂ්පාදිතය මෙය විය.

සංචාරකයන්ගේ පැමිණීම ඉහළ යාම හා ව්‍යාපාරය පිළිබඳ විශ්වාසය වැඩි වීම සමග ආර්ථිකය යළි ප්‍රාණවත් වීමට පටන් ගත් අතර කොවිඩ් - 19 වසංගත තත්වය ඇති වීම නිසා 2020 දී මෙරට ආර්ථික තත්වය පිළිබඳ තවදුරටත් අවිනිශ්චිතතාවන් මතු විය. (මූලාශ්‍රය - 2019 මහ බැංකු වාර්ෂික වාර්තාව)

### ශ්‍රී ලංකා රක්ෂණ වෙළඳපළ

2019 වසර අවසාන වන විට ශ්‍රී ලංකාවේ රක්ෂණ අංශය රක්ෂණ සමාගම් විසි හතකින් හා රක්ෂණ තැරැව්කාර සමාගම් හැට හතකින් සමන්විත විය. රක්ෂකයන් විසි හත් දෙනා අතුරින් දහතුන් දෙනෙක් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ සහ දොළොස් දෙනෙක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නියැළුණු අතර දෙදෙනෙක් ජීවිත රක්ෂණය හා ජීවිත රක්ෂණය නොවන රක්ෂණ සේවා සපයන රක්ෂකයන් (composite insurer) වූහ. වසර තුළ ජීවිත රක්ෂණය හා ජීවිත රක්ෂණය නොවන රක්ෂණ සේවා සපයන රක්ෂණකරුවකු වන සීමාසහිත සණස රක්ෂණ සමාගම විසින් එහි දිගුකාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ලෙස වෙන් වශයෙන් දෙකකට වෙන් කරන ලදී. එනම් සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ් හා සණස ජෙනරල් ඉන්ෂුවරන්ස් කම්පැනි ලිමිටඩ්

ලෙසයි. පසුගිය වසර දෙක පුරාවට මූලිකව වෙළඳපළට එක් වීමට ඇති වැඩි කැමැත්ත හේතුවෙන් අලුතින් ලියාපදිංචි වන රක්ෂණ තැරැව්කාර සමාගම් සංඛ්‍යාව මද වශයෙන් ඉහළ ගියේය.


වෙළඳපළ ක්‍රියාකරුවන් අතර තීව්‍ර වෙමින් පවතින තරඟකාරීත්වයත් සමග පාර්භෝගිකයන් රඳවා ගැනීම හා පිරිවැය ඵලදායීතාව තීරණාත්මක තත්වයකට පත් වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවැය අඩු කර ගැනීම හා ලාභදායීතාව පවත්වා ගනිමින් විකුණුම් හා පාර්භෝගික තෘප්තිමත් බව ඉහළ නැංවීම සඳහා වන ක්‍රම සෙවීම කෙරෙහි රක්ෂණ සමාගම්වලට යොමු වීමට සිදු වී ඇත. එමගින් මාර්ගගත වේදිකාවන්, ජංගම යෙදවුම් හා සමාජ මාධ්‍ය ආදී නව විකල්ප බෙදාහැරීමේ මාර්ග ඇති වීමට මග පාදා ඇති අතර ඒවා මගින් අඩු පිරිවැයක් මත වාරික ඉහළ නැංවීමට හැකි වේ. එසේම බැංකු හරහා ජීවිත රක්ෂණ හා වෙනත් රක්ෂණ සේවා අලෙවි කිරීමේ හිමිකම් ලබා ගැනීම වැනි රක්ෂණ සමාගම් විසින් අනුග මනය කරන ලද උපායමාර්ග වසර තුළ නිරීක්ෂණය වූ අතර එමගින් තරඟකාරීත්වය උපරිම මට්ටමකට පැමිණ ඇති බව පෙනී යයි.

2019 දී රක්ෂණ කර්මාන්තය පසුගිය වසරට සාපේක්ෂව නාමිකව 8.64% ක වර්ධනයක් පෙන්නුම් කළ අතර වාර්තා වූ මුළු දළ ලිඛිත වාරිකය රු.මි. 196,513 (2018: රු.මි. 180,880) විය. වාරිකයේ වර්ධනය ප්‍රධාන වශයෙන් හේතුවූයේ ඉන්පසු දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය වන අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය අතර ඊට අදාළ ගිණුම්ගත කළ වාරික ඉහළ යාම පිළිවෙලින් රු.මි. 8,487 හා රු.මි. 7,146ක් (2018: රු.මි.8,723 හා රු.මි. 7,197) විය.

පසුගිය වසරේ දක්නට ලැබුණු රක්ෂණ ව්‍යාපාරයේ මන්දගාමී වර්ධනය 2019 වසරේ ද දක්නට ලැබුණු අතර වාරිකයේ වර්ධනය 7.10%ක් (2018:7.71%) විය. මෙය පසුගිය වසර පහ තුළ වාර්තා වූ අඩුම වර්ධන අනුපාතය වේ. කෙසේ වුවද, පෙර වසරවල මෙන් නොව මෝටර් රථ පන්තිය වාරිකයේ වර්ධනය සඳහා දැක්වූ දායකත්වය 2019 දි සැලකිය යුතු අන්දමින් පහළ බැස්සේය. දේශීය භාණ්ඩ බදු හා සුඛෝපභෝගී බදු ඉහළ යාම සහ විනිමය අනුපාතය පහත වැටීම හා රජය විසින් පනවන ලද ආනයන සීමාවන් හේතුවෙන් මෙම වර්ෂය තුළ අලුතින් සිදු කෙරෙන මෝටර් රථ ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව පහත වැටිණි. පසුගිය වසරට සාපේක්ෂව මෝටර් රථ වාරික වර්ධනය මන්දගාමී ස්වරූපයක් ගත්තේ මේ හේතුවෙන් විය හැකිය.

**I ප්‍රස්තාරය**

**රක්ෂණ ක්ෂේත්‍රයේ වාරික ආදායම හා වර්ධන අනුපාතය**




පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව පැවති අභියෝගාත්මක පරිසරය තුළ වුවද මෙම වර්ෂයේ 10.57%ක වාරික වර්ධනයක් (2018: 12.19%) වාර්තා කරමින් සාමාන්‍ය මට්ටමේ වර්ධනයක් අඛණ්ඩව පවත්වා ගැනීමට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සමත්වී ඇත. රක්ෂණය පිළිබඳ ඉහළ මට්ටමක පවතින දැනුවත්භාවය, ආකර්ෂණීය නිෂ්පාදන සංවර්ධනය හා රක්ෂකයන්ගේ වැඩි දියුණු කළ පාර්භෝගික සේවාව ආදිය මගින් පසුගිය වසර කිහිපය තුළ වාරික වර්ධනයක් ඇති කර ඇත. ඉහළ යන වැඩිහිටි ජනගහනය හේතුවෙන් ආකර්ෂණීය රක්ෂණ සැලසුම් හඳුන්වා දීමෙන් වැඩිහිටි පුරවැසියන් සඳහා සෞඛ්‍ය හා සමාජාරක්ෂණය සැපයීමට රක්ෂකයන්හට අවස්ථාව උදා වී ඇත. තවද, කොවිඩ් 19 වසංගතයේ බලපෑමත් සමග දිගුකාලීන ප්‍රතිපත්තිවලට සෞඛ්‍ය ප්‍රතිලාභ විධිවිධාන ඇතුළත් කිරීම සඳහා වන ඉල්ලීම් ඉහළ යනු ඇති බවට අපේක්ෂා කෙරේ.

1 වගුවෙහි දක්වා ඇති ආකාරයට දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවල්වලට සාපේක්ෂව තවමත් මෙරට ව්‍යාප්තිය වඩා පහළ මට්ටමක පැවතිය ද එය පසුගිය වසර පහ තුළ මද වශයෙන් ඉහළ ගොස් ඇත. එනම් 2015 දී 1.12% සිට 2019 අවසානය වන විට 1.31% දක්වා වන ආකාරයටයි. මහජනතාව තුළ රක්ෂණය පිළිබඳ වන දැනුම හා රක්ෂණයේ අගය පිළිබඳ ඔවුන් තුළ වන අවබෝධය තවමත් වර්ධනය වෙමින් පවතියි. කෙසේ වුවද, පසුගිය වසර කිහිපය තුළ රක්ෂණය කෙරෙහි වන පාර්භෝගික විශ්වාසය හා රක්ෂණ ඔප්පු මිළදී ගැනීම සඳහා වන චර්යාත්මක අපේක්ෂාව උක්ත සඳහන් මහජනයා තුළ වන දැනුවත්භාවය හා වැඩි දියුණු කළ සේවාවන් හා නිෂ්පාදන සංවර්ධනයන් හේ තුවෙන් ක්‍රමයෙන් ඉහළ ගොස් ඇත.

තවද, රක්ෂණ වාරික හා රටේ මුළු ජනගහනය අතර අනුපාතය පිළිඹිබු කරන රක්ෂණ ඝණත්වය පසුගිය වසර පහ තුළ වර්ධනය වී ඇති අතර එයින් ශ්‍රී ලංකාවේ රක්ෂණ සංවර්ධනයේ ධනාත්මක දර්ශක පෙන්නුම් කරයි.

මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2019 මැයි මස දිගුකාලීන රක්ෂණ සමාගම්වලට අදාළ පාර්භෝගික මූල්‍ය තත්ව විශ්ලේෂණ නීති නිකුත් කරන ලදී. රක්ෂණ කර්මාන්තය තුළ කළු සල්ලි ජාවාරම මර්ධනය හා ත්‍රස්තවාදය සඳහා මූල්‍ය සම්පාදනයට එරෙහිව ක්‍රියා කිරීම අධීක්ෂණය කිරීම සඳහා මෙම වසර තුළ රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මූල්‍ය බුද්ධි ඒකකයේ සහයෝගය ඇතිව කළු සල්ලි ජාවාරම මර්ධනය කිරීම සඳහා වන ක්ෂේත්‍රය තුළ සිදු කෙරෙන පරීක්ෂාවන් දිගුකාලීන රක්ෂණ සමාගම් කිහිපයක් තුල සිදු කරන ලදී.

**1 වගුව**
**වාරික ආදායම හා ව්‍යාප්තිය**

| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (අ) |
|---|---|---|---|---|---|
| වාරික ආදායම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය (රු.මි ) | 53,691 | 63,477 | 71,571 | 80,294 | 88,781 |
| වාරික ආදායමේ වර්ධන අනුපාතය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය (%) | 20.39 | 18.23 | 12.75 | 12.19 | 10.57 |
| වාරික ආදායම - සාමාන්‍යය රක්ෂණ ව්‍යාපාරය (රු.මි ) | 69,271 | 79,590 | 93,389 | 100,586 | 107,732 |
| වාරික ආදායමේ වර්ධන අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය (%) | 13.18 | 14.90 | 17.34 | 7.71 | 7.10 |
| මුළු වාරික ආදායම - රක්ෂණ ව්‍යාපාරය (රු.මි ) | 122,962 | 143,067 | 164,960 | 180,880 | 196,513 |
| මුළු වාරික ආදායමේ වර්ධන අනුපාතය - රක්ෂණ ව්‍යාපාරය(%)* | 16.22 | 16.35 | 15.30 | 9.65 | 8.64 |
| ප්‍රතිරක්ෂණ වාරික ආදායම(රු.මි)** | 1,738 | 2,397 | 3,683 | 4,056 | 4,174 |
| වර්තමාන වෙළඳපළ මිළ යටතේ දළ දේශීය නිෂ්පාදිතය (රු.බි)* | 10,951 | 11,996 | 13,328 | 14,366 | 15,016 |
| දළ දේශීය නිෂ්පාදිත වර්ධන අනුපාතය (%)* | 5.00 | 4.50 | 3.60 | 3.30 | 2.30 |
| ව්‍යාප්තිය % (රක්ෂණ ව්‍යාපාරයෙහි මුළු වාරිකය දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස) | 1.12 | 1.19 | 1.24 | 1.26 | 1.31 |
| ව්‍යාප්තිය % (දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි වාරිකය දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස) | 0.49 | 0.53 | 0.54 | 0.56 | 0.59 |
| ව්‍යාප්තිය % (සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි වාරිකය දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස) | 0.63 | 0.66 | 0.70 | 0.70 | 0.72 |
| රක්ෂණ ඝණත්වය - (මුළු වාරික ආදායම - රක්ෂණ ව්‍යාපාරය/ ජනගහනය) රු. | 5,864 | 6,747 | 7,693 | 8,347 | 9,013 |
| ජනගහනය .000 (මධ්‍ය වාර්ෂික)* | 20,970 | 21,203 | 21,444 | 21,670 | 21,803 |

* මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

: වර්තමාන වෙළඳපළ මිළට අදාළ දළ දේශීය නිෂ්පාදිතය 2019 ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව මත පදනම්ව 2014 සිට යාවත්කාලීන කරන ලදී

** ප්‍රතිරක්ෂණ වාරික ආදායම මගින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත පවරා දෙන ලද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රතිරක්ෂණ වාරික අනිවාර්ය පැවරීම පෙන්නුම් කෙරේ.

### රක්ෂණ සමාගම්හි මුළු වත්කම්

ඵලදායී වත්කම් හා බැරකම් කළමනාකරණයක් පවත්වා ගැනීම නියාමන අවශ්‍යතාවලට අනුකූල වන අතරම නුබුන්වත් බව හා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා රක්ෂකයන්හට ඉතා වැදගත් වේ. ශක්තිමත් වත්කම් කළඹක් මගින් ලාභදායී බව කෙරෙහි වන පීඩනය අවම කෙරෙන අතර විශේෂයෙන් ඉහළ හිමිකම් හා වියදම් පවතින තත්වයක් තුළ රක්ෂකයන්ගේ සාර්ථකත්වය පිළිබඳ බොහෝ විට තීරණය කරනු ලැබේ. අභියෝගාත්මක ආර්ථික තත්වයන් මධ්‍යයේ වුවද රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් 2018 දී වාර්තා වූ 8.38% ට සාපේක්ෂව 2019 දී 10.44%ක සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කර ඇත. පසුගිය වසර පහ තුළ රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් පිළිබඳ තොරතුරු 2 වගුව හා 2 ප්‍රස්තාරය මගින් පෙන්නුම් කෙරේ.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කළ අතර මෙම වර්ෂය තුළ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය 12.76% ක සාමාන්‍ය වේගයකින් වර්ධනය විය. 2019 වත්කම්වලින් වැඩි කොටසක් සංයුක්ත ණය උපකරණ හා රාජ්‍ය සුරැකුම් පත්වල සිදු කළ ආයෝජන වූ අතර 2019 සිට කල්බදු කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 16ට අනුව "වත්කම පාවිච්චි කිරීමේ හිමිකම" රක්ෂකයන් විසින් පිළිගත විය අතර මෙයද මුළු වත්කම් කෙරෙහි සුළු බලපෑමක් වන

සංයුක්ත රක්ෂකයෙකු වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා දිගුකාලීන රක්ෂකයන් වන සෙලින්කෝ ලයිෆ්, ඒඅයිඒ ලයිෆ් හා යුනියන් ලයිෆ් මුළු වත්කම් ආයෝජන කළඹෙහි ප්‍රධාන දායකයන් වන අතර සාමාන්‍ය රක්ෂණ සමාගම් අතර ඉහළම වත්කම් නියෝජනය කරනු ලබන්නේ ඵලායන්ස් ජෙනරල් හා සෙලින්කෝ ජෙනරල් ද විය.

පසුගිය වසර දෙක තුළ නිරීක්ෂණය කළ නිරන්තර පහළ බැසීම අතර වුවද ජාතික රක්ෂණ භාර අරමුදල එහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ වත්කම්වල කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර එය 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මි. 6,690ක් විය. මෙය ප්‍රධාන වශයෙන් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට අදාළ රාජ්‍ය ණය සුරැකුම් පත්වල සිදු කෙරෙන ආයෝජන සැලකිය යුතු අන්දමින් ඉහළ යාම හේතුවෙන් සිදු විය.


**2 වගුව**
**රක්ෂණ සමාගම්හි මුළු වත්කම්**

| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (අ) |
|---|---|---|---|---|---|
| දිගුකාලීන රක්ෂණය (රු.මි) | 312,713 | 345,589 | 391,890 | 430,759 | 485,723 |
| වර්ධන අනුපාතය - දිගුකාලීන රක්ෂණය (%) | 26.57 | 10.51 | 13.40 | 9.92 | 12.76 |
| සාමාන්‍ය රක්ෂණය (රු.මි) | 151,177 | 173,985 | 185,583 | 196,005 | 203,870 |
| වර්ධන අනුපාතය - සාමාන්‍ය රක්ෂණය (%) | (13.41) | 15.09 | 6.67 | 5.62 | 4.01 |
| ප්‍රතිරක්ෂණය (රු.මි) | 3,417 | 5,755 | 4,212 | 3,683 | 6,690 |
| වර්ධන අනුපාතය - ප්‍රතිරක්ෂණය (%) | 11.48 | 68.42 | (26.82) | (12.54) | 81.63 |
| එකතුව (රු.මි*) | *466,519 | 525,329 | 581,685 | 630,447 | 696,283 |
| වර්ධන අනුපාතය - එකතුව (%) | 10.54 | 12.61 | 10.73 | 8.38 | 10.44 |

* *අන්තර් කොටස් ගණුදෙනු ඉවත් කර ඇත*

**2 ප්‍රස්තාරය**

**රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් හා වත්කම් වර්ධන අනුපාතය**




**ප්‍රධාන මූල්‍ය අංශයන්හි මුළු වත්කම් ව්‍යාප්තිය**

පාස්කු ඉරිදා ප්‍රහාර හා ඒ හේතුවෙන් මෙම වසර තුළ ඇති වූ ආර්ථික පසුබෑම හේතුවෙන් 2018 වසරට සාපේක්ෂව මෙම වර්ෂය තුළ මූල්‍ය අංශයේ කාර්යසාධනය අඩු මට්ටමක පැවතිණි. 3 වගුව හා 3 ප්‍රස්තාරය මගින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන මූල්‍ය අංශ අතර වත්කම් ව්‍යාප්තිය පිළිබඳ විස්තර දැක්වේ. එහි පෙන්නුම් කර ඇති ආකාරයට මූල්‍ය අංශයේ මුළු වත්කම් පදනම 2018 වාර්තා වූ 11.23% ක වර්ධනයට සාපේක්ෂව 2019 වසර අවසානය වන විට 6.17%ක අඩු වී ඇත. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක වී ඇත්තේ බැංකු අංශය වන අතර ගිවිසුම්ගත ඉතුරුම් ආයතන ද මෙයට දායක වී ඇත.  බැංකු අංශය හා වෙනත් තැන්පතු ලබා ගන්නා මූල්‍ය ආයතන සහ විශේෂිත මූල්‍ය ආයතන කෙරෙහි බලපාන ප්‍රධාන ගැටළුවක් වී ඇත්තේ අක්‍රීය ණය හා අත්තිකාරම් වන අතර ඒවා 2014 වසරේ සිට එම ආයතනවල වත්කම් තත්වය දුර්වල මට්ටමකට පත් කිරීමට බලපා ඇත (මූලාශ්‍රය - 2019 මහ බැංකු වාර්ෂික වාර්තාව).

බලපත්‍රලාභී බැංකු 33න් සමන්විත බැංකු අංශය 2019 වසර අවසානය වන විට රු.බි. 14,442ක මුළු වත්කම් ප්‍රමාණයක් වාර්තා කළ අතර එය ශ්‍රී ලංකාවේ මූල්‍ය කර්මාන්තයේ මුළු වත්කම් ආයෝජන කළඹින් 71.6% ක් විය. කෙසේ වුවද, 2019 මහ බැංකු වාර්ෂික වාර්තාවේ පැහැදිලි කර ඇති ආකාරයට ණය හා අත්තිකාරම් සහ අක්‍රීය ණය ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් බැංකු විසින් ණය පිළිබඳ සිදු කරන දැඩි පරීක්ෂාවෙහි ප්‍රතිඵලයක් ලෙස බැංකු ක්ෂේත්‍රය කලින් වසරේ වාර්තා වූ 15.25% ක වර්ධනයට සාපේක්ෂව 2019 දී 5.33%ක අඩු වර්ධනයක් පෙන්නුම් කර ඇත.

**3 වගුව**

**ප්‍රධාන මූල්‍ය අංශයන්හි මුළු වත්කම් ව්‍යාප්තිය**

| මූල්‍ය අංශ | 2015 | | 2016 | | 2017 | | 2018 | | 2019 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | (රු.බි) | % | (රු.බි) | % | (රු.බි) | % | (රු.බි) | % | (රු.බි) | % |
| බැංකු අංශය | 9,503.7 | 68.7 | 10,575.8 | 69.5 | 11,897.4 | 69.7 | 13,711.4 | 72.2 | 14,442.1 | 71.6 |
| වෙනත් තැන්පතු ලබා ගන්නා මූල්‍ය ආයතන | 1,044.2 | 7.6 | 1,246.7 | 8.2 | 1,370.4 | 8.0 | 1,603.2 | 8.4 | 1,647.2 | 8.2 |
| විශේෂිත මූල්‍ය ආයතන | 557.8 | 4.0 | 335.4 | 2.2 | 388.9 | 2.3 | 241.1 | 1.3 | 282.6 | 1.4 |
| ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන | 2,257.5 | 16.3 | 2,536.6 | 16.7 | 2,838.0 | 16.6 | 2,807.4 | 14.8 | 3,096.5 | 15.4 |
| රක්ෂණ සමාගම්* | 466.5 | 3.4 | 525.3 | 3.5 | 581.7 | 3.4 | 630.4 (a) | 3.3 | 696.3 (b) | 3.5 |
| එකතුව | **13,829.6** | **100** | **15,219.8** | **100** | **17,076.4** | **100** | **18,993.5** | **100** | **20,164.7** | **100** |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2019*

** රක්ෂණ සමාගම් වෙතින් ලද දත්ත මත පදනම්ව රක්ෂණ සමාගම්වල වත්කම් ප්‍රතිස්ථාපනය කෙරිණ.*


2019 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් ප්‍රමාණය රු.බි. 1,647ක් වූ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, ග්‍රාමීය බැංකු හා සමුපකාර සමාජ මගින් තැන්පතු භාර ගන්නා වෙනත් මූල්‍ය ආයතන නියෝජනය කරන ලද අතර එමගින් 2018 වසරේ දී පෙන්නුම් කළ 16.99% වර්ධනයට සාපේක්ෂව 2.74%ක අඩු වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

කෙසේ වුවද, පෙර වර්ෂයේ නිරීක්ෂණය කරන ලද සැලකිය යුතු පහත වැටීමෙන් පසු තම වත්කම් පදනම යථා තත්වයට පත් කර ගැනීමට විශේෂිත මූල්‍ය ආයතනවලට 2019 වසරේ දී හැකියාව ලැබිණි. මෙය, මෙම වසර තුළ ඒකක භාරවල වත්කම් ඉහළ යාම හා නිකුත් කළ ඒකක සංඛ්‍යාව සහ ඒකක හිමිකරුවන් සංඛ්‍යාව කැපී පෙනෙන අන්දමින් ඉහළ යාමෙහි ප්‍රතිඵලයක් විය. ඒ අනුව, 2018 රු.බි. 241.1ක් වූ විශේෂිත මූල්‍ය ආයතනවල වත්කම් පදනම 2019 දී රු.බි. 282.6ක් වූ අතර එය 17.21%ක වර්ධනයකි.

සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාර අරමුදල ප්‍රධාන ස්ථානයක් ගත් ගිවිසුම්ගත ඉතුරුම් ආයතන ද වසර තුළ 10.30%ක සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාර අරමුදලේ සාමාජිකයින්ගේ ශුද්ධ දායකත්වයන් සහ අරමුදල් ආයෝජනයෙන් උත්පාදනය වූ ආදායම යන දෙකෙහි ප්‍රතිඵලයකි.

කලින් වසරට සාපේක්ෂව 10.44%ක සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කරමින් 2019 දී රු.බි. 696.3ක වත්කම් ප්‍රමාණයක් වාර්තා කළ රක්ෂණ සමාගම් ද මූල්‍ය අංශයේ සමස්ථ වත්කම් අයෝජන කළඹ කෙරෙහි සාධනීය දායකත්වයක් දැක්විය. ඒ අනුව, 2019 දී මූල්‍ය අංශයේ මුළු වත්කම් අතරින් 3.5%ක් රක්ෂණ සමාගම් සතු විය (2018:3.3%).

**රූප සටහන 4**
**2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම**




### ලාභදායීබව

වසර තුළ පැවති අයහපත් ආර්ථික තත්වයන් සහ පාස්කු ඉරිදා ප්‍රහාරයන් මගින් එල්ල වූ ඍණාත්මක බලපෑම් හේතුවෙන් රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය කෙරෙහි අභියෝග එල්ල විය. ඒ අනුව, රක්ෂණ ව්‍යාපරයේ සමස්ථ ලාභදායී බව 2018 දී වාර්තා වූ රු.මි. 39,335ට සාපේක්ෂව 2019 දී වාර්තා වූ රු.මි. 30,544 මගින් 22.35% ක අඩු වීමක් පෙන්නුම් කළේය.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය පසුගිය වසර දෙක තුළ ලබාහදායී බව ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර එය ප්‍රධාන වශයෙන් ජනශක්ති ලයිෆ් විසින් 2018 දී ජනශක්ති ජෙනරල්හි සිය අතිරේක ආයෝජන එලායන්ස් ජෙනරල් වෙත විකිණීමෙන් උපයා ගත් ඒකෝච්ත අතිරික්තය සහ සැලකිය යුතු ලාභය ඇතුළුව රක්ෂකයන් රැසක් විසින් සිදු කරන ලද අතිරික්තය මාරු කිරීමේ ප්‍රතිඵලයක් විය. කෙසේ වුවද, 2018ට සාපේක්ෂව 2019 දී ලාභදායී බව 24.92% ක අඩු වීමක් පෙන්නුම් කළ අතර එය සිදු වූයේ ප්‍රධාන වශයෙන් හිමිකම් ඉහළ යෑම සහ ගිවිසුම්ගත අතිරික්ත මාරු කිරීම් හේතුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, යුනියන් ලයිෆ්, සණස ලයිෆ්, එච්එන්බී ලයිෆ්, ආර්පිකෝ හා එලායන්ස් ලයිෆ් යන ජීවිත රක්ෂකයන් අදාළ වසර සඳහා අඩු ලාභ වාර්තා කිරීමයි.

විශේෂයෙන් එලායන්ස් ජෙනරල්හි " සුරක්ෂා යෝජනා ක්‍රමයේ" ඉහළ ගිය හිමිකම් හේතුවෙන් මෙම වසර තුළ එලායන්ස් ජෙනරල්, සෙලින්කෝ ජෙනරල්, හා අමානා ජෙනරල්හි කාර්යසාධනය පහළ බැසීම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි සමස්ථ ලාභදායී බව කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑවේය. ඒ අනුව, 2019 රක්ෂණ ව්‍යාපාරයේ මුළු බදු පෙර ලාභය රු.මි. 11,130ක් (2018: රු.මි. 11,737) වූ අතර එය 2018 වසරට සාපේක්ෂව 5.17%ක අඩු වීමකි.

කෙසේ වුවද, ජාතික රක්ෂණ භාර අරමුදල, එල්ඕඑල්සී ජෙනරල් හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් පසුගිය වසරට සාපේක්ෂව ලාභදායී බව සැලකිය යුතු අන්දමේ ඉහළ යෑමක් වාර්තා කෙරිණි. ජාතික රක්ෂණ භාර අරමුදලේ ලාභදායී බව ඉහළ යාමට ප්‍රධාන හේතුව අග්‍රහාර, ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය (NNDIS) හා වර්ජන, කැරළි, සිවිල් කැළඹීම් යෝජනාක්‍රමය (SRCC) ආදියෙහි දළ ලිඛිත වාරිකය ඉහළ යාමයි. තවද, 2018ට සාපේක්ෂව ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ රක්ෂණ හිමිකම් පෑම් කැපී පෙනෙන අයුරින් පහත වැටිණි.

**4 වගුව**
**රක්ෂණ සමාගම්හි ලාභදායීතාව**

| රක්ෂණකරු | 2018(අ) | | | 2019(ආ) | | |
|---|---|---|---|---|---|---|
| | දිගුකාලීන රක්ෂණය (රු. 000) | සාමාන්‍ය රක්ෂණය (රු. 000) | එකතුව (රු. 000) | දිගුකාලීන රක්ෂණය (රු. 000) | සාමාන්‍ය රක්ෂණය (රු. 000) | එකතුව (රු. 000) |
| ඒඅයිඒ ලයිෆ් | 1,616,852 | - | 1,616,852 | 3,167,397 | - | 3,167,397 |
| අලියාන්ස් ජෙනරල් | - | 647,973 | 647,973 | - | (1,691,424) | (1,691,424) |
| අලියාන්ස් ලයිෆ් | 85,583 | - | 85,583 | 46,603 | - | 46,603 |
| අමානා ජෙනරල් | - | 23,986 | 23,986 | - | (264,168) | (264,168) |
| අමානා ලයිෆ් | (62,976) | - | (62,976) | (29,478) | - | (29,478) |
| ආර්පිකෝ | 198,834 | - | 198,834 | 83,485 | - | 83,485 |
| සෙලින්කෝ ජෙනරල් | - | 2,335,822 | 2,335,822 | - | 1,734,516 | 1,734,516 |
| සෙලින්කෝ ලයිෆ් | 7,157,389 | - | 7,157,389 | 8,211,937 | - | 8,211,937 |
| කොන්ටිනෙන්ටල් | - | 427,023 | 427,023 | - | 506,285 | 506,285 |
| කෝපරේටිව් ජෙනරල් | - | 405,776 | 405,776 | - | 368,873 | 368,873 |
| කෝප්ලයිෆ් | 43,737 | - | 43,737 | 57,592 | - | 57,592 |
| ෆෙයාෆර්ස්ට් | - | 520,205 | 520,205 | - | 614,175 | 614,175 |
| එච්එන්බී ලයිෆ් | 1,297,848 | - | 1,297,848 | 1,106,535 | - | 1,106,535 |
| එච්එන්බී ජෙනරල් | - | 282,806 | 282,806 | - | 354,826 | 354,826 |
| ජනශක්ති ලයිෆ් | 9,855,686 | - | 9,855,686 | 591,571 | - | 591,571 |
| එල්අයිසී | (133,772) | - | (133,772) | (240,571) | - | (240,571) |
| එල්ඕඑල්සී ජෙනරල් | - | 181,870 | 181,870 | - | 730,806 | 730,806 |
| එල්ඕඑල්සී ලයිෆ් | (263,142) | - | (263,142) | 145,948 | - | 145,948 |
| එම්බීඑස්එල් | - | (149,235) | (149,235) | 32,115 | (79,206) | (47,091) |
| එන්අයිටීඑෆ් | - | 1,717,284 | *3,288,840 | - | 3,134,564 | *3,008,485 |
| ඔරියන්ට් | - | 94,742 | 94,742 | - | 169,429 | 169,429 |
| පීපල්ස් | - | 847,017 | 847,017 | - | 912,029 | 912,029 |
| සණස ලයිෆ් | 249,819 | - | 249,819 | 16,386 | - | 16,386 |
| සණස ජෙනරල් | - | 4,475 | 4,475 | - | 97,599 | 97,599 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 1,094,762 | - | 1,094,762 | 2,603,557 | - | 2,603,557 |
| එස්එල්අයිසී | 2,753,607 | 4,396,994 | 7,150,601 | 2,038,641 | 4,541,432 | 6,580,073 |
| යූනියන් ලයිෆ් | 2,132,392 | - | 2,132,392 | 1,708,463 | - | 1,708,463 |
| එකතුව | **26,026,618** | **11,736,739** | **39,334,913** | **19,540,181** | **11,129,736** | **30,543,839** |

** ප්‍රතිරක්ෂණයට අදාළ බදු පෙර ලාභය හා අලාභය පිළිවෙලින් රු.මි. 536ක් (2018: රු.මි. 229) හා රු.මි. 662 (2018: රු.මි. 1342) ඇතුළත් වේ.*

**රක්ෂණ සමාගම්හි කොටස්කරුවන්ගේ අරමුදල**

මූලික වශයෙන් වසර තුළ ඇති වූ ලාභදායී බව හේතුවෙන් රක්ෂණ කර්මාන්තයේ කොටස්කරුවන්ගේ මුළු අරමුදල් ප්‍රමාණය 2018 දී රු.මි. 195,542 සිට 2019 අවසානය වන විට රු.මි. 209,271 දක්වා එනම් 7.02% කින් වර්ධනය විය. කෙසේ වුවද, රක්ෂණකරුවන් රැසකගේ ලාභදායී බව අඩු වීම හේතුවෙන් 2018 වාර්තා වූ ප්‍රමාණයට (10.61%) වඩා ඉහත වර්ධන අනුපාතය අඩු විය.

"සීමිත නියාමන සංචිතය" ලෙස පවත්වාගෙන යනු ලබන ඒකෝචිත අතිරික්තය පසුගිය වසරට සාපේක්ෂව රු.මි. 16,248ක් ලෙස නොවෙනස්ව පැවති අතර ප්‍රකාශිත ප්‍රාග්ධනය 2019 දී රු.මි. 43,891ක් (2018:රු.මි. 41,430) විය. එයින් පෙන්නුම් කළේ ප්‍රධාන වශයෙන් වසර තුළ එල්ඕඑල්සී ජීවිත, එම්බීඑස්එල්, සණස ජීවිත, හා සණස සාමාන්‍ය යන රක්ෂණකරුවන් විසින් ප්‍රාග්ධන සැපයුම හේතුවෙන් වූ 5.94%ක සාමාන්‍ය වර්ධනයකි. සෙලින්කෝ ජීවිත, ඒඅයිඒ ජීවිත හා සොෆ්ට්ලොජික් ජීවිත විසින් වර්තා කරන ලද කැපී පෙනෙන බදු පෙර ලාභවල ප්‍රතිඵලයක් ලෙස 2019 වර්ෂය අවසාන වන විට මෙම කර්මාන්තයේ වෙනත් සංචිත රු.මි. 149,132ක් වූ නොවෙනස් තත්වයක පැවතිණි.

5 වගුවේ  දක්වා ඇති ආකාරයට සංයුක්ත රක්ෂණකරු වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කර්මාන්තය තුළ වන ඉහළම කොටස්කරුවන්ගේ අරමුදල් ප්‍රමාණය වර්තා කළ අතර එය රු.මි. 60,912ක් විය. මීළඟට ඉහළ ස්ථානයන් හිමි කර ගන්නා ලද්දේ සෙලින්කෝ ලයිෆ්, ඒඅයිඒ ලයිෆ් හා යූනියන් ලයිෆ් විසිනි. පසුගිය වසරේ දී මෙන්ම සාමාන්‍ය රක්ෂණකරුවන් අතර ඉහළ ම මට්ටමේ කොටස්කරුවන්ගේ අරමුදල් ප්‍රමාණය පවත්වාගෙන යනු ලැබුවේ සෙලින්කෝ ජෙනරල් හා අලියාන්ස් ජෙනරල්  විසිනි. එල්අයිසී හා අමානා ලයිෆ් යන රක්ෂණකරුවන්ට දැරීමට සිදු වූ නිරන්තර අලාභ හේතුවෙන් ඔවුන්ගේ සංචිත තවදුරටත් අඩු වූ අතර ඔවුහු 2019 දෙසැම්බර් 31 දිනට අඩුම කොටස්කරුවන්ගේ අරමුදල් ප්‍රමාණයක් වාර්තා කළහ.

**5 වගුව**

**රක්ෂණ සමාගම්හි කොටස්කරුවන්ගේ මුළු අරමුදල් ප්‍රමාණය**

| | 2018 (අ) | | 2019(ආ) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | මුළු කොටස් කරුවන්ගේ අරමුදල් (රු. 000) | % | ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු. 000) | සීමිත නියාමක සංචිතය (රු. 000) | මුළු වෙනත් සංචිත (රු. 000) | මුළු කොටස් කරුවන්ගේ අරමුදල් (රු. 000) | % |
| ඒඅයිඒ ලයිෆ් | 18,698,864 | 9.56 | 511,922 | 6,080,848 | 14,048,613 | 20,641,383 | 9.86 |
| අලියාන්ස් ජෙනරල් | 11,114,237 | 5.68 | 8,619,972 | - | 1,377,284 | 9,997,256 | 4.78 |
| අලියාන්ස් ලයිෆ් | 1,325,815 | 0.68 | 739,624 | - | 862,259 | 1,601,883 | 0.77 |
| අමානා ජෙනරල් | 1,935,856 | 0.99 | 2,124,823 | - | (383,044) | 1,741,779 | 0.83 |
| අමානා ලයිෆ් | 547,777 | 0.28 | 580,033 | - | (10,473) | 569,560 | 0.27 |
| ආර්පිකෝ | 1,432,318 | 0.73 | 675,565 | - | 840,319 | 1,515,884 | 0.72 |
| සෙලින්කෝ ජෙනරල් | 11,145,323 | 5.70 | 500,200 | - | 11,197,392 | 11,697,592 | 5.59 |
| සෙලින්කෝ ලයිෆ් | 26,425,582 | 13.51 | 500,001 | 3,456,184 | 27,535,891 | 31,492,076 | 15.05 |
| කොන්ටිනන්ටල් | 1,731,618 | 0.89 | 750,000 | - | 1,251,919 | 2,001,919 | 0.96 |
| කෝපරේටිව් ජෙනරල් | 2,360,158 | 1.21 | 1,515,757 | - | 1,086,282 | 2,602,039 | 1.24 |
| කෝප්ලයිෆ් | 785,213 | 0.40 | 544,260 | - | 348,966 | 893,226 | 0.43 |
| ෆෙයාෆර්ස්ට් | 5,138,088 | 2.63 | 3,131,949 | - | 2,531,469 | 5,663,418 | 2.71 |
| එච්එන්බී ලයිෆ් | 5,515,881 | 2.82 | 1,171,875 | 381,156 | 4,724,964 | 6,277,995 | 3.00 |
| එච්එන්බී ජෙනරල් | 1,378,434 | 0.70 | 1,150,000 | - | 436,349 | 1,586,349 | 0.76 |
| ජනශක්ති ලයිෆ් | 9,321,040 | 4.77 | 4,853,752 | 1,795,829 | 2,986,706 | 9,636,286 | 4.60 |
| එල්අයිසී | 460,893 | 0.24 | 500,000 | - | (207,022) | 292,978 | 0.14 |
| එල්ඕඑල්සී ජෙනරල් | 1,293,985 | 0.66 | 700,000 | - | 1,164,891 | 1,864,891 | 0.89 |
| එල්ඕඑල්සී ලයිෆ් | 720,022 | 0.37 | 1,250,000 | 256,134 | (181,375) | 1,324,760 | 0.63 |
| එම්බීඑස්එල් | 419,141 | 0.21 | 2,280,022 | - | (738,745) | 1,541,277 | 0.74 |
| එන්අයිටීඑෆ් | 6,995,501 | 3.58 | - | - | 6,153,313 | 6,153,313 | 2.94 |
| ඔරියන්ට් | 768,777 | 0.39 | 825,000 | - | 61,154 | 886,154 | 0.42 |
| පීපල්ස් | 3,375,147 | 1.73 | 1,350,000 | - | 2,305,436 | 3,655,436 | 1.75 |
| සණස ලයිෆ් | 864,300 | 0.44 | 1,044,844 | - | 118,217 | 1,163,061 | 0.56 |
| සණස ජෙනරල් | 254,317 | 0.13 | 508,995 | - | 168,179 | 677,174 | 0.32 |
| සොෆ්ට්ලොජික් ජීවිත | 6,670,963 | 3.41 | 1,062,500 | 798,004 | 6,358,415 | 8,218,919 | 3.93 |
| එස්එල්අයිසී | 61,191,386 | 31.29 | 6,000,000 | 98,237 | 54,813,348 | 60,911,585 | 29.11 |
| යූනියන් ලයිෆ් | 13,671,688 | 6.99 | 1,000,000 | 3,381,934 | 10,280,968 | 14,662,903 | 7.01 |
| **එකතුව** | **195,542,325** | **100** | **43,891,092** | **16,248,326** | **149,131,676** | **209,271,094** | **100** |

*සටහන: 2018 දී ප්‍රකාශයට පත් කරන ලද සංඛ්‍යා විගණන ගැලපුම්වලට අනුව සංශෝධනය කරන ලදී (ප්‍රධාන වශයෙන් රක්ෂණකරුවන් රැසකගේ ඍණාත්මක ආදායම් බදු වියදම්/ ආදායම් බදු මුදල් ආපසු ලබා දීම නිසා)*

**රක්ෂණකරුවන්ගේ ශාඛා, සේවකයන් හා ඒජන්තවරුන් පිළිබඳ විශ්ලේෂණය**

රට පුරා පුළුල් ශාඛා ජාලයක් පැවතීම හේතුවෙන් වැඩි රක්ෂණ ඔප්පු හිමියන් ප්‍රමාණයක් ඇති කිරීමට සහ ඔවුන්ට වඩා කාර්යක්ෂමව සේවා සැපයීමට රක්ෂණ සමාගම්වල ධාරිතාව ඉහළ නැංවේ. කෙසේ වුවද, මෙම වසර තුළ රක්ෂණකරුවන් කිහිප දෙනෙක් විසින් ඔවුන්ගේ ශාඛා ප්‍රතිව්‍යුහගත කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2018 දී වාර්තා වූ 2,147 ක් වූ ශාඛා ජාලය 2012 දක්වා අඩු විය. සමස්ථ ශාඛා ජාලය අතුරින් බහුතරය බස්නාහිර පළාත තුළ ස්ථාපිත වී ඇති අතර 2019 දී එම සංඛ්‍යාව 670ක් විය. එමගින් රටේ ඉහළම රක්ෂණ ඔප්පු හිමියන් පදනම නියෝජනය කෙරේ. මුළු ශාඛා ප්‍රමාණය දිගුකාලීන රක්ෂණ ශාඛා 1,119 ක්, සාමාන්‍ය රක්ෂණ ශාඛා 806 ක් හා සංයුක්ත රක්ෂණ ශාඛා 144 ක් සමන්විත විය.

2019 දී රක්ෂණ සාමගම් විසින් ඇති කළ රැකියා අවස්ථා ප්‍රමාණය 19,841 ක් වූ අතර එය 2018 වාර්තා වූ 19,437 ට සාපේක්ෂව මද වශයෙන් ඉහළ යාමකි. කෙසේ වුවද, ඒවා අතරින් 60%ක් බස්නාහිර පළාත තුළ කේන්ද්‍රගත වී ඇත. මුළු සේවකයන්ගෙන් 51%ක් සාමාන්‍ය රක්ෂණ සමාගම් වලට අදාල වූ අතර දිගුකාලීන රක්ෂණකරුවන්ට අදාලව 33% ක් හා සංයුක්ත රක්ෂණකරුවන් අදාලව 15% ද විය.

කාර්යක්ෂම නියෝජිතයින් සමූහයක් යනු කර්මාන්තයේ වර්ධනය හා සාර්ථකත්වය තීරණය කරන ප්‍රධාන සාධක අතුරින් එකක් ලෙස සැලකෙන නමුත් ඒවා කළමනාකරණය කිරීම බොහෝ රක්ෂණකරුවන්හට අභියෝගාත්මක කාර්යයක් වී ඇත. මෙම නියෝජිතයින් අතරට අලුතින් එක් වන්නන් ප්‍රමාණය වසරින් වසර වැඩි වන අතර ප්‍රධාන වශයෙන් දුර්වල කාර්යසාධනය, රක්ෂණ ඔප්පු හිමියන්ගෙන් රැස් කරන ලද අරමුදල් අවභාවිතය හා වෙනත් මූල්‍ය වංචා යන හේතු මත රක්ෂණ සමාගම් විසින් සැලකිය යුතු නියෝජිතයින් සංඛ්‍යාවක් ඉවත් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස රක්ෂණ කර්මාන්තය තුළ සේවය කරන මුළු නියෝජිතයින් සංඛ්‍යාව මෙම වසර තුළ 44,904 සිට 44,998 දක්වා මද වශයෙන් ඉහල ගොස් ඇත. කෙසේ වුවද, සොෆ්ට්ලොජික් ලයිෆ්, ආර්පිකෝ, එල්ඕඑල්සී ලයිෆ් හා එච්එන්බී ලයිෆ් වැනි රක්ෂණකරුවන් රැසක් විසින් 2019 දී සිය නියෝජිතයින්ගේ ජාලය පුළුල් කරන ලදී. පසුගිය වසරවල මෙන්ම මුළු නියෝජිතයින්ගෙන් 40% ක් බස්නාහිර පළාත තුළ සිටින අතර 2019 නියෝජිතයින්ගෙන් බහුතරය දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සතු විය.


**6 වගුව**

**2018 හා 2019 දෙසැම්බර් 31 දිනට ශාඛා, සේවකයන් හා ඒජන්තවරුන් සංඛ්‍යාව**

| පළාත | ශාඛා සංඛ්‍යාව | | සේවකයන් සංඛ්‍යාව | | ඒජන්තවරුන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | 2018 | 2019 | 2018 | 2019 | 2018 | 2019 |
| මධ්‍යම පළාත | 204 | 211 | 1,070 | 1,158 | 3,768 | 4,036 |
| නැගෙනහිර පළාත | 166 | 134 | 682 | 682 | 2,272 | 2,151 |
| උතුරු මැද පළාත | 144 | 146 | 753 | 725 | 2,257 | 2,478 |
| වයඹ පළාත | 233 | 221 | 1,151 | 1,263 | 4,497 | 4,212 |
| උතුරු පළාත | 162 | 144 | 622 | 613 | 2,683 | 2,805 |
| සබරගමුව පළාත | 160 | 171 | 866 | 872 | 3,166 | 3,347 |
| දකුණු පළාත | 274 | 250 | 1,554 | 1,559 | 5,015 | 4,848 |
| ඌව පළාත | 124 | 122 | 632 | 634 | 2,204 | 2,430 |
| බස්නාහිර පළාත | 680 | 670 | 12,107 | 12,335 | 19,042 | 18,691 |
| **එකතුව** | **2,147** | **2,069** | **19,437** | **19,841** | **44,904** | **44,998** |

**4 ප්‍රස්තාරය**

**2018 හා 2019 දෙසැම්බර් 31 දිනට ශාඛා, සේවකයන් හා ඒජන්තවරුන් සංඛ්‍යාව**




**රක්ෂණ සමාගම්හි බෙදාහැරීමේ මාර්ග**
පසුගිය වසර කිහිපය තුළ තාක්ෂණික සංවර්ධනයන් මගින් ලොව පුරා රක්ෂණ බෙදාහැරීම් කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කර ඇති නමුත් තවමත් ශ්‍රී ලංකාවට එහි ප්‍රභලත්වය නිසියාකාරව අත් දකින්නට හැකි වී නැත. පාරිභෝගිකයන් දිගින් දිගටම තමන්ගේ දෛනික කටයුතුවලදී අන්තර්ජාලය භාවිතා කිරීම හේතුවෙන් මාර්ගගත වේදිකාවන්, වෙබ් අඩවි, ජංගම දුරකථන යෙදවුම් හා සමාජ මාධ්‍ය තම රක්ෂණ නිෂ්පාදන පිළිබඳ ප්‍රචාරණය සහ ඒවා බෙදාහැරීම සඳහා රක්ෂකයන්ගේ ආකර්ෂණය දිනාගෙන ඇත. සමාජ මාධ්‍ය ඇතුළු ජංගම දුරකථන හා අන්තර්ජාලය (පහත 5 ප්‍රස්තාරයේ -සෘජු- කාණ්ඩය මගින් ආවරණය කෙරේ) මගින් සමස්ථ දළ ලිඛිත වාරිකය කෙරෙහි දක්වන ලද දායකත්වය 2018 ට සාපේක්ෂව 2019 දී ඉහළ නංවන ලද බැවින් මෙම සාධක සාධනීය අපේක්ෂාවන් පිළිඹිබු කරයි.

5 ප්‍රස්තාරයෙන් දැක්වෙන පරිදි ඒජන්තවරුන් අඛණ්ඩව දිගුකාලීන රක්ෂණ වෙළඳපළ තුළ ප්‍රධානත්වය ගත් අතර එය 2019 මුළු දළ ලිඛිත වාරිකයෙන් 85.72%ක් විය. බෙදාහැරීමේ ක්‍රමයක් ලෙස දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය තුළ බැංකු හරහා ජීවිත රක්ෂණ හා වෙනත් රක්ෂණ සේවා සහ නිෂ්පාදන අලෙවි කිරීමෙහි වැදගත්කම මෙම වසරේ දී තවදුරටත් වැඩි වූ අතර වාර්ෂික දායකත්වය 7.14% සිට 8.18% දක්වා ඉහළ ගොස් ඇත. සැබවින්ම මෙම වසර තුළ දිගුකාලීන රක්ෂණකරුවන් කිහිප දෙනෙකු විසින් වාරික වර්ධනයෙහි තම තරඟකාරීත්වය වැඩි කර ගැනීමේ අරමුණින් ඇතැම් බැංකු වෙතින් බැංකු හරහා ජීවිත රක්ෂණ හා වෙනත් රක්ෂණ සේවා සහ නිෂ්පාදන අලෙවි කිරීමේ හිමිකම ලබා ගන්නා ලදී.

2019 දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වාරික බෙදාහැරීමට ඒජන්තවරුන්, තැරැව්කරුවන්, අලෙවිකරණ නිලධාරීන් වැනි විශේෂ අලෙවි බලකාය හා සෘජු ව්‍යාපාරය දායක වූ අතර ඔවුන්ගේ මුළු දළ ලිඛිත වාරික උත්පාදනයෙන් පිළිවෙලින් 23.69%, 22.81%, 22.15% හා 21.07% ක් විය. සෘජු ව්‍යාපාරය ප්‍රධාන වශයෙන් රජයේ රක්ෂණ යෝජනාක්‍රම හා ජාතික රක්ෂණ භාර අරමුදලින් (එහි නිෂ්පාදනවල ස්වභාවය හේතුවෙන්) සහ පාරිභෝගිකයන්, ජංගම යෙදවුම් හා අන්තර්ජාලය ආදියෙන් සමන්විත වේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට සම්බන්ධ අදාළ/ සමූහ ව්‍යාපාර මගින් රක්ෂකයා අයත් වන සමූහය උත්පාදනය කරන දළ ලිඛිත වාරිකයෙහි කොටස නියෝජනය කරනු ලබන අතර එය 2019 දී 6.85% ක් (2018:6.17%) ලෙස වාර්තා විය.

**5 ප්‍රස්තාරය**
**රක්ෂණ සමාගම්හි බෙදාහැරීමේ මාර්ග**




| | | 2018 | | 2019 | |
|---|---|---|---|---|---|
| | | දිගුකාලීන | සාමාන්‍ය | දිගුකාලීන | සාමාන්‍ය |
| | නියෝජිතයින් | 86.94 | 25.01 | 85.72 | 23.69 |
| | තැරැව්කරුවන් | 1.01 | 20.02 | 1.30 | 22.81 |
| | විශේෂිත විකුණුම් බලකාය (රක්ෂණ නියෝජිතයින් නොවූ) | 1.13 | 25.24 | 1.26 | 22.15 |
| | සෘජු | 1.80 | 18.93 | 1.92 | 21.07 |
| | බැංකුරක්ෂණය | 7.14 | 2.65 | 8.18 | 2.79 |
| | අදාළ/සමූහ සමාගම් | 1.74 | 6.17 | 1.41 | 6.85 |
| | වෙනත් | 0.24 | 1.98 | 0.21 | 0.64 |

*සටහන: 2018 දී ප්‍රකාශයට පත් කළ ප්‍රතිශතයන් මෙම වසරේ සිදු කළ වර්ගීකරණයන් හේතුවෙන් සංශෝධනය කරන ලදී.*

**දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**
**දළ ලිඛිත වාරිකය**
2019 වසර තුළ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි සිදු වූ සංවර්ධනයන් මගින් 10.57% ක සාමාන්‍ය වර්ධනයක් එනම් රු.මි. 88,781 ක සමස්ථ දළ ලිඛිත වාරිකයක් සඳහා මග පාදන ලදී. 2019 දී සිදු වූ ආර්ථික හා දේශපාලනික පසුබෑම සහ 2019 අප්‍රේල් මස එල්ල වූ පාස්කු ප්‍රහාරය හමුවේ ගුණාත්මක බවින් යුතු පාරිභෝගික සේවාවක් තහවුරු කිරීම සඳහා මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩි දියුණු කිරීම හා බෙහෙවින් අභියෝගාත්මක පරිසරයක් තුළ වෙනස් වන පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම මගින් ජාතික රක්ෂණ අංශයේ වර්ධනය පවත්වා ගැනීම සිදු කෙරිණි. දිගුකාලීන රක්ෂණ කර්මාන්තය දිගුකාලීන රක්ෂණ සමාගම් 13 කින් සහ සංයුක්ත රක්ෂණකරුවන් 02 කින් සමන්විත බෙහෙවින් තරඟකාරී වෙළඳපළක් තුළ ක්‍රියාත්මක විය. සමාගම් හතරක් විදේශීය රක්ෂණ සමාගම් සමග සහයෝගීතාවයෙන් කටයුතු කර ඇත.

කෙසේ වුවද, 2019 වසර සඳහා වාර්තා වූ දළ ලිඛිත වාරිකයේ වර්ධනය පසුගිය වසරේ 12.19% (රු.මි. 80,294) ක් වූ වර්ධනයට සාපේක්ෂව අඩු වීමක් සහ කලින් වසරට සාපේක්ෂව කාර්යසාධනය අඩු මට්ටමක පැවති බව පෙන්නුම් කරන අතර මෙයට ප්‍රධාන හේතුව ආර්ථික ක්‍රියාකාරකම් සීමා වීම සහ මෙම වසරේ දී එල්ල වූ පාස්කු ප්‍රහාරයන් හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතාවයි. තවද, 2015 වසරේ සිට ජීවිත රක්ෂණ කර්මාන්තයේ

දළ ලිඛිත වාරික වර්ධනය අඩු වීමක් පෙන්නුම් කළ අතර සමාලෝචිත වසර තුළ ඊට අදාළ අඩුම අගය වාර්තා විය. කෙසේ වුවද, 2015 සිට 2019 දක්වා වූ කාල සීමාව තුළ දළ ලිඛිත වාරික වර්ධනයේ 65%ක ඉහළ යාමක් පෙනී ගියේය.

රක්ෂණ ව්‍යාපාරයේ ව්‍යාප්තිය මට්ටමෙහි විශාල වෙනසක් පෙන්නුම් නොකළද මෙම අංශය පුළුල් කිරීම සඳහා වන අවස්ථාවන් වර්ධනය වෙමින් පවතින අතර ආර්ථික පසුබෑමෙන් මිදී වර්ධනය වීම සඳහා මෙම අංශයට හැකියාව ඇත. Insure-Tech වැනි නව තාක්ෂණය නිරන්තරයෙන් භාවිතා කිරීම ප්‍රගතිය පෙන්නුම් කරන ප්‍රධාන ලක්ෂණයක් වන අතර පාරිභෝගික ඉල්ලුම වන සමාජ ආර්ථික හා පාරිසරික සාධක වුවද දිගුකාලීන රක්ෂණකරුවන් සඳහා වන නව ප්‍රවේශයක් වනු ඇත. කෙසේ වුවද, 2019 දෙසැම්බර් සිට ආරම්භ වූ කොවිඩ් 19 වසංගතය රක්ෂණකරුවන්ගේ දිගුකාලීන මූල්‍ය තත්වය කෙරෙහි බලපානු ඇත.

**7 වගුව**

**සමාගම අනුව දළ ලිඛිත වාරිකය හා වෙළඳපළ කොටස - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂණකරු | 2015 | | 2016 | | 2017 | | 2018 (අ) | | 2019 (ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දළ ලිඛිත වාරිකය (රු. 000) | වෙළඳපළ කොටස (%) | දළ ලිඛිත වාරිකය (රු. 000) | වෙළඳපළ කොටස (%) | දළ ලිඛිත වාරිකය (රු. 000) | වෙළඳපළ කොටස (%) | දළ ලිඛිත වාරිකය (රු. 000) | වෙළඳපළ කොටස (%) | දළ ලිඛිත වාරිකය (රු. 000) | වෙළඳපළ කොටස (%) |
| ඒඅයිඒ ලයිෆ් | 8,433,333 | 15.71 | 10,103,915 | 15.92 | 11,510,581 | 16.08 | 12,739,351 | 15.87 | 13,848,283 | 15.60 |
| එලයන්ස් ලයිෆ් | 919,144 | 1.71 | 1,040,269 | 1.64 | 1,178,817 | 1.65 | 1,301,254 | 1.62 | 1,403,858 | 1.58 |
| අමානා ලයිෆ් | 928,294 | 1.73 | 820,727 | 1.29 | 792,174 | 1.11 | 827,948 | 1.03 | 851,293 | 0.96 |
| ආර්පිකෝ | 482,447 | 0.90 | 745,386 | 1.17 | 1,038,085 | 1.45 | 1,387,432 | 1.73 | 1,635,336 | 1.84 |
| සෙලින්කෝ ලයිෆ් | 13,456,828 | 25.06 | 15,027,600 | 23.67 | 15,765,484 | 22.03 | 17,812,774 | 22.18 | 18,718,553 | 21.08 |
| කෝප්ලයිෆ් | 494,598 | 0.92 | 466,997 | 0.73 | 626,972 | 0.88 | 619,881 | 0.77 | 774,601 | 0.87 |
| එච්එන්බී ලයිෆ් | 2,788,715 | 5.19 | 3,554,078 | 5.60 | 3,963,642 | 5.54 | 4,420,513 | 5.51 | 5,175,044 | 5.83 |
| ජනශක්ති ලයිෆ් | 2,550,782 | 4.75 | 2,943,963 | 4.64 | 2,902,873 | 4.06 | 3,008,842 | 3.75 | 3,511,660 | 3.96 |
| එල්අයිසී | 386,885 | 0.72 | 473,867 | 0.75 | 582,114 | 0.81 | 522,698 | 0.65 | 598,897 | 0.67 |
| එල්ඕඑල්සී ලයිෆ් | 1,209,578 | 2.25 | 1,896,558 | 2.99 | 2,467,166 | 3.45 | 2,610,785 | 3.25 | 2,682,522 | 3.02 |
| එම්බීඑස්එල් | 203,235 | 0.38 | 235,533 | 0.37 | 123,732 | 0.17 | 65,839 | 0.08 | 54,757 | 0.06 |
| සණස ලයිෆ් | 311,434 | 0.58 | 367,637 | 0.58 | 454,056 | 0.62 | 521,193 | 0.65 | 527,464 | 0.59 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 10,470,079 | 19.50 | 11,893,640 | 18.74 | 2,517,119 | 17.49 | 13,205,802 | 16.45 | 14,820,025 | 16.69 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 4,091,042 | 7.62 | 5,635,701 | 8.88 | 7,530,935 | 10.52 | 10,005,733 | 12.46 | 12,531,283 | 14.11 |
| යූනියන් ලයිෆ් | 6,964,390 | 12.97 | 8,270,751 | 13.03 | 10,117,630 | 14.14 | 11,243,915 | 14.00 | 11,647,757 | 13.12 |
| එකතුව | **53,690,783** | **100** | **63,476,622** | **100** | **71,571,380** | **100** | **80,293,960** | **100** | **88,781,332** | **100** |
| **වර්ධන අනුපාතය (%)** | **20.40** | | **18.23** | | **12.75** | | **12.19** | | **10.57** | |

පසුගිය වසරේ මෙන්ම 2019 වසර සඳහා රු.මි. 18,719 ක දළ ලිඛිත වාරිකයක් උත්පාදනය කරමින් (2018: රු.මි. 17,813) වෙළඳපොළ ප්‍රමුඛයා වන්නට සෙලින්කෝ ලයිෆ් සමාගමට හැකි වූ අතර එය මුළු දළ ලිඛිත වාරිකයෙන් 21.08%ක් විය. කෙසේ වුවද, 2015 සිට 2019 දක්වා වන කාල සීමාව තුළ අනෙක් තරඟකරුවන්ගේ තරඟකාරීත්වය ඉහළ යාමත් සමග වෙළඳපොළ ප්‍රමුඛයාගේ වෙළඳපොළ කොටස 3.98% කින් අඩු විය. 2019 වසර අවසානය වන විට සෙලින්කෝ ලයිෆ් සමාගමෙහි වෙළඳපොළ කොටසේ පහළ බැසීම 1.1%ක් ලෙස වාර්තා විය.

2019 දළ ලිඛිත වාරිකයට අදාළව දෙවන හා තෙවන ස්ථාන තහවුරු කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා ඒඅයිඒ ලයිෆ් සමාගමට හැකි වූ අතර වාර්තා කළ දළ ලිඛිත වාරිකය පිළිවෙලින් රු.මි. 14,820 (රු.මි. 13,206) සහ රු.මි. 13,848 (2018:රු.මි. 13,206) විය. එසේම, ඊට අදාළ වෙළඳපළ කොටස් 16.69% හා 15.60% විය. 2019 වසරේ දී ඒඅයිඒ ලයිෆ් සමාගමෙහි වෙළඳපළ කොටස 0.27%කින් පහත වැටුණු අතර තම වෙළඳපළ කොටස 0.24%ක් වැනි සුළු ප්‍රමාණයකින් වර්ධනය කර ගැනීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හැකි විය.

කෙසේ වුවද, 2015 සිට 2019 කාල සීමාව තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි වෙළඳපොළ කොටස 2.81% කින් අඩු විය. 2018 වසරේ දී 54.50% ක් වූ දළ ලිඛිත වාරිකය කෙරෙහි මෙම සමාගම් තුනෙහි දායකත්වය 2019 දී මඳ වශයෙන් අඩු වූ අතර එය 53.37%ක් විය.

සොෆ්ට්ලොජික් ලයිෆ් සමාගම රු.මි. 12,531 ක් (2018:රු.මි. 10,006) උත්පාදනය කරමින් දළ ලිඛිත වාරිකයට අදාළව සිව් වන ස්ථානය ලබා ඇති අතර එහි වෙළඳකොටස 14.11%ක් (2018: 12.46%) විය. මෙය වසර ගණනාවක්

පුරාවට දළ ලිඛිත වාරිකය කෙරෙහි සිව්වන ස්ථානය ලෙස දායකත්වය දැක්වූ යුනියන් ලයිෆ් සමාගම ඉක්මවා යාමකි. යුනියන් ලයිෆ් සමාගම රු.මි. 11,648 (2018: රු.මි. 11,244) දළ ලිඛිත වාරිකයක් සහ 13.12% වෙළඳපළ කොටසක් (2018:14.00%) වාර්තා කර ඇත.


කර්මාන්තයේ වර්ධන අනුපාතය හා සැසඳීමේදී පසුගිය වසර පහ තුළ සොෆ්ට්ලොජික් ලයිෆ් සමාගම තම වෙළඳපළ කොටස දෙගුණ කර ගනිමින් 14.1% කට ළඟා වූ අතර සුවිශේෂ පාරිභෝගික අවශ්‍යතා සපුරාලමින් අදාළ කරන්නා ලද වෙළඳපළ උපායමාර්ග හේතුවෙන් වේගයෙන් වර්ධනය වන සමාගමක් ලෙස පෙනී යයි.

2017 ජූනි 28 දින සිට 2019 අප්‍රේල් 2 දින දක්වා කාල සීමාව තුළ අත්හිටවූ එම්බීඑස්එල් සමාගම හැර පසුගිය වසරට සාපේක්ෂව සියළු දිගුකාලීන රක්ෂණකරුවන් දළ ලිඛිත වාරිකයේ වර්ධනයක් වාර්තා කළේය. තවද, 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී 25% හා 15% වර්ධන අනුපාත වාර්තා කළ කෝප්ලයිෆ් හා එල්අයිසී වෙතින් කැපී පෙනෙන වර්ධනයක් දැකිය හැකි විය. තවද, 2018 වසරේ දී 34% හා 15% ලෙසින් වාර්තා වූ ආර්පිකෝ හා සණස ලයිෆ් සමාගම්හි දළ ලිඛිත වාරිකයේ වර්ධනය 2019 වසරේ දී 18% හා 1% ක් ලෙස වාර්තා වීමෙන් එහි පහත වැටීම පෙන්නුම් කෙරේ.

එක් එක් දිගුකාලීන රක්ෂණකරුවාගේ දළ ලිඛිත වාරිකයට අදාළ වෙළඳපළ කොටස 6 වන පරිච්ඡේදයෙන් දැක්වේ.

**6 ප්‍රස්තාරය**

**සමාගම් අනුව දළ ලිඛිත වාරිකය -2019 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**




**දළ ලිඛිත වාරිකය කෙරෙහි ඉහළම දායකත්වයක් සපයන රක්ෂණ ආයතන පහ සහ අනෙකුත් රක්ෂණකරුවන් - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**


2015 සිට 2019 දක්වා වූ කාල සීමාව තුළ වෙළඳපළ කොටස්වලට අදාළ ඉහළම දායකයන් පහ සහ අනෙකුත් රක්ෂණකරුවන්ගේ විස්තර 7 ප්‍රස්තාරය මගින් දැක්වේ.

දිගුකාලීන රක්ෂණ කර්මාන්තයේ දළ ලිඛිත වාරිකය දායකයන් පස් දෙනෙකු මත කේන්ද්‍රගතව ඇති අතර එය රු.මි. 71,566 (2018: රු.මි. 65,008) වන අතර මුළු දළ ලිඛිත වාරිකයෙන් 80.60% කි. ඉතිරි රක්ෂණකරුවන් 10 දෙනා සාමූහිකව රු.මි. 17,215 ක් (2018: රු.මි. 15,286) දරණ අතර එහි ප්‍රතිශතය 19.38% කි. සෙලින්කෝ ලයිෆ්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ඒඅයිඒ ලයිෆ්, සොෆ්ට්ලොජික් ලයිෆ් හා යුනියන් ලයිෆ් විසින් 2019 දී දිගුකාලීන රක්ෂණ වෙළඳපොළෙහි ඉහළම වෙළඳපල කොටස් පහ ළඟා කරගනු ලැබිය. සොෆ්ට්ලොජික් ලයිෆ් සමාගම 2018 දී ලබා ගත් පස් වන ස්ථානයේ සිට 2019 දී සිව් වන ස්ථානයට ළඟා වීමට සමත් විය.

පාරිභෝගිකයන් වෙත සේවාව සපයමින් වසර ගණනාවක් පුරාවට ඉහළ ම ස්ථානයේ රැඳී සිටීමට සෙලින්කෝ ලයිෆ් සමාගමට හැකි වී තිබේ. කෙසේ වුවද, පසුගිය වසර පහ තුළ සෙලින්කෝ ලයිෆ් සතු වෙළඳපොළ කොටසෙහි පහත බැසීමක් පෙන්නුම් කෙරිණ. 2019 දී වෙළඳපළ කොටස 0.24%ක් වැනි ඉතා සුළු ප්‍රමාණයකින් ඉහළ නැංවීමට දෙවන විශාලත ම දායකයා වන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හැකි විය. තෙවන හා පස් වන දායකයන් වන ඒඅයිඒ ලයිෆ් හා යුනියන් ලයිෆ් සමාගම්හි දළ ලිඛිත වාරිකය 2018ට සාපේක්ෂව 2019 දී මදක් අඩු වී ඇත. සිව් වන දායකයා වන සොෆ්ට්ලොජික් ලයිෆ් සමාගම වෙළඳපල කොටසින් 14.11% ක් හිමි කරගෙන ඇති අතර එමගින් පෙන්නුම් කෙරෙන්නේ පසුගිය වසර පහ පුරාවට ඔවුන්ගේ වෙළඳපළ කොටසෙහි අඛණ්ඩ වර්ධනයක් සිදුවී ඇති බවයි. කෙසේ වුවද, ඉතිරි රක්ෂණකරුවන්ගේ වෙළඳපොළ කොටස පහත 7 ප්‍රස්තාරයේ දක්වා ඇති ආකාරයට නොවෙනස්ව පැවතිණි. ඒ අනුව, පසුගිය වසර පහ තුළ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි වෙළඳපොළ කොටසින් 80% ක් පමණ ඉහළම රක්ෂණකරුවන් පස් දෙනෙකු අතර හුවමාරු විය.

**7 ප්‍රස්තාරය**

**2015 සිට 2019 දක්වා වූ කාල සීමාව සඳහා ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙකුත් රක්ෂණකරුවන්ගේ වෙළඳපල කොටස - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | සෙලින්කෝ ලයිෆ් | එස් එල් අයි සී | ඒ අයි ඒ ලයිෆ් | සොෆ්ට්ලොජික් ලයිෆ් | යුනියන් ලයිෆ් | වෙනත් |
|---|---|---|---|---|---|---|
| 2015 | 25.06 | 19.50 | 15.71 | 7.62 | 12.97 | 19.14 |
| 2016 | 23.67 | 18.74 | 15.92 | 8.88 | 13.03 | 19.76 |
| 2017 | 22.03 | 17.49 | 16.08 | 10.52 | 14.14 | 19.74 |
| 2018 (ඈ) | 22.18 | 16.45 | 15.87 | 12.46 | 14.00 | 19.04 |
| 2019 (ආ) | 21.08 | 16.69 | 15.60 | 14.11 | 13.12 | 19.39 |

**භාණ්ඩය අනුව දළ ලිඛිත වාරිකය, ප්‍රතිරක්ෂකයන් වෙත පවරන ලද වාරිකය හා රැඳවුම් අනුපාතය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

2019 දී දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි දළ ලිඛිත වාරිකය සහභාග ව්‍යාපාරයේ 24.08%ක් (2018: 25.61%), සහභාග නොවන ව්‍යාපාරයේ 36.52% (2018: 38.51%), 37.27% (2018: 33.32%) සර්වත්‍ර ආයුකාල හා 2.13% (2018: 2.57%) දිගුකාලීන බැඳි ව්‍යාපාරය (linked long term business) ආදියෙන් සමන්විත විය. මුළු සහභාග ව්‍යාපාර කළඹෙන් 47%ක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හිමි විය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, සෙලින්කෝ ජීවිත හා සොෆ්ට්ලොජික් ජීවිත සමාගම් විසින් 2019 වසරේ දී වාර්තා වූ මුළු සහභාග ව්‍යාපාරයෙන් 92%ක් සඳහා සාමූහික සහභාගීත්වය ලබා දෙන ලදී.

2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී දළ ලිඛිත වාරිකය කෙරෙහි සර්වත්‍ර ආයුකාල ව්‍යාපාරයේ දායකත්වය 3.95% කින් වර්ධනය වීම හේතුවෙන් දිගුකාලීන රක්ෂණකරුවන් සර්වත්‍ර ආයුකාල ව්‍යාපාරය වෙත යොමු වීමේ ප්‍රවණතාවක් ඇති විය. වසර ගණනාවක් පුරාවට දිගුකාලීන බැඳි නිපැයුම්වල දායකත්වය අඩු වී ඇති අතර 2019 දී ඒමගින් උත්පාදනය කරන ලද දළ ලිඛිත වාරිකය රු.මි. 1,892කි.

8 වගුවෙහි දක්වා ඇති පරිදි 2019 වසරේ ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙහි සමස්ථ රැඳවුම් අනුපාතය 95.84%ක් (2017:95.81%) විය. ප්‍රධාන වශයෙන් සහභාග නොවන ව්‍යාපාරය මගින් වාර්තා කරන ලද සමස්ථ ජීවිත රක්ෂණ ව්‍යාපාරයෙහි වාර්තා වූ ප්‍රතිරක්ෂකයන්හට ඉඩ දෙන ලද වාරිකයෙහි 10%ක ඉහළ යාමක් පෙන්නුම් කළ අතර එය වාර්තා වූ දළ ලිඛිත වාරිකයේ වර්ධනයට සමව පවතියි.

**8 වගුව**

**භාණ්ඩය අනුව දළ ලිඛිත වාරිකය, ප්‍රතිරක්ෂකයන් වෙත පවරන ලද වාරිකය හා රැඳවුම් අනුපාතය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| පන්තිය | 2017 | | | 2018 (ඈ) | | | 2019 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දළ ලිඛිත වාරිකය (රු. 000) | ප්‍රතිරක්ෂණකරුවන් වෙත පවරන ලද වාරිකය (රු. 000) | රැඳවා ගැනීමේ අනුපාතය (%) | දළ ලිඛිත වාරිකය (රු. 000) | ප්‍රතිරක්ෂණකරුවන් වෙත පවරන ලද වාරිකය (රු. 000) | රැඳවා ගැනීමේ අනුපාතය (%) | දළ ලිඛිත වාරිකය (රු. 000) | ප්‍රතිරක්ෂණකරුවන් වෙත පවරන ලද වාරිකය (රු. 000) | රැඳවා ගැනීමේ අනුපාතය (%) |
| සහභාගි | 19,187,271 | 148,134 | 99.23 | 20,560,064 | 152,573 | 99.26 | 21,380,056 | 151,684 | 99.29 |
| සහභාගි නොවන | 50,327,490 | 2,661,364 | 94.71 | 30,922,561 | 2,214,357 | 92.84 | 32,422,036 | 2,984,257 | 90.80 |
| සර්වත්‍ර ආයුකාල | | | | 26,751,609 | 900,185 | 96.64 | 33,087,161 | 473,569 | 98.57 |
| බැඳි දිගුකාලීන | 2,056,618 | 59,872 | 97.09 | 2,059,725 | 98,671 | 95.21 | 1,892,079 | 84,394 | 95.54 |
| **එකතුව** | **71,571,380** | **2,869,370** | **95.99** | **80,293,960** | **3,365,786** | **95.81** | **88,781,332** | **3,693,903** | **95.84** |

### දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්

9 වගුවෙහි දක්වා ඇති ආකාරයට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් ප්‍රමාණයට අදාළව 2018 දෙසැම්බර් 31 දිනට වාර්තා කළ රු.මි. 430,759ක එනම් 9.65% වර්ධනය ඉක්මවා යමින් 2019 දෙසැම්බර් 31 දිනට රු.මි. 485,723ක එනම් 12.76%ක් වන සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. මුළු වත්කමෙහි වර්ධනයට ප්‍රධාන හේතුව වී ඇත්තේ මූල්‍ය ආයෝජන ඉහළ යාමයි. තවද, 2019 ජනවාරි 1 දින සිට ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි 16 අදාළ කර ගැනීමෙන් රක්ෂණකරුවන්හට ශේෂ පත්‍රයෙහි අමතර භාවිතා කිරීමේ හිමිකම පිළිගැනීමට ඉඩ සැලසිණි.

දිගුකාලීන රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම්, සමාගම් දෙකක් (ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා සෙලින්කෝ ජීවිත) මත සංකේන්ද්‍රනය වී ඇති අතර එය මුළු දිගුකාලීන කර්මාන්ත වත්කමෙන් 56.3% ක් වේ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා සෙලින්කෝ ජීවිත මුළු වත්කම් අතුරින් 27.48%ක් දරණ අතර පිළිවෙලින් රු.මි. 141,097 හා රු.මි. 133,459 වේ. ඒඅයිඒ ලයිෆ් හා යූනියන් ලයිෆ් වෙළඳපළ තුළ 12.76% (රු.මි. 61,973) හා 11.37% (රු.මි. 55,249) වටිනා වත්කම් හිමි කරගෙන ඇති අතර පිළිවෙලින් තෙවන හා සිව්වන ස්ථාන හිමි කරගෙන ඇත. ඒ අනුව, මෙම සමාගම් හතර සාමූහිකව මුළු දිගුකාලීන රක්ෂණ වත්කම්වලින් 80.66%ක් හිමි කරගෙන ඇත.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම්වලට අදාළව පිළිවෙලින් පස් වන, හය වන හා හත් වන ස්ථාන ලබා ගැනීමට ජනශක්ති ලයිෆ්, එච්එන්බී ලයිෆ් හා සොෆ්ට්ලොජික් ලයිෆ් සමත් විය. 2019 වසර තුළ තම මුළු වත්කම් ප්‍රමාණය වැඩි කර ගැනීමට සියළු සමාගම් සමත් වූ අතර එම්බීඑස්එල්, එල්ඕඑල්සී ජීවිත, ආර්පිකෝ, කෝප්ලයිෆ් හා එලයන්ස් ලයිෆ් යන සමාගම් 2018ට සාපේක්ෂව20%ට වැඩි වර්ධනයක් පෙන්නුම් කළේය. 8 ප්‍රස්තාරය මගින් 2019 හා 2018 දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණයක් දැක්වේ.


**9 වගුව**

**සමාගම් අනුව මුළු වත්කම් පිළිබඳ විශ්ලේෂණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂණකරු | 2018 (අ) | | 2019 (ආ) | |
|---|---|---|---|---|
| | (රු '000) | % | (රු '000) | % |
| ඒඅයිඒ ලයිෆ් | 54,405,486 | 12.63 | 61,973,401 | 12.76 |
| එලයන්ස් ලයිෆ් | 5,256,584 | 1.22 | 6,314,300 | 1.30 |
| අමානා ලයිෆ් | 2,877,575 | 0.67 | 2,919,019 | 0.60 |
| ආර්පිකෝ | 2,996,478 | 0.70 | 3,719,090 | 0.77 |
| සෙලින්කෝ ලයිෆ් | 118,059,390 | 27.41 | 133,458,907 | 27.48 |
| කෝප්ලයිෆ් | 2,502,305 | 0.58 | 3,054,977 | 0.63 |
| එච්එන්බී ලයිෆ් | 18,678,274 | 4.34 | 22,152,378 | 4.56 |
| ජනශක්ති ලයිෆ් | 20,921,406 | 4.86 | 22,508,304 | 4.63 |
| එල්අයිසී | 2,766,230 | 0.64 | 3,110,665 | 0.64 |
| එල්ඕඑල්සී ලයිෆ් | 4,683,738 | 1.09 | 5,985,833 | 1.23 |
| එම්බීඑස්එල් | 850,132 | 0.20 | 1,287,877 | 0.16 |
| සණස ලයිෆ් | 1,893,220 | 0.44 | 2,209,112 | 0.45 |
| එස්එල්අයිසී | 128,418,012 | 29.81 | 141,097,026 | 29.05 |
| සොෆ්ට්ලොජික් | 17,332,967 | 4.02 | 20,682,874 | 4.26 |
| යූනියන් ලයිෆ් | 49,116,729 | 11.40 | 55,249,152 | 11.37 |
| **එකතුව** | **430,758,524** | **100** | **485,722,913** | **100** |

**8 ප්‍රස්තාරය**

**සමාගම් අනුව 2018 හා 2019 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් විශ්ලේෂණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**



### 2018 හා 2019 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

2018 දෙසැම්බර් 31 දිනට හා 2019 දෙසැම්බර් 31 දිනට විවිධ වත්කම් ඛාණ්ඩ අතර දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම් සංකේන්ද්‍රණය 10 වගුවෙන් හා 9 ප්‍රස්තරයෙන් දැක්වේ.

තමන් සිටින ස්ථානයේ ම රැදී සිටීමට හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූල වීම සඳහා පසුගිය වසරවලට සමානව ජීවිත රක්ෂණකරුවන් විසින් රජයේ ණය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම කෙරෙහි ප්‍රමුඛතාව ලබා දෙන ලදී. ඒ අනුව, රජයේ ණය සුරැකුම්පත්වල වටිනාකම රු.මි. 193,385ක් (2017: රුමි. 177,086) ලෙස පවත්වා ගිනිමින් මුළු වත්කම්වලින් 39.81%ක් නියෝජනයක් කළේය. කෙසේ වුවද 2018 වසර අවසාන වන විට පැවති 41.11%ට සාපේක්ෂව 2019 වසර අවසාන වන විට මුළු වත්කම්වල කොටසක් ලෙෂ රජයේ ණය සුරැකුම්පත්වලට අදාළ වත්කම් 39.81%ක් දක්වා මද වශයෙන් පහත වැටිණි.

තැන්පතු මත සිදු කෙරෙන ආයෝජන රු.මි. 76,097ක් (2018:රු.මි. 66,853) වූ අතර එය මුළු වත්කම්වලින් 15.67% ක් විය. පසුගිය වසර තුළ තැන්පතුවල වේගවත් වර්ධනයක් (63.13%) වාර්තා වුවද 2019 වසරේ දී වාර්තා වූයේ 13.83% ක් වැනි සුළු වැඩි වීමකි. ඊට හේතුව අප්‍රේල් මස එල්ල වූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් පොළී අනුපාත පහළ බැසීමයි. ස්කන්ධ ටකොටස් මත ආයෝජනය රු.මි. 35,865ක් (2018: රු.මි. 35,112) වූ අතර මුළු වත්කම් ප්‍රමාණයෙන් 7.38%ක් (2018: 8.15%) විය. එය 2018 වසරට සාපේක්ෂව 2.14% ක වර්ධනයක් වූ අතර ඊට ප්‍රධාන හේතුව වූයේ වසර පුරා ස්කන්ධ කොටස් වෙළඳපොළ තුළ මිළ දර්ශක ඉක්මනින් වෙනස් වීමයි.


දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම්වලින් 84.83%ක් (2018: 83.63%) ප්‍රාධාන ආයෝජන කාණ්ඩ වන රාජ්‍ය ණය සුරැකුම්පත්, සාංගමික ණය, තැන්පතු හා ස්කන්ධ කොටස් සාමූහිකව වාර්තා කළේය.

තවද අනෙක් වත්කම් 2019 දෙසැම්බර් 31 දිනට රු.මි. 41,230ක් වූ අතර මුළු වත්කම් කළඹින් 8.49%ක් නියෝජනය කළේය. මෙම කාණ්ඩය පසුගිය වසරට සාපේක්ෂව 2.86%ක ඉහළ යාමක් වාර්තා කළ අතර ප්‍රධාන වශයෙන් විලම්භිත ණය

**10 වගුව**
**2018 හා 2019 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| වත්කම් වර්ගය | 2018 (අ) | | 2019 (ආ) | |
|---|---|---|---|---|
| | (රු '000) | % | (රු '000) | % |
| රාජ්‍ය ණය සුරැකුම්පත් | 177,085,744 | 41.11 | 193,384,762 | 39.81 |
| ස්කන්ධයන් | 35,112,119 | 8.15 | 35,864,744 | 7.38 |
| සංස්ථා ණය | 81,180,677 | 18.85 | 106,694,774 | 21.97 |
| ඉඩම් හා ගොඩනැගිලි | 13,606,144 | 3.16 | 15,547,326 | 3.20 |
| තැන්පතු | 66,853,162 | 15.52 | 76,097,450 | 15.67 |
| ඒකක භාර | 6,884,886 | 1.60 | 5,584,810 | 1.15 |
| රක්ෂණ ඔප්පු ණය | 6,048,322 | 1.40 | 6,810,982 | 1.40 |
| වෙනත් වත්කම් | 40,084,935 | 9.31 | 41,229,509 | 8.49 |
| මුදල් හා මුදල් සමාන දෑ | 3,902,535 | 0.91 | 4,508,555 | 0.93 |
| **එකතුව** | **430,758,524** | **100** | **485,722,913** | **100** |

**9 ප්‍රස්තාරය**
**2018 හා 2019 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රණය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**




වත්කම්, දේපළ පිරියත හා උපකරණ, ලැබිය යුතු වාරික, අස්පෘෂ්‍ය වත්කම් ආදියෙන් සමන්විත වේ.

ඒකක භාරවල පහළ බැසීමට ප්‍රධාන හේතුව වූයේ 2019 වසර තුළ එක් දිගුකාලීන රක්ෂකයෙකු විසින් ඒකක විශාල ප්‍රමාණයක් විකිණීමයි.

**ආයෝජන ආදායම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

වසර පුරාවට පොළී අනුපාතයන් පහත වැටීම හා සමකොටස් වෙළඳපළ වෙනස් වීම හේතුවෙන් ඇති වූ ආර්ථික පසුබෑම අභිබවා සමස්ථ ආයෝජන ආදායම 2018 වාර්තා වූ රු.මි. 36,817 ට සාපේක්ෂව රු.මි. 43,538ක් එනම් 18.26% (2018: 7.71%)ක වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් බැංකු තැන්පතු, ස්කන්ධ කොටස් හා රජයේ භාණ්ඩාගාර බැඳුම්කර හේතුවෙන් සිදු විය. තවද, රාජ්‍ය ණය සුරැකුම් පත්, සාංගමික ණයකර හා බැංකු තැන්පතුවල එකතුව මුළු ආයෝජන ආදායමින් 95.38%ක් විය. 2019 දී දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ ආයෝජන සාමාන්‍යය රු.මි. 407,738ට (2018: රු.මි. 367,586) ළඟා වූ අතර එය 10.92% ක වර්ධනයකි.

2019 දී රාජ්‍ය ණය සුරැකුම්පත්වල සිදු කළ ආයෝජන සාමාන්‍යය මුළු ආයෝජන සාමාන්‍යය වූ රු.මි. 185,235 න් (2018: රු.මි. 180,218) විශාලතම කොටස නියෝජනය කළ අතර උත්පාදනය කළ ආයෝජන ඵලය 10.77%ක් (2018: 10.58%) විය. එය 2018 වසරට සාපේක්ෂව ආයෝජන ඉපයීමෙහි වැඩි වීමකි. ආයෝජන කළඹෙහි කැපී පෙනෙන කොටසක් නියෝජනය කළ සාංගමික ණයකර මගින් රු.මි. 10,461ක (2018: රු.මි. 9,525) ආයෝජන ආදායමක් උත්පාදනය කෙරුණු අතර එය පසුගිය වසරට සාපේක්ෂව 9.83%ක වැඩි වීමකි. කෙසේ වුවද, 2018 දී වාර්තා වූ සාංගමික ණයකරවල ආයෝජන ඉපයීම 12.36%ක් වූ අතර ඊට සාපේක්ෂව 2019 දී එය 11.14% දක්වා පහත වැටිණි.

බැංකු හා මූල්‍ය සමාගම්වල තැන්පතු මගින් රු.මි. 9,717ක (2018: රු.මි. 6,521) ආයෝජන ආදායමක් උත්පාදනය කරන ලදී. 2018 දී තැන්පතුවලට අදාළ සාමාන්‍ය ආයෝජනවලින් ඉපයූ පොළී ආදායමෙන් උත්පාදනය වූ 12.09%ක ආයෝජන ඉපයීමට සාපේක්ෂව 2019 දී එය 13.59% ක් විය. ඒ අනුව, වැඩිම ආයෝජන ඉපයීම් අනුපාතය වාර්තා වූයේ 2019 මූල්‍ය ආයෝජනවල තැන්පතු මගින් වාර්තා විය.

2019 දී මුළු ස්කන්ධ ප්‍රමාණයෙන් උත්පාදනය කෙරුණු ආයෝජන ආදායම රු.මි. 2,651ක් (2018: රු.මි. 1,271) වූ අතර එමගින් 8.88%ක (2018: 4.09%) ආයෝජන ඉපයීමක් පෙන්නුම් කෙරිණි. ස්කන්ධ කොටස්වල ආයෝජන ආදායමෙහි ඉහළ යාම ප්‍රධාන වශයෙන් 2019 දී රු.මි. 1,515ක ප්‍රාග්ධන ඉපැයීම් හේතුවෙන් සිදු වූ අතර එයට කලින් වසරේ වාර්තා වූ රු.මි. 26ට සාපේක්ෂව උපලබ්ධි වූ ලාභය ඇතුළත්වේ.

ඒකක භාර හා රක්ෂණ ඔප්පු ණය 2019 දී සාපේක්ෂව සාමාන්‍ය ආයෝජන ආදායමක් උත්පාදනය කළ අතර ඒවාට අදාළ ආයෝජන ඉපයීම් අනුපාතය පිළිවෙලින් 5.71% (2018: 3.39%) හා 5.01% (2018: 2.00%) විය.

2019 වසරේ සමස්ථ ආයෝජන ඉපයීම 2018 වසරේ 10.02%ට සාපේක්ෂව 10.68% ක් විය.

**II වගුව**
**ආයෝජන ආදායම හා ආයෝජන සාමාන්‍යය වෙන් කර දැක්වීම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| කාණ්ඩය | 2018 (අ) | | | 2019 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජන ආදායම (රු. 000) | ආයෝජන සාමාන්‍යය (රු. 000) | ආයෝජන ඉපයීම් අනුපාතය (%) | ආයෝජන ආදායම (රු. 000) | ආයෝජන සාමාන්‍යය (රු. 000) | ආයෝජන ඉපයීම් අනුපාතය (%) |
| රාජ්‍ය ණය සුරැකුම්පත් | 19,071,108 | 180,217,863 | 10.58 | 19,949,101 | 185,235,253 | 10.77 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 17,323,247 | - | - | 18,756,653 | - | - |
| - භාණ්ඩාගාර බිල්පත් | 296,376 | - | - | 208,077 | - | - |
| - වෙනත් (රෙපෝ) | 1,451,485 | - | - | 984,370 | - | - |
| ස්කන්ධ | 1,271,035 | 31,042,874 | 4.09 | 2,651,114 | 29,848,261 | 8.88 |
| - ප්‍රාග්ධන ලාභ/ අලාභ | 26,459 | - | - | 1,514,819 | - | - |
| - ලාභාංශ | 1,244,576 | - | - | 1,136,295 | - | - |
| සාංගමික ණය | 9,524,794 | 77,060,034 | 12.36 | 10,460,658 | 93,937,725 | 11.14 |
| - ණයකර | 9,433,711 | - | - | 10,288,882 | - | - |
| - වාණිජ පත්‍රිකා | 91,083 | - | - | 157,358 | - | - |
| වත්කම් මත පදනම් ඇපකර සහිත සුරැකුම්පත් | - | - | - | - | - | - |
| - වෙනත් සමාන මූල්‍ය උපකරණ | - | - | - | 14,418 | - | - |
| ඉඩම් හා ගොඩනැගිලි | 73,859 | 12,341,897 | 0.60 | 82,742 | 14,576,735 | 0.57 |
| තැන්පතු | 6,520,896 | 53,950,925 | 12.09 | 9,716,917 | 71,475,306 | 13.59 |
| - බැංකු | 5,975,784 | - | - | 9,009,462 | - | - |
| - මූල්‍ය සමාගම් | 545,112 | - | - | 707,455 | - | - |
| ඒකක භාර | 233,578 | 6,883,088 | 3.39 | 355,937 | 6,234,848 | 5.71 |
| ඔප්පු ණය | 121,875 | 6,089,456 | 2.00 | 321,937 | 6,429,652 | 5.01 |
| වෙනත් | 610,768 | 1,151,807 | - | (88,103) | 1,762,070 | - |
| එකතුව | **36,817,146** | **367,586,137** | **10.02** | **43,538,406** | **407,737,781** | **10.68** |

**සටහන:**
"වෙනත්" කාණ්ඩය යටතේ වාර්තා කරන ආයෝජන ආදායම මගින් ඊට අදාළ සියළු වත්කම් සම්පූර්ණයෙන් නියෝජනය කරනු නොලැබේ. මන්ද යත්, භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් මත අය කෙරෙන රඳවා ගැනීමේ බද්ද සඳහා වන ජාතික බදු ආදායම, කාර්ය මණ්ඩල ණය පොළිය, ඉතිරිකිරීම් ගිණුමේ පොළිය ආදිය මෙයට ඇතුළත් වන බැවිණි. ඒ අනුව, "වෙනත්" කාණ්ඩය නියෝජනය කරන සංඛ්‍යා මුළු ප්‍රමාණයෙන් ඉවත් කළ අතර ඒ සඳහා "ආයෝජන ආදායම" ගණනය කර නැත.

**රක්ෂණ සමාගම්හි නුබුන්වතභාවය - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීතිවලට අනුව රක්ෂණකරුවන් ප්‍රාග්ධන ප්‍රමාණ්‍යය ඇගයීම සඳහා අවදානම් කෙරෙහි අවධානය යොමු කෙරෙන ප්‍රවේශයක් භාවිතා කරන්නේද යන්න ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අඛණ්ඩව අධීක්ෂණය කරන අතර රක්ෂණ ඔප්පු හිමිකරුවාගේ හා රක්ෂකයාගේ ආරක්ෂාව ඉහළ නංවා ඔවුන් යෝග්‍ය ආකාරයට කටයුතු කරන බවට වග බලා ගැනීම යන අරමුණ සහිතව අදාළ අවදානම පිළිඹිබු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. නියමිත අවස්ථාවේ යෝග්‍ය නියාමන සහ අධීක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම තුළින් වසර තුළ කිසිඳු ප්‍රධාන ගැටළුවක් ඇති නොකර කර්මාන්තයෙහි සමස්ථ ස්ථාවර බව තහවුරු කෙරිණි.

අවදානම් පාදක ප්‍රාග්ධන රීති යටතේ ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අවශ්‍යතාවලට අනුකූල වීම පිණිස රක්ෂණකරුවන් විසින් අවම මුළු ප්‍රාග්ධනය රු.මි. 500ක් සහ ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතය 120%ක් ලෙස පවත්වා ගත යුතුය. 12, 13 හා 14 වගු මගින් 2018 හා 2019 වසර සඳහා දිගුකාලීන රක්ෂකයන්ගේ අවදානම් පාදක ප්‍රාග්ධන විස්තර දැක්වේ.

2019 වසර සඳහා වාර්තා වූ දිගුකාලීන රක්ෂකයන්ගේ ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතයේ සාමාන්‍යය හා මුළු ප්‍රාග්ධන ප්‍රමාණය පිළිවෙලින් 298% ක් (2018: 304%) සහ රු.මි. 220,371ක් (2018: රු.මි. 197,574) විය. සියළු දිගුකාලීන රක්ෂණ සමාගම් 2019 දෙසැම්බර් 31 දිනට අවම ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාත අවශ්‍යතාව සපුරා තිබූ අතර එක් රක්ෂණකරුවෙක් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් නියම කරන ලද වලංගු මට්ටම වන 160% ට අඩු ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතයක් වාර්තා කර තිබිණි. එක් රක්ෂණකරුවෙකු හැර සියළු ම දිගුකාලීන රක්ෂණකරුවන් 2019 දෙසැම්බර් 31 දිනට රු.මි. 500ක අවම මුළු ප්‍රාග්ධන ප්‍රමාණයට අනුකූල විය. ඒ අනුව, 2015 නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීති ප්‍රකාරව ඊට අනුකූල නොවූ රක්ෂණකරුවාට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලදී.

තවද, සියළු ම ජීවිත රක්ෂණ ගිවිසුම් එක වර පවාරණය කළහොත් ඇති විය හැකි අහිතකර තත්වය පිළිඹිබු කරන පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තුව (SVCC) 2019 දෙසැම්බර් 31 දිනට රු.මි. 3,853ක් වූ අතර එය 2018 වසරට සාපේක්ෂව කැපී පෙනෙන අන්දමින් පහළ බැසීමකි.

**12 වගුව**

**සමාගම් අනුව නුබුන්වත්භාවය පිළිබඳ විශ්ලේෂණය - 2018 හා 2019 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2018 දෙසැම්බර් 31 දිනට (අ) | | | | 2019 දෙසැම්බර් 31 දිනට (ආ) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු. 000) | නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු. 000) | පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තු (රු. 000) | ප්‍රාමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%) | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු. 000) | නියමිත අවදානම් ප්‍රාග්ධනය (රු. 000) | පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තු (රු. 000) | ප්‍රාමාණවත් ප්‍රාග්ධන අනුපාතය (%) |
| ඒඅයිඒ ලයිෆ් | 19,221,556 | 2,934,346 | 974,079 | 655 | 23,479,150 | 3,674,691 | 121,861 | 639 |
| එලයන්ස් ලයිෆ් | 1,209,377 | 297,583 | 98,240 | 406 | 1,447,524 | 223,007 | 471,435 | 307 |
| අමානා ලයිෆ් | 493,210 | 282,745 | 174 | 508,242 | 267,470 | - | - | 190 |
| ආර්පිකෝ | 1,618,804 | 413,912 | 406,492 | 391 | 1,802,462 | 485,405 | 349,870 | 371 |
| සෙලින්කෝ ලයිෆ් | 53,860,075 | 14,813,327 | 8,129 | 364 | 61,948,169 | 17,865,001 | 10,631 | 347 |
| කෝප්ලයිෆ් | 773,800 | 321,092 | 241 | 885,437 | 469,593 | 189 | - | - |
| එච්එන්බී ලයිෆ් | 6,636,693 | 2,082,131 | 451,835 | 319 | 7,921,589 | 2,461,800 | 416,272 | 322 |
| ජනශක්ති ලයිෆ් | 9,841,633 | 2,923,139 | 728,421 | 337 | 9,376,364 | 3,125,593 | 119,593 | 300 |
| එල්අයිසී | 476,371 | 248,126 | - | 192 | 395,312 | 275,015 | - | 144 |
| එල්ඕඑල්සී ලයිෆ් | 634,156 | 455,978 | - | 139 | 1,280,311 | 588,513 | - | 218 |
| එම්බීඑස්එල් | 141,348 | 57,775 | - | 245 | 548,464 | 199,502 | - | 275 |
| සණස ලයිෆ් | 577,288 | 282,015 | 2,953 | 205 | 711,479 | 390,784 | 19,312 | 182 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 79,905,443 | 18,286,644 | 1,325,178 | 437 | 83,505,746 | 19,148,373 | 1,046,379 | 436 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 7,828,045 | 3,935,366 | 1,450,442 | 199 | 8,151,141 | 4,489,448 | 1,041,915 | 182 |
| යූනියන් ලයිෆ් | 14,356,049 | 5,495,622 | 164,406 | 261 | 18,409,499 | 5,002,806 | 255,663 | 368 |
| **එකතුව/මුළු එකතුව** | **197,573,848** | **52,829,802** | **5,610,175** | **304** | **220,370,890** | **58,667,000** | **3,852,929** | **298** |

**සටහන:**

2019 වසර සඳහා වාර්තා කළ සංඛ්‍යාවන් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ වාර්ෂික ආදායම් වාර්තාවෙන් ලබා ගන්නා ලද අතර එම්බිඑස්එල් සඳහා පමණක් වාර්ෂික වාර්තාවට ඉදිරිපත් කළ සංඛ්‍යාවන් යොදා ගන්නා ලදී.

**රක්ෂණ සමාගම්හි පවත්නා මුළු ප්‍රාග්ධන අවශ්‍යතාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

2019 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණකරුවන්ගේ මුළු ප්‍රාග්ධන ප්‍රමාණය රු.මි. 220,371 (2018: රු.මි. 197,574) දක්වා ඉහළ ගිය අතර පසුගිය වසරට සාපේක්ෂව 11.54%ක වර්ධනයක් පෙන්නුම් කළේය. නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීතිවලට අනුව මුළු ප්‍රාග ්ධනය ගණනය කරනු ලැබුවේ "පළමුවන ස්ථරයේ" හා " දෙවන ස්ථරයේ" ප්‍රාග්ධනය එකතු කර "අඩු කිරීම්" ලෙස දක්වා ඇති අයිතම අඩු කිරීමෙනි. 2019 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන රක්ෂණකරුවන්ට අදාළ මුළු ප්‍රාග්ධන සැකැස්ම 13 වගුවෙන් දැක්වේ. සෙලින්කෝ ලයිෆ් වෙතින් මුළු ප්‍රාග්ධනයෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණු අතර එය ප්‍රධාන වශයෙන් සිදු වූයේ ගලපන ලද රඳවා ගත් ඉපැයුම් මත පදනම් වූ පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනය මගින්ය. එසේම 2019 දී තක්සේරු අතිරික්තය සහ වර්ධනය රු.මි. 8,088 ක් විය. තවද, මූලිකව පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනයෙන් ඇති වූ මුළු ප්‍රාග්ධනයෙහි කැපී පෙනෙන වර්ධනයන් ඒඅයිඒ ලයිෆ්, යුනියන් ලයිෆ් හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් වාර්තා කරන ලදී. පසුගිය වසරට සාපේක්ෂව 2019 දී සියළුම දිගුකාලීන රක්ෂණකරුවන් මුළු ප්‍රාග්ධනයෙහි වර්ධනයක් වාර්තා කළ අතර ජනශක්ති ලයිෆ් හා එල්අයිසී පමණක් පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනයෙහි අඩු වීමක් වාර්තා කෙරිණි.

කොටස් ප්‍රාග්ධනය, රඳවා ගත් ඉපැයුම්, රඳවා ගත් ඉපැයුම්වලට සිදු කළ ඕනෑම ගැලපුමක්, වෙන් නොකළ තක්සේරු අතිරික්තය හා සහභාග ව්‍යාපාර සඳහා වන පුරෝකථනය කළ ප්‍රසාද දීමනා අතරින් 50% යනාදියෙන් සමන්විත පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනය අලාභයන් ආවරණය කිරීම සඳහා පූර්ණ වශයෙන් පවතින ස්ථාවර ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ. 2018 දෙසැම්බර් 31 දිනට පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනය වූ රු.මි. 212,586ට සාපේක්ෂව 2019 දෙසැම්බර් 31 දිනට පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනය රු.මි. 234,867 වූ අතර එය 10.48%ක වර්ධනයකි.

උසස් තත්වයේ ප්‍රාග්ධනයෙහි ඇතැම් ලක්ෂණ නොතිබූ 2 වන ස්ථරය, නිදහස් කළ නොහැකි සමුච්ජිත වරණීය කොටස්, නිදහස් කළ හැකි වරණීය කොටස් ආදියෙන් සමන්විත වූ පළමු වන ස්ථරයට සමාන්තර වූ අතර 2018 වසරට සාපේක්ෂව 1.70%න් වර්ධනය විය. අඩු කිරීම් ප්‍රධාන වශයෙ-න් අස්පෘශ්‍ය හෝ ද්‍රවශීලතාවයෙන් අඩු වත්කම්වලින් සමන්විත වූ අතර ඒවායෙහි වටිනාකම රු.මි. 33,728ක් (2018: රු.මි. 33,923) විය. එය පසුගිය වසරට බොහෝ දුරට සමාන විය.

**13 වගුව**

**රක්ෂණ සමාගම්වල පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2018 දෙසැම්බර් 31 දිනට (අ) (රු. 000) | 2019 දෙසැම්බර් 31 දිනට (ආ) (රු. 000) | | | |
|---|---|---|---|---|---|
| | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු. 000) | දෙවන ස්ථරය (රු. 000) | දෙවන ස්ථරය (රු. 000) | අඩු කිරීම් (රු. 000) | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (රු. 000) |
| ඒඅයිඒ ලයිෆ් | 19,221,556 | 21,454,885 | 6,273,764 | 4,249,499 | 23,479,150 |
| එලයන්ස් ලයිෆ් | 1,209,377 | 2,144,362 | 696,838 | 1,447,524 | - |
| අමානා ලයිෆ් | 493,210 | 475,917 | 88,127 | 55,801 | 508,242 |
| ආර්පිකෝ | 1,618,804 | 2,283,238 | 480,776 | 1,802,462 | - |
| සෙලින්කෝ ලයිෆ් | 53,860,075 | 68,914,794 | 3,753,287 | 10,719,912 | 61,948,169 |
| කූෆ්ලයිෆ් | 773,800 | 1,050,665 | 99,888 | 265,115 | 885,437 |
| එච්එන්බී ලයිෆ් | 6,636,693 | 10,589,626 | 381,156 | 3,049,192 | 7,921,589 |
| ජනශක්ති ලයිෆ් | 9,841,633 | 9,715,399 | 1,795,829 | 2,134,864 | 9,376,364 |
| එල්අයිසී | 476,371 | 398,314 | 61,899 | 64,901 | 395,312 |
| එල්ඕඑල්සී ලයිෆ් | 634,156 | 1,291,704 | 256,134 | 267,527 | 1,280,311 |
| එම්බීඑස්එල් | 141,348 | 769,573 | 221,109 | 548,464 | - |
| සණස ලයිෆ් | 577,288 | 1,253,400 | 4,060 | 545,981 | 711,479 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 79,905,443 | 85,681,871 | 155,614 | 2,331,739 | 83,505,746 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 7,828,045 | 10,418,385 | 890,713 | 3,157,957 | 8,151,141 |
| යුනියන් ලයිෆ් | 14,356,049 | 18,424,468 | 5,471,340 | 5,486,309 | 18,409,499 |
| **එකතුව** | **197,573,848** | **234,866,600** | **19,231,811** | **33,727,521** | **220,370,890** |

**සටහන:**

2019 වසර සඳහා වාර්තා කළ සංඛ්‍යාවන් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ වාර්ෂික ආදායම් වාර්තාවෙන් ලබා ගන්නා ලද අතර එම්බීඑස්එල් සඳහා පමණක් වාර්ෂික වාර්තාවට ඉදිරිපත් කළ සංඛ්‍යාවන් යොදා ගන්නා ලදී.

### රක්ෂණ සමාගම් අනුව නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR) සැසඳීම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

අවදානම් පාදක ප්‍රාග්ධන රීතිය යටතේ ගණනය කළ ප්‍රධාන අවදානම් කාණ්ඩවලින් සමන්විත නියමිත අවදානම් ප්‍රාග්ධනයෙහි (RCR) සමාගම් අනුව විශ්ලේෂණය 14 වගුවෙන් පෙන්නුම් කෙරේ. එය 2018 හා 2019 දෙසැම්බර් 31 දිනට ණය අවදානම, සංකේන්ද්‍රණ අවදානම, වෙළඳපළ අවදානම, ප්‍රතිරක්ෂණ අවදානම, වගකීම් අවදානම හා මෙහෙයුම් අවදානම ආදියෙන් සමන්විතවේ.

මුළු අවදානම් ප්‍රාග්ධන ගාස්තු විවිධාංගීකරණයෙන් පසුව 2019 වසරේදී සාමාන්‍ය වේගයකින් වර්ධනය වූ අතර 2018 වසරට සාපේක්ෂව රු.මි. 58,667ක් එනම් 11.05%කින් ඉහළ ගියේය. විවිධාංගීකරණයට පෙර 2019 දී එය රු.මි. 76,581ක් විය. පසුගිය වසරවල මෙන්ම 2019 දී ද දිගුකාලීන රක්ෂණකරුවන් මුහුණ දුන් ප්‍රධාන අවදානම වෙළඳපළ අවදානම වූ අතර විවිධාංගීකරණයට පෙර එය මුළු අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාවයෙන් 54.65%ක් සහ රු.මි. 41,848ක් විය. විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාවයෙන් 23.29%ක් හා 8.97%ක් වූයේ පිළිවෙලින් වගකීම් අවදානම හා සංකේන්ද්‍රණ අවදානමයි. ඒ අනුව, මෙම අවදානම් කාණ්ඩ තුන විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන ගාස්තුවලින් 86.91%ක් නියෝජනය කළේය.

**14 වගුව**

**2018 හා 2019 දෙසැම්බර් 31දිනට සමාගම් අනුව නියමිත අවදානම් ප්‍රාග්ධනය පිළිබඳ විශ්ලේෂණය- දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2018 දෙසැම්බර් 31 දිනට (අ) (රු. 000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම | සංකේන්ද්‍රණ අවදානම | වෙළඳපළ අවදානම | ප්‍රතිරක්ෂණ අවදානම | වගකීම් අවදානම | මෙහෙයුම් අවදානම | විවිධාංගීකරණයට පෙර නියමිත අවදානම් ප්‍රාග්ධන අයකරීම් | විවිධාංගීකරණයට පසු නියමිත අවදානම් ප්‍රාග්ධන අයකරීම් |
| ඒඅයිඒ ලයිෆ් | 420,637 | 574,443 | 1,007,142 | - | 2,074,536 | 545,703 | 4,622,461 | 2,934,346 |
| එලයන්ස් ලයිෆ් | 2,375 | 5,900 | 216,028 | 791 | 189,745 | 43,419 | 458,258 | 297,583 |
| අමානා ලයිෆ් | 18,882 | 153,823 | 104,693 | 512 | 43,188 | 29,076 | 350,175 | 282,745 |
| ආර්පිකෝ | 33,831 | 121,978 | 135,120 | 264 | 292,926 | 26,911 | 611,030 | 413,912 |
| සෙලින්කෝ ලයිෆ් | 1,426,249 | 733,458 | 12,362,089 | 4,393 | 2,659,740 | 1,162,007 | 18,347,936 | 14,813,327 |
| කෝප්ලයිෆ් | 53,770 | 41,319 | 193,484 | - | 138,573 | 24,960 | 452,107 | 321,092 |
| එච්එන්බී ලයිෆ් | 239,892 | 405,478 | 1,352,803 | 2,235 | 547,326 | 184,588 | 2,732,322 | 2,082,131 |
| ජනශක්ති ලයිෆ් | 247,969 | 66,591 | 2,468,861 | 2,397 | 863,013 | 197,909 | 3,846,741 | 2,923,139 |
| එල්අයිසී | 27,673 | 67,415 | 143,172 | 117 | 63,359 | 26,978 | 328,715 | 248,126 |
| එල්ඕඑල්සී ලයිෆ් | 15,260 | 26,772 | 202,240 | - | 382,183 | 46,723 | 673,179 | 455,978 |
| එම්බීඑස්එල් | 2,342 | 4,692 | 43,589 | - | 26,513 | 8,505 | 85,641 | 57,775 |
| සණස ලයිෆ් | 25,283 | 164,414 | 88,412 | 341 | 40,565 | 18,776 | 337,791 | 282,015 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1,264,435 | 2,382,087 | 14,045,424 | - | 4,449,082 | 1,265,728 | 23,406,756 | 18,286,644 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 167,517 | 608,112 | 1,990,814 | - | 2,793,684 | 170,954 | 5,731,081 | 3,935,366 |
| යූනියන් ලයිෆ් | 218,989 | 603,863 | 4,542,621 | - | 1,089,026 | 477,063 | 6,931,561 | 5,495,622 |
| **එකතුව** | **4,165,104** | **5,960,347** | **38,896,493** | **11,050** | **15,653,460** | **4,229,299** | **68,915,755** | **52,829,802** |

| රක්ෂකයා | 2019 දෙසැම්බර් 31 දිනට (ආ) (රු. 000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම | සංකේන්ද්‍රණ අවදානම | වෙළඳපළ අවදානම | ප්‍රතිරක්ෂණ අවදානම | වගකීම් අවදානම | මෙහෙයුම් අවදානම | විවිධාංගීකරණයට පෙර නියමිත අවදානම් ප්‍රාග්ධන අයකරීම් | විවිධාංගීකරණයට පසු නියමිත අවදානම් ප්‍රාග්ධන අයකරීම් |
| ඒඅයිඒ ලයිෆ් | 470,921 | 677,436 | 1,394,906 | - | 2,580,737 | 612,344 | 5,736,344 | 3,674,691 |
| එලයන්ස් ලයිෆ් | 2,563 | 5,057 | 104,964 | 1,105 | 184,830 | 51,426 | 349,945 | 223,007 |
| අමානා ලයිෆ් | 20,138 | 148,814 | 95,430 | 449 | 23,613 | 29,118 | 317,560 | 267,470 |
| ආර්පිකෝ | 41,291 | 141,501 | 194,599 | 211 | 303,031 | 34,744 | 715,377 | 485,405 |
| සෙලින්කෝ ලයිෆ් | 1,563,802 | 1,051,504 | 14,986,895 | 4,878 | 2,708,943 | 1,345,605 | 21,661,627 | 17,865,001 |
| කෝප්ලයිෆ් | 87,808 | 13,345 | 331,666 | - | 179,742 | 29,625 | 642,187 | 469,593 |
| එච්එන්බී ලයිෆ් | 336,655 | 356,165 | 1,662,346 | 1,617 | 677,346 | 217,332 | 3,251,461 | 2,461,800 |
| ජනශක්ති ලයිෆ් | 355,358 | 131,977 | 2,535,244 | 2,433 | 757,422 | 211,997 | 3,994,432 | 3,125,593 |
| එල්අයිසී | 38,898 | 40,181 | 183,824 | 27 | 74,306 | 31,308 | 368,543 | 275,015 |
| එල්ඕඑල්සී ලයිෆ් | 21,935 | 63,311 | 259,741 | 5,399 | 469,213 | 58,451 | 878,049 | 588,513 |
| එම්බීඑස්එල් | 5,786 | 151,119 | 40,484 | 37 | 25,653 | 12,878 | 235,957 | 199,502 |
| සණස ලයිෆ් | 24,066 | 268,721 | 94,441 | 220 | 46,149 | 21,596 | 455,192 | 390,784 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1,604,482 | 2,340,302 | 14,480,502 | - | 5,011,022 | 1,434,825 | 24,871,132 | 19,148,373 |
| සොෆ්ට්ලොජික් ලයිෆ් | 202,984 | 847,336 | 1,688,459 | - | 3,551,671 | 199,656 | 6,490,106 | 4,489,448 |
| යූනියන් ලයිෆ් | 385,195 | 633,902 | 3,794,651 | 158 | 1,243,261 | 555,585 | 6,612,752 | 5,002,806 |
| **එකතුව** | **5,161,880** | **6,870,671** | **41,848,153** | **16,534** | **17,836,939** | **4,846,489** | **76,580,665** | **58,667,000** |

**සටහන:**

2019 වසර සඳහා වාර්තා කළ සංඛ්‍යාවන් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ වාර්ෂික ආදායම් වාර්තාවෙන් ලබා ගන්නා ලද අතර එම්බීඑස්එල් සඳහා පමණක් වාර්ෂික වාර්තාවට ඉදිරිපත් කළ සංඛ්‍යාවන් යොදා ගන්නා ලදී.


### නිකුත් කරන ලද හා බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

2019 වසර අවසානය වන විට බලාත්මකව පැවති මුළු දිගුකාලීන රක්ෂණ ඔප්පු ප්‍රමාණය 3,402,663ක් වූ අතර එය 2018 වසර අවසානයේ දී බලාත්මකව පැවති 3,199,354ක් වූ රක්ෂණ ඔප්පු සංඛ්‍යාවට සාපේක්ෂව 6.35%ක ඉහළ යාමකි. මෙරට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය 2019 වසර තුළ තවදුරටත් පුළුල් වූ අතර නව රක්ෂණ ඔප්පු 736,961ක් නිකුත් කරන ලදී. එය 10 ප්‍රස්තාරයේ දක්වා ඇති ආකාරයට 2018 දී නිකුත් කරන ලද 711,126ක් වූ නව රක්ෂණ ඔප්පු සංඛ්‍යාවට සාපේක්ෂව 3.63%ක වැඩි වීමකි.

බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස 15.61% ක අගයක් වාර්තා කල අතර එය 2018 වර්ෂයේ වාර්තා වූ 14.76% ට වඩා වර්ධනයක් පෙන්නුම් කරන ලදී. එමෙන්ම මුළු ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස ගත්කල බලාත්මකව පවි.න ජීවිත රක්ෂණ ඔපුපු සංඛ්‍යාව තවදුරටත් වර්ධනයක් පෙන්නුම් කරමින් 2019 වසර අවසානය වන විට 41.59% අගයක් වාර්තා කරන ලදී.

සමස්ථයක් ලෙස ගත් කල මෙම ප්‍රවණතාව මගින් මෙරට දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ ඉදිරි ගමන් මග සහ අඩු රක්ෂණ ව්‍යාප්තියක් සහිත වෙළඳපල තව දුරටත් පුළුල් කිරීමේ හැකියාව පෙන්නුම් කරනු ලබයි.

### 10 ප්‍රස්තාරය
### නිකුත් කරන ලද හා බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය




| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ▬ | නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 740,511 | 668,714 | 643,483 | 711,126 | 736,961 |
| —×— | බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | 2,889,763 | 3,009,427 | 3,068,866 | 3,199,354 | 3,402,663 |
| ▬ | බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස* | 13.77 | 14.19 | 14.31 | 14.76 | 15.61 |
| —▲— | බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ශ්‍රම බලකායෙහි ප්‍රතිශතයක් ලෙස* | 33.56 | 37.86 | 37.39 | 39.55 | 41.59 |

* මූලාශ්‍රය: මධ්‍ය වාර්ෂික ශ්‍රම බලකාය හා ජනගහනය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ මහ බැංකුව

### නිපැයුම් අනුව බලාත්මකව පවතින ඔප්පු හා රක්ෂිත මුදල - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

15 වගුව මගින් 2018 හා 2019 වසර සඳහා වන නිපැයුම් වර්ගය මත පදනම්ව බලාත්මකව පවතින ඔප්පු සංඛ්‍යාව සහ රක්ෂිත මුදල පිළිබඳ විස්තර දැක්වේ. ප්‍රධාන වශයෙන් උත්පාදන රක්ෂණය, යුනිවර්සල් ජීවිත රක්ෂණය, කාලීන යාවජීව රක්ෂණ සහ සෞඛ්‍ය සැලසුම්, සබැදි ඒකක (unit linked) හා කණ්ඩායම් ජීවිත රක්ෂණය (group life) ඇතුළත් 'වෙනත්' ලෙස ජීවිත රක්ෂණය කාණ්ඩගත කෙරිණි. 2019 දී මුළු රක්ෂිත මුදල රු.මි. 3,849,146ක් වූ අතර එය 2018 දී වාර්තා වූ රු.මි. 3,055,587 සාපේක්ෂව 25.97%ක වර්ධනයක් විය. 2018 දී වාර්තා වූ බලාත්මකව පැවති මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව වූ 3,199,354ට සාපේක්ෂව 2019 වසර අවසානය වන විට බලාත්මකව පැවති රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 3,402,663ක් දක්වා වර්ධනය විය.

පෙර වසරවල අඩුවෙමින් පැමිණි ඔප්පු සංඛ්‍යාව පසුගිය වසරට සාපේක්ෂව 2.83%ක පහත වැටීමක් පෙන්නුම් කළද, පසුගිය වසරවලට සමානවම බලාත්මකව පැවති රක්ෂණ ඔප්පු අතුරින් බහුතරය උත්පාදන රක්ෂණ නිපැයුම් වූ අතර එම සංඛ්‍යාව 1,225,008ක් විය. කෙසේ වුවද, රක්ෂිත මුදල සම්බන්ධයෙන් ගත් කල 2019 වසර සඳහා වූ මුළු රක්ෂිත මුදලින් උත්පාදන රක්ෂණ කාණ්ඩය හිමි කර ගත්තේ රු.මි. 439,951ක් පමණි. අනෙක් අතට රක්ෂණකරුවන් විසින් හඳුන්වා දෙන ලද නව්‍ය නිපැයුම් ලක්ෂණ හේතුවෙන් පසුගිය වසරට සාපේක්ෂව "වෙනත්" කාණ්ඩයේ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 43.97%කින් ඉහළ ගිය අතර උකස් ආරක්ෂණ සැලසුම් හා කණ්ඩායම් ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාවේ ඉහළ යාමට ප්‍රධාන වශයෙන් රක්ෂණකරුවන් දෙදෙනෙකු හේතු විය. ඒ අනුව, 2019 වසරේ අවසානය වන විට "වෙනත්" කාණ්ඩයේ බලාත්මකව පැවති ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 710,021ක් (2018: 493,169) වූ අතර මුළු රක්ෂිත මුදල රු.මි. 1,801,924ක් (2018: රු.මි. 1,323,437) විය.

යුනිවර්සල් ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාවද 5.48%කින් වැඩි වුණු අතර එය වාර්තා වූයේ 942,677ක් (2018: 893,697) ලෙසයි. එසේම මුළු රක්ෂිත මුදල රු.මි. 433,120ක් (2018: රු.මි. 393,397) විය. කාලීන රක්ෂණයද මුළු රක්ෂිත මුදලින් සැලකිය යුතු ප්‍රමාණයක් නියෝජනය කළ අතර 2019 දී බලාත්මකව පැවති රක්ෂණ ඔප්පුවලට අදාළව 4.96%ක සුළු පහත වැටීමක් වාර්තා විය. පසුගිය වසරට සාපේක්ෂව, යාවජීව ජීවිත රක්ෂණ කාණ්ඩය රක්ෂණ ඔප්පුවල හා රක්ෂිත මුදලෙහි වර්ධනය අඩු වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.

**15 වගුව**

**2018 හා 2019 සඳහා නිෂ්පාදන අනුව බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සහ රක්ෂිතය කළ මුදල - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**

| ජීවිත රක්ෂණ වර්ගය | 2018 | | 2019 | |
|---|---|---|---|---|
| | බලාත්මකව පවතින ඔප්පු සංඛ්‍යාව | රක්ෂිත මුදල (රු. 000) | බලාත්මකව පවතින ඔප්පු සංඛ්‍යාව | රක්ෂිත මුදල (රු. 000) |
| කාලීන රක්ෂණය | 527,307 | 920,092,488 | 501,176 | 1,172,542,129 |
| යුනිවර්සල් ජීවිත රක්ෂණය | 893,697 | 393,397,498 | 942,677 | 433,120,480 |
| යාවජීව ජීවිත රක්ෂණ | 24,435 | 1,635,183 | 23,781 | 1,608,526 |
| උප්පාදන රක්ෂණ | 1,260,746 | 417,025,131 | 1,225,008 | 439,950,741 |
| වෙනත් | 493,169 | 1,323,437,053 | 710,021 | 1,801,923,679 |
| **එකතුව** | **3,199,354** | **3,055,587,353** | **3,402,663** | **3,849,145,555** |


### රක්ෂණ ඔප්පු අවලංගුවීම් - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය

2019 වසරේ දී නව රක්ෂණ ඔප්පු සහ මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාවට අදාළව රක්ෂණ ඔප්පු අවලංගුවීමේ අනුපාතයන් මද වශයෙන් අඩු වූ බවක් 12 ප්‍රස්තාරය මගින් පෙන්නුම් කෙරේ. 2019 දී අවලංගු වූ මුළු ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 249,744ක් (2018: 268,339) වූ අතර ඒ අතරින් 86,139ක් (2018: 86,484) නව රක්ෂණ ඔප්පු විය. ඒ අනුව, 2019 වසර තුළ නව රක්ෂණ ඔප්පු අවලංගු වීම ද සුළු වශයෙන්, එනම් රක්ෂණ ඔප්පු 345කින් අඩු විය.

බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස 15.61% ක අගයක් වාර්තා තල අතර එය 2018 වර්ෂයේ වාර්තා වූ 14.76% ට වඩා වර්ධනයක් පෙන්නුම් කරන ලදී. එමෙන්ම, මුළු ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස ගත් කල බලාත්මකව පවතින ජීවිත රක්ෂණ ඔප්පු ඔප්පු සංඛ්‍යාව තවදුරටත් වර්ධනයක් පෙන්නුම් කරමින් 2019 වසර අවසානය වන විට 41.59% අගයක් වාර්තා කරන ලදී. සමස්ථයක් ලෙස ගත් කල මෙම ප්‍රවණතාව මගින් මෙරට දිගුකාලීන රක්ෂණව්‍යාපාරයේ ඉදිරි ගමන් මග සහ අඩු රක්ෂණ ව්‍යාප්තියක් සහිත වෙළඳපල තව දුරටත් පුළුල් කිරීමේ හැකියාව පෙන්නුම් කරනු ලබයි.


**11 ප්‍රස්තාරය**

**2018 හා 2019 සඳහා නිෂ්පාදන අනුව බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**




**ප්‍රස්තාරය 12**

**රක්ෂණ ඔප්පු අවලංගු වීම - දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය**




| | | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
|---|---|---|---|---|---|---|
| | අවලංගු වූ නව රක්ෂණ ඔප්පු | 93,008 | 102,697 | 90,350 | 86,484 | 86,139 |
| | අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු | 264,473 | 271,586 | 275,039 | 268,339 | 249,744 |
| | අවලංගු වූ නව රක්ෂණ ඔප්පු ප්‍රමාණය නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 12.56 | 15.36 | 14.04 | 12.16 | 11.69 |
| | අවලංගු වූ මුළු රක්ෂන ඔප්පු ප්‍රමාණය බල පවත්නා මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | 9.15 | 9.02 | 8.96 | 8.39 | 7.34 |

### රක්ෂණ සමාගම් විසින් දරන ලද හිමිකම් පෑම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර

2019 වසරේ දී වාර්තා වූ මුළු හිමිකම් පෑම් ප්‍රමාණය රු.මි. 36,079ක් (2018: රු.මි. 34,416) වූ අතර එය 2018 වසරට සාපේක්ෂව 4.83%ක වැඩි වීමකි. 13 ප්‍රස්තාරය මගින් දැක්වෙන පරිදි දරන ලද මුළු හිමිකම් පෑම් අකර්මන්‍යතා ප්‍රතිලාභ, මරණ ප්‍රතිලාභ, පවාරණ ප්‍රතිලාභ, කල්පිරීම් ප්‍රතිලාභ සහ ඔප්පු හිමියන් වෙත ගෙවනු ලබන අනෙකුත් ප්‍රතිලාභවලින් සමන්විත විය.


දරණ ලද මුළු හිමිකම් පෑම් අතරින් වැඩිම ප්‍රතිශතය වාර්තා වූයේ කල්පිරීම් ප්‍රතිලාභවලට අදාළව වන අතර එය 2019 වසර සඳහා 52.25% ක් සහ රු.මි. 18,852 (2018: රු.මි. 18,343) විය. ඒවා ගිවිසුම්ගත බැඳීම්වලට අනුකූල විය.

පවාරණ ප්‍රතිලාභ, දරණ ලද සමස්ථ හිමිකම් පෑම් අතරින් කැපී පෙනෙන කොටසක් නියෝජනය කරන ලද අතර එය රු.මි. 7,070ක් සහ මුළු හිමිකම් පෑම්වලින් 19.59%ක් විය. එය පසුගිය වසරට සාපේක්ෂව 0.93%ක වර්ධනයකි. තවද, මරණ හිමිකම් පෑම්හි කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කෙරුණු අතර එය වටිනාකම අනුව 24.08%ක් වූ අතර එමගින් 2019 දී දරණ ලද මුළු හිමිකම් පෑම්වලින් 9.78%ක් නියෝජනය කෙරිණි.

සෞඛ්‍ය ප්‍රතිලාභ, අත්තිකාරම් ගෙවීම්, ප්‍රසාද මුදල්, අවලංගු කිරීම් සහ ආපසු ගෙවීම් යනාදිය ඇතුළත් අනෙකුත් ප්‍රතිලාභ රු.මි. 5,618ක් වූ අතර එය මුළු හිමිකම් පෑම්වලින් 15.57% ක් විය.

මෙලෙස එය පෙර වසරට වඩා 7.20% ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. 2019 වසර තුළ රු.මි. 1,011 ක් වූ අකර්මන්‍යතා ප්‍රතිලාභ 2.70%කින් ඉහළ ගොස් ඇත.

**13 ප්‍රස්තාරය**
**රක්ෂණ සමාගම් විසින් දරන ලද හිමිකම් පෑම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර**




| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
|---|---|---|---|---|---|
| අකර්මන්‍යතා ප්‍රතිලාභ | 430,617 | 488,818 | 636,472 | 984,923 | 1,011,482 |
| මරණ | 1,640,801 | 1,616,565 | 2,106,087 | 2,842,975 | 3,527,686 |
| පවාරන | 5,267,864 | 5,121,636 | 5,530,517 | 7,004,688 | 7,069,627 |
| කල්පිරීමේ ප්‍රතිලාභ | 11,687,811 | 12,370,659 | 14,393,605 | 18,343,285 | 18,852,491 |
| වෙනත් | 1,906,560 | 2,887,039 | 3,704,469 | 5,240,493 | 5,617,722 |

### රක්ෂණ හිමිකම් පෑම් සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

පසුගිය වසර පහ තුළ හිමිකම් පෑම් සංඛ්‍යාව වැඩි වීමේ ප්‍රවණතාවක් වාර්තා වී ඇති අතර 2019 වසර සඳහා වන මුළු හිමිකම් පෑම් සංඛ්‍යාව 3.85%කින් ඉහළ ගිය අතර එය 429,606ක් (2018: 413,685) විය. දරණ ලද මුළු හිමිකම් පෑම් සංඛ්‍යාවෙන් වැඩිම ප්‍රතිශතය " වෙනත්" යන කාණ්ඩයට අදාළ වේ. "වෙනත් ප්‍රතිලාභ" වලට අදාළ හිමිකම් පෑම් මුළු හිමිකම් පෑම් අතරින් 46.07% ක් වූ අතර එය 197,906 (2018: 166,745) විය. තවද එය පසුගිය වසර කිහිපය තුල අඛණ්ඩව ඉහළ ගියේය.

කල්පිරීම් ප්‍රතිලාභ හිමිකම්පෑම් සංඛ්‍යාව 2019 වසරේදී 130,723 (2018: 153,856) ක් විය. එය මුළු හිමිකම් පෑම්වලින් 30.43%ක් නියෝජනය කළ අතර 2019 වසරේ දී 15.04%ක පහත වැටීමක් පෙන්නුම් කළේය. පවාරණ හිමිකම් පෑම් සංඛ්‍යාව, මුළු දිගුකාලීන රක්ෂණ හිමිකම් පෑම් සංඛ්‍යාවෙන් 17.84%ක් නියෝජනය කළ අතර එය 76,630 (2018: 70,412) ක් විය. තවද 2019 වසරේ දී අකර්මන්‍යතා ප්‍රතිලාභ සුළු වශයෙන් ඉහළ ගිය අතර එය 11,427ක් (2018: 10,737) ලෙස වාර්තා විය.
2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රක්ෂණ හිමිකම් පෑම් සංඛ්‍යාව කාණ්ඩ වශයෙන් වෙන් කර 16 වගුව මගින් ඉදිරිපත් කෙරේ.

**16 වගුව**
**රක්ෂණ හිමිකම් පෑම් සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය**

| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
|---|---|---|---|---|---|
| අකර්මන්‍යතා ප්‍රතිලාභ | 14,081 | 9,521 | 10,749 | 10,737 | 11,427 |
| මරණ ප්‍රතිලාභ | 6,747 | 8,418 | 11,247 | 11,935 | 12,920 |
| පවාරණ | 42,814 | 46,484 | 47,191 | 70,412 | 76,630 |
| කල්පිරීම් මත ප්‍රතිලාභ | 120,661 | 108,680 | 128,266 | 153,856 | 130,723 |
| වෙනත් ප්‍රතිලාභ | 112,337 | 143,336 | 145,452 | 166,745 | 197,906 |
| **එකතුව** | **296,640** | **316,439** | **342,905** | **413,685** | **429,606** |

## සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

### දළ ලිඛිත වාරික ආදායම

17 වගුවෙන් දැක්වෙන ආකාරයට මෑත කාලීන ඉතිහාසය තුළ වඩාත් අභියෝගාත්මක වසරවලින් එකක් වූ 2019 වසරේ දී ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය 7.10%කින් වර්ධනය වූ අතර සමස්ථ දළ ලිඛිත වාරික ආදායම රු.මි. 107,732ක් විය. ආනයනික මෝටර් රථ සඳහා වන බදු වැඩි වීම්, සාමාන්‍ය රක්ෂණකරුවන් අතර පවතින දැඩි මිළ තරඟය, අයහපත් කාලගුණික තත්වයන් හා 2019 අප්‍රේල් මස එල්ල වූ පාස්කු ප්‍රහාරයන් හේතුවෙන් ආර්ථික කටයුතු අඩු මට්ටමක පැවතීම මන්දගාමී වර්ධනයට හේතු වූ බව කිව හැකිය.

2019 වසර තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වේගවත් වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මෝටර් රථ නොවන රක්ෂණයන් වන අතර එය සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ ඉතිහාසය වෙනස් කළේය.

"සුරක්ෂා සිසු රක්ෂණ ඔප්පුව", "අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය", "ජාතික ස්වභාවික ආපදා යෝජනා ක්‍රමය" ආදී ජාතික අවශ්‍යතාවයන් සඳහා රජය විසින් හඳුන්වා දෙන ලද රක්ෂණ යෝජනා ක්‍රමවල දායකත්වය මෙම වර්ධනයේ ප්‍රධාන සාධකය විය.

2015 සිට 2019 දක්වා කාල සීමාව තුළ වටිනාකමට අදාළව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායමෙ හි 56%ක වර්ධනයක් දැකිය හැකි විය.

සාමාන්‍ය රක්ෂණ කර්මාන්තය තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පමණක් පවත්වාගෙන යාමට ලියාපදිංචි වී ඇති රක්ෂණ සාමාගම් එකොළහක් හා සාමාන්‍ය හා දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර යන දෙවර්ගයම පවත්වාගෙන යන සංයුක්ත සමාගම් දෙකක් අතර දැඩි තරඟකාරීත්වයක් පෙන්නුම් කරයි.

කෙසේ වුවද, වසර අවසාන භාගයේදී ව්‍යාප්ත වූ කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් සෞඛ්‍ය, චාරිකා, අවස්ථා අවලංගු කිරීම්, ව්‍යාපාර බාධා, සේවායෝජකයාගේ වගකීම, ආදායම් සුරක්ෂිත කිරීම් ආදී රක්ෂණාවරණ රැසක් කෙරෙහි බලපෑම් එල්ල විය හැකි අතර, එය රක්ෂණාවරණ අඩුවීම, හිමිකම් පෑම් වැඩිවීම ආදී හේතූන් හරහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මූල්‍ය තත්වය කෙරෙහි සෘණාත්මක බලපෑම් සිදුකල හැක.

**17 වගුව**

**සමාගම් වශයෙන් දළ ලිඛිත වාරිකය සහ වෙළඳපොළ කොටස් - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**


| රක්ෂකයා | 2015 | | 2016 | | 2017 | | 2018 (අ) | | 2019 (ආ) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දළ ලිඛිත වාරිකය (රු.'000) | වෙළඳපොළ කොටස (%) | දළ ලිඛිත වාරිකය (රු.'000) | වෙළඳපොළ කොටස (%) | දළ ලිඛිත වාරිකය (රු.'000) | වෙළඳපොළ කොටස (%) | දළ ලිඛිත වාරිකය (රු.'000) | වෙළඳපොළ කොටස (%) | දළ ලිඛිත වාරිකය (රු.'000) | වෙළඳපොළ කොටස (%) |
| ඒඅයිඒ ජෙනරල් | 3,297,840 | 4.76 | - | - | - | - | - | - | - | - |
| ඒඅයපී | 3,141 | 0.00 | - | - | - | - | - | - | - | - |
| අලියාන්ස් ජෙනරල් | 3,244,844 | 4.68 | 4,247,691 | 5.34 | 5,956,142 | 6.38 | 17,983,748 | 17.88 | 18,095,258 | 16.80 |
| අමානා ජෙනරල් | 1,438,732 | 2.08 | 1,474,186 | 1.85 | 1,686,270 | 1.81 | 1,841,067 | 1.83 | 1,621,461 | 1.51 |
| සෙලින්කෝ ජෙනරල් | 12,921,561 | 18.65 | 15,265,433 | 19.18 | 17,012,087 | 18.22 | 18,137,933 | 18.03 | 18,401,405 | 17.08 |
| කොන්ටිනෙන්ටල් | 2,309,413 | 3.33 | 3,088,064 | 3.88 | 3,892,780 | 4.17 | 4,545,405 | 4.52 | 5,002,548 | 4.64 |
| කෝපරේටිව් ජෙනරල් | 1,691,705 | 2.44 | 2,420,130 | 3.04 | 2,966,679 | 3.18 | 3,692,397 | 3.67 | 4,192,960 | 3.89 |
| ෆෙයාෆර්ස්ට් | 1,908,901 | 2.76 | 2,361,614 | 2.97 | 9,610,990 | 10.29 | 10,980,850 | 10.92 | 11,247,669 | 10.44 |
| එච්එන්බී ජෙනරල් | 2,577,224 | 3.72 | 2,982,385 | 3.75 | 3,662,008 | 3.92 | 4,062,171 | 4.04 | 4,394,457 | 4.08 |
| ජනශක්ති ජෙනරල් | 7,406,160 | 10.69 | 10,137,864 | 12.74 | 11,740,185 | 12.57 | - | - | - | - |
| එල්ඕඑල්සී ජෙනරල් | 2,476,961 | 3.58 | 3,096,834 | 3.89 | 3,795,106 | 4.06 | 4,318,721 | 4.29 | 4,954,896 | 4.60 |
| එම්බීඑස්එල් | 1,159,208 | 1.67 | 972,976 | 1.22 | 260,806 | 0.28 | (512) | 0.00 | 96,217 | 0.09 |
| එන්අයිටීඑෆ් | 4,961,413 | 7.16 | 6,420,822 | 8.07 | 8,114,412 | 8.69 | 9,644,901 | 9.59 | 13,358,203 | 12.40 |
| ඔරියන්ට් | 746,935 | 1.08 | 810,728 | 1.02 | 1,179,000 | 1.26 | 1,376,398 | 1.37 | 1,564,902 | 1.45 |
| පීපල්ස් | 3,637,404 | 5.25 | 4,166,727 | 5.24 | 4,587,432 | 4.91 | 5,354,368 | 5.32 | 5,694,164 | 5.29 |
| සණස ජෙනරල් | 349,527 | 0.50 | 384,481 | 0.48 | 569,509 | 0.61 | 732,379 | 0.73 | 945,162 | 0.88 |
| එස්එල්අයිසී | 13,583,222 | 19.61 | 15,198,381 | 19.10 | 18,355,361 | 19.65 | 17,916,274 | 17.81 | 18,163,072 | 16.86 |
| යුනියන් ජෙනරල් | 5,557,189 | 8.02 | 6,561,571 | 8.23 | - | - | - | - | - | - |
| **එකතුව** | **69,271,380** | **100** | **79,589,888** | **100** | **93,388,766** | **100** | **100,586,101** | **100** | **107,732,375** | **100** |
| **වර්ධන අනුපාතය (%)** | **13.18** | | **14.90** | | **17.34** | | **7.71** | | **7.10** | |

ආර්ථික පසුබෑමෙන් යථා තත්වයට පත් වී වර්ධනය වීමේ හැකියාව සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයට ඇති බැවින් සාමාන්‍ය රක්ෂණකරුවන්හට මෙම අභියෝග මධ්‍යයේ නව අවස්ථාවන් සෙවීමට හැකිය. ඒ අනුව, මහජනතාව වෙත නව්‍ය, පිරිවැය ඵලදායී රක්ෂණ නිපැයුම් හඳුන්වා දීම සඳහා තාක්ෂණ රක්ෂණය වැනි ගෝලීය මට්ටමේ නව සංවර්ධනයන් හඹා යාම ඉදිරියට යාමේ දී රක්ෂකයන් අවධානය යොමු කරනු ඇති ප්‍රධාන අංශයක් වන බවට අපේක්ෂා කෙරේ.

17 වගුව හා 14 ප්‍රස්තාරය මගින් දැක්වෙන පරිදි 2019 වසර තුළ 17.08%ක් වූ වෙළඳපොළ කොටසක් ළඟා කර ගනිමින් ද රු.මි. 18,401ක වාරික ආදායමක් වාර්තා කරමින් ද වෙළඳපළ ඉදිරියෙන් සිටියේ සෙලින්කෝ ජෙනරල් රක්ෂණ සමාගමයි. රු.මි. 18,163 ක (2018: රු.මි. 17,916) දළ ලිඛිත වාරික ආදායමක් සහ 16.86% (2018: 17.81%) වෙළඳපොළ කොටසක් වාර්තා කරමින් දෙවන වැඩිම වෙළඳපොළ කොටස ළඟා කර ගත්තේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවයි. එමගින් පෙන්නුම් කළේ 2018 වසරට සාපේක්ෂව දළ ලිඛිත වාරිකයේ සුළු වැඩි වීමකි. අලියාන්ස් ජෙනරල් සමාගම රු.මි. 18,095ක් (2018: රු.මි. 17,984) වන දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කරමින් තෙවන වැඩිම වෙළඳපොළ කොටස වන 16.80% (2018: 17.88%) ළඟා කර ගත්තේය.

ජාතික රක්ෂණ භාර අරමුදල 12.40% ක (2018: 9.59%) වෙළඳපොළ කොටසක් වාර්තා කරමින් සුවිශේෂී සන්දිස්ථානයකට ළඟා වූ අතර රු.මි. 13,358ක (2018: රු.මි. 9,645) දළ ලිඛිත වාරික ආදායමට අදාළව සිව් වන වැඩිම වෙළඳපොළ කොටස හිමි කර ගත්තේය. එසේම මෙය 2018 දළ ලිඛිත වාරිකය කෙරෙහි සිව් වන වැඩි ම දායකත්වය ලබා දුන් ෆෙයාෆස්ට් සමාගම අභිබවා යාමකි. "ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය" සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගෙවන ලද වාරිකය රු.මි. 500 සිට රු.මි. 1,500 දක්වා ඉහළ යාම හා අග්‍රහාර වෙතින් ලැබුණු දායකත්වය ඉහළ යාම සහ ජාතික රක්ෂණ භාර අරමුදල මගින් කළමනාකරණය කෙරෙන වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් රක්ෂණ යෝජනාක්‍රමය හරහා උත්පාදනය වූ වාරික ආදායම හේතුවෙන් 2019 වසර තුළ දළ ලිඛිත වාරිකයට අදාළව ජාතික රක්ෂණ භාර අරමුදලෙහි කාර්යසාධනය කැපී පෙනෙන අයුරින් ඉහළ ගියේය. ජීවිත 250කට අධික සංඛ්‍යාවක් බිලි ගත් 2019 අප්‍රේල් පාස්කු ප්‍රහාරයන් හේතුවෙන් වර්ජනල කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් රක්ෂණ යෝජනාක්‍රමය යටතේ ත්‍රස්තවාදයට අදාළ රක්ෂණාවරණය සඳහා වන ඉල්ලුම විශාල

### 14 ප්‍රස්තාරය
### 2019 දෙසැම්බර් 31 වන දිනට අවසන් වූ වර්ෂය සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ සමාගම් අනුව දළ ලිඛිත වාරිකවල වෙළඳපොළ කොටස




ලෙස වැඩි විය. ඒ අනුව, 2019 දෙසැම්බර් 31 දිනට වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් රක්ෂණ යෝජනාක්‍රමය රු.මි. 6,307ක් (වර්ධන අනුපාතය 37.67%) වූ දළ ලිඛිත වාරික ආදායමක් වාර්තා කරමින් කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. එය පසුගිය වසර පහ තුළ වාර්තා වූ වැඩිම දළ ලිඛිත වාරිකයයි.

ෆෙයාෆස්ට් සමාගම විසින් 2019 වසරේ දී රු.මි. 11,248ක (2018: රු.මි. 10,981) දළ ලිඛිත වාරික ප්‍රමාණයක් උත්පාදනය කරමින් 10.44%ක් වූ පස් වන වැඩි ම වෙළඳපොළ කොටස ළඟා කර ගන්නා ලදී.

අමානා ජෙනරල් හැර සියළු ම සාමාන්‍ය රක්ෂකයන් විසින් මෙම වසර තුළ දළ ලිඛිත වාරිකයට අදාළව වර්ධනයක් පෙන්නුම් කරන ලදී.


### දළ ලිඛිත වාරිකය සහ අනෙකුත් රක්ෂණ සඳහා ඉහළම දායකත්වය සපයන සමාගම් පහෙහි වෙළඳපොළ කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2019 දී ප්‍රධාන වශයෙන් සෙලින්කෝ ජෙනරල්, එස්එල්අයිසී, අලියාන්ස් ජෙනරල්, එන්අයිටීඑෆ් හා ෆෙයාෆස්ට් යන සමාගම් කිහිපය විසින් සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයෙන් 73.58% ක ප්‍රමාණයක් පාලනය කරමින් එය මෙහෙයවනු ලැබීය. එමෙන් ම එම සමාගම් වාර්තා කළ මුළු දළ ලිඛිත වාරික ආදායම රු.මි. 79,266 (2018: 74, 664) ක් විය. ඉතිරි රක්ෂකයන් දස දෙනා සතුව 26.42%ක වෙළඳපොළ කොටසක් වූ අතර එම සමාගම් විසින් රු.මි. 28,467ක දළ ලිඛිත වාරික ප්‍රමාණයක් සාමූහිකව උත්පාදනය කරන ලදී.

15 ප්‍රස්තාරයේ පෙන්වා දී ඇති ආකාරයට 33.94%ක (2018: 35.84%) මුළු වෙළඳපළ කොටසක් සඳහා සාමූහිකව දායක වෙමින් සෙලින්කෝ ජෙනරල් හා එස්එල්අයිසී සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළ පෙරමුණේ පසු විය. කෙසේ වුවද, 2018 වසරට සාපේක්ෂව 2019 වසර තුළ සෙලින්කෝ ජෙනරල් හා එස්එල්අයිසී වෙළඳපොළ කොටස් සුළු වශයෙන් අඩු විය. අලියාන්ස් ජෙනරල් සමාගමෙහි වෙළඳපොළ කොටස 2018 වසරේ 17.88%ට සාපේක්ෂව 2019 වසරේ දී 16.08% දක්වා පහත වැටුණු අතර වෙළඳපොළ තෙවන ස්ථානයට පත් විය. සිව් වන විශාලතම දායකයා ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල වෙළඳපලෙන් 12.40%ක් හිමි කර ගත් අතර පසුගිය වසරවලට සාපේක්ෂව සමාලෝචිත වසර තුළ ඔවුන්ගේ කොටසට අදාළව සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළේය.

ෆෙයාෆස්ට් සමාගම 10.44%ක වෙළඳපොළ කොටසක් වාර්තා කරමින් රක්ෂණ වෙළඳපොළ තුළ පස් වන ස්ථානය ලබා ගත්තේය (2018: 10.92%)

### රූප සටහන 15
### 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා දළ ලිඛිත වාරිකයට දායක වන ප්‍රමුඛතම සමාගම් පහෙහි සහ අනෙකුත් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය




| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2015 | 18.65 | 19.61 | 10.69 | 7.16 | 8.02 | 35.86 |
| 2016 | 19.18 | 19.10 | 12.74 | 8.07 | 8.24 | 32.67 |
| 2017 | 18.22 | 19.65 | 12.57 | 8.69 | 10.29 | 30.58 |
| 2018 (අ) | 18.03 | 17.81 | 17.88 | 9.59 | 10.92 | 25.77 |
| 2019 (ආ) | 17.08 | 16.86 | 16.80 | 12.40 | 10.44 | 26.42 |

### පන්ති වශයෙන් දළ ලිඛිත වාරිකය පිළිබඳ විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2015 සිට 2019 දක්වා කාල සීමාව තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ පන්ති වශයෙන් දළ ලිඛිත වාරිකය පිළිබඳ විශ්ලේෂණය 18 වගුවෙන් සහ 16 වන රූප සටහන මගින් පෙන්නුම් කෙරේ. ගිනි, මුහුදු, මෝටර් රථ වාහන, සෞඛ්‍ය හා විවිධ රක්ෂණ ව්‍යාපාර, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන උප පන්ති වේ. මීට අමතරව, ජාතික රක්ෂණ භාර අරමුදල මගින් සපයනු ලබන, වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් රක්ෂණ ආවරණයට අදාළ වාරික ද පහත වගුව තුළ වෙන් වෙන්ව දක්වා ඇත.

මෝටර් රථ වාහන රක්ෂණ පන්තිය 2019 වසරේදී රු. මි. 63,733 ක දළ ලිඛිත වාරිකයක් (2018: රු.මි. 62,363) පෙන්නුම් කරමින් 59.16% ක (2018: 62.00%) වෙළඳපළ කොටසක් වාර්තා කර ඇත. පසුගිය වසර හතර තුළ දිගින් දිගටම වාර්තා තුළ අංක දෙකක

### වගුව 18
### දළ ලිඛිත වාරික ආදායම පන්ති අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

| පන්තිය | දළ ලිඛිත වාරික ආදායම (රු. '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| ගිනි | 6,604,074 | 7,479,910 | 8,597,489 | 8,821,655 | 8,270,010 |
| මුහුදු | 1,996,862 | 2,086,394 | 2,191,654 | 2,403,366 | 2,385,567 |
| මෝටර් රථ වාහන | 42,622,205 | 49,333,000 | 56,047,640 | 62,363,476 | 63,732,958 |
| සෞඛ්‍ය | 8,534,364 | 10,036,518 | 14,649,440 | 14,161,542 | 16,578,713 |
| විවිධ | 6,495,454 | 7,120,742 | 7,866,260 | 8,254,421 | 10,457,778 |
| අනු එකතුව | **66,252,959** | **76,056,564** | **89,352,484** | **96,004,460** | **101,425,025** |
| වර්ජනලු කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් | 3,018,421 | 3,533,324 | 4,036,283 | 4,581,641 | 6,307,350 |
| එකතුව | **69,271,380** | **79,589,888** | **93,388,766** | **100,586,101** | **107,732,375** |

| පන්තිය | වර්ධනය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| ගිනි | 3.95 | 13.26 | 14.94 | 2.61 | (6.25) |
| මුහුදු | 4.44 | 4.48 | 5.05 | 9.66 | (0.74) |
| මෝටර් රථ වාහන | 19.10 | 15.74 | 13.61 | 11.27 | 2.20 |
| සෞඛ්‍ය | 12.39 | 17.60 | 45.96 | (3.33) | 17.07 |
| විවිධ | (3.37) | 9.63 | 10.47 | 4.93 | 26.69 |
| අනු එකතුව | **13.51** | **14.80** | **17.48** | **7.44** | **5.65** |
| වර්ජනලු කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් | 6.46 | 17.06 | 14.23 | 13.51 | 37.67 |
| එකතුව | **13.18** | **14.90** | **17.34** | **7.71** | **7.10** |

| පන්තිය | ප්‍රතිශත කොටස (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| ගිනි | 9.53 | 9.40 | 9.21 | 8.77 | 7.68 |
| මුහුදු | 2.88 | 2.62 | 2.35 | 2.39 | 2.21 |
| මෝටර් රථ වාහන | 61.53 | 61.98 | 60.02 | 62.00 | 59.16 |
| සෞඛ්‍ය | 12.32 | 12.61 | 15.69 | 14.08 | 15.39 |
| විවිධ | 9.38 | 8.95 | 8.42 | 8.21 | 9.71 |
| අනු එකතුව | **95.64** | **95.56** | **95.68** | **95.45** | **94.15** |
| වර්ජනලු කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් | 4.36 | 4.44 | 4.32 | 4.55 | 5.85 |
| එකතුව | **100** | **100** | **100** | **100** | **100** |

වර්ධනයට සාපේක්ෂව, මෝටර් රථ වාහන රක්ෂණ පන්තිය 2019 දී 2.20% ක් වූ අඩුම වර්ධන අනුපාතය වාර්තා කර ඇත.

මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පුද්ගලික වාහන ආනයනය අඩු වීම සහ මහ බැංකුව විසින් වාර්තා කරන ලද අන්දමට 2019 රාජ්‍ය අයවැය තුළින් පුද්ගලික වාහන ආනයනවලට අදාළ කාණ්ඩ බොහෝමයක බදු ව්‍යුහය ඉහළ නැංවීමයි.

රු.මි. 16,579 (2018: රු.මි. 14,162)ක දළ ලිඛිත වාරිකයක් වාර්තා කරමින් සෞඛ්‍ය රක්ෂණය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි දෙවන විශාලතම කාණ්ඩය නියෝජනය කළ අතර පසුගිය වසරට සාපේක්ෂව 17.07%ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරන ලදී. රජය විසින් හඳුන්වා දෙන ලද "සුරක්ෂා සිසු රක්ෂණය" හා "අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය" වැනි රක්ෂණ යෝජනා ක්‍රම සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ වර්ධනයක් පෙන්නුම් කිරීමට සමත්විය.


විවිධ රක්ෂණ ව්‍යාපාරය රු.මි. 10,458ක (2018: රු.මි. 8,254) වාරික ආදායමක් උත්පාදනය කළ අතර මුළු දළ ලිඛිත වාරිකයෙන් 9.71%ක් නියෝජනය කරන ලදී. 2018 දී වාර්තා වූ 4.93% ක වර්ධන අනුපාතයට සාපේක්ෂව 2019 වර්ෂයේදී 26.69%කින් තම වර්ධන අනුපාතය ඉහළ නංවා ගැනීමට විවිධ රක්ෂණ ව්‍යාපාරය සමත් වී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය සහ කොන්ත්‍රාත්කරුවන්ගේ සියලු අවදානම් යන රක්ෂණාවරණ තුළින් උත්පාදනය වූ වාරික ඉහළ යාමයි.

ගිනි රක්ෂණයෙහි දළ ලිඛිත වාරිකය රු.මි. 8,270ක් (2018: රු.මි. 8,822) වූ අතර එය මුළු දළ ලිඛිත වාරිකයෙන් 7.68%ක් (2018: 8.77%) විය. එසේම මෙමගින් 2018 වසරට සාපේක්ෂව 6.25% ක (2018: 2.61%) ඍණාත්මක වර්ධනයක් වාර්තා කෙරිණි.

ඉහත පෙන්නුම් කර ඇති ආකාරයට 2019 දී වර්ජන, කැරළි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් රක්ෂණ යෝජනාක්‍රමය වෙත වූ දායකත්වයන් රු.මි. 6,307 (2018: රු.මි. 4,582) දක්වා 37.67% කින් ඉහළ ගිය අතර මෙය පසුගිය වසර පහ තුළ වාර්තා වූ වැඩිම වර්ධන වේගය විය.

**රූප සටහන 16**

**2015 සිට 2019 දක්වා දළ ලිඛිත වාරික ආදායම පන්ති අනුව විශ්ලේෂණය (ප්‍රතිශත කොටස සහ සමස්ථ කර්මාන්ත වර්ධනය) - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




| | | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
|---|---|---|---|---|---|---|
| | වර්ජන, කැරලි, කෝලාහල, ජන කැළඹීම සහ ත්‍රස්ත ක්‍රියාකාරම් | 4.36 | 4.44 | 4.32 | 4.55 | 5.85 |
| | විවිධ | 9.38 | 8.95 | 8.42 | 8.21 | 9.71 |
| | සෞඛ්‍ය | 12.32 | 12.61 | 15.69 | 14.08 | 15.39 |
| | මෝටර් රථ වාහන | 61.53 | 61.98 | 60.02 | 62.00 | 59.16 |
| | මුහුදු | 2.88 | 2.62 | 2.35 | 2.39 | 2.21 |
| | ගිනි | 9.53 | 9.40 | 9.21 | 8.77 | 7.68 |
| | සමස්ථ කර්මාන්ත වර්ධනය | 13.18 | 14.90 | 17.34 | 7.71 | 7.10 |

**වගුව 19**

**2018 හා 2019 වර්ෂ සඳහා විවිධ රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම කාණ්ඩ අනුව විශ්ලේෂණය**

| කාණ්ඩය | දළ ලිඛිත වාරික ආදායම රු.000 | |
|---|---|---|
| | 2018 (අ) | 2019 (ආ) |
| හිමිකම් අයිතිය | 488,362 | 399,180 |
| පුද්ගලික අනතුරු | 1,673,887 | 1,694,374 |
| කොන්ත්‍රාත්කරුවන්ගේ සියලු අවදානම් | 467,916 | 1,140,043 |
| වෘත්තීමය හානි රක්ෂණය | 334,698 | 441,897 |
| චාරිකා රක්ෂණය | 532,025 | 477,130 |
| විශ්වාසයතා ඇපය | 117,853 | 92,779 |
| සොර බිය | 395,880 | 401,421 |
| සේප්පුගත මුදල් ඇතුළු මාර්ගස්ථ මුදල් | 436,850 | 433,592 |
| මාර්ගස්ථ භාණ්ඩ | 125,159 | 115,912 |
| නිෂ්පාදන වගකීම | 148,401 | 167,535 |
| මහජන වගකීම් | 450,273 | 535,243 |
| බැංකුකරුවන්ගේ හානි පූරණ රක්ෂණය | 397,674 | 413,313 |
| ගුවන් යානා බඳ | 1,061,979 | 1,616,254 |
| කම්කරු වන්දි රක්ෂණය | 709,476 | 696,591 |
| ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය | 500,000 | 1,500,000 |
| වෙනත් | 902,693 | 1,102,389 |
| **අනු එකතුව** | **8,743,127** | **11,227,652** |
| අඩු කලා: ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා වන වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් වාරික ආදායම | (460,879) | (711,516) |
| සහභාග - රක්ෂකයින්ගේ වාරික ආදායම | (27,827) | (58,360) |
| **මුළු විවිධ රක්ෂණ දළ ලිඛිත වාරික ආදායම** | **8,254,421** | **10,457,776** |

**විවිධ රක්ෂණ ව්‍යාපාරයේ කටයුතුවල දළ ලිඛිත වාරික ආදායම කාණ්ඩ අනුව විශ්ලේෂණය**

2018 හා 2019 වර්ෂ තුළදී විවිධ රක්ෂණ ව්‍යාපාර කටයුතු යටතේ වර්ග කරන ලද රක්ෂණ කාණ්ඩ වලින් උත්පාදනය කෙරුණු දළ ලිඛිත වාරික ආදායම් 19 වගුව මගින් දැක්වේ. විවිධ රක්ෂණ ව්‍යාපාර කටයුතු වල ප්‍රධාන කාණ්ඩ වශයෙන් පුද්ගලික අනතුරු, ගුවන් යානා බඳ, ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය, කම්කරු වන්දි රක්ෂණය, කොන්ත්‍රාත්කරුවන්ගේ සියලු අවදානම් යනාදිය නම් කල හැක.

වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් යෝජනා ක්‍රමය සහ සහභාග රක්ෂණ හැර විවිධ රක්ෂණ

ව්‍යාපාරය වෙතින් උත්පාදනය කෙරුණු දළ ලිඛිත වාරික ආදායම රු.මි. 10,458ක් (2018: රු.මි. 8,254) වූ අතර, එය 2018 වසරට සාපේක්ෂව 26.69%ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරන ලදී. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ශ්‍රී ලංකා රජය විසින් 2016 අප්‍රේල් 01 වන දින සිට හඳුන්වා දෙන ලද, ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමයේ වාර්ෂික වාරිකය රු.මි. 1,500 දක්වා (2018: රු.මි. 500) වැඩිවීමයි. මෙම රක්ෂණ යෝජනා ක්‍රමය මගින් දැනටමත් රක්ෂණය නොකළ ජීවිත හා දේපළ ආදියට ස්වභාවික විපත් වලින් සිදුවන හානි ආවරණය කෙරේ. තවද, කොන්ත්‍රාත්කරුවන්ගේ සියළු අවදානම් රක්ෂණ කාණ්ඩයේ දළ ලිඛිත වාරික ආදායම කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින් රු.මි. 1,140 (2018: රු.මි. 468)ක අගයක් වාර්තා කරන ලදී.


විවිධ රක්ෂණ ව්‍යාපාරය යටතේ වැඩිම වාරික ආදායම වාර්තා වූයේ පුද්ගලික අනතුරු කාණ්ඩය වෙතින් වන අතර එය රු.මි. 1,694 (2018: රු.මි. 1,674) ක් විය. එසේම එය 2018 වසරට සාපේක්ෂව 2019 දී 1.22%ක් වැනි සුළු වර්ධනයක් පෙන්නුම් කළේය. පසුගිය වසරට සාපේක්ෂව ගුවන් යානා බඳ, වෘත්තීමය හානි රක්ෂණය, මහජන වගකීම හා නිෂ්පාදන වගකීම් ආදී විවිධ රක්ෂණ ව්‍යාපාර කාණ්ඩ කිහිපයක සාමාන්‍ය වර්ධනයක් දක්නට ලැබිණි.

19 වගුවෙහි දැක්වෙන වෙනත් කාණ්ඩය ප්‍රධාන වශයෙන් නැව් බඳට ඇති සියළු අවදානම් (Hull All Risk), පුද්ගලික රක්ෂණ ඔප්පු ආදියෙන් සමන්විත වූ අතර 2019 දී රු.මි. 1,102ක දළ ලිඛිත වාරිකයක් වාර්තා කළේය. එය 2018 දී උත්පාදනය කළ රු.මි. 902ට සාපේක්ෂව 22.12%ක සාධනීය වර්ධනයක් විය.

### දළ ලිඛිත වාරික ආදායම ප්‍රතිරක්ෂණ වාරිකය සහ රක්ෂකයන් විසින් රඳවාග ැනීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

20 වගුව සහ 17 ප්‍රස්තාරය මගින් 2015 වසරේ සිට 2019 දක්වා රක්ෂණ සමාගම් විසින් උත්පාදනය කරන ලද දළ ලිඛිත වාරික ආදායම ප්‍රතිරක්ෂකයන් වෙත පවරා දෙන ලද ප්‍රතිරක්ෂණ වාරිකය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල ප්‍රධාන පන්තිවල රඳවාගැනීම් මට්ටම් විදහා දැක්වේ. 20 වගුවේ දැක්වෙන පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු මගින් 2019 වසරේදී රුපියල් මිලියන 101,425 ක් වූ (2018: රු.මි 96,004) මුළු දළ ලිඛිත වාරිකයෙන් වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම්වලට අදාළ අගය හැර රුපියල් මිලියන 17,813 ක ප්‍රතිරක්ෂණ වාරිකයක් පවරා දී ඇත.

**රූප සටහන 17**
**ප්‍රතිරක්ෂණ වාරික සහ රක්ෂකයන් විසින් රඳවාගැනීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




ඒ අනුව, 2019 වසරේ දී සාමාන්‍ය රක්ෂකයන් විසින් 82.44%ක (2018: 81.42%) සමස්ථ රඳවා ගැනීමේ අනුපාතයක් (වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ආවරණ හැර) වාර්තා කරන ලද අතර එය පසුගිය වසරට සාපේක්ෂව සුළු වැඩි වීමකි. වසර පහක් පුරාවට මෝටර් රථ වාහන රක්ෂණ ව්‍යාපාරය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි ඉහළම රඳවා ගැනීමේ පන්තිය ලෙස පැවති අතර 2019 වසරේ දී 93.36%ක (2018: 93.11%) රඳවා ගැනීමේ අනුපාතයක් වාර්තා කළේය.

2019 දී සෞඛ්‍ය රක්ෂණය 91.11% ක (2018: 87.49%) කැපී පෙනෙන රඳවා ගැනීමේ අනුපාතයක් වාර්තා කළ අතර 3.62% වැඩි වීමක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2019 වසරේ දී සෞඛ්‍ය රක්ෂණය සඳහා ප්‍රතිරක්ෂකයන් වෙත පවරා දෙන ලද වාරිකය 2018 වාර්තා වූ රු.මි. 1,771 සිට රු.මි. 1,473 දක්වා පහත වැටිණි.

ගිනි රක්ෂණ පන්තිය පසුගිය වසර පහ පුරාවට අඩු ම රඳවා ගැනීමේ අනුපාතය වාර්තා කළ අතර, 2019 දී එය 26.70%ක් විය. එය 2018 වසරේ දී වාර්තා වූ 30.81%ක් වූ රඳවා ගැනීමේ අනුපාතයට සාපේක්ෂව තවත් පහළ බැසීමකි. එසේම පසුගිය වසර පහ තුළ මුහුදු රක්ෂණ ව්‍යාපාරය ද අඩු රඳවා ගැනීමේ අනුපාතයක් වාර්තා කළ අතර 2019 වසර සඳහා එය 48.58%ක් (2018: 50.07%) විය. මෙම පන්තිවලට අදාළ රඳවා ගැනීමේ අනුපාතය පහළ අගයක පැවතියේ හිමිකම් පෑමේ අවදානම අවම කිරීම සඳහා වැඩි ප්‍රතිරක්ෂණ වාරික ප්‍රමාණයක් ප්‍රතිරක්ෂකයන් වෙත මාරු කිරීම හේතුවෙනි.

**වගුව 20**

**දළ ලිඛිත වාරික, ප්‍රතිරක්ෂණ වාරිකය සහ රක්ෂකයන් විසින් රඳවාගැනීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය.**

| පන්තිය | දළ ලිඛිත වාරික ආදායම (රු.'000) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| ගිනි | 6,604,074 | 7,479,910 | 8,597,489 | 8,821,655 | 8,270,010 |
| මුහුදු | 1,996,862 | 2,086,394 | 2,191,654 | 2,403,366 | 2,385,567 |
| මෝටර් රථ වාහන | 42,622,205 | 49,333,000 | 56,047,640 | 62,363,476 | 63,732,958 |
| සෞඛ්‍ය | 8,534,364 | 10,036,518 | 14,649,440 | 14,161,542 | 16,578,713 |
| විවිධ | 6,495,454 | 7,120,742 | 7,866,260 | 8,254,421 | 10,457,778 |
| **අනු එකතුව** | **66,252,959** | **76,056,563** | **89,352,484** | **96,004,460** | **101,425,025** |
| වර්ජනල කැරලි කෝලාහල ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් | 3,018,421 | 3,533,324 | 4,036,283 | 4,581,641 | 6,307,350 |
| **එකතුව** | **69,271,380** | **79,589,888** | **93,388,766** | **100,586,101** | **107,732,375** |

| පන්තිය | ප්‍රතිරක්ෂණ වාරිකය (රු.'000) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| ගිනි | 5,137,042 | 5,959,242 | 6,947,675 | 6,103,609 | 6,061,765 |
| මුහුදු | 1,154,511 | 1,174,266 | 1,177,400 | 1,200,069 | 1,226,580 |
| මෝටර් රථ වාහන | 1,115,036 | 1,233,466 | 2,152,508 | 4,296,451 | 4,229,957 |
| සෞඛ්‍ය | 3,012,362 | 486,984 | 2,682,617 | 1,771,091 | 1,473,033 |
| විවිධ | | 3,213,645 | 3,840,459 | 4,462,894 | 4,821,722 |
| **අනු එකතුව** | **10,418,951** | **12,067,604** | **16,800,660** | **17,834,113** | **17,813,058** |
| වර්ජනල කැරලි කෝලාහල ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් | - | - | 108,750 | 81,656 | 55,564 |
| **එකතුව** | **10,418,951** | **12,067,604** | **16,909,410** | **17,915,770** | **17,868,622** |

| පන්තිය | රඳවාගැනීම් (රු.'000)* | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| ගිනි | 1,467,033 | 1,520,667 | 1,649,814 | 2,718,046 | 2,208,244 |
| මුහුදු | 842,351 | 912,129 | 1,014,254 | 1,203,297 | 1,158,987 |
| මෝටර් රථ වාහන | 41,507,169 | 48,099,534 | 53,895,132 | 58,067,024 | 59,503,000 |
| සෞඛ්‍ය | 12,017,456 | 9,549,533 | 11,966,823 | 12,390,451 | 15,105,680 |
| විවිධ | | 3,907,097 | 4,025,800 | 3,791,528 | 5,636,056 |
| **අනු එකතුව** | **55,834,008** | **63,988,960** | **72,551,823** | **78,170,347** | **83,611,967** |
| වර්ජනල කැරලි කෝලාහල ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් | 3,018,421 | 3,533,324 | 3,927,533 | 4,499,984 | 6,251,787 |
| **එකතුව** | **58,852,429** | **67,522,284** | **76,479,356** | **82,670,331** | **89,863,753** |

| පන්තිය | රඳවාගැනීම දළ ලිඛිත වාරිකයෙන් ප්‍රතිශතයක් ලෙස (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| ගිනි | 22.21 | 20.33 | 19.19 | 30.81 | 26.70 |
| මුහුදු | 42.18 | 43.72 | 46.28 | 50.07 | 48.58 |
| මෝටර් රථ වාහන | 97.38 | 97.50 | 96.16 | 93.11 | 93.36 |
| සෞඛ්‍ය | 79.96 | 95.15 | 81.69 | 87.49 | 91.11 |
| විවිධ | | 54.87 | 51.18 | 45.93 | 53.89 |
| **අනු එකතුව** | **84.27** | **84.13** | **81.20** | **81.42** | **82.44** |
| වර්ජනල කැරලි කෝලාහල ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් | 100.00 | 100.00 | 97.31 | 98.22 | 99.12 |
| **සමස්ථ රඳවාගැනීමේ අනුපාතය** | **84.96** | **84.84** | **81.89** | **82.19** | **83.41** |

### සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2018 හා 2019 දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය රක්ෂණ සමාගම් අතර වත්කම් ව්‍යාප්තිය 21 වගුව සහ 18 ප්‍රස්තාරය මගින් දැක්වේ.

මෙරට පැවති අයහපත් වෙළඳපොළ හා ආර්ථික තත්වයන් හේතුවෙන් 2019 දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි මුළු වත්කම් ප්‍රමාණය 4.01%ක අඩු වේගයකින් වර්ධනය වූ අතර එය රුපියල් මිලියන 203,870 ක් (2018: රුපියල් මිලියන 196,005) විය. පසුගිය වසරවලට සමානව සාමාන්‍ය රක්ෂකයන් අතර විශාලතම වත්කම් කොටස එස්එල්අයිසී හිමි කර ගත් අතර එය රුපියල් මිලියන 71,059ක් (2018: රුපියල් මිලියන 70,854) වටිනා වත්කම් වාර්තා කරමින් සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයෙහි වත්කම් වලින් 34.86% ක් (2018: 36.15%) නියෝජනය කළේය. කෙසේ වුවද, ඔවුන්ගේ වත්කම් කොටස 2018 වසරට සාපේක්ෂව 1.29% ක සුළු අඩු වීමක් පෙන්නුම් කළේය.

අලියාන්ස් ජෙනරල් සමාගමෙහි වත්කම් 2018 වසරේ වාර්තා වූ රුපියල් මිලියන 34,053 ට සාපේක්ෂව 2019 දී 13.23% කින් එනම් රුපියල් මිලියන 29,548 ක් දක්වා කැපී පෙනෙන අඩු වීමක් පෙන්නුම් කළේය. 2019 වසරේ දී සෙලින්කෝ ජෙනරල්, ෆෙයාෆස්ට් හා එන්අයිටීඑෆ් හි මුළු වත්කම් අතරින් පිළිවෙලින් 14.02% (2018: 14.23%), 7.86% (2018: 7.61%) හා 7.20% (2018: 6.08%)ක් නියෝජනය කරමින් තෙවන, සිව් වන හා පස් වන ස්ථාන ලබා ගත්තේය.

රක්ෂණ සමාගම් වල මුළු වත්කම් වලින් 78.43% ක් (2018:81.44%) ඉහළම මට්ටමේ සමාගම පහ අතර සංකේන්ද්‍ර ගත වීම සිත් ගන්නා සුළු කරුණක් වන අතර ඉතිරි 21.57% (2018:18.54%) ක ප්‍රමාණය අනෙකුත් සමාගම් දහය විසින් හිමි කර ගෙන ඇත.


**21 වගුව**

**සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2018 (අ) | | 2019 (ආ) | |
|---|---|---|---|---|
| | (රු.'000) | % | (රු.'000) | % |
| අලියාන්ස් ජෙනරල් | 34,052,708 | 17.37 | 29,547,615 | 14.49 |
| අමානා ජෙනරල් | 3,327,423 | 1.70 | 2,822,858 | 1.38 |
| සෙලින්කෝ ජෙනරල් | 27,899,029 | 14.23 | 28,586,500 | 14.02 |
| කොන්ටිනෙන්ටල් | 5,284,712 | 2.70 | 6,610,621 | 3.24 |
| කෝපරේට්ව් ජෙනරල් | 5,492,747 | 2.80 | 6,622,720 | 3.25 |
| ෆෙයාෆර්ස්ට් | 14,917,948 | 7.61 | 16,025,516 | 7.86 |
| එච්එන්බී ජෙනරල් | 4,773,910 | 2.44 | 5,644,112 | 2.77 |
| එල්ඕඑල්සී ජෙනරල් | 5,505,042 | 2.81 | 7,540,029 | 3.70 |
| එම්බීඑස්එල් | 868,408 | 0.44 | 1,682,661 | 0.83 |
| එන්අයිටීඑෆ් | 11,909,582 | 6.08 | 14,679,797 | 7.20 |
| ඔරියන්ට් | 2,007,118 | 1.02 | 2,208,665 | 1.08 |
| පීපල්ස් | 8,417,568 | 4.29 | 9,600,978 | 4.71 |
| එස්පීඅයිසී | 694,728 | 0.35 | 1,238,079 | 0.61 |
| එස්එල්අයිසී | 70,854,183 | 36.15 | 71,059,444 | 34.86 |
| **එකතුව** | **196,005,105** | **100** | **203,869,596** | **100** |

**18 ප්‍රස්තාරය**

**සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල වත්කම් සංකේන්ද්‍රණය

2018 සහ 2019 වසරවල දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල වත්කම් විවිධ වත්කම් කාණ්ඩ අතර සංකේන්ද්‍රණය වී ඇති ආකාරය 22 වගුව සහ 19 ප්‍රස්තාරය මගින් දැක්වේ.

අඩු අවදානම හා නියාමන අවශ්‍යතා හේතුවෙන් රාජ්‍ය ණය සුරැකුම් පත් ප්‍රධාන ආයෝජන කාණ්ඩය ලෙස පැවතිණි. ඒ අනුව, මුළු වත්කම් අතුරින් රාජ්‍ය ණය සුරැකුම්පත් රුපියල් මිලියන 54,814 ක් (2018: රුපියල් මිලියන 53,189) වූ අතර 26.89% ක් (2018: 27.14% නියෝජනය කළේය.

2019 දෙසැම්බර් 31 දිනට කොටස් සඳහා වූ ආයෝජනයන් රු.මි. 32,329ක් (2018: රුපියල් මිලියන 34,260) වූ අතර 2019 වසරේ දේශීය හා ගෝලීය සංවර්ධනයන් අයහපත් තත්වයක පැවතුණු පසුබිමක් තුළ කොටස් වෙළඳපළ කඩා වැටීමේ ප්‍රතිඵලයක් ලෙස එම ආයෝජනයන් 5.63% ක ඍණාත්මක වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, සමකොටස් ආයෝජනය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ දෙවන විශාලතම වත්කම් කාණ්ඩය නියෝජනය කළ අතර 2019 මුළු වත්කම් අතුරින් 15.86%ක් (2018: 17.48%) එය සතු විය.

බැංකු හා මූල්‍ය සමාගම්වල තැන්පතු මුළු වත්කම් අතුරින් 11.72% ක් නියෝජනය කළ අතර 2018 වසරට සාපේක්ෂව 17.42 ක වර්ධනයක් වාර්තා කරමින් 2019 දී එම ප්‍රමාණය රුපියල් මිලියන 23,897ක් (2018: රුපියල් මිලියන 20,351) ක් විය.

2019 දී රක්ෂණ ඔප්පු හිමියන්ගේ හා අතරමැදියන්ගෙන් ලද වාරික වටිනාකම රුපියල් මිලියන 22,862ක් (2018: රු.මි. 23,668) වූ අතර එය මුළු වත්කම්වලින් 11.21%ක් නියෝජනය කළේය. එය 2018 වසරට සාපේක්ෂව 3.4%ක සුළු අඩු වීමකි.

සංස්ථා ණය ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන ආයෝජන කාණ්ඩයක් වන අතර එය 2019 වසරේ දී මුළු වත්කම් අතරින් 8.15% ක් (2018: 6.89%) නියෝජනය කළේය. 2019 වසරේ දී සංස්ථා ණය රුපියල් මිලියන 16,613ක් (2018: රුපියල් මිලියන 13,505) දක්වා ඉහළ ගිය අතර 2018 වසරට සාපේක්ෂව 23.02%ක වර්ධනයක් වාර්තා කළේය. ශ්‍රී ලංකා මහ බැංකුව වාර්තා කළ ආකාරයට එකී වර්ධනයට වැඩි වශයෙන් හේතු වූයේ 2019 වසර තුළ ඉහළ මට්ටමක පැවති සංස්ථා ණය උපකරණවලට අදාළ වූ පොළී අනුපාතයයි.

**ආයෝජන ආදායම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

2018 හා 2019 වසර සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල විවිධ වත්කම් කාණ්ඩයන්හි ආයෝජන ආදායම්, සාමාන්‍ය ආයෝජනය සහ ආයෝජන ඉපැයීම් අනුපාතය 23 වගුව මගින් දැක්වේ. සාමාන්‍ය ආයෝජනය රුපියල් මිලියන 138,464 ක් වූ අතර එය 2018 වසරේ වාර්තා වූ රුපියල් මිලියන 129,787 අගයට සාපේක්ෂව 6.69% ක වර්ධනයකි. 2019 වසරේදී මුළු ආයෝජන ආදායම රුපියල් මිලියන 12,578 ක් (2018: රුපියල් මිලියන 9,380) වූ අතර සමස්ථ ආයෝජන ඉපැයීම 9.08% (2018: 7-23%) දක්වා ලඟා විය.


පසුගිය වසරට සමානව, සාමාන්‍ය ආයෝජනය අතරින් විශාලතම කොටස නියෝජනය කරන රාජ්‍ය ණය සුරැකුම්පත් වල සිදු කෙරුණු සාමාන්‍යය ආයෝජන ප්‍රමාණය රුපියල් මිලියන 54,001 ක් (2018: 47,534) වූ අතර 9.17% (2018: 9.91) ක් වූ ආයෝජන ඉපැයීමක් 2019 වසරේ දී රාජ්‍ය ණය සුරැකුම්පත් වලට අදාළ පොළී අනුපාතය පහළ දැමීම නිසා උත්පාදනය කර හැකි විය.

කොටස් වල සාමාන්‍ය ආයෝජනය, ආයෝජන කළඹෙහි සැලකිය යුතු කොටසක් නියෝජනය කරන අතර රුපියල් මිලියන 2,872 ක ආයෝජන ආදායමක් ජනනය කර පසුගිය වසරට සාපේක්ෂව රුපියල් මිලියන 2,567 ක වර්ධනයක් පෙන්නුම් කිරීමෙහි ප්‍රතිඵලය ලෙස 8.63% (2018:0.84%) ක ආයෝජන ඉපැයීමක් වාර්තා කර ඇත. ප්‍රධාන වශයෙන් කොටස් වල ආයෝජනය ආදායමෙහි වැඩිවීම, එක් විශාල රක්ෂකයකු විසින් ලැයිස්තුගත නොකල උප සමාගමක ආයෝජනයෙන් ලද ලාභාංශ ආදායම වූ රුපියල් මිලියන 2,783 ක් හේතුවෙන් සිදු විය.

**22 වගුව**
**2018 හා 2019 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍ර ගත වීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| වත්කම් කාණ්ඩය | 2018 (අ) | | 2019 (ආ) | |
|---|---|---|---|---|
| | (රු.'000) | % | (රු.'000) | % |
| රජයේ ණය සුරැකුම්පත් | 53,189,008 | 27.14 | 54,813,771 | 26.89 |
| ස්කන්ධ | 34,259,179 | 17.48 | 32,329,010 | 15.86 |
| සංස්ථා ණය | 13,504,819 | 6.89 | 16,613,054 | 8.15 |
| ඉඩම් හා ගොඩනැගිලි | 11,984,083 | 6.11 | 12,205,956 | 5.99 |
| තැන්පතු | 20,351,392 | 10.38 | 23,896,705 | 11.72 |
| ඒකක භාර | 1,229,474 | 0.63 | 1,962,072 | 0.96 |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ | 13,059,051 | 6.66 | 13,071,993 | 6.41 |
| ඔප්පු හිමියන් සහ අතරමැදියන් වෙතින් ලැබිය යුතු වාරිකය | 23,666,720 | 12.07 | 22,862,086 | 11.21 |
| දේපළ පිරියත හා උපකරණ | 7,314,626 | 3.73 | 8,245,249 | 4.04 |
| අනෙකුත් වත්කම් | 14,659,052 | 7.48 | 14,863,884 | 7.29 |
| මුදල් හා මුදල් සමාන දෑ | 2,787,702 | 1.42 | 3,005,818 | 1.47 |
| **එකතුව** | **196,005,106** | **100** | **203,869,597** | **100** |

**19 ප්‍රස්තාරය**
**2018 හා 2019 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍ර ගත වීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**




බැංකු හා මූල්‍ය සමාගම්වල පොළී ආදායම ඇතුළුව තැන්පතු මගින් රුපියල් මිලියන 2,589ක (2018: රුපියල් මිලියන 2,139) ආයොජන ආදායමක් උත්පාදනය කරන ලද අතර එමගින් 11.70%ක (2018: 11.07%) ආයෝජන ඉපැයීමක් පෙන්නුම් කෙරිණි. ඒ අනුව, සියළු මූල්‍ය ආයෝජන අතරින් තැන්පතු වැඩිම ආයෝජන ඉපැයීමේ අනුපාතය ලෙස වාර්තා වේ.

තවද, රුපියල් මිලියන 15,060ක (2018: රුපියල් මිලියන 13,130) සාමාන්‍ය ආයෝජනයක් වාර්තා කරමින් සංස්ථා ණය තවදුරටත් ආකර්ෂණීය තත්වයේ පැවති අතර 11.44%ක (2018: 11.74%) ආයෝජන ඉපැයීමක් නියෝජනය කළේය.

**23 වගුව**

**සවිස්තරාත්මක ආයෝජන ආදායම සහ සාමාන්‍ය ආයෝජන - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| | 2018 (අ) | | | 2019 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | ආයෝජන ආදායම (රුපියල් '000) | සාමාන්‍ය ආයෝජන (රුපියල් '000) | ආයෝජන ඉපැයීම් අනුපාතය (%) | ආයෝජන ආදායම (රුපියල් '000) | සාමාන්‍ය ආයෝජන (රුපියල් '000) | ආයෝජන ඉපැයීම් අනුපාතය (%) |
| **රජයේ ණය සුරැකුම්පත්** | 4,712,050 | 47,534,405 | 9.91 | 4,950,605 | 54,001,390 | 9.17 |
| - භාණ්ඩාගාර බැඳුම්කර | 2,499,753 | - | - | 2,743,083 | - | - |
| - භාණ්ඩාගාරබිල්පත් | 1,315,775 | - | - | 1,363,360 | - | - |
| - වෙනත් (ප්‍රති මිලදීගැනීම් ගිවිසුම) | 896,522 | - | - | 844,162 | - | - |
| **ස්කන්ධ** | 305,772 | 36,307,360 | 0.84 | 2,872,148 | 33,294,094 | 8.63 |
| - ලාභ/අලාභ | (259,131) | - | - | 88,909 | - | - |
| - ලාභාංශ | 564,903 | - | - | 2,783,239 | - | - |
| **සාංගමික ණය** | 1,541,159 | 13,130,058 | 11.74 | 1,722,851 | 15,058,937 | 11.44 |
| - ණයකර | 1,483,310 | - | - | 1,623,188 | - | - |
| - වාණිජ පත්‍රිකා | 57,849 | - | - | 99,663 | - | - |
| **ඉඩම් හා ගොඩනැගිලි** | - | 11,676,822 | - | - | 12,095,019 | - |
| **තැන්පතු** | 2,139,716 | 19,336,823 | 11.07 | 2,588,873 | 22,124,048 | 11.70 |
| - බැංකු | 1,669,174 | - | - | 2,054,773 | - | - |
| - මූල්‍ය සමාගම් | 470,543 | - | - | 534,100 | - | - |
| **ඒකක භාර** | 88,013 | 1,378,872 | 6.38 | 58,203 | 1,595,773 | 3.65 |
| **වෙනත්** | 593,076 | 422,698 | - | 384,991 | 294,799 | - |
| **එකතුව** | **9,379,785** | **129,787,038** | **7.23** | **12,577,671** | **138,464,061** | **9.08** |

**රක්ෂණ සමාගම්වල නුබුන්වත් තත්වය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

පැහැර හැරීමේ අවදානම අවම කිරීම හා රක්ෂණ අංශය තුළ වැඩි විනිවිදභාවයක් හා නම්‍යශීලීභාවයක් ඇති කිරීම අරමුණු කොටගෙන, 2019 වසරේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් එහි අධීක්ෂණ හා නියාමන රාමුව ශක්තිමත් කරමින්, සාමාන්‍ය රක්ෂණ ඔප්පු හිමියන්ගේ සුරක්ෂිත බව ඉහළ නැංවීම සඳහා අවදානම් පාදක ප්‍රාග්ධනයට (RBC) අදාළ දිගු කාලීන හා යෝග්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු විය.

වගකීම් වලට ආවේණික වූ ප්‍රාග්ධනයට අදාළ අවධානම් ප්‍රමාණය හා නොපෙනෙන පාඩු පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමේ ප්‍රමාණවත් බව, අවධානම් පාදක ප්‍රාග්ධන ක්‍රමවේදය මගින් මනිනු ලැබේ.

2015 නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධනය) (RBC) රීතිවලට අනුව සාමාන්‍ය රක්ෂකයන්ගේ අවදානම් පාදක ප්‍රාග්ධනයට (RBC) අදාළ විස්තර 24, 25 හා 26 යන වගු මගින් පෙන්නුම් කෙරේ. තවද, 2019 ජනවාරි 01 දින සිට සමාගම් විසින් "වත්කම් භාවිතා කිරීමේ හිමිකම" හා "කල්බදු වගකීම" ලෙස කල්බදු ගිවිසුම් සඳහා ශේෂ පත්‍රයේ හඳුනා ගත යුතුය යන අවශ්‍යතාව ඇතුළත් ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි අංක 16 ප්‍රකාරව 2019 වසර සඳහා වන අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) විස්තර ඉහත වගු මගින් පෙන්නුම් කෙරේ. ඒ අනුව, ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි අංක 16 අදාළ කර ගැනීම පිළිබඳ පැහැදිලි කිරීම - ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2015 නුබුන්වත් ආන්තික රීතිවලට අනුව වන කල්බදු සපයන ලද අතර ඒවා 2019 දෙසැම්බර් 31 දින සිට බලාත්මක විය.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ 2018 හා 2019 වසර සඳහා වාර්තා වූ සාමාන්‍ය ප්‍රාග්ධන ප්‍රමාණය අනුපාතය පිළිවෙලින් 166%ක් හා 213%ක් විය. ගෝලීය හා දේශීය වශයෙන් අභියෝගාත්මක ව්‍යාපාර පරිසර පැවති තත්වයක් තුළ පසුගිය වසර මෙන් නොව 2019 දෙසැම්බර් 31 දිනට අවම ප්‍රමාණ්‍ය ප්‍රාග්ධන අනුපාතය වූ 120%ක් වැනි බොහෝ ඉහළින් වන ප්‍රමාණ්‍ය ප්‍රාග්ධන අනුපාතයක් (CAR) වාර්තා කිරීමට සාමාන්‍ය රක්ෂකයන් සියල්ලන්ම සමත් වී තිබේ. 24 වගුවේ දක්වා ඇති ආකාරයට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අවදානම් පාදක ප්‍රාග්ධනය (RBC) පිළිබඳ බලාත්මක කිරීමේ උපායමාර්ගයට අනුව සියළු සාමාන්‍ය රක්ෂණ සමාගම් 2019 දෙසැම්බර් 31 දිනට 160% වන බලාත්මක කිරීමේ මට්ටමට වඩා ඉහළ ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාතයක් (CAR) වාර්තා කළේය.

තවද, 2019 දෙසැම්බර් 31 දිනට රු.මි. 500ක් වූ අවම මුළු ප්‍රාග්ධනයට අනුකූල වීමට අමානා සාමාන්‍ය සමාගම හැර සියළු රක්ෂණ සමාගම්වලට හැකි විය.

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි සාමාන්‍ය රක්ෂණ කාණ්ඩය විසින් 2018 හා 2019 දෙසැම්බර් 31 දිනට වාර්තා කරන ලද ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතය 563% හා 660% ක් වූ අතර එය පහත 24 වගුවෙහි සැලකිල්ලට ගෙන නොමැත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතය (CAR) ගණනය කරන්නේ කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ආවරණ සැලකිල්ලට ගෙන වුවද එම අරමුණ සඳහා යොදා ගන්නා වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් අරමුදල 2008 අංක 1 දරණ  වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් රෙගුලාසිය ප්‍රකාරව ස්ථාපිත කර ඇති බව අවධාරණය කරමින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව මගින් නියෝග පනවන ලදී. ඒ අනුව, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ආවරණ නොමැතිව ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතය (CAR) 120%ක් වූ අවම ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතයට (CAR) වඩා බොහෝ සෙයින් අඩු මට්ටමක පැවති අතර 2018 දෙසැම්බර් 31 හා 2019 දෙසැම්බර් 31 දිනට 331% සහ 399% සෘණාත්මක අනුපාතයන් පෙන්නුම් කර ඇත.

### 24 වගුව
### සමාගම් අනුව නුබුන්වත් තත්වය පිළිබඳ විශ්ලේෂණය* 2018 හා 2019 වර්ෂවල දෙසැම්බර් 31 වන දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර

| රක්ෂකයා | 2018 දෙසැම්බර් 31 වන දිනට (අ) | | | 2019 දෙසැම්බර් 31 වන දිනට (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC) (රු.'000) | නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR) (රු.'000) | ප්‍රමාණවත් ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාතය (CAR) (%) | පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC) (රු.'000) | නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR) (රු.'000) | ප්‍රමාණවත් ප්‍රාග්ධන ප්‍රාමාණ්‍ය අනුපාතය (CAR) (%) |
| අලියාන්ස් ජෙනරල් | 8,144,763 | 3,632,835 | 224 | 6,515,992 | 3,901,094 | 167 |
| අමානා ජෙනරල් | 514,583 | 276,025 | 186 | 493,293 | 247,534 | 199 |
| සෙලින්කෝ ජෙනරල් | 5,260,754 | 3,044,281 | 173 | 5,978,705 | 3,220,685 | 186 |
| කොන්ටිනන්ටල් | 1,545,782 | 623,260 | 248 | 1,836,265 | 721,772 | 254 |
| කෝපරේටිව් ජෙනරල් | 1,353,242 | 759,566 | 178 | 1,698,652 | 907,055 | 187 |
| ෆෙයාෆර්ස්ට් | 3,188,331 | 1,723,550 | 185 | 3,960,925 | 2,187,118 | 181 |
| එච්එන්බී ජෙනරල් | 1,171,520 | 585,201 | 200 | 1,391,752 | 616,879 | 226 |
| එල්ඕඑල්සී ජෙනරල් | 1,093,268 | 634,029 | 172 | 1,742,118 | 832,159 | 209 |
| එම්බීඑස්එල් | (244,292) | 136,264 | (179) | 522,190 | 283,548 | 184 |
| ඔරියන්ට් | 628,248 | 242,456 | 259 | 768,495 | 255,346 | 301 |
| පීපල්ස් | 3,036,641 | 1,279,479 | 237 | 3,141,246 | 1,264,299 | 248 |
| සණස ජෙනරල් | 116,699 | 148,533 | 79 | 533,062 | 256,532 | 208 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 25,110,666 | 12,524,166 | 200 | 26,163,057 | 12,350,481 | 212 |
| **එකතුව** | **50,920,206** | **25,609,646** | **166** | **54,745,752** | **27,044,502** | **213** |

* සටහන:2019 වසර සඳහා වාර්තා කළ සංඛ්‍යාවන් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ වාර්ෂික ආදායම් වාර්තාවෙන් ලබා ගන්නා ලද අතර එම්බීඑස්එල් සඳහා පමණක් වාර්ෂික වාර්තාවට ඉදිරිපත් කළ සංඛ්‍යාවන් යොදා ගන්නා ලදී

### සමාගම් අනුව 2019 හා 2018 දෙසැම්බර් 31 දිනට පවත්නා මුළු ප්‍රාග්ධනය පිළිබඳ විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළව 2019 හා 2018 දෙසැම්බර් 31 දිනට පවත්නා මුළු ප්‍රාග්ධනය 25 වගුවෙන් දැක්වේ. නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධනය) රීතිවලට අනුව පවත්නා මුළු ප්‍රාග්ධනය යනු පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනයේ හා දෙවන ස්ථරයේ ප්‍රාග්ධනෙයේ සහ අඩු කිරීම් ලෙස දක්වා ඇති අඩු කරන අයිතමවල එකතුවයි.

2019 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි සමස්ථ මුළු ප්‍රාග්ධනය රුපියල් මිලියන 54,746 ක් වූ අතර එය 2018 දෙසැම්බර් 31 දිනට වාර්තා වූ රුපියල් මිලියන 50,920ට සාපේක්ෂව 7.51% ක සුළු වැඩි වීමකි. සමාගමේ නිකුත් කළ සහ සම්පූර්ණයෙන් ගෙවීම් සිදු කළ සාමාන්‍ය කොටස්වල ප්‍රාග්ධන සංචිත සහ රඳවාගත් ඉපැයුම් සඳහා කළ අනෙකුත් ගැළපුම් නියෝජනය කරන ලද පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනය රුපියල් මිලියන 81,474ක් (2018: රුපියල් මිලියන 84,946) විය. 2015 නුබුන්වත් ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) නීති අනුව, දෙවන ස්ථරයේ ප්‍රාග්ධන අගයට රුපියල් මිලියන 8,486 ක් වූ පළමු වන ස්ථරයේ ප්‍රාග්ධනයෙන් 50% ක ප්‍රමාණයක් ඉක්මවිය නොහැකි වේ. 2019 දී පවත්නා මුළු ප්‍රාග්ධනයෙන් කළ අඩුකිරීම් රුපියල් මිලියන 35,214 ක් වූ අතර එය ණය හා අත්තිකාරම්, පූර්ව ගෙවීම්, භාණ්ඩ, ඇපයට තබන ලද වත්කම්, විලම්භිත ආදායම් බදු යනාදී පිළිගත නොහැකි වත්කම්වලින් සමන්විත විය.

සාමාන්‍ය රක්ෂණ කාණ්ඩය ලෙස ජාතික රක්ෂණ භාර අරමුදලෙහි 2018 දෙසැම්බර් 31 දිනට හා 2019 දෙසැම්බර් 31 දිනට පවත්නා මුළු ප්‍රාග්ධනය රුපියල් මිලියන 6,459 ක් හා රුපියල් මිලියන 6,540 ක් වූ අතර එය 25 වගුවෙහි සැලකිල්ලට භාජනය කර ඇත.

කෙසේ වුවද, ජාතික රක්ෂණ භාර අරමුදලට උපදෙස් ලබාදී තිබුණේ වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ආවරණ නොමැතිව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා වෙනම රුපියල් මිලියන 500 ක අවම මුළු ප්‍රාග්ධන අවශ්‍යතාවට අනුකූල වන ලෙසයි. ඒ අනුව, වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ආවරණ නොමැතිව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කාණ්ඩයෙහි 2018 දෙසැම්බර් 31 දිනට හා 2019 දෙසැම්බර් 31 දිනට මුළු ප්‍රාග්ධනය පිළිවෙලින් ඍණාත්මක රුපියල් මිලියන 2,083 හා රුපියල් මිලියන 3,822 ක් විය. මෙම කරුණු ජාතික රක්ෂණ භාර අරමුදල හා භාණ්ඩාගාරය වෙත අවධාරණය කරන ලද අතර රක්ෂණ හා ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයන් වෙන් කිරීමට අනුකූල වීම ඔවුන්ගේ අපේක්ෂාවයි.

### 25 වගුව
### 2018 හා 2019 වර්ෂවල දෙසැම්බර් 31 වන දිනට සමාගම් අනුව පවත්නා මුළු ප්‍රාග්ධනය විශ්ලේෂණය* සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

| රක්ෂකයා | 2018 දෙසැම්බර් 31 වන දිනට (අ) පවත්නා මුළු ප්‍රාග්ධනය (රු.'000) | 2019 දෙසැම්බර් 31 වන දිනට (ආ) | | | |
|---|---|---|---|---|---|
| | | පළමු වන ස්ථරයේ (රු.'000) | පළමු වන ස්ථරයේ (රු.'000) | අඩුකිරීම් (%) | පවත්නා මුළු ප්‍රාග්ධනය (රු.'000) |
| අලියාන්ස් ජෙනරල් | 8,144,763 | 9,262,690 | - | 2,746,697 | 6,515,992 |
| අමානා ජෙනරල් | 514,583 | 1,386,604 | 302,432 | 1,195,743 | 493,293 |
| සෙලින්කෝ ජෙනරල් | 5,260,754 | 11,059,405 | 468,226 | 5,548,926 | 5,978,705 |
| කොන්ටිනන්ටල් | 1,545,782 | 1,966,790 | - | 130,525 | 1,836,265 |
| කෝපරේටිව් ජෙනරල් | 1,353,242 | 2,182,940 | 421,742 | 906,031 | 1,698,652 |
| ෆෙයාෆර්ස්ට් | 3,188,331 | 5,789,907 | - | 1,828,982 | 3,960,925 |
| එච්එන්බී ජෙනරල් | 1,171,520 | 1,546,966 | - | 155,215 | 1,391,752 |
| එල්ඕඑල්සී ජෙනරල් | 1,093,268 | 2,021,724 | - | 279,606 | 1,742,118 |
| එම්බීඑස්එල් | (244,292) | 892,131 | (3,400) | 366,541 | 522,190 |
| ඔරියන්ට් | 628,248 | 858,278 | - | 89,783 | 768,495 |
| පීපල්ස් | 3,036,641 | 3,652,950 | - | 511,704 | 3,141,246 |
| සණස ජෙනරල් | 116,699 | 638,570 | - | 105,508 | 533,062 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 25,110,666 | 40,215,323 | 7,296,794 | 21,349,060 | 26,163,057 |
| **එකතුව** | **50,920,206** | **81,474,279** | **8,485,794** | **35,214,321** | **54,745,752** |

* සටහන:2019 වසර සඳහා වාර්තා කළ සංඛ්‍යාවන් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ වාර්ෂික ආදායම් වාර්තාවෙන් ලබා ගන්නා ලද අතර එම්බීඑස්එල් සඳහා පමණක් වාර්ෂික වාර්තාවට ඉදිරිපත් කළ සංඛ්‍යාවන් යොදා ගන්නා ලදී.

### 2018 හා 2019 දෙසැම්බර් 31 දිනට නියමිත අවදානම් ප්‍රාග්ධනය සමාගම් අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

නියමිත අවදානම් ප්‍රාග්ධනය ණය අවදානම, සංකේන්ද්‍රණ අවදානම, ප්‍රතිරක්ෂණ අවදානම, වෙළඳපළ අවදානම, රක්ෂණ වගකීම් අවදානම හා මෙහෙයුම් අවදානම යනාදියෙන් සමන්විත වේ. 2018 හා 2019 වර්ෂවල දෙසැම්බර් 31 වන දිනට අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාවට අදාළ විවිධ අවදානම් ගාස්තුවල සමාගම් වශයෙන් පැවති සංයුතිය 26 වගුව මගින් දැක්වේ. විවිධාංගීකරණයෙන් අනතුරුව සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් වාර්තා කරන ලද මුළු නියමිත අවදානම් ප්‍රාග්ධනය රුපියල් මිලියන 27,045 ක් (2018: රුපියල් මිලියන 25,610) විය. සාමාන්‍ය රක්ෂණ අංශය 2019 දී විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන ගාස්තුවලින් 31.15% ක් (2018: 31.45%) නියෝජනය කළ ප්‍රධාන අවදානම් කාණ්ඩය වන සංකේන්ද්‍රණ අවදානමට විශාල වශයෙන් නිරාවරණය වන බවට සැලකේ. 2018 දී වාර්තා වූ රුපියල් මිලියන 10,675 ට සාපේක්ෂව 2019 දී රුපියල් මිලියන 11,050 ක් වූ වගකීම් අවදානම් ගාස්තුව රක්ෂණ කර්මාන්තයේ දෙවන විශාලතම අවදානම් කාණ්ඩය විය. කෙසේ වුවද, 26 වගුවෙන් දැක්වෙන ආකාරයට පසුගිය වසරේ මෙන් ම සාමාන්‍ය රක්ෂකයන්ගෙන් බහුතරය මුහුණ දුන් ප්‍රධාන අවදානම, වගකීම් අවදානම වේ. විවිධාංගීකරණයට පෙර මුළු අවදානම් ප්‍රාග්ධන ගාස්තුවලින් 29.28% ක් වෙළඳපොළ අවදානම නියෝජනය කළ අතර තෙවන විශාලතම අවදානම් කාණ්ඩය විය. එය 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී 8.90% ක සුළු ඉහළ යාමකි. ඒ අනුව, මෙම අවදානම් කාණ්ඩ තුන විවිධාංගීකරණයට පෙර මුළු ප්‍රාග්ධන ගාස්තුවලින් 90% ක් නියෝජනය කළේය.

**26 වගුව**

**2018 සහ 2019 යන වර්ෂවල දෙසැම්බර් 31 වන දිනට නියමිත අවදානම් ප්‍රාග්ධනය පිළිබඳ සමාගම් අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| රක්ෂකයා | 2018 දෙසැම්බර් 31 වන දිනට (අ) (රු.'000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම් | සංකේන්ද්‍රණ අවදානම් | වෙළඳපල අවදානම් | ප්‍රතිරක්ෂණ අවදානම් | වගකීම් අවදානම් | මෙහෙයුම් අවදානම් | විවිධාංගකරණයට පෙර නියමිත අවදානම් ප්‍රාග්ධනය | විවිධාංගකරණයට පසු නියමිත අවදානම් ප්‍රාග්ධනය |
| අලියාන්ස් ජෙනරල් | 171,105 | 1,756,511 | 850,202 | 39,489 | 2,274,785 | 292,628 | 5,384,719 | 3,632,835 |
| අමානා ජෙනරල් | 19,073 | 156,677 | 35,724 | 11,204 | 160,367 | 29,784 | 412,829 | 276,025 |
| සෙලින්කෝ ජෙනරල් | 200,544 | 1,310,057 | 784,432 | 201,960 | 1,724,169 | 244,779 | 4,465,941 | 3,044,281 |
| කොන්ටිනන්ටල් | 110,459 | 72,465 | 238,212 | 23,173 | 434,587 | 46,655 | 925,551 | 623,260 |
| කෝපරේටිව් ජෙනරල් | 102,980 | 216,076 | 296,847 | 8,623 | 429,092 | 52,797 | 1,106,416 | 759,566 |
| ෆෙයාෆර්ස්ට් | 44,858 | 736,958 | 542,124 | 172,824 | 847,586 | 109,183 | 2,453,533 | 1,723,550 |
| එච්එන්බී ජෙනරල් | 49,594 | 201,164 | 103,698 | 13,447 | 453,106 | 42,457 | 863,466 | 585,201 |
| එල්ඕඑල්සී ජෙනරල් | 12,200 | 130,323 | 185,458 | 21,123 | 526,920 | 49,737 | 925,762 | 634,029 |
| එම්බීඑස්එල් | 4,164 | 81,762 | 26,363 | 4,666 | 69,387 | 8,651 | 194,994 | 136,264 |
| ඔරියන්ට් | 24,023 | 124,491 | 32,290 | 3,758 | 156,201 | 17,973 | 358,736 | 242,456 |
| පීපල්ස් | 136,663 | 612,648 | 237,891 | 6,239 | 802,455 | 78,781 | 1,874,677 | 1,279,479 |
| සණස ජෙනරල් | 5,793 | 87,400 | 43,982 | 1,852 | 51,805 | 7,040 | 197,873 | 148,533 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 144,615 | 5,456,490 | 6,496,868 | 102,198 | 2,744,674 | 690,886 | 15,635,730 | 12,524,166 |
| **එකතුව** | **1,026,070** | **10,943,021** | **9,874,091** | **610,558** | **10,675,134** | **1,671,351** | **34,800,226** | **25,609,646** |

| රක්ෂකයා | 2019 දෙසැම්බර් 31 වන දිනට (ආ) (රු.'000) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය අවදානම් | සංකේන්ද්‍රණ අවදානම් | වෙළඳපල අවදානම් | ප්‍රතිරක්ෂණ අවදානම් | වගකීම් අවදානම් | මෙහෙයුම් අවදානම් | විවිධාංගකරණයට පෙර නියමිත අවදානම් ප්‍රාග්ධනය | විවිධාංගකරණයට පසු නියමිත අවදානම් ප්‍රාග්ධනය |
| අලියාන්ස් ජෙනරල් | 150,270 | 2,112,929 | 809,124 | 56,456 | 2,314,253 | 271,122 | 5,714,155 | 3,901,094 |
| අමානා ජෙනරල් | 20,821 | 155,490 | 14,344 | 8,341 | 144,798 | 26,585 | 370,379 | 247,534 |
| සෙලින්කෝ ජෙනරල් | 251,653 | 1,434,138 | 889,040 | 196,997 | 1,621,495 | 246,035 | 4,639,358 | 3,220,685 |
| කොන්ටිනන්ටල් | 101,481 | 106,767 | 258,939 | 26,567 | 523,304 | 57,573 | 1,074,631 | 721,772 |
| කෝපරේටිව් ජෙනරල් | 98,794 | 235,237 | 379,357 | 14,822 | 537,405 | 60,446 | 1,326,062 | 907,055 |
| ෆෙයාෆර්ස්ට් | 50,803 | 942,834 | 880,683 | 141,810 | 839,011 | 121,529 | 2,976,669 | 2,187,118 |
| එච්එන්බී ජෙනරල් | 60,806 | 211,162 | 119,661 | 12,983 | 463,003 | 49,564 | 917,179 | 616,879 |
| එල්ඕඑල්සී ජෙනරල් | 22,708 | 136,823 | 352,249 | 39,798 | 619,815 | 63,866 | 1,235,259 | 832,159 |
| එම්බීඑස්එල් | 7,590 | 228,732 | 30,136 | 4,380 | 82,290 | 16,600 | 369,727 | 283,548 |
| ඔරියන්ට් | 25,556 | 147,984 | 15,740 | 3,229 | 166,580 | 19,821 | 378,910 | 255,346 |
| පීපල්ස් | 170,641 | 241,118 | 504,659 | 17,730 | 847,603 | 85,957 | 1,867,709 | 1,264,299 |
| සණස ජෙනරල් | 7,875 | 173,878 | 66,600 | 1,284 | 57,945 | 11,500 | 319,082 | 256,532 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 187,158 | 5,313,217 | 6,432,786 | 67,442 | 2,832,715 | 704,002 | 15,537,320 | 12,350,481 |
| **එකතුව** | 1,156,156 | 11,440,310 | 10,753,318 | 591,840 | 11,050,217 | 1,734,600 | 36,726,441 | 27,044,502 |

* සටහන:2019 වසර සඳහා වාර්තා කළ සංඛ්‍යාවන් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ වාර්ෂික ආදායම් වාර්තාවෙන් ලබා ගන්නා ලද අතර එම්බීඑස්එල් සඳහා පමණක් වාර්ෂික වාර්තාවට ඉදිරිපත් කළ සංඛ්‍යාවන් යොදා ගන්නා ලදී.

### ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දරන ලද ශුද්ධ හිමිකම් පෑම්, ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය, ශුද්ධ වියදම්, ශුද්ධ වියදම් අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු

27 වගුවේ සහ 20 ප්‍රස්තාරයේ දැක්වෙන පරිදි, වර්ජනල කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ඇතුළුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළ ප්‍රධාන උප පන්තිවල මුළු ශුද්ධ ඉපැයූ වාරික රුපියල් මිලියන 88,002 ක් වූ අතර එය 2018 වසරේදී වාර්තා වූ රුපියල් මිලියන 80,863 ක අගයට සාපේක්ෂව 8.83% ක වර්ධනයක් වාර්තා කොට තිබේ. දළ ලිඛිත වාරිකයේ වර්ධන අනුපාතය 2019 වසරේ ශුද්ධ ඉපැයූ වාරිකයේ වාර්තා වූ වර්ධන අනුපාතයට හිතකර අන්දමින් බලපෑවේය.

පසුගිය වසර පහ තුළ වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ඇතුළුව දරණ ලද ශුද්ධ හිමිකම් පෑම් ප්‍රමාණය ඉහළ ගියේය. කෙසේ වුවද, 2019 වසර තුළ දී සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කළ එය රුපියල් මිලියන 58,436 ක් වූ අතර පසුගිය වසරට සාපේක්ෂව වර්ධනය 11.28% (2018: 9.85%) විය. පසුගිය වසරට සාපේක්ෂව 2019 වසර තුළ විවිධ රක්ෂණ ව්‍යාපාරය හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයෙහි සියළු උප පන්ති මගින් දරණ ලද ශුද්ධ හිමිකම් පෑම් ඉහළ ගොස් ඇත.

පෙර වසරවල් හා සමානවමල මෝටර් රථ වාහන රක්ෂණ ව්‍යාපාර කටයුතු මගින් ඉහළම ශුද්ධ ඉපැයූ වාරිකය වාර්තා කොට ඇති අතර එම අගය රුපියල් මිලියන 58,753 ක් (2018: රුපියල් මිලියන 56,891) වූ අතර මුළු ශුද්ධ ඉපැයූ වාරිකයෙන් 71.27% ක් (2018: 74.05%) නියෝජනය කළේය. එය 2018 වසර තුළ වාර්තා වූ ප්‍රමාණයට වඩා 3.27%ක් පමණ වූ සුළු වැඩි වීමකි. තවද, මෝටර් රථ රක්ෂණ ව්‍යාපාරය රුපියල් මිලියන 34,704ක (2018: රුපියල් මිලියන 34,682) ශුද්ධ හිමිකම් පෑම් ප්‍රමාණයක් දරමින් විශාලම උප අංශය ලෙස තම තත්වය පවත්වා ගැනීමට සමත් වූ අතර එම ප්‍රමාණය වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ඇතුළුව 2019 වසර තුළ දැරූ මුළු හිමිකම් පෑම් අතරින් 59.39%ක් (2018: 66.04%) නියෝජනය කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 59.07%ක (2018: 60.96%) ශුද්ධ හිමිකම් පෑම් අනුපාතයක් ඇති විය.

සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු මගින් මුළු ශුද්ධ ඉපැයූ වාරිකයෙන් 18.58% ක් නියෝජනය කරමින් රුපියල් මිලියන 15,315 ක් වශයෙන් (2018: රුපියල් මිලියන 12,386) ඉහළම ශුද්ධ ඉපැයූ වාරිකය වාර්තා කෙරුණු අතර එමගින් පෙර වර්ෂයට සාපේක්ෂව 2019 වසරේ දී 23.65% ක වර්ධනයක්ද එය වාර්තා කෙරිණි. මෙම ව්‍යාපාර පන්තියේ ව්‍යාපාර කටයුතු මගින් දරන ලද ශුද්ධ හිමිකම් පෑම්හි දෙවන ස්ථානයට ඉහළම අගය වන රුපියල් මිලියන 16,739ක් (2018: රුපියල් මිලියන 12,148) වාර්තා කර තිබෙන අතර වී පසුගිය වසරට සාපේක්ෂව වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ඇතුළත් මුළු දරන ලද ශුද්ධ හිමිකම් පෑම්වලින් 37.79%ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමිනි. කෙසේ වුවද, සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල, ඉහළ පිරිවැයද සියලු රක්ෂණ සමාගම් වෙත අභියෝගයක් වන අතර 2018 වසරේ වාර්තා වූ 98.08%ට සාපේක්ෂව ඉහළම ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය වන 109.30%ක් වාර්තා කළේය.

විවිධ රක්ෂණ ව්‍යාපාර කටයුතු රුපියල් මිලියන 5,008 ක ශුද්ධ ඉපැයූ වාරික වාර්තා කළ අතර 2018 වර්ෂයේදී වාර්තා වූ රුපියල් මිලියන 4,492 ක අගයට වඩා 11.48% ක වර්ධනයක් අත්කර ගත්තේය.

ශුද්ධ ඉපැයූ වාරිකයෙහි වර්ධනයක් තිබුණද විවිධ රක්ෂණ ව්‍යාපාරය මගින් දරණ ලද ශුද්ධ හිමිකම් පෑම් 2018 වසරට සාපේක්ෂව 5.81%කින් පහළ බැස තිබුණි. තවද, මෙම ව්‍යාපාර පන්තිය මගින් 2018 වාර්තා කරන ලද ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය වූ 76.97% ට සාපේක්ෂව 2019 දී වාර්තා වූ ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය 65.03%ක් විය. එය 11.94%ක පහළ බැසීමකි. විවිධ රක්ෂණ පන්තිය මගින් දරණ ලද එම පහළ බැසීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය මගින් 2018 වසර තුළ දරණ ලද රුපියල් මිලියන 1,358ක් වූ ශුද්ධ හිමිකම් පෑම්වලට සාපේක්ෂව 2019 වසර තුළ දරණ ලද රුපියල් මිලියන 893ක් වූ ශුද්ධ හිමිකම් පෑම්වල අඩු වීමයි.

ගිනි රක්ෂණ ව්‍යාපාර කටයුතුවල දරන ලද ශුද්ධ හිමිකම් පෑම් 2018 වසරේදී වාර්තා වූ රුපියල් මිලියන 1,697 සිට රුපියල් මිලියන 2,581 දක්වා 52.12%කින් 2019 වසරේදී ඉහළ ගොස් තිබේ.

මෙම උප පන්තිය 2018 වසර තුළ වාර්තා කළ 86.68% ක ශුද්ධ හිමිකම් පෑම් අනුපාතයට සාපේක්ෂව 2019 දී 118.20%ක ඉහළම ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය වාර්තා කළේය. මෙයට ප්‍රධාන හේතුව ගිනි රක්ෂණය යටතේ දේපළවලට කැපී පෙනෙන හානි ඇති කරමින් අහිතකර කාලගුණික තත්වයන් මගින් අඛණ්ඩ අවදානමක් ඇති කිරීම හා 2019 අප්‍රේල් මස එල්ල වූ පාස්කු ප්‍රහාරයයි.

පෙර වසරවල් හා සමානවම, දරන ලද ශුද්ධ හිමිකම් පෑම්වල පහළම අගය මුහුදු රක්ෂණ වෙතින් රුපියල් මිලියන 463 ක් ලෙස වාර්තා වුණු අතර (2018: රුපියල් මිලියන 454) හිමිකම් පෑම් අනුපාතය 39.45% ක් ලෙස වාර්තා විය (2018: 41.10%).


2019 අප්‍රේල් මස පාස්කු ප්‍රහාරයේ ප්‍රතිඵල ලෙස සමාලෝචිත වසර තුළ වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ආවරණය මගින් ශුද්ධ ඉපැයූ වාරිකයේ හා ශුද්ධ හිමිකම් පෑම් දැරීමේ ප්‍රබල වර්ධනයක් වාර්තා කරන ලද අතර එම ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් මිලියන 5,569ක් (2018: රුපියල් මිලියන 4,032) හා රුපියල් මිලියන 693ක් (2018: රුපියල් මිලියන76) විය.

27 වගුව සහ 20 ප්‍රස්තාරය මගින් පිළිබිඹු කෙරෙන පරිදි, පසුගිය වසර පහ සමග සන්සන්දනය කරන විට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු ඉහළම වියදම් ප්‍රමාණය (වර්ජනල කැරලි කෝලාහලල ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් ඇතුළුව) වාර්තා කර ඇත්තේ 2019 වසරේදීය. ඒ අනුව එම වියදම් ප්‍රමාණය 2018 වසරේදී වාර්තා වූ රුපියල් මිලියන 30,333 ක ප්‍රමාණය සමග සැසඳීමේදී 10.36%ක වර්ධනයක් පෙන්නුම් කරයි. ජාතික රක්ෂණ භාර අරමුදල මගින් වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් සඳහා සැලකිල්ලට ගනු ලැබූ ශුද්ධ වියදම් 2018 වසරේදී වාර්තා වූ රුපියල් මිලියන 843 සිට 2019 වසරේදී රුපියල් මිලියන 1,412 දක්වා ඉහළ ගොස් තිබේ.

ශුද්ධ හිමිකම් පෑම් අනුපාතයේ සහ ශුද්ධ වියදම් අනුපාතයේ එකතුව පිළිබිඹු කරන ශුද්ධ ඒකාබද්ධ අනුපාතය 2018 වසරේදී වාර්තා වූ 102.45% සිට 2019 වසරේදී 104.44% දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් තිබේ. කෙසේවුවද, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු මගින් දරන ලද මුළු වියදම් හා හිමිකම් පෑම් පිළිබිඹු කරන ඒකාබද්ධ අනුපාතය 2017 සිට 100%ට වඩා ඉහළ අගයක් වාර්තා කළේය.

**20 ප්‍රස්තාරය**

**ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දරන ලද ශුද්ධ හිමිකම් පෑම්, ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය, ශුද්ධ වියදම්, ශුද්ධ වියදම් අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**



**27 වගුව**

**ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දරන ලද ශුද්ධ හිමිකම් පෑම්, ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය, ශුද්ධ වියදම්, ශුද්ධ වියදම් අනුපාතය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| පන්තිය | ශුද්ධ ඉපැයූ වාරික (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| ගිනි | 1,283,463 | 1,213,542 | 1,721,160 | 1,957,237 | 2,183,580 |
| මුහුදු | 797,026 | 903,170 | 991,573 | 1,104,376 | 1,173,537 |
| මෝටර් රථ වාහන | 37,958,834 | 44,593,900 | 50,580,010 | 56,891,349 | 58,752,984 |
| සෞඛ්‍ය | 8,071,777 | 9,349,093 | 11,435,476 | 12,386,134 | 15,315,057 |
| විවිධ | 3,270,599 | 3,306,901 | 3,891,564 | 4,492,033 | 5,007,719 |
| **අනු එකතුව** | **51,381,699** | **59,366,606** | **68,619,783** | **76,831,128** | **82,432,877** |
| වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් | 2,914,630 | 3,274,297 | 3,734,321 | 4,031,846 | 5,568,739 |
| **එකතුව** | **54,296,329** | **62,640,903** | **72,354,104** | **80,862,975** | **88,001,616** |

| පන්තිය | දරන ලද ශුද්ධ හිමිකම් පෑම් (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| ගිනි | 645,231 | 1,024,290 | 1,640,062 | 1,696,698 | 2,581,074 |
| මුහුදු | 295,624 | 266,057 | 345,331 | 453,917 | 462,919 |
| මෝටර් රථ වාහන | 24,274,415 | 28,966,019 | 31,134,209 | 34,681,762 | 34,703,545 |
| සෞඛ්‍ය | 6,958,816 | 8,065,476 | 10,511,212 | 12,148,224 | 16,739,265 |
| විවිධ | 1,677,736 | 2,121,221 | 4,186,860 | 3,457,623 | 3,256,712 |
| **අනු එකතුව** | **33,851,822** | **40,443,063** | **47,817,674** | **52,438,224** | **57,743,515** |
| වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් | 780 | 33,677 | (10,519) | 76,068 | 692,926 |
| **එකතුව** | **33,852,602** | **40,476,740** | **47,807,154** | **52,514,292** | **58,436,440** |

| පන්තිය | ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| ගිනි | 50.27 | 84.40 | 95.29 | 86.69 | 118.20 |
| මුහුදු | 37.09 | 29.46 | 34.83 | 41.10 | 39.45 |
| මෝටර් රථ වාහන | 63.95 | 64.96 | 61.55 | 60.96 | 59.07 |
| සෞඛ්‍ය | 86.21 | 86.27 | 91.92 | 98.08 | 109.30 |
| විවිධ | 51.30 | 64.15 | 107.59 | 76.97 | 65.03 |
| **අනු එකතුව** | **65.88** | **68.12** | **69.68** | **68.25** | **70.05** |
| වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් | 0.03 | 1.03 | (0.28) | 1.89 | 12.44 |
| **එකතුව** | **62.35** | **64.62** | **66.07** | **64.94** | **66.40** |

| විස්තරය | ශුද්ධ වියදම් (රුපියල් '000) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලු උප පන්ති සඳහා ශුද්ධ වියදම් | 19,134,713 | 21,421,928 | 24,491,746 | 29,490,544 | 32,062,276 |
| වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් | 486,985 | 653,706 | 732,786 | 842,515 | 1,411,974 |
| **එකතුව** | **19,621,698** | **22,075,634** | **25,224,532** | **30,333,059** | **33,474,250** |

| විස්තරය | ශුද්ධ වියදම් අනුපාතය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලු උප පන්ති සඳහා ශුද්ධ වියදම් අනුපාතය | 37.24 | 36.08 | 35.69 | 38.38 | 38.90 |
| සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ වියදම් අනුපාතය | 36.14 | 35.24 | 34.86 | 37.51 | 38.04 |

| විස්තරය | ශුද්ධ ඒකාබද්ධ අනුපාතය (%) | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලු උප පන්ති සඳහා ශුද්ධ ඒකාබද්ධ අනුපාතය | 103.12 | 104.21 | 105.38 | 106.63 | 108.94 |
| සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය | 98.49 | 99.86 | 100.94 | 102.45 | 104.44 |

### දළ ලිඛිත වාරිකය නියෝජනය කරන ඔප්පු සංඛ්‍යාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2015 සිට 2019 දක්වා කාලපරිච්ඡේදය තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල විවිධ උප පන්තිවල දළ ලිඛිත වාරිකය උත්පාදනය කිරීම සඳහා දායක වී තිබෙන මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 28 වගුව මගින් ඉදිරිපත් කෙරේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල සියලු උප පන්තිවලට අදාළ රක්ෂණ ඔප්පුවල මුළු සංඛ්‍යාව 2018 දී වාර්තා වූ 6,492,003 ප්‍රමාණයේ සිට 2019 දී 6,728,073 දක්වා 3.64% කින් ඉහළ ගොස් තිබේ. 2017 සිට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල මුළු ඔප්පු සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ ගොස් තිබේ. පෙර වසර හා සමානවම මෝටර් රථ රක්ෂණ ව්‍යාපාර කටයුතු මුළු ඔප්පු සංඛ්‍යාවෙන් 88.60% ක ප්‍රමාණයක් (2018: 86.48%) නියෝජනය කරමින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ එක් උප පන්තියක් ලෙස විශාලතම ඔප්පු සංඛ්‍යාවට හිමිකම් කී අතර එය 2,895,485 (2018: 2,821,529) ක තෙවන පාර්ශ්ව රක්ෂණ ඔප්පු සහ 3,065,956 (2018: 2,605,302) ක විස්තීර්ණ රක්ෂණ ඔප්පුවලින් සමන්විත විය. ඒ අනුව විස්තීර්ණ රක්ෂණ ඔප්පුවල බහුතරය මගින් පෙන්නුම් කෙරෙනුයේ රක්ෂණ ලබාගනුයේ අනිවාර්ය අවශ්‍යතාව සැපිරීම සඳහා අඩු වාරිකයක් මත අවම මට්ටමේ ආරක්ෂාවක් ලබා ගැනීමට වඩා පුළුල් පරාසයක් තුළ වන ආරක්ෂාවක් ලබා ගැනීමට වන බවයි.

2018 වර්ෂයේදී වාර්තා වූ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව හා සැසඳීමේදී 2019 වසර තුළ සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 35.47% කින් ඉහළ ගොස් තිබේ. කෙසේ වුවද, විවිධ

**28 වගුව**

**දළ ලිඛිත වාරිකය නියෝජනය කරනු ලබන ඔප්පු සංඛ්‍යාව-සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය**

| පන්තිය | රක්ෂණ ඔප්පු සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 (අ) | 2019 (ආ) |
| ගිනි | 227,800 | 246,058 | 241,884 | 245,027 | 232,469 |
| මුහුදු | 190,720 | 191,966 | 172,733 | 187,338 | 179,084 |
| මෝටර් රථ වාහන | 4,531,187 | 5,075,622 | 5,390,222 | 5,614,901 | 5,961,441 |
| තෙවන පාර්ශ්ව පමණක් | 2,460,596 | 2,628,255 | 2,784,920 | 2,821,529 | 2,895,485 |
| විස්තීර්ණ | 2,070,591 | 2,447,367 | 2,605,302 | 2,793,372 | 3,065,956 |
| සෞඛ්‍ය | 15,053 | 16,040 | 11,893 | 17,267 | 23,393 |
| විවිධ | 202,038 | 238,921 | 311,084 | 427,470 | 331,686 |
| **එකතුව** | **5,166,798** | **5,768,607** | **6,127,816** | **6,492,003** | **6,728,073** |

රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2019 දී 22.40% ක් පමණ වූ අතර එය සැලකිය යුතු පහළ බැසීමකි.තවද, මුහුදු හා ගිනි රක්ෂණ ව්‍යාපාර කටයුතු 2018 වසරට සාපේක්ෂව 2019 පිළිවෙලින් 4.40% හා 5.12% කින් අඩු විය.

### නව, අලුත් කරන ලද සහ බල පවත්නා ඔප්පු පිළිබඳ දත්ත - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2018 හා 2019 වර්ෂ සඳහා නව රක්ෂණ ඔප්පු, අලුත් කරන ලද ඔප්පු සහ බල පවත්නා ඔප්පු පිළිබඳ දත්ත 29 වගුව සහ 21 ප්‍රස්තාරය මගින් දැක්වේ. සාමාන්‍ය රක්ෂණවල බල පවත්නා මුළු ඔප්පු සංඛ්‍යාව 2019 වසරේදී 6,672,241ක් (2018: 6,393,900) වූ අතර එය 2018 වසරට සාපේක්ෂව 4.35%ක වර්ධනයකි.

පසුගිය වර්ෂයන් හා සමානවම 2019 වසර අවසානය වන විට රක්ෂණ ඔප්පු 5,935,214 ක් (2018 : 5,571,194) වාර්තා කරමින් මොටර් රථ රක්ෂණ ව්‍යාපාරය බලාත්මකව පවතින වැඩිම රක්ෂණ ඔප්පු සංඛ්‍යාව නියෝජනය කළ අතර එම සංඛ්‍යාව තෙවන පාර්ශව ඔප්පු 2,897,534 කින් (2018: 2,819,590) හා විස්තීර්ණ ඔප්පු 3,037,680 (2018: 2,751,604) කින් සමන්විත විය. මෙම වසර තුළ මුහුදු, ගිනි හා විවිධ රක්ෂණය සඳහා බලාත්මකව පැවති ඔප්පු සංඛ්‍යාව පසුගිය වසරට සාපේක්ෂව පිළිවෙලින් 3.55%, 5.65% හා18.89%ක් විය. 2018 වසරට සාපේක්ෂව 2019 දී බලාත්මකව පැවති සෞඛ්‍ය රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 40.37% ගොස් ඇත.

2019 වසරේ දී රක්ෂණ සමාගම් නව ඔප්පු 3,285,509 ක් ප්‍රාරක්ෂණය කර ඇති අතර එය පසුගිය වසරට සාපේක්ෂව 7.12% ක ඉහළ යාමකි. 2018 වසරේ දී අලුත් කරන ලද 3,394,775 ක් (2018 : 5,571,194) වූ ඔප්පු සංඛ්‍යාවට සාපේක්ෂව 2019 වසරේදී අලුත් කරන ලද මුළු ඔප්පු සංඛ්‍යාව 3,414,769 ක් විය.


**29 වගුව**

**නව, අලුත් කරන ලද සහ බල පවත්නා ඔප්පු පිළිබඳ දත්ත - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**

| | 2018 | | | 2019 | | |
|---|---|---|---|---|---|---|
| | නව ඔප්පු | අලුත් කරන ලද ඔප්පු | වසර අවසානයට ක්‍රියාත්මක ඔප්පු | නව ඔප්පු | අලුත් කරන ලද ඔප්පු | වසර අවසානයට ක්‍රියාත්මක ඔප්පු |
| ගිනි | 87,735 | 157,142 | 244,976 | 85,417 | 149,869 | 231,127 |
| මුහුදු | 183,594 | 4,256 | 178,908 | 176,076 | 4,087 | 172,564 |
| මෝටර් රථ වාහන | 2,523,101 | 3,100,420 | 5,571,194 | 2,789,135 | 3,161,298 | 5,935,214 |
| තෙවන පාර්ශ්ව පමණක් | 1,329,968 | 1,492,035 | 2,819,590 | 1,438,245 | 1,456,199 | 2,897,534 |
| විස්තීර්ණ | 1,193,133 | 1,608,385 | 2,751,604 | 1,350,890 | 1,705,099 | 3,037,680 |
| සෞඛ්‍ය | 9,790 | 7,465 | 16,665 | 15,574 | 7,794 | 23,392 |
| විවිධ | 262,811 | 125,492 | 382,157 | 219,307 | 91,721 | 309,944 |
| **එකතුව** | **3,067,031** | **3,394,775** | **6,393,900** | **3,285,509** | **3,414,769** | **6,672,241** |

**21 ප්‍රස්තාරය**

**නව අලුත් කරන ලද සහ බල පවත්නා ඔප්පු පිළිබඳ දත්ත - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**




## ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය

ජාතික රක්ෂණ භාර අරමුදල 2008 වසරේ සිට ප්‍රතිරක්ෂණයෙහි අවදානම භාර ගැනීම ආරම්භ කළේ ශ්‍රී ලංකාවේ සියළු ප්‍රාථමික රක්ෂණ සමාගම් සඳහා 'ජාතික ප්‍රතිරක්ෂකයෙකු' වීමේ මූලික අරමුණ ඇතිවය. ඒ අනුව අංක 1791/4 වන 2012 දෙසැම්බර් 31 වන දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව 2013 සිට ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ මුළු මුදලින් 30% ක ප්‍රමාණයක් ලබා ගැනීම අනිවාර්ය වේ.

2019 වසරේදී ජාතික රක්ෂණ භාර අරමුදල විසින් උත්පාදනය කරන ලද ප්‍රතිරක්ෂණ වාරික ආදායම 2018 වසරේ දී වාර්තා වූ රුපියල් මිලියන 4,056 ට සාපේක්ෂව 2.89% ක ඉහළ යාමක් වූ අතර එය රුපියල් මිලියන 4,174 ක් විය. ප්‍රතිපවරාදීමේ වාරික ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල විසින් මෙම වසර තුලදී රුපියල් මිලියන 449ක් ප්‍රතිරක්ෂකයන් වෙත පවරා දෙන ලද අතර එය පෙර වසරට වඩා 22.23% ක අඩු වීමකි.

ජාතික රක්ෂණ භාර අරමුදල 2019 වර්ෂයේදී දරන ලද හිමිකම් පෑම් රුපියල් මිලියන 3,560 ක් වූ අතර 2018 වර්ෂයේදී එම අගය රුපියල් මිලියන 1,504 ක් විය. එය පසුගිය වසරට සාපේක්ෂව 137% ක කැපී පෙනෙන වර්ධනයක් වූ අතර ඊට හේතුව රක්ෂකයෙකු විසින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත පවරා දෙන ලද විශාල හිමිකම් පෑම් කිහිපයක අදාළ කොටස හේතුවෙනි. ජාතික රක්ෂණ භාර අරමුදල මගින් රඳවා ගන්නා ඉහළ රඳවා ගැනීමේ මට්ටම් හේතුවෙන් 2019 දී ප්‍රතිරක්ෂකයන්ගෙන් ලබාගෙන ඇත්තේ රු.මි. 498 ක් පමණි. තවද, 2018 හා 2017 වසර තුළදී ප්‍රතිරක්ෂකයන් වෙත කිසිඳු හිමිකම් පෑමක් පවරා නොතිබුණි. ඒ අනුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, ප්‍රතිපවරාදීමේ වැඩ පිළිවෙලෙහි ඵලදායීතාව පිළිබඳ නැවත පරීක්ෂා කර බලන ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල වෙත දැනුම් දෙනු ලැබිනි. 2019 වසරේ දී හිමිකම්පෑම් වල සැලකිය යුතු ඉහළ යාම හේතුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාර කටයුතු, 2018 වසරේ වාර්තා වූ ප්‍රාරක්ෂණ ලාභ හා ශුද්ධ බදු පෙර ලාභ පිළිවෙලින් රුපියල් මිලියන 1,130 හා රුපියල් මිලියන 1,342 ට සාපේක්ෂව ප්‍රාරක්ෂණ අලාභ හා ශුද්ධ බදු පෙර අලාභ පිළිවෙලින් රුපියල් මිලියන 763 හා රුපියල් මිලියන 662ක් විය.

ප්‍රතිරක්ෂණ මෙහෙයුම් වල මුළු වත්කම්, 2018 ට සාපේක්ෂව 81.63 % යුතු වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් මිලියන 6,690 ක් විය.

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය යටතේ වාර්තා කළ රාජ්‍ය ණය සුරැකුම්පත් වල සිදු කළ ආයෝජනයන් 2018 දෙසැම්බර් 31 දිනට වාර්තා වූ රු.මි. 594 ට සාපේක්ෂව 2019 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 2,484 ක් දක්වා වැඩි වූ අතර 318 % ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. ඒ අනුව, ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය යටතේ වූ මුළු වත්කම් ප්‍රමාණයෙන් රාජ්‍ය ණය සුරැකුම්පත් 37.13% ක් නියෝජනය කළේය. තවද, ප්‍රතිපවරා දීමේ කටයුතුවලින් ලැබිය යුතු ප්‍රමාණය මුළු වත්කම්වලින් 23.61% ක් නියෝජනය කළේය. කෙසේ වුවද, මූල්‍ය ආයෝජනයන් මගින් ප්‍රතිරක්ෂණ වගකීමෙන් 47% ක් පමණක් ආවරණය කෙරෙන බැවින් ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට සහාය ලබා දීමට ප්‍රමාණවත් මූල්‍ය ආයෝජන නොමැත.

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ කාණ්ඩය මගින් වාර්තා කරන ලද ප්‍රාග්ධන ප්‍රමාණය අනුපාතය 120% ක් වූ අවම ප්‍රාග්ධන ප්‍රමාණය අනුපාතයට වඩා බොහෝ සෙයින් අඩු මට්ටමක පැවති අතර 2018 දෙසැම්බර් 31 දිනට හා 2019 දෙසැම්බර් 31 දිනට 67% හා 64% ක් වූ සෘණ අනුපාතයන් පෙන්නුම් කළේය. එසේම, ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ පවත්නා සමස්ථ උපයෝජ්‍ය ප්‍රාග්ධනය, අවම සමස්ථ උපයෝජ්‍ය ප්‍රාග්ධනය වන රු.මි. 500 ට වඩා බොහෝ අඩු මට්ටමක වූ අතර එය 2018 දෙසැම්බර් 31 දිනට හා 2019 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සෘණ රුපියල් මිලියන 1,085 ක් හා සෘණ රුපියල් මිලියන 899 ක් ලෙස තව දුරටත් පහත වැටිණි. මෙම කරුණු රක්ෂණ භාර අරමුදල හා භාණ්ඩාගාරය වෙත අවධාරණය කරන ලද අතර රක්ෂණ හා ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයන් වෙන් කිරීමේ දී ඒවාට අනුකූල වීම ඔවුන්ගේ අපේක්ෂාවයි.

## රක්ෂණ තැරැව්කාර සමාගම්

2019 වර්ෂය අවසාන වන විට රක්ෂණ තැරැව්කාර සමාගම් 67 ක් වෙළඳපොල තුළ ක්‍රියාත්මක වූ අතර රුපියල් මිලියන 29,317 ක දළ ලිඛිත වාරික උත්පාදනය කළේය. ඒ අනුව, රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර තුළින් උත්පාදනය කරන ලද මුළු දළ ලිඛිත වාරික 2018 වසරේදී රුපියල් මිලියන 25,063 ක් වූ අගයට සාපේක්ෂව 2019 වසරේදී 16.97% ක වර්ධනයක් වාර්තා කළේය. මෙම මුළු දළ ලිඛිත වාරික, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර තුළින් උත්පාදනය කරන ලද වාරික ආදායමෙන් සමන්විත වූ අතර එය පිළිවෙලින් රුපියල් මිලියන 1,095 ක් හා රුපියල් මිලියන 28,222 ක් වශයෙනි. උත්පාදනය කරන ලද මුළු දළ ලිඛිත වාරිකයෙන් 96.26% ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය දළ ලිඛිත වාරිකය නියෝජනය කළ අතර දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකයෙන් 3.74% ක් පමණක් නියෝජනය කළේය.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ රුපියල් මිලියන 107,732 ක් වූ මුළු දළ ලිඛිත වාරිකයෙන් (වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හා ත්‍රස්ත ක්‍රියාකාරකම් රක්ෂණ වාරිකය ඇතුළුව) 26.20% ක් රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් උත්පාදනය කරන ලදී. පසුගිය වර්ෂයන් හා සමානවම 2019 වසරේ දී දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය කෙරෙහි රක්ෂණ තැරැව්කාර සමාගම් දැක්වූයේ කැපී පෙනෙන දායකත්වයක් නොවේ. තැරැව්කාර සමාගම් විසින් ලබා දෙන ලද විස්තර ප්‍රකාරව ඔවුන් මගින් උත්පාදනය කර ඇත්තේ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයෙහි මුළු දළ ලිඛිත වාරිකයෙන් 1.23% ක් (රුපියල් මිලියන 88,781) පමණි.

2019 වසරේදී, රක්ෂණ තැරැව්කාර සමාගම් තිස් එකක් විසින් රුපියල් මිලියන 100 ඉක්මවන දළ ලිඛිත වාරික එක් එක් සමාගම වෙතින් සපයන ලද අතර මෙම රක්ෂණ තැරැව්කාර සමාගම් සියල්ල එක්ව රුපියල් මිලියන 27,897 ක දළ ලිඛිත වාරික උත්පාදනය කරන ලදී. ඉතිරි රක්ෂණ තැරැව්කාර සමාගම් තිස් හය විසින් 30 වන වගුවේ දැක්වෙන පරිදි රුපියල් මිලියන 1,420 ක් උත්පාදනය කරන ලදී.


**30 වගුව**

**රක්ෂණ තැරැව්කාර සමාගම් තුළින් උත්පාදනය කරන ලද දළ ලිඛිත වාරික - 2019**

| අංකය | රක්ෂණ තැරැව්කාර සමාගමේ නම | දළ ලිඛිත වාරික 2019 | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර | | සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය | | එකතුව | |
| | | රු.('000) | වෙළඳපල කොටස (%) | රු.('000) | වෙළඳපල කොටස (%) | රු.('000) | වෙළඳපල කොටස (%) |
| 1 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 24,536 | 2.24 | 985,649 | 3.49 | 1,010,184 | 3.45 |
| 2 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | - | - | 857,685 | 3.04 | 857,685 | 2.93 |
| 3 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 208 | 0.02 | 946,017 | 3.35 | 946,225 | 3.23 |
| 4 | ඇලියොන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 33,806 | 3.09 | 86,644 | 0.31 | 120,450 | 0.41 |
| 5 | ඇම්ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 2,503 | 0.23 | 152,818 | 0.54 | 155,320 | 0.53 |
| 6 | අසේකි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | - | - | 2,127,693 | 7.54 | 2,127,693 | 7.26 |
| 7 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 28,858 | 2.64 | 2,117,281 | 7.50 | 2,146,139 | 7.32 |
| 8 | සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 21,977 | 2.01 | 146,430 | 0.52 | 168,406 | 0.57 |
| 9 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 846 | 0.08 | 3,385,228 | 11.99 | 3,386,074 | 11.55 |
| 10 | කළම්බු රී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 7,416 | 0.68 | 311,527 | 1.10 | 318,943 | 1.09 |
| 11 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 25,565 | 2.34 | 2,487,291 | 8.81 | 2,512,856 | 8.57 |
| 12 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 202,480 | 18.50 | 1,237,916 | 4.39 | 1,440,396 | 4.91 |
| 13 | එසාජී කරිම්ජී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 137,288 | 12.54 | 547,992 | 1.94 | 685,280 | 2.34 |
| 14 | ඉක්විටි ඉන්ෂුවරන්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 19 | 0.00 | 106,529 | 0.38 | 106,547 | 0.36 |
| 15 | ෆයින්ඩ් මයි ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 14,926 | 1.36 | 142,861 | 0.51 | 157,787 | 0.54 |
| 16 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 24,316 | 2.22 | 1,176,712 | 4.17 | 1,201,028 | 4.10 |
| 17 | ජෝර්ජ් ස්ටුවර්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 26,996 | 2.47 | 874,878 | 3.10 | 901,875 | 3.08 |
| 18 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් | 9,018 | 0.82 | 151,098 | 0.54 | 160,116 | 0.55 |
| 19 | ඉන්ෂුවර් මී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 66,410 | 6.07 | 510,271 | 1.81 | 576,681 | 1.97 |
| 20 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් ප්‍රයිවට් ලිමිටඩ් | 7,230 | 0.66 | 181,784 | 0.64 | 189,014 | 0.64 |
| 21 | මර්කන්ටයිල් ෆෝචූන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 31,714 | 2.90 | 997,180 | 3.53 | 1,028,894 | 3.51 |
| 22 | මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 9,506 | 0.87 | 383,300 | 1.36 | 392,806 | 1.34 |
| 23 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 105,282 | 9.62 | 2,155,293 | 7.64 | 2,260,575 | 7.71 |
| 24 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 8,708 | 0.80 | 363,020 | 1.29 | 371,728 | 1.27 |
| 25 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 915 | 0.08 | 621,724 | 2.20 | 622,639 | 2.12 |
| 26 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් අට්මෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 103,239 | 9.43 | 74,703 | 0.26 | 177,942 | 0.61 |
| 27 | රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 48,743 | 4.45 | 1,103,794 | 3.91 | 1,152,537 | 3.93 |
| 28 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 21,728 | 1.98 | 1,279,658 | 4.53 | 1,301,386 | 4.44 |
| 29 | සෙංකඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | - | - | 976,401 | 3.46 | 976,401 | 3.33 |
| 30 | ස්ට්‍රැටර්ජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 12,782 | 1.17 | 87,835 | 0.31 | 100,617 | 0.34 |
| 31 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 36,456 | 3.33 | 307,031 | 1.09 | 343,487 | 1.17 |
| | **අනු එකතුව** | 1,013,469 | 92.60 | 26,884,242 | 95.25 | 27,897,711 | 95.17 |
| | **අනෙකුත් රක්ෂණ තැරැව්කාර සමාගම් (37)** | 81,176 | 7.40 | 1,338,402 | 4.75 | 1,419,579 | 4.83 |
| | **මුළු එකතුව** | **1,094,645** | **100** | **28,222,645** | **100** | **29,317,290** | **100** |

**22 ප්‍රස්තාරය**

**2010 වසරේ සිට 2019 වසර දක්වා රක්ෂණ තැරැව්කාර සමාගම් තුළින් උත්පාදනය කෙරී ඇති දළ ලිඛිත වාරික**




*සටහන: දත්ත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් 2019 දී රෙඩ්මෝ ස්විස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්හි දළ ලිඛිත වාරිකය සාමාන්‍ය රක්ෂණයෙන් බැහැර කරන ලදී*

# මෙහෙයුම් සමාලෝචනය

# අධීක්ෂණ සමාලෝචනය

### රක්ෂණ සමාගම්

### I. වාර්තා පිළිබඳ සමාලෝචනය

#### අ) වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ජීවගණකඥ වාර්තා

2017 මාර්තු මස 13 වන දින සංශෝධිත නිර්ණය අංක 140 සහ 150 අනුකූල වන පරිදි සියළු රක්ෂණ සමාගම් ඔවුන්ගේ වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, අදාල මූල්‍ය වර්ෂය අවසන් වී සිව් මසක් ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ. මීට අමතරව, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ නිරතව සිටින රක්ෂණ සමාගම් තම ජීවගණකඥ වාර්තා සහ එහි සංක්ෂිප්තයන් වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සමග ඉදිරිපත් කළ යුතු වේ.

එනමුදු, 2019 පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසුව ඇතිවූ දුෂ්කරතා හේතුවෙන් රක්ෂණ සමාගම් විසින් කරන ලද බොහෝ ඉල්ලීම් සලකා බැලීමෙන් අනතුරුව, වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා ඉදිරිපත් කිරීම සඳහා 2019 මැයි 31 වන දින දක්වා මාසයක දීර්ඝ කිරීමක් කොමිෂන් සභාව විසින් ලබා දෙන ලදී.

රක්ෂණ සමාගම් විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් වාර්තා නියමිත දිනට පනතේ විධිවිධාන ප්‍රකාරව ඉදිරිපත් කර ඇතිදැයි විශ්ලේෂණය කර, එම තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබීය. එම වාර්තාවන් සමාලෝචනය කිරීමේ දී හඳුනාගත් ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවලින් බැහැර වීම්, වෙනත් විෂමතාවයන් හා හඳුනාගත් දෝෂ නිවැරදි කිරීම සඳහා අදාල රක්ෂණ සමාගම් වෙත දැනුවත් කිරීම් කරන ලදී. එමෙන්ම අවශ්‍ය අවස්ථාවල දී පසු විපරම් කටයුතු නිසියාකාරව සිදු කරන ලදී. තවද, ඉදිරිපත් කරන ලද වාර්තා සමාලෝචනය කිරීමේ දී නිරීක්ෂණය කරන ලද ඇතැම් කරුණු ක්ෂේත්‍රගත විමර්ෂණ අතරතුර දී අවධානයට ලක් කරන ලදී.

ඉදිරිපත් කරන ලද තොරතුරු අධ්‍යයනය කිරීමේදී, සමහර රක්ෂණ සමාගම් විසින් තම මව් සමාගමේ සංක්ෂිප්ත හා / හෝ වෙළඳ ලකුණ භාවිතා කිරීම වෙනුවෙන් පුරස්කාර වියදම් ලෙස තම මව් සමාගමට ගෙවීම් සිදුකර ඇති බව නිරීක්ෂණය විය. මෙය සලකා බැලීමෙන් අනතුරුව, කොමිෂන් සභාව විසින් වර්ෂය තුළදී විධාන අංක 20 නිකුත් කරන ලදී. ඒ අනුව සියළුම රක්ෂණ සමාගම් වලට සංක්ෂිප්ත හා / හෝ වෙළඳ ලකුණ භාවිතා කිරීම වෙනුවෙන් තම මව් සමාගමට, සම්බන්ධිත සහ / හෝ සම්බන්ධිත නොවන සමාගම්වලට ගෙවීම් සිදුකිරීම තහනම් කරන ලදී.

තවද, බොහෝ රක්ෂණ සමාගම් රක්ෂණ ඔප්පුහිමියන්ගෙන් / යෝජනාකරුවන්ගෙන් ලැබුණු දළ ලිඛිත වාරික වලට හඳුනා නොගත් වාරික තැන්පතු සැලකිය යුතු ප්‍රමාණයක් වගකීම් ශේෂයන් ලෙස තම මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති බව නිරීක්ෂණය කරන ලදී. මේවා අතිරික්ත වාරික, අත්තිකාරම් වාරික, හඳුනා නොගත් වාරික තැන්පතු, යෝජනා තැන්පතු සහ කල් ඉකුත් වූ ඔප්පු වාරික වැනි විවිධ ස්වරූපවල ශේෂයන් ලෙස වර්ගීකරණය කර තිබුණි. රක්ෂණ සමාගම් විසින් මෙම තැන්පතු මුදල්, අදාළ ඔප්පුහිමියන්ට හෝ යෝජනාකරුවන්ට ආපසු ගෙවීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව අනාවරණය විය. එමෙන්ම, සමහර සමාගම් මෙම තැන්පතු මුදල් යම් කාල සීමාවක් වගකීම් ශේෂයන් ලෙස තබා ගැනීමෙන් පසුව ආදායමක් ලෙස ආදායම් ප්‍රකාශනයට හඳුනාගෙන තිබුණි. එබැවින්, කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධව වැඩිදුර උපදෙස් නිකුත් කරන තෙක්, ඔප්පුහිමියන් හට අයත් එවැනි මුදල් ආපසු ගෙවීමට හැකි සියලු උත්සාහයන් ගන්නා ලෙසත්, 2019 මුදල් වර්ෂයේ සිට බල පැවැත්වෙන පරිදි එම වගකීම් ශේෂයන් ආදායම් ප්‍රකාශනයට මාරු නොකරන ලෙසත් රක්ෂණ සමාග ම්වලට උපදෙස් දෙන ලදී.

#### ආ) රක්ෂණ සමාගම් සහ සමූහයේ මූල්‍ය අවධානම තක්සේරු කිරීම

සෑම රක්ෂණ සමාගමක් ම එක් එක් සමාගමේ අවධානම් තක්සේරු කිරීමේ වාර්තා වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තාවන්හි කොටසක් ලෙස කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව අදාල වර්ෂයේදී එක් එක් සමාගමෙහි මෙහෙයුම් කටයුතුවල සමාලෝචනයන් ලබා ගැනීම උදෙසා ආයතනික ව්‍යුහය හා හිමිකාරත්වය, ව්‍යාපාර පැතිකඩ, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය, අලෙවිකරණය සහ බෙදාහැරීම් කටයුතු, හිමිකම් පරිපාලනය, අවධානම් කළමනාකරණය ආදී අංශ පිළිබඳව තොරතුරු පරීක්ෂා කර බලන ලදී.

#### ඇ) ප්‍රතිරක්ෂණ ගිවිසුම්

පනතේ 31(1) වගන්තිය ප්‍රකාරව සියළු රක්ෂණ සමාගම් විසින් ඔවුන්ගේ ප්‍රතිරක්ෂක ගිවිසුම්, වාර්ෂිකව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ. කොමිෂන් සභාව විසින් නියම කරන ලද ශ්‍රේණිගත කිරීම් අවශ්‍යතා සපුරන ලද ප්‍රතිරක්ෂණ ආයතන වෙතින් ප්‍රතිරක්ෂණ ගිවිසුම් ලබාගෙන ඇතිදැයි සහ සියළුම රක්ෂණ උප පන්ති සඳහා ප්‍රතිරක්ෂණ ආවරණ ලබාගෙන ඇතිදැයි තහවුරු කර ගැනීම සඳහා එහි ලේඛන සමාලෝචනය කරන ලදී. එමෙන් ම ශ්‍රී ලංකා රක්ෂණභාර අරමුදල වෙත අනිවාර්යයෙන් යොමු කළ යුතු ප්‍රතිරක්ෂණ ප්‍රතිශතයන් නිසියාකාරව සපුරා ඇති ද යන්න පිළිබඳව ද අවධානය යොමු කරන ලදී. කොමිෂන් සභාව මගින් නිරීක්ෂණය කරන ලද කොන්දේසි වලින් බැහැර වීම් සහ විචලනයන් නියම කරන ලද කාලයන් තුළ නිවැරදි කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස අදාල සමාගම් වෙත උපදෙස් ලබා දෙන ලදී. තවද, සියළු රක්ෂණ සමාගම් විසින් එලැඹුණු අතිරේක (Facultative) ප්‍රතිරක්ෂණ ආවරණ සෑම කාර්තුවක් සඳහා ම ඉදිරිපත් කළ යුතු වේ. එසේ ඉදිරිපත් කරනු ලැබූ වාර්තා කොමිෂන් සභාව මගින් සමාලෝචනය කර හඳුනාගත් කොන්දේසි වලින් බැහැරවීම් සහ විචලනයන් නියමිත කාලයන් තුළ නිවැරදි කර ඉදිරිපත් කරන ලෙස අදාල සමාගම් වෙත දන්වන ලදී.

#### ඈ) කාර්තුමය වාර්තා

පනතේ විධිවිධාන ප්‍රකාරව සියළු රක්ෂණ සමාගම් එක් එක් කර්තුවක් අවසන් වී දින 45ක් ඇතුළත සිය කාර්තුමය වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

2019 වර්ෂය තුළ දී ඉදිරිපත් කරන ලද කාර්තුමය වාර්තා, එක් එක් සමාගමේ කාර්ය සාධනය නිර්ණය කිරීම උදෙසාත් පනතේ අදාල නීති රීති රෙගුලාසි වලට අනුකූල වන ලෙස ඉදිරිපත් කර ඇති ද යන්න පරීක්ෂා කර බැලීම සඳහාත් සමාලෝචනය කරන ලදී.

එක් එක් සමාගමෙහි මූල්‍ය තත්ත්වයන් කාර්තුමය වාර්තා පදනම් කර ගනිමින් නිරන්තරව නිරීක්ෂණය කරනු ලැබූ අතර මෙහි දී වත්කම් හා බැරකම් තත්වය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය, ද්‍රවශීලතාවය සහ අනෙකුත් අවදානම් සහිත අංශ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලදී.

එකී කාර්තුමය වාර්තාවන් සමාලෝචනය කිරීමේදී  නිරීක්ෂණය කරන ලද විෂමතාවයන් නීති රීති රෙගුලාසිවලින් බැහැරවීම් සහ අනෙකුත් වෙනස්කම් නියමිත කාලයන් තුළ නිවැරදි කිරීමට අදාල සමාගම් වෙත උපදෙස් ලබා දුනි.

රක්ෂණ සමාගම් වල කාර්තුමය කාර්ය සාධනය ඇගයීමේදී වාරික ආදායම, දල ලාභය සහ ශුද්ධ ලාභය පදනම් කරගන්නා ලදී. තවද, රක්ෂණකරුවන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා ලාභදායීත්වය, වත්කම් සහ හිමිකම් පදනම් කරගනිමින් අනුපාත විශ්ලේෂණය ආදිය සිදු කරන ලදී. එක් එක් සමාගමෙහි අනුපාතයන් රක්ෂණ කර්මාන්තයේ සාමාන්‍යයන් සමග සැසඳීම පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශකයක් ලෙස යොදා ගන්නා ලදී.

සෑම රක්ෂණ සමාගමක් ම පනතේ විධිවිධාන සහ රීති සපුරාලන බවටත් 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු විධිවිධාන පනතට අනුකූල වී ඇති බවටත් සහතික කිරීමේ වාර්තා දෙකක් සෑම කාර්තුවකටම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

### ඉ) මාසික වාර්තා

2019 වර්ෂය තුළදී සමාගම් 4ක් කොමිෂන් සභාව වෙත මාසික වාර්තාවන් සැපයිය යුතු විය. ඉන් සමාගම් 03ක් අවධානම් පාදක ප්‍රාග්ධන රාමුව යටතේ වාර්තාවන් සැපයිය යුතු අතර, එක් සමාගමක් ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකාශනය පමණක් මාසිකව සැපයිය යුතු විය.

මෙම සමාගම්හි වාර්තා වූ නියාමන අවශ්‍යතාවලින් බැහැර වීම් හේතුවෙන්, ඔවුන්ගේ මූල්‍ය ස්ථාවරත්වය සහ අනුකූලතාවය නිරන්තරයෙන් පරීක්ෂා කිරීම උදෙසා කොමිෂන් සභාව විසින් මෙම තීරණය ගනු ලැබීය.

## 2. නුබුන්වත් ආන්තික (අවධානම් පාදක ප්‍රාග්ධන) රීති ප්‍රකාර අනුකූලතාවය අධීක්ෂණය කිරීම

2015 දී ප්‍රකාශිත, නුබුන්වත් ආන්තික (අවධානම් පාදක ප්‍රාග්ධන) රීති නියමයන්ට අනුව සෑම සාමාන්‍ය සහ දිගුකාලීන  රක්ෂණ සමාගමක් ම අවම ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතය සහ අවම පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලිය යුතු අතර එම ගනණය කිරීම් මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කරනු ලබන වාර්තා කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරනු ලබන අතර  අවධානම් පාදක ප්‍රාග්ධන නියමයන්ට දක්වන අනුකූලතාවය විශ්ලේෂණය කරනු ලබයි. අවධානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරා නොමැති අවස්ථාවල දී සහ ගණනය කිරීම් සාවද්‍ය වන අවස්ථාවල දී නියම කරන ලද කාලයන් ඇතුළත අනුකූලතාවයන් සපුරා ගන්නා ලෙස සහ නිවැරදි කර නැවත ඉදිරිපත් කරන ලෙස අදාල රක්ෂණ සමාගම් වෙත කොමිෂන් සභාව විසින් උපදෙස් දෙනු ලැබුණි.

## 3. ආයෝජන පිරිවිතරයන්ට අනුකූලවීම නිරීක්ෂණය කිරීම

### අ) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය

පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව සියලුම රක්ෂණ සමාගම් විසින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සඳහා වූ තාක්ෂණික සංචිත වලින් 20%ට නොඅඩු ප්‍රමාණයක් සහ දිගුකාලීන රක්ෂණ අරමුදලේ වත්කම් වලින් 30% ට නොඅඩු ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතුය.

එකී ආයෝජන පනතේ විධිවිධාන ප්‍රකාරව සිදුකර ඇති ද යන වග රක්ෂණ සමාගම් විසින් යොමු කරනු ලබන මාසික, කාර්තුමය සහ වාර්ෂික වාර්තා විශ්ලේෂණය තුළින් නිරීක්ෂණය කරනු ලබයි.

කොමිෂන් සභාව මගින් නිරීක්ෂණය කරනු ලබන දෝෂ සහ නියාමන අවශ්‍යතාවයන්ගෙන් බැහැර වීම්, නියම කරනු ලබන කාලසීමාවන් තුළ නිවැරදි කරන ලෙස අදාල ආයතන වෙත දැනුම් දෙනු ලැබීය.

### ආ) නිර්ණය අංක 01ට අනුව කෙරෙන අනෙකුත් ආයෝජන

2011 මාර්තු පළමු වන දින දරණ නිර්ණය අංක 01 සහ පසුව කළ සංශෝධනවලට අදාල වන පරිදි සියළුම රක්ෂණ සමාගම් ඔවුන්ගේ තාක්ෂණික සංචිතයන්හි ශේෂව පවතින වත්කම් හා දිගුකාලීන රක්ෂණ අරමුදලේ ශේෂව පවතින වත්කම් ආයෝජනය කළ යුතුය. එසේ කරනු ලබන ආයෝජන කොමිෂන් සභාව මගින් මාසිකව, ත්‍රෛමාසිකව සහ වාර්ෂිකව විශ්ලේෂණය කරනු ලබන අතර හඳුනා ගත් දෝෂයන් සහ නියාමන අවශ්‍යතාවයන්ගෙන් බැහැරවීම් නියමිත කාලසීමාවන් තුළ නිවැරදි කරන ලෙස අදාල සමාගම් වෙත දැනුම් දෙන ලදී.

2019 ගිණුම් වර්ෂය තුළදී කොමිෂන් සභාව විසින් එක් රක්ෂණ සමාගමකට අදාලව නිර්ණය අංක 01 නියමයන්ගෙන් බැහැරවීම් සහ දෝෂ හඳුනාගත් අතර එම ආයතනයට මෙම දෝෂ නිවැරදි කර නිර්ණය අංක 01 සමග වහාම අනුකූල වන ලෙස දැනුම් දෙන ලදී.

## 4. නුබුන්වත් ආන්තික (අවධානම් පාදක ප්‍රාග්ධන) රීති මත බලාත්මක උපාය මාර්ග

යම්කිසි රක්ෂණ සමාගමක් අවධානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතා අනුව ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය පවත්වාගැනීමට අපොහොසත් වුවහොත්, කොමිෂන් සභාව එම සමාගමට අදාල රීතිවලට අනුකූල වීම සඳහා අවශ්‍ය නිවැරදි ක්‍රියාමාර්ග, අවධානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපාය මාර්ග අනුව සම්පාදනය කරන ලෙස දැනුම් දෙනු ලබයි.

මෙහි මූලික අරමුණ වනුයේ ගැටළු සහගත රක්ෂණ සමාගම් මුල් අවදියේදී ම හඳුනාගැනීම  සහ එම තත්ත්වයන් පාලනය කිරීමට ප්‍රායෝගික හා ඵලදායී පිළියම් යෙදීමයි. මෙමගින් අදාල රක්ෂණ සමාගම්වල මූල්‍ය තත්ත්වය හෝ ණය ගෙවීමේ හැකියාව සැලකිය යුතු  ලෙස පහළ යාමට පෙර තම අධීක්ෂණ මැදිහත් වීම් ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවට ඉඩ සැලසෙන අතර ඇතිවිය හැකි අර්බුධකාරී තත්ත්වයන් මගහරවා ගැනීමට හැකිවේ.

අදාල මූල්‍ය වර්ෂය තුළ දී රක්ෂණ ආයතන 5ක් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය 120% සහ 160% අතර වාර්තා කළ අතර කොමිෂන් සභාව මගින් අවධානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපාය මාර්ග අනුව අදාල පියවර ගනු ලැබීය.

## 5. ක්ෂේත්‍රගත විමර්ෂණ

2019 වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් අවධානම් පාදක අධීක්ෂණ ක්‍රමවේදය යටතේ රක්ෂණ සමාගම් 3ක ක්ෂේත්‍රගත විමර්ෂණ පවත්වන ලදී. මෙම පරීක්ෂා කිරීම් වලදී ප්‍රධාන වශයෙන් රක්ෂකයන්ගේ අවධානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන පද්ධති, ආයතනික පාලනය, මූල්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම, ආයෝජන, ප්‍රතිරක්ෂණ සහ වෙනත් මෙහෙයුම් කාර්යයන් ආදී ඉහළ මට්ටිමේ අවධානම් සහිත ක්ෂේත්‍ර අධ්‍යයනය කිරීම සිදු විය.

ඒ අනුව කොමිෂන් සභාව විසින් එක් එක් රක්ෂණ සමාගමෙහි මෙහෙයුම් කාර්ය සාධනය, තොරතුරු තාක්ෂණය, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි කොමිෂන් සභාව විසින් පනවන ලද විධිවිධාන වලට අනුකූලව සිදුවන්නේදැයි සමාලෝචනය කරන ලදී.
මෙමගින් පවත්නා අවධානම් අවම කිරීමේ ක්‍රමෝපායයන්, පද්ධති පාලන ක්‍රම සහ ක්‍රියාපටිපාටීන් පිළිබඳ වැඩිදුරටත් පරීක්ෂා කරනු ලැබීය. තවද, එම රක්ෂණ සමාගම්වල මෙහෙයුම් පද්ධති, වගකීම් තක්සේරු කිරීම්, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටීන් පිළිබඳ වැඩිදුර අවබෝධයන් ලබා ගැනීම පිණිස සමාගම්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, අභ්‍යන්තර / බාහිර විගණකයින් සහ ජීවගණකඥයින් සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.

ක්ෂේත්‍රගත විමර්ෂණ අතරතුරදී කරන ලද නිරීක්ෂණයන් සහ අදාල අංශ වල වැඩිදියුණු කිරීම් සඳහා කොමිෂන් සභාවේ නිර්දේශයන්, එම සමාගම් වෙත දැනුම් දෙන ලදී.

## 6. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත තොරතුරු ඉදිරිපත් කිරීම

කාර්තුමය වාර්තා මගින් එක් රැස් කර ගත් සංඛ්‍යානමය සහ අනෙකුත් තොරතුරු පදනම්ව රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳව මූල්‍ය තොරතුරු කාර්තුමය පදනමකින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය.

## 7. රක්ෂණ කර්මාන්තයේ අත්පොත - 2018

කොමිෂන් සභාව විසින් 2018 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන්වන වර්ෂය සඳහා එක් රැස් කරගත් දත්ත සහ සංඛ්‍යා ලේඛන පදනම් කරගෙන රක්ෂණ කර්මාන්තයේ අත්පොත - 2018, රක්ෂණ කර්මාන්තයේ සහ අනෙකුත් පාර්ෂවකරුවන්ගේ ප්‍රයෝජනය උදෙසා ප්‍රකාශයට පත්කරනු ලැබීය.

එක් එක් රක්ෂණ සමාගමෙහි මුළු වත්කම්, විවිධ රක්ෂණ පන්තින්හි දල ලිඛිත වාරික ආදායම, වෙළඳපල කොටස, ප්‍රාරක්ෂණ ලාභය, පූර්ණ පවත්නා ප්‍රාග්ධනය, නුබුන්වත් භාවය මෙන්ම ආදායම් ප්‍රකාශන සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු සහ විවිධ මූල්‍ය අනුපාතයන්ද ඇතුළත් කොට මෙම අත්පොත සකස් කරන ලදී.

## 8. අවදානම් මෙවලම

වාර්ෂික සහ කාර්තුමය වාර්තා හරහා රක්ෂණ සමාගම් විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය හා වෙනත් තොරතුරු මත පදනම්ව, එක් එක් සමාග මේ ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණයක් ලෙස කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර අවදානම් මෙවලමක් නිර්මාණය කරන ලදී. ඒ අනුව, ප්‍රාග්ධන ප්‍රමාණ්‍ය අනුපාතය, පූර්ණ පවත්නා ප්‍රාග්ධනය, ප්‍රාරක්ෂණ ලාභ අනුපාතය, ලාභදායිතා අනුපාතය යනාදිය මත පදනම්ව එක් එක් සමාග මේ අවදානම, අඩු, මධ්‍යස්ථ හා ඉහළ ලෙස වර්ගීකරණය කර ඇති අතර අධීක්ෂණ මැදිහත්වීම අවශ්‍ය පරිදි ගනු ලැබේ.

## 9. මුදල් විශුද්ධීකරණය සහ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මුදල් සැපයීම වැලැක්වීම (AML/CFT)

### අ) ක්ෂේත්‍රගත විමර්ෂණ

2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දක්වා ඇති නෛතික හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව රක්ෂණ සමාගම් විසින් ගනුදෙනුකරුවන්ගේ යථායෝගී රීති ක්‍රියාවලිය ක්‍රියාත්මක කරේද යන්න අධීක්ෂණය කිරීම සඳහා, කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) සමඟ එක්ව ක්ෂේත්‍රගත විමර්ෂණ තුනක් පවත්වන ලදී. ක්ෂේත්‍රගත විමර්ෂණ අතරතුරදී කරන ලද නිරීක්ෂණයන් අදාළ රක්ෂණ සමාගම් වෙත දැනුම් දෙන ලදී.

### ආ) මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකායේ (FATF) ක්ෂේත්‍රගත විමර්ෂණ කණ්ඩායම හමුවීම

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැලැක්වීම පිළිබඳ ගෝලීය ප්‍රතිපත්ති සම්පාදකයා වන FATF, ශ්‍රී ලංකාව එහි අනුකූලතා ලේඛනයේ උපායමාර්ගික අඩුපාඩු සහිත රටක් ලෙස, එනම් “අළු ලැයිස්තුව”ට අයත් රටක් ලෙස හඳුනාගෙන තිබෙන අතර එබැවින්, කාල සීමාවන් සහිතව ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ලබා දී ඇත. මෙම ක්‍රියාකාරී සැලසුම් අයිතමයන්ගෙන් එකක් රක්ෂණ අංශය ඇතුළු මූල්‍ය ආයතන අධීක්ෂණය හා සම්බන්ධ වේ.

ඒ අනුව, රක්ෂණ ක්ෂේත්‍රයේ අවදානම් පදනම් කරගත් මුදල් විශුද්ධීකරණය සහ ත්‍රස්තවාදී ක්‍රියා සඳහා මුදල් සැපයීම පිළිබඳ අධීක්ෂණයන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා කොමිෂන් සභාව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශයේ නිලධාරීන් සමඟ, 2019 සැප්තැම්බර් 16 වන දින ශ්‍රී ලංකාවට පැමිණි FATF ඇගයුම්කරුවන්ගේ කණ්ඩායම හමුවිය.

### ඇ) මුදල් විශුද්ධිකරණය (AML) හා සම්බන්ධ අවදානම් මෙවලම සංවර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම

2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධානවලට අනුව, කොමිෂන් සභාව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය සමඟ එක්ව 2020 වර්ෂය සඳහා සියලුම ජීවිත රක්ෂණ සමාගම්වල මුදල් විශුද්ධීකරණ අවදානම තක්සේරු කිරීම ආරම්භ කරන ලදී.

ඒ අනුව, සමූහ අධීක්ෂණ ක්‍රියාමාර්ගද සැලකිල්ලට ගනිමින් සාමූහිකව ප්‍රශ්නාවලියක් සකස් කරනලද අතර එය, රක්ෂණ ගිවිසුම් වර්ග, ගනුදෙනුකරුවන්, දේශපාලනිකව නිරාවරණය වූ පුද්ගලයින්, බෙදා හැරීමේ මාර්ග, ආයතනික පාලනය, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි, අවදානම් කළමනාකරණය, සේවක යථායෝගී බව, අනුකූලතාවය, අභ්‍යන්තර පාලනය වැනි එක් එක් සමාගමට අදාළ පුළුල් පරාසයක

තොරතුරු එක්රැස් කිරීම සඳහා සකස් කර ඇත.

අවදානම් මෙවලමට දත්ත සම්පාදනය කිරීම සහ 2020 වර්ෂය සඳහා සමාගම්වල අවදානම් මට්ටම තක්සේරු කිරීම සඳහා, මෙම ප්‍රශ්නාවලිය සියළුම ජීවිත රක්ෂණ සමාගම් වෙත ඔවුන්ගේ ප්‍රතිචාර ලබා ගැනීම සඳහා සන්නිවේදනය කරන ලදී.

**10. IFRS 17 ක්‍රියාත්මක කිරීම සඳහා වූ පෙර සූදානම තක්සේරු කිරීම**

රක්ෂණ ගිවිසුම් පිළිබඳ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය (IFRS 17) 2021 ජනවාරි මස හෝ ඊට පසුව රක්ෂණ සමාගම් සඳහා අනුගත කිරීමට මූලික වශයෙන් සැලසුම් සකස් කොට තිබුණි. එනමුත්, පසුව මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව වසරකින් දීර්ඝ කරන ලදී. IFRS 17 ක්‍රියාත්මක කිරීමේදී ඇති විය හැකි සැලකිය යුතු වෙනස්කම් සැලකිල්ලට ගනිමින් එක් එක් සමාගමෙහි මෙම ගිණුම්කරණ ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ සූදානම අන්තරාංශ විශ්ලේෂණ, අයවැය ඇස්තමේන්තු සහ අභියෝග ඇතුළු අනෙකුත් තොරතුරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.

**11. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය (SLFRS) 16 කල්බදු**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් අළුතින් නිකුත් කරන ලද SLFRS 16 - කල්බදු ප්‍රමිතියෙන් කල්බදු හඳුනා ගැනීම, ගණනය කිරීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම සඳහා වන මූලධර්ම දක්වා ඇත. මෙම ප්‍රමිතියේ මූලික අරමුණ වනුයේ බදුහිමියා සහ බදුකරු කල්බදු ගිවිසුම හා සම්බන්ධ ගනුදෙනු විශ්වාසවන්තව නියෝජනය වන අයුරින් අදාළ තොරතුරු සැපයීම සහතික කිරීමයි. මෙම තොරතුරු පරිශීලනය කිරීම හරහා කල්බදු ගිවිසුම් මගින් ආයතනයක මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ මුදල් ප්‍රවාහයන් කෙරෙහි ඇති කරන බලපෑම තක්සේරු කිරීමට මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට පදනමක් සපයයි.

**රක්ෂණ තැරැව්කාර සමාගම්**

**1. කාර්තුමය වාර්තා, අතුරු මූල්‍ය ප්‍රකාශන සහ විගනනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම**

2010 පෙබරවාරි 25 වන දින අංක 1642/16 ගැසට් නිවේදනය (පළමු උපලේඛනය) ප්‍රකාරව සියළු රක්ෂණ තැරැව්කාර සමාගම් ඔවුන්ගේ කාර්තුමය වාර්තා එක් එක් කාර්තුව අවසන් වී දින 45ක් ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

2019 වර්ෂය තුළදී බොහෝ රක්ෂණ තැරැව්කාර සමාගම් නියමිත දිනට හෝ ඊට ප්‍රථම ඔවුන්ගේ කාර්තුමය වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. එසේ එවන ලද කාර්තුමය වාර්තා එක් එක් සමාගමේ කාර්යසාධනය, මූල්‍ය තත්ත්වය හා නියාමන අවශ්‍යතාවන් සපුරාලීම ආදී කරුණු මුල්කොට ගෙන සමාලෝචනය කරන ලදී. එහිදී හඳුනාගත් දෝෂ හෝ නියාමන අවශ්‍යතාවයන්ගෙන් බැහැර වීම්, අදාල සමාගම් වෙත වැඩිදුර පැහැදිලි කිරීම් සහ නිවැරදි කිරීම් සඳහා යොමු කරන ලදී.

රක්ෂණ තැරැව්කාර සමාගම් සිය විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 06 ඇතුළත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ. එසේ යොමු කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාව මගින් සමාලෝචනය කරන ලද අතර, අවශ්‍ය අවස්ථාවල දී වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා අදාල සමාගම් වෙත යොමු කරන ලදී.

**2. වාරික එකතු කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම**

පනතේ 89 වන වගන්තිය ප්‍රකාරව තැරැව්කාර සමාගම් මගින් එකතු කරන ලද රක්ෂණ වාරික සති දෙකක් ඇතුළත අදාල රක්ෂණ ආයතනය වෙත යොමු කළ යුතු වේ. කාර්තුමය වාර්තා සමාලෝචනය කිරීමේදී සහ ක්ෂේත්‍රගත විමර්ෂණ අතරතුරදී මේ පිළිබඳව සියුම්ව අධීක්ෂණය කල අතර, නියාමන අවශ්‍යතාවයන්ගෙන් බැහැර වීම් වාර්තාවූ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා නිසි නියාමන ක්‍රියාමාර්ග ගනු ලැබීය.

**3. ක්ෂේත්‍රගත විමර්ෂණ**

2019 වසර තුළ දී කොමිෂන් සභාව මගින් රක්ෂණ තැරැව්කාර සමාගම් 10ක ක්ෂේත්‍රගත විමර්ෂණ පවත්වන ලදී. මෙහිදී අදාල නීති රෙගුලාසිවලට අනුකූල වන සේ රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය පවත්වාගෙන යන්නේදැයි විමර්ෂණය කරන ලදී. මෙහිදී නිරීක්ෂණය කරනු ලැබූ වැරදි හෝ නියාමන අවශ්‍යතාවලින් බැහැර වීම්, නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙස අදාල සමාගම් වෙත දැනුම් දෙන ලදී. තවද, නීති හා රෙගුලාසි උල්ලංග ණය කළ අවස්ථාවලදී නිසි නියාමන ක්‍රියාමාර්ග ගනු ලැබීය.

**4. ලියාපදිංචිය අළුත් කිරීම**

2020 වර්ෂය සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත් කිරීම සඳහා එක් එක් සමාග මෙන් ලද ඉල්ලුම් පත් කොමිෂන් සභාව මගින් සමාලෝචනය කරන ලදී. මෙහිදී විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය වාර්තා උපයෝගී කරගනිමින් එක් එක් සමාගමේ මූල්‍ය තත්ත්වය විශ්ලේෂණය කරනු ලැබීය.

**5. නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම**

වසර තුළ දී නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලෙස ලියාපදිංචි වීම සඳහා අයදුම් පත් කොමිෂන් සභාව වෙත ලැබුණු අතර එම ආයතන ලියාපදිංචි කිරීමට ප්‍රථම ඔවුන්ගේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, ව්‍යාපාර සැලැස්ම, ආදායම් පුරෝකථනය, සංවිධාන ව්‍යුහය, යටිතල පහසුකම් සපුරා ගැනීම වැනි කරුණු නිරීක්ෂණය කරන ලදී.

# නියාමන සමාලෝචනය

## රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

මෙම වසර තුලදී, රක්ෂණ සමාගම් ලෙස ක්‍රියාකිරීම සඳහා නව ලියාපදිංචි කිරීම් ප්‍රදානය කර නොමැත, කෙසේ වෙනත් වෙන් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම හේතු කොටගෙන සණස ජෙනරල් රක්ෂණ සමාගමට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රය නිකුත් කරන ලදි. එබැවින්, ලියාපදිංචි රක්ෂණ සමාගම් ගණන 28 වන අතර ඒ අතරින් එක් රක්ෂණ සමාග මක් තවදුරටත් රක්ෂණ ව්‍යාපාර කටයුතු වල නිරතවීම නවතා, ඈවර කිරීමේ ක්‍රියාවලියේ නිරත වී සිටී.

**පරිශිෂ්ඨය 1:** කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින රක්ෂණ සමාගම්වල නාම ලේඛණය, ඔවුන්ට කරගෙන යාමට අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය / පන්ති දැක්වේ.

## බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

### රක්ෂණ සමාගම්

### අත්හිටුවීම්

කොමිෂන් සභාව විසින් එක් රක්ෂණ සමාගමක පහල යන මුල්‍යමය තත්වය සලකා බලා (සමාගමේ මූල්‍ය ස්වශක්තතාව සංකීර්ණ ගැටළුවකට පත්ව තිබීම හා ඒ හේතුවෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් වලට අගතිදායි බලපෑමක් ඇති වීමට ඇති අවස්ථාවක) එම සමාගමේ සාමාන්‍ය හා ජීවිත රක්ෂණය පවත්වා ගෙන යාමට ලබාදී තිබූ ලියාපදිංචිය 2017 ජුනි 28 දින සිට අත්හිටුවන ලදි. ඒ අනුව අදාල සමාගම විසින් ලිඛිතව කොමිෂන් සභාව වෙත අදාල අත්හිටුවීම ඉවත් කල යුත්තේ ඇයිදැයි හේතු දැක්වීමක් සහ ප්‍රාග්ධන සැලස්මක් (පනතේ ප්‍රතිපාදන වලට අනුකූල නියමිත ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට අදාලව) වහාම කොමිෂන් සභාවේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කල යුතු විය. කෙසේ වුවද එසේ සිදු කිරීමට සමාගම අපොහොසත් වීම නිසා අදාල අත්හිටුවීම 2017 ජූලි 20 දින සිට 2019 අප්‍රේල් 02 දක්වා පනතේ දක්වා ඇති නියමිත ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරාලන තෙක් බලාත්මකව තිබුණි. කෙසේ වෙතත්, එකී අත්හිටුවීම 2019 අප්‍රේල් 03 දින සිට ඉවත් කරනු ලැබුවේ, එකී සමාගම විසින් කොන්දේසි කීපයකට එකඟ වීමට යටත්වය.

2009 වසරේ දී සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් සම්බන්ධයෙන් පනවන ලද අත්හිටුවීම 2019 වසරේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක වේ. සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් විසින් අව්‍යාජ බවට කොමිෂන් සභාවේ විසින් හඳුනාගත් සියළු හිමිකම් පෑම නිරවුල් කර තිබුණද, සමාගමට එරෙහිව තවමත් විභාග වෙමින් පවතින නඩුකරයන් නිසා අදාල හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට නොලැබුණි.

පණතේ 18 (1) වගන්තිය ප්‍රකාරව රක්ෂණකරුවකුගේ ලියාපදිංචි කිරීම, වෙනත් කරුණු අතර කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ණය ගෙවීමේ හැකියාව පිළිබඳ සීමාව පවත්වා ගෙන යාමට අසමත් වීම සහ පනතේ යම් විධි විධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් හෝ පනත යටතේ කොමිෂන් සභාව විසින් පනවන ලද යම් කොන්දේසියක් හෝ දෙන ලද යම් විධානයක් කඩ කර තිබීම හේතුවෙන්, සම්පූර්ණයෙන්ම හෝ රක්ෂණ ව්‍යාපාරයේ එක්තරා පන්තියක් සම්බන්ධයෙන් අවලංගු කරනු ලැබිය හැකිය.

### අවවාද කිරීම

එක්තරා රක්ෂණකරුවෙකු විසින් 2018 මාර්තු 31 හා 2018 ජුනි 30 සඳහා කොමිෂන් සභාව, වෙත ඉදිරිපත් කර තිබූ වෛකල්පිත ප්‍රතිරක්ෂණ විධිවිධාන වලට අනුව, එකී සමාගම කෙන්යා රිඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (කෙන්යා රි) සමග ප්‍රතිරක්ෂණයන් ලබාගෙන තිබුනි නමුත්, එකී "කෙන්යා රි" සමාගමේ ඇගයුම, කොමිෂන් සභාව විසින් නියම කර ඇති ප්‍රතිරක්ෂණ විධිවිධාන වලට අදාල නියම හා කොන්දේසි වල ඇගයුම් වලට වඩා පහළ අගයක් ගන්නා ලදි. තවද එකී ප්‍රතිරක්ෂණ විධිවිධාන වලට එලඹී ඇත්තේ අදාල ඇගයුම් පහල වැටීමෙන් පසුව බවට නිරීක්ෂණය විය. නමුත් එකී රක්ෂණ සමාගම, ඊළඟ කාර්තුව සඳහාද මෙලෙස කොමිෂන් සභාවේ නියම කළ ඇගයුම වලට වඩා පහල වැටී තිබූ කෙන්යා රී සමඟ ප්‍රතිරක්ෂණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම හේතුවෙන්, එම රක්ෂණ සමාගමට අවවාද කරන ලදි.

එකී රක්ෂණ සමාගම වෙත වර්ෂ 2012 දි කොමිෂන් සභාව විසින් පනතේ 57 වන වගන්තිය යටතේ විධානයක් නිකුත් කරනු ලැබූ අතර, ඒ අනුව එකී රක්ෂණ සමාගම කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව බැංකු මගින් පහසුකම් ලබා ගැනීම වළක්වන ලදි. කෙසේ වෙතත්, වර්ෂ 2016 දී හා 2017 දී එකී රක්ෂණ සමාගම විසින් එහි මාලදිවයින් සමාගමේ හා එකී සමාගමේ දීර්ඝ කාලින රක්ෂණ ව්‍යාපාරයේ කොටස් ඇපයට තබා ලංකා බැංකුව වෙතින් ණය පහසුකම් ලබා ගැනීමට ගිවිසුම් 2 කට ඇතුළත්ව තිබූ බව නිරීක්ෂණය කරන ලදී. කෙසේ නමුත් ඒ සඳහා කොමිෂන් සභාවේ ලිඛිත අනුමැතිය ලබාගෙන නොතිබූ හෙයින්, ඉහත සටහන් කළ විධානය උල්ලංඝනය කර තිබුනි. එබැවින් වර්ෂ 2019 දී ඉහත උල්ලංඝනය කිරීම් දෙකම සඳහා රක්ෂණ සමාගමට අවවාද කරන ලදී.

කොමිෂන් සභාව විසින් එක්තරා රක්ෂණ සමාගමක ප්‍රධාන නිලධාරියාට හා ප්‍රධාන මූල්‍ය නිලධාරියාට එරෙහිව අවවාද කිරීමක් කරන ලද්දේ පනතේ ප්‍රතිපාදනයන් හා කොමිෂන් සභාව විසින් එම සමාගමට වර්ෂ 2017 අගෝස්තු 02 දින නිකුත් කරන ලද විධානය උල්ලංඝනය කිරීම හේතුවෙනි. එකී රක්ෂණකරු විසින් කොමිෂන් සභාව වෙත ලබාදිය යුතු මූල්‍ය වාර්තා හා අනෙකුත් ලේඛණ /තොරතුරු ලබා නොදීම, ලබා දීමට ප්‍රමාද කිරීම හෝ වැරදි තොරතුරු ලබාදීම යන කරුණු සලකා බැලීමෙන් අනතුරුව එලෙස අවවාද කිරීම සිදු කරන ලදී.

### විධානයන්

එක්තරා රක්ෂණකරුවකු සිය කටයුතු පවත්වාගෙන යන ආකාරය ජාතික යහපත හා එහි ඔප්පුහිමියන්ගේ යහපතට අගතිදායක බවට කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. තවද එකී රක්ෂණකරුගේ ප්‍රධාන නිලධාරයා හා ප්‍රධාන මූල්‍ය නිලධාරියා තම කාර්යභාරය / රාජකාරි කටයුතු නිසි අවධානය හා සැලකිල්ල ඇතිව ක්‍රියාත්මක කිරීමට අපොහොසත්ව ඇති බවට වැඩිදුරටත් නිරීක්ෂණය කරන ලදී. එබැවින්, එකී කරුණු සැලකිල්ලට ගෙන පනතේ 57 වන වගන්තියේ ප්‍රතිප්‍රදාන යටතේ එකී රක්ෂණ සමාගමට එරෙහිව විධානයන් නිකුත් කරන ලද අතර, ඒ අතරින් එක් විධානයක් නිකුත් කරනු ලැබුවේ අදාල ප්‍රධාන නිලධාරියා හා ප්‍රධාන මූල්‍ය නිලධාරියා එම තනතුරු වලින් ඉවත් කිරීම සඳහාය.

## නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම සහ රක්ෂණ තැරැව්කාර සමාගම් වල ලියාපදිංචිය අළුත් කිරීම

මෙම වසර තුළදී රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා නව ව්‍යාපාර යෝජනා පත්‍ර 4ක් කොමිෂන් සභාව වෙත ලැබී ඇත. කොමිෂන් සභාව විසින් එම සමාගම් සඳහා රක්ෂණ තැරැව්කරුවන් ලෙස නව ලියාපදිංචි කිරීම් ලබා දී ඇත.

2020 වසර සඳහා ලියාපදිංචිය අළුත් කිරීමේ අපේක්ෂාවෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් 64 කින් ඉල්ලලුම්පත්‍ර කොමිෂන් සභාව වෙත ලැබී තිබෙන

අතර එම සමාගම් අතරින් සමාගම් 62 ක් පනත යටතේ අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති බැවින් 2020 වසර සඳහා සිය ලියාපදිංචිය අළුත් කිරීම ප්‍රදානය කර ඇත.

රක්ෂණ තැරැව්කාර සමාගම් දෙකක ශුද්ධ ප්‍රාග්ධනය, කොමිෂන් සභාව විසින් නියම කරන ලද අවම අගයට වඩා පහළ යාම නිසා, එකී සමාගම් ලියාපදිංචිය අළුත් කිරීම 2019 දෙසැම්බර් 31 වන විට නියමිතව තිබුණි. කෙසේ නමුත්, ඉන් එක් සමාගමක් පසුව පනත යටතේ අවශ්‍ය නියමයන් සම්පූර්ණ කිරීම හේතුවෙන් 2020 සඳහා ලියාපදිංචිය අළුත් කරන ලදි.

එසේ අවශ්‍ය නියමන් සම්පූර්ණ කිරීමට අසමත් වීම හේතුවෙන් අනෙක් සමාග මේ ලියාපදිංචිය අළුත් කිරීම තවමත් අපේක්ෂිතව පවති.

**පරිශිෂ්ඨය II:** කොමිෂන් සභාවේ ලියාපදිංචි වී සිටින රක්ෂණ තරැව්කාර සමාගම්වල නාම ලේඛණය, ඔවුන්ට කරගෙන යාමට අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය / පන්ති සහ කාල පරිච්ඡේදය දැක්වේ.

### බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

### රක්ෂණ තැරැව්කාර සමාගම්

### අවවාද කිරීම්

වසර තුලදී කොමිෂන් සභාව මගින් රක්ෂණ තැරැව්කාර සමාගම් දෙකකට අවවාද කිරීම් නිකුත් කර ඇත.

මාස 6ක කාලසීමාවක් ගත වනතෙක් මාසිකව වාර්තා ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාව විසින් පනතේ 96 අ වගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයක් පිළිපැදීමට අසමත් වු එක් රක්ෂණ තැරැව්කාර සමාගමකට කොමිෂන් සභාව විසින් අවවාදත්මක ලිපියක් නිකුත් කරන ලදි.

පනතේ 86 (1) වගන්තියට අනුකූලව කටයුතු කිරීමට අසමත් වීම හේතුවෙන් අනෙක් රක්ෂණ තැරැව්කාර සමාගමට කොමිෂන් සභාව විසින් අවවාදාත්මක ලිපියක් නිකුත් කරන ලදි.

පනතේ 86 (1) වගන්තිය සමඟ කියවිය යුතු වර්ෂ 2010 පෙබරවාරි 25 දිනැති අංක 1642/16 දරන ගැසට් පත්‍රයේ 7 වන රීතියේ දැක්වෙන කරුණු අතර සෑම රක්ෂණ තැරැව්කාර සමාගමක් විසින්ම එකී සමාගමේ ප්‍රධාන නිලධරයා සහ අධ්‍යක්ෂවරයකු විසින් සහතික කරනු ලැබු ඔවුන්ගේ කාර්තුමය වාර්තා සෑම කාර්තුවකම අවසාන දිනයේ සිට දින හතලිස් පහක් ඇතුලත දි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බව දක්වා ඇත.

### විධාන

රක්ෂණ තැරැව්කාර සමාගම් 2 ක ශුද්ධ ප්‍රාග්ධනය නියමිත අගය වන රුපියල් මිලියන 2.5 ට වඩා අඩු බව නිරීක්ෂණය කල කොමිෂන් සභාව විසින් ඔවුනට වහාම ප්‍රාග්ධනය වැඩිකරන ලෙසටත්, එලෙස ප්‍රාග්ධනය වැඩිකිරීමෙන් පසුව ඒ බව තහවුරු කිරීමට සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සහතික කරනු ලැබු 06 ආකෘති පත්‍රය සහ විගණන මුල්‍ය ප්‍රකාශන සමග කොමිෂන් සභාව වෙතට ඉදිරිපත් කරන ලෙසටත් විධානය කරන ලදී.

තවද, මෙකී වාර්තා ඔවුන්ගේ සාමාන්‍ය කාර්තුමය වාර්තා යොමු කිරීමට අතිරේකව, එකී ආකෘති පත්‍ර ප්‍රකාරව,මාසිකව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බවත් එකී සමාගමට දන්වන ලදි.

### අත්හිටුවීම්

විධාන අංක 19න් නියම කර ඇති පරිදි කාර්තුමය අවසානයේ සිට මාසයක් ඇතුළතදී අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවයට සිය අනුකූලතාවය පෙන්වීමට රක්ෂණ තැරැව්කාර සමාගම් පහක් අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය කල කොමිෂන් සභාව, එකී සමාගම් සිය අනුකූලතාවය පෙන්නුම් කරන තෙක් ලියාපදිංචිය අත්හිටුවීමට තීරණය කරන ලදී. වර්ෂය තුල තැරැව්කාර සමාගම් දෙකක් අනුකූලතාවය පෙන්වීමට අපොහොසත් වී ඇති හෙයින්, එම සමාගම්වල අත්හිටුවීම කොමිෂන් සභාව තවදුරටත් දීර්ඝ කරන ලදි.

### නව අලාභ ගැලපුම්කරුවන් ලියාපදිංචි කිරීම සහ අලාභ ගැලපුම්කරුවන්ගේ ලියාපදිංචිය අළුත් කිරීම

කොමිෂන් සභාව විසින් වසර තුලදී අලාභ ගැලපුම්කරුවන් ලෙස පුද්ගලයින් 6 දෙනෙකුට ලියාපදිංචිය සඳහා අනුමැතිය ලබා දෙන ලදි. මීට අමතරව අලාභ ගැලපුම්කරුවන් දස දෙනෙකුගේ ලියාපදිංචිය අළුත් කිරීමද වසර තුළදි ප්‍රදානය කර ඇත.

පනතේ 114(1) වගන්තියට අනුව "අලාභ ගැලපුම්කරු" යන්නෙන් රක්ෂණ හිමිකම් පෑමකදී උද්ගත වන අලාභ විමර්ශනය කිරීමේ සහ තක්සේරු කිරීමේ විශේෂිත දැනුමක් ඇති සහ මේ පනතේ විධි විධාන යටතේ අලාභ ගැලපුම්කරුවකු ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තකු අදහස් වේ.

**පරිශිෂ්ඨය III:** කොමිෂන් සභාවේ සමග ලියාපදිංචි වී සිටින අලාභ ගැලපුම්කරුවන්ගේ නාම ලේඛණය, ඔවුනට ලියාපදිංචිය දුන් දිනය දැක්වේ.

### නියාමන / උපදේශන ක්‍රියාමාර්ග

1 එක්තරා නෞකා ආයතනයක් විසින් ඔවුන්ගේ නැව් පන්තියක් සඳහා විදේශීය රක්ෂණකරුවකුගෙන් ලබාගත් Hull,Machinery and war risk රක්ෂණාවරණය තවදුරටත් පවත්වාගෙන යාමට කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා සිටින ලදී. ඉහත රක්ෂණාවරණය සඳහා කොමිෂන් සභාව විසින් පනතේ 101 වගන්තිය ප්‍රකාරව, 2019 ජුනි මස සිට තවත් වසරක් සඳහා අනුමැතිය ලබාදෙන ලදි. පනතේ 101 වගන්තිය ප්‍රකාරව ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය හෝ කොමිෂන් සභාවේ විශේෂ අනුමැතිය ලද රක්ෂණයන් හැරුණුකොට, කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව, ශ්‍රී ලංකාවේ කිසිම තැනැත්තෙකු විසින් පනත යටතේ ලියාපදිංචි කර නොමැති රක්ෂණකරුවෙකු සමඟ කෙලින් හෝ අන්‍යාකාරයෙන් රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් කටයුතු කළ නොහැකි අතර, රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් වු රජයේ ප්‍රතිපත්තිය සහ ජාතික යහපත සැලකිල්ලට ගැනීමෙන් පමණක් ඉහත සඳහන් ආකාරයට ලිඛිත අනුමැතිය ලබා දීමට සලකා බලනු ලැබේ.

2 2018 පෙබරවාරි 27 වන දින කොමිෂන් සභාව විසින් රක්ෂණ තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුවට අදාලව නිශ්චයන් #9 සංශෝධනය කරන ලදී. ශ්‍රී ලංකා තැරැව්කරුවන්ගේ සංගමය විසින් ඉදිරිපත් කළ කරුණු ද සැලකිල්ලට ගනිමින් කොමිෂන් සභාව විසින් රක්ෂණ තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුවට අදාළව නිශ්චයන් #9, 2018 අගෝස්තු 13 වන දින ප්‍රතිසංශෝධනය කරන ලදි. නැවතත් වර්ෂ 2019 දී, ශ්‍රී ලංකා තැරැව්කරුවන්ගේ සංගමය විසින් අදාළ ලියාපදිංචිය අලුත් කිරීමෙ ගාස්තුව තවදුරටත් අඩුකරන ලෙසට ඉල්ලීමක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ නමුත්, ඉහත කී ප්‍රතිසංශෝධනය කිරීමේදී ශ්‍රී ලංකා තැරුව්කරුවන්ගේ සංගමයේ මතය සැලකිල්ලට ගත් බැවින්, කොමිෂන් සභාව අදාළ ඉල්ලීමට එකග නොවීය.

3. රක්ෂණ නියෝජිතයන් ලෙස ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන පුද්ගලයින් විසින් ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ පවත්වනු ලබන පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණයට ඉදිරිපත් වීම සඳහා තම සුදුසුකම් සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ ඉල්ලීම් සලකා බලා 2010 ඔක්තෝබර් 5 දිනැති අංක 1674/4 මගින් සංශෝධිත 2002 සැප්තැම්බර් 23 දිනැති 1255/3 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 2 (ඇ) (11) රීතිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් අනුමැතිය ප්‍රදානය කර ඇත.

   රක්ෂණ නියෝජිත සුදුසුකම් රීති 2 (ඇ) (1) (2010 ඔක්තෝබර් 5 දිනැති අංක 1674/4 මගින් සංශෝධිත 2002 සැප්තැම්බර් 23 දිනැති අංක 1255/3 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) ප්‍රකාරව, ගණිතය සහ සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව යන විෂයන්ට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව අ.පො.ස (සා/පෙළ) විභාගය සමත් වී තිබීම රක්ෂණ නියෝජිතයෙකු ලෙස ලියාපදිංචි වීමට සපුරාලිය යුතු එක් අවම සුදුසුකමක් ලෙස සඳහන් කර ඇත. එසේ වුවද, එම රීති 2 (අ) (11) ප්‍රකාර, යම් තැනැත්තෙකු රීති 2 (ඇ) (1) හි සඳහන් කර ඇති මට්ටමට සමාන හෝ ඉහල වෙනත් යම් අදාල ක්ෂේත්‍රයකින් සුදුසුකම් ලබා ඇත්තේ නම්, එම සුදුසුකම් රීති වල සඳහන් කර ඇති මට්ටමට සමාන බවට, කොමිෂන් සභාව විසින්, එක් එක් සිද්ධිය අනුව, සලකා බලනු ලැබිය හැකිය.

4 එක්තරා රක්ෂණ සමාගමකට ලියාපදිංචියෙන් පසු මුල් මාස 3 සඳහා මාසික වාර්තා ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාව විසින් නියම කරන ලදි. පසුව, අදාල සමාගමේ ගිණුම් වාර්තා සමාලෝචනය කිරීමෙන් පසු කොමිෂන් සභාව විසින් නැවත දැනුම් දෙන තුරු මාසික වාර්තා ඉදිරිපත් කිරීමට නියම කරන ලදි. මාස 12ට පසු අදාල සමාගම විසින් මාසික වාර්තා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය ඉවත් කරන මෙන් ඉල්ලා සිටි අතර, ඒ වන විටත් අදාල සමාගම විසින් කොමිෂන් සභාවේ නිර්නායකයන් හා අනුකූල පරිදි කටයුතු කර තිබූ බැවින්, ඔවුන්ගේ ඉල්ලීම පිලි ගන්නා ලදි.

5. ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර රක්ෂණ වෙළඳ පොලවල් වල අන්තර් ජාතික කටයුතු වැඩිකරගැනීම සහ අන්‍යෝන්‍ය සහයෝගය සඳහා වන ලිපි ගනදෙනු අවශ්‍යතා වෙනුවෙන් අවබෝධතා ගිවිසුමකට ඇතුලත්වීම සඳහා තායිලන්ත රක්ෂණ කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාව වෙත ආරාධනාවක් කරන ලදි. දෙරටෙහි රක්ෂණ නීති බලාත්මක කිරීමට සහ පරිපාලන කටයුතු සච්ලතාව වැඩිකර ගැනීමට හැකියාව ලැබෙන බැවින්, එකී අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීමට සහ අත්සන් කිරීමට කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජිතයකු පත්කිරීමට, කොමිෂන් සභාව අනුමැතිය ලබා දෙන ලදි. නමුත්, එම අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම 2019 අප්‍රේල් පාස්කු ප්‍රහාරය නිසා කල් දමන ලදි.

6 එක්තරා රක්ෂණ සමාගමක්, සාමාන්‍ය හා ජීවිත රක්ෂණය වශයෙන් තම රක්ෂණ ව්‍යාපාරය වෙන් කිරීම පිලිබිඹු කරමින්, සමාගමේ නම වෙනස් කිරීම සඳහා ඉල්ලීමක් ඉදරිපත් කරන ලදි. ඒ සඳහා අදාල සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ රක්ෂණ ව්‍යාපාරයේ වෙළඳ නාමකරණය කිරීමේ අරමුණින් යෝජනා කරන ලද නාමයක් නිර්දේශ කරන ලදි.

   එම නාමයට "රක්ෂණය" යන වචනය ඇතුලත් කිරීමට පනතේ 96 වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දෙන ලදි. පනතේ 96 වන වගන්තිය අනුව, රක්ෂණකරුවකු, පනත යටතේ ලියාපදිංචි කර ඇති තැරුව්කරුවකු හෝ එවැනි රක්ෂණකරුවකුගේ හෝ තැරැව්කරුවකුගේ රක්ෂණ නියෝජිතයකු නොවන වෙනත් කිසිම තැනැත්තකු විසින්, මණ්ඩලයේ ලිඛිත අනුමතය තොමැතිව, ස්වකීය නාමයේ, අභිධානයේ හෝ විස්තරයේ කොටසක් වශයෙන් "රක්ෂණය" යන වචනය හෝ ඒ වචනයේ ව්‍යුත්පන්න කිසිවක් හෝ වෙනත් භාෂාවක ඒ වචනයට සමාන වෙනත් යම් වචනයක්, ඒ නාමයෙන්, අභිධානයෙන් හෝ විස්තරයෙන් ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙහි රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන බව පෙන්නම් කිරීම පිණිස භාවිත කිරීම හෝ ඒ ප්‍රතිඵලය ගෙන දෙන නිරූපණ කිසිවක් යම් බල්පත්‍ර ශීර්ෂයක, ලිපි ශීර්ෂයක, දැන්වීමක හෝ ප්‍රචාරක දැන්වීම කිරීම හෝ නොකළ යුතුය.

7 චක්‍රලේඛ අංක 36 යටතේ, විදේශ සෞඛ්‍ය රක්ෂණාවරණයක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන රක්ෂණ තැරුව්කාර සමාගම් කිපයකටම අවසර ලබා දෙන ලදි.

8 කොමිෂන් සභාව විසින්, රක්ෂණ තැරුව්කාර සමාගම් කීපයක් වෙත විධාන # 10 යටතේ රක්ෂණ තැරුව්කාර ව්‍යාපාරය හැර වෙනත් ආකාරයක අනුයාත සේවා කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. විධාන #10 අනුව රක්ෂණ තැරුව්කාර සමාගම් විසින් පනතේ අර්ථ රක්ෂණ තැරුව්කාර ව්‍යාපාරය හැර වෙනත් ආකාරයෙන් අනුයාත සේවා කිරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතු වේ.

9 2011 අංක 3 දරන සංශෝධිත පනතින් හඳුන්වා දුන් විධි විධාන ප්‍රකාරව, රක්ෂණ සමාගම් වල අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ඉල්ලුම් පත්‍ර රාශියකට අනුමැතිය ප්‍රදානය කර ඇත.

10 පනතේ විධි විධාන ප්‍රකාරව රක්ෂණ සමාගම් වල සහ රක්ෂණ තැරැව්කාර සමාගම් වල ප්‍රධාන නිලධාරීන් පත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ඉල්ලුම්පත්‍ර රාශියකට අනුමැතිය ප්‍රදානය කර ඇත.

11 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිය පනත යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍ර රාශියකට කොමිෂන් සභාව ප්‍රතිචාර දක්වන ලදි.

12 කොමිෂන් සභාව විසින් රක්ෂණ නිමැවුම් රැසක් විශ්ලේෂණය කර අදාල රක්ෂණ ආයතන වෙත නිරීක්ෂණයන් සපයන ලදි. චක්‍රලේක අංක 39 අනුව සියළුම රක්ෂණ ආයතන, නව රක්ෂණ නිමැවුම් නිකුත් කිරීමට පෙර අදාල ලිය කියවිලි කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතුය.

# විමර්ශන සමාලෝචනය


රක්ෂණ ඔප්පුහිමියන්ගේ සුභසිද්ධිය සුරැකීමේ සමස්ථ පරමාර්ථය පෙරදැරිව කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන රක්ෂණ වන්දි ගෙවීම් සම්බන්ධයෙන් රක්ෂකයන් හා හිමිකම්පාන්නන් අතර හටගන්නා ආරවුල් විමර්ශනය කිරීමට හා ඒවා නිරාකරණය කිරීමට කොමිෂන් සභාවට බලතල ඇත. එමෙන්ම, කිසියම් රක්ෂකයකු, තැරැව්කරුවකු හෝ නියෝජිතයකුගේ විෂමාචාරයක් හෝ අක්‍රමිකතාවයක් පිළිබඳව ලැබෙන පැමිණිලි ද කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලැබේ.

යම් ආරවුලක් හෝ පැමිණිල්ලක් (රක්ෂකයකු, තැරැව්කරුවකු හෝ නියෝජිතයකුට එරෙහිව) කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබූ අවස්ථාවකදී කොමිෂන් සභාව විසින් තීරණයක් ගැනීමට පෙර අදාල සියළු පාර්ශවයන්ට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදෙනු ලැබේ. රක්ෂකයන් විසින් රක්ෂණ හිමිකම සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණයට පදනම් වූ කරුණු අදාල ලිපිලේඛන හා තොරතුරු මගින් තහවුරු කළ යුතු වේ. කොමිෂන් සභාව විසින් තීරණයන්ට එළැඹීමට පෙර අවශ්‍ය අවස්ථාවලදී තෙවන පාර්ශවයන් වෙතින් කරුණු තහවුරු කර ගැනීම් හා විශේෂඥ මතයන් ලබාගැනීමද සිදු කරනු ලැබේ.

### සමස්ථ පැමිණිලි පිළිබඳ සමාලෝචනය


සමාලෝචනයට පාත්‍ර වන වසර තුළ දී නව පැමිණිලි 315 ක් කොමිෂන් සභාව වෙත යොමු වූ අතර එම කාලය තුළ දී පැමිණිලි 352 ක් (පෙර වසරින් ඉදිරියට ගෙන ආ පැමිණිලි ද ඇතුළුව) සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කෙරුණි. කොමිෂන් සභාවේ මැදිහත්වීම මත, රක්ෂණ වන්දි ආරවුල් 54 ක් රක්ෂණ හිමිකම්පාන්නන්ට වාසිදායක ලෙස නිරාකරණය විය. එසේ කොමිෂන් සභාවේ මැදිහත්වීම මත රක්ෂකයන් විසින් නිරාකරණය කරන ලද රක්ෂණ වන්දි වල ආසන්න මුළු වටිනාකම රුපියල් මිලියන 139 ක් පමණ වේ.

*රූප සටහන 1 : පසුගිය වසර පහ (5) තුළ වාර්ෂිකව ලැබුණු පැමිණිලි*





පසුගිය වසර පහ (5) තුළදී කොමිෂන් සභාවට ලැබුණු මුළු පැමිණිලි වල එකතුව රූප සටහන 1 මගින් දක්වා ඇති ආකාරයට 1,529 කි. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී ලැබුණු පැමිණිලි සංඛ්‍යාව (315) පසුගිය වසරට (247) සාපේක්ෂව වැඩි වී ඇත. වර්ෂය තුළ පැමිණිලි සංඛ්‍යාව වැඩිවීම මහජනතාව අතර රක්ෂණ නියාමන කොමිෂන් සභාව පිළිබඳව දැනුවත්භාවය වැඩිවීම විය හැක.

*රූප සටහන 2 : සමාලෝචිත වසර තුළදී මාසිකව ලැබුණු පැමිණිලි ප්‍රමාණය විශ්ලේෂණය*




සමාලෝචිත වසර තුළ දී කොමිෂන් සභාව වෙත මාසිකව ලැබුණු පැමිණිලි පිළිබඳ විස්තරයක් දෙවැනි රූප සටහන මගින් දැක් වේ. ජූලි මාසයේ දී වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (42) ලැබී ඇති අතර අඩුම පැමිණිලි සංඛ්‍යාව (14) වාර්තා වී ඇත්තේ අප්‍රේල් මාසයේ දීය. මාසිකව ලැබුණු පැමිණිලි වල සාමාන්‍ය අගය 26 ක් වන අතර ජනවාරි, ජූනි, ජූලි, අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝබර් යන මාසයන්හි එකී සාමාන්‍ය අගය ඉක්මවා පැමිණිලි ලැබී ඇත.

*රූප සටහන 3 : 2019 වසරේ දී ලැබුණු පැමිණිලි වර්ගීකරණය*




තෙවන රූප සටහන මගින් 2019 වර්ෂය තුළ ලද සමස්ථ පැමිණිලි වල වර්ගීකරණයක් දක්වා ඇත. සමස්ථ පැමිණිලිවලින් බහුතරය, එනම්, 176 (56%) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ආශ්‍රිතව ද පැමිණිලි 107 (34%) ක් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිතව ද වේ. විශේෂිතවූ රක්ෂණ ව්‍යාපාරයකට වර්ගීකරණය කළ නොහැකි වෙනත් පැමිණිලි 32 (10%) ක් ද වේ. සමාලෝචිත වර්ෂයේ දී කොමිෂන් සභාව වෙත ලැබුණු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ආශ්‍රිත පැමිණිලි වල ප්‍රතිශතය 49% (2018 වසරේ දී) සිට 56% දක්වා වැඩි වී ඇත. දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර ආශ්‍රිත පැමිණිලිවල ප්‍රතිශතය 31% (2018 වසරේදී) සිට 34% දක්වා සුළු වශයෙන් වැඩිවීමක් සිදු වී ඇති අතර වෙනත් පැමිණිලි ඊට සමානුපාතිකව 20% (2018 වසරේ දී) සිට 10% දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

### සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාලව කොමිෂන් සභාවට ලැබුණු පැමිණිලි ගැටළුවේ ස්වභාවය අනුව වර්ගීකරණය කර පළමුවන වගුවේ දක්වා ඇත.

*වගුව 1 - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි : ගැටළුව අනුව*

| ගැටළුව | # | % |
|---|---|---|
| රක්ෂණ වන්දි ආරවුල් | 164 | 93.2 |
| වගකීම පිළිනොගැනීම | 131 | 79.9 |
| ගෙවන ලද/ යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම | 21 | 12.8 |
| හිමිකම් ගෙවීම ප්‍රමාදවීම | 12 | 7.3 |
| වෙනත් පැමිණිලි | 12 | 6.8 |
| **එකතුව** | **176** | **100.0** |

පළමුවන වගුවෙහි දැක්වෙන පරිදි, සමස්ථ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පැමිණිලි අතුරින් (176) රක්ෂණ වන්දි ආරවුල් 164 (93.2%) වන අතර ඉතිරි පැමිණිලි 12 (6.8%) අර්ධකාලීනව රක්ෂණ ඔප්පු අවලංගු කිරීම්, අසන ලද ප්‍රශ්න වලට ප්‍රතිචාර නොදැක්වීම්, වාරික නැවත ලබාගැනීම පිළිබඳ ඉල්ලීම් හා රක්ෂණ ඔප්පු නොලැබීම ආදී වෙනත් පැමිණිලි වේ. රක්ෂණ වන්දි ආරවුල් යටතේ ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කරනුයේ වගකීම පිළිනොගැනීම (79.9%) සඳහා වන පැමිණිලියි.

පැමිණිලි වල මූලසාධකයන් විශ්ලේෂණය කිරීමේ දී මෝටර් රථ වාහන හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ ප්‍රධාන හේතු ලෙසට අනාවරණය වන්නේ; අනතුර සම්බන්ධයෙන් වන වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ කරුණු වරදවා දැක්වීම (රක්ෂණය ලබාගත් අරමුණට පරිබාහිර අරමුණු සඳහා වාහනය භාවිතා කිරීම, රියදුරු බීමත්ව සිටීම, වලංගු රියදුරු බලපත්‍රයක් නොමැති අයෙක් රිය පැදවීම හෝ හිමිකම්පාන්නාට වාහනය කෙරෙහි එය විකිණීමෙන් පසුව රක්ෂණීය බැඳියාවක් නොමැතිවීම මෙම කරුණු වරදවා දැක්වීම හෝ වැදගත් කරුණු ඉදිරිපත් නොකිරීමට හේතු විය හැක) රියදුරු/ රක්ෂිතයා විසින් අනතුර පිළිබඳ ලබාදුන් විස්තරය සමග අනතුරෙන් සිදු වූ අලාභහානි නොසැසඳීම හෝ අනතුර සිදුවන දිනය වන විට මුළු රක්ෂණ වාරික මුදල නොගෙවීම මත රක්ෂණ ඔප්පුව අවලංගුවීමයි. රක්ෂණ හිමිකම සම්බන්ධ පැමිණිලි විභාග කිරීමේ දී අවශ්‍ය අවස්ථාවන්හිදී රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, පොලිස් ස්ථාන, රෝහල් හා සිද්ධිය පිළිබඳ ප්‍රකාශ ලබාදුන් අය වෙතින් අදාල තොරතුරු කැඳවීමෙන් හිමිකම් ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් සවිස්තරාත්මක පරීක්ෂණයන් පවත්වන ලදී. හිමිකම උද්ගතවීමට හේතු වූ අලාභය රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය වන සහ කිසිදු ආකාරයක වංචාවක් හෝ හිතාමතා කරුණු වරදවා දැක්වීමක් සිදු ව නොමැති අවස්ථා වලදී හිමිකම්පාන්නන්ට සහාය වීමට කොමිෂන් සභාවට හැකි විය.

රක්ෂණ වන්දි ආරවුල් යටතේ ප්‍රධාන වශයෙන් බලපෑ මීළඟ හේතුව (12.8%) වූයේ ගෙවන ලද/ යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීමයි. මෙම පැමිණිලි වලට මූලික හේතූන් වූයේ රක්ෂණ ඔප්පුවෙහි කරුණු වරදවා වටහා ගැනීම සහ රක්ෂකයන් විසින් ගෙවන ලද අලාභ ගැලපුම්/ අඩු කිරීම් පිළිබඳව ප්‍රමාණවත් පැහැදිලි කිරීම් ලබා නොදීමයි. ලිඛිත කරුණු පැහැදිලි කිරීම් තුළින් හෝ කොමිෂන් සභාවේ දී පවත්වනු ලබන සාකච්ඡා වලදී හිමිකම්පාන්නන්ට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාදීම මගින් මෙවැනි බොහොමයක් ආරවුල් විසඳාගත හැකි විය. කොමිෂන් සභාවට යොමු කරන ලද ඉතිරි පැමිණිලි 9 හිමිකම් ගෙවීම ප්‍රමාද වීම සම්බන්ධවයි. රක්ෂිතයන්ගේ හෝ අළුත්වැඩියාකරුවන්ගේ පාර්ශවයෙන් හිමිකම් නිරාකරණය කිරීමට අවශ්‍ය තොරතුරු හා ලේඛන ඉදිරිපත්කිරීමේදී සිදුවන ප්‍රමාදයන් සහ හිමිකම් පිළිබඳව තවදුරටත් විමර්ශන කටයුතු සිදුකරගෙන යාම බොහොමයක් ප්‍රමාදයන් වලට හේතු වී ඇති බවට නිරීක්ෂණය කරන ලදී.

### දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාලව ලැබුණු පැමිණිලි ගැටළුවේ ස්වභාවය අනුව විශ්ලේෂණය කර දෙවන වගුවේ දක්වා ඇත.

*වගුව 2 - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාලව පැමිණිලි: ගැටළුව අනුව*

| ගැටළුව | # | % |
|---|---|---|
| රක්ෂණ වන්දි ආරවුල් | 46 | 43.0 |
| වගකීම පිළිනොගැනීම | 29 | 63.0 |
| පූර්ණත්ව සහ පවාරණ ප්‍රතිලාභ | 11 | 24.0 |
| යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීම | 6 | 13.0 |
| වෙනත් පැමිණිලි | 61 | 57.0 |
| ගෙවන ලද වාරික මුදල් ආපසු ලබාගැනීම/ ඔප්පු අවලංගු කිරීම හෝ පුනස්ථාපනය සඳහා වන ඉල්ලීම් | 35 | 57.3 |
| තොරතුරු ලබාදීම | 5 | 8.2 |
| වාරික ගෙවීම/ සාවද්‍ය පරිහරණය | 3 | 5.0 |
| වෙනත් | 18 | 29.5 |
| **එකතුව** | **107** | **100.0** |

දෙවන වගුවට අනුව සමස්ථ දීර්ඝ කාලීන ව්‍යාපාරය යටතේ ලැබුණු පැමිණිලි (107) වන අතර 43% රක්ෂණ වන්දි ආරවුල් සම්බන්ධයෙන් වන අතර 57% වෙනත් පැමිණිලි සම්බන්ධයෙන් වේ.

රක්ෂණ වන්දි ආරවුල් සඳහා මූලික හේතුව වන්නේ රක්ෂිතයා වගකීම පිළිනොගැනීමයි. බොහොමයක් හිමිකම් ගෙවීම් ප්‍රතික්ෂේප වීමට පාදක වී ඇත්තේ රක්ෂණ ඔප්පුව ලබාගැනීමේ දී හෝ පුනස්ථාපනය කිරීමේ දී වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ වරදවා දැක්වීම මතයි. රක්ෂණ ගිවිසුමක පදනම වන "උපරිම සද්භාවය" *(Uberrimae fidei)* නම් මූලික නෛතික මූලධර්මය ගිවිසුමේ දෙපාර්ශවය එනම්, රක්ෂකයා මෙන්ම රක්ෂිතයාට එකසේ ක්‍රියාකරයි. යෝජකයා විසින් රක්ෂණ යෝජනා පත්‍රය මගින් හෙළිදරව් කරන තොරතුරු මත පදනම්ව, රක්ෂණ යෝජකයාගේ ජීවිතය පිළිබඳ අවදානම පිළිගන්නේද යන වග සහ ඊට අදාල කොන්දේසි හා නියමයන් රක්ෂකයා විසින් තීරණය කරයි. එවන් අවස්ථාවක, රක්ෂිතයා විසින් කිසියම් වැදගත් කරුණක් හෙළිදරව් නොකළහොත් හෝ වරදවා දැක්වීමක් සිදුකළහොත්, උපරිම සද්භාවය මූලධර්මය උල්ලංඝනය වේ.

සමහර අවස්ථාවලදී, යෝජකයා විසින් වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හා වරදවා දැක්වීමට හේතු වී ඇත්තේ අදාල රක්ෂණ මූලධර්ම හා වැදගත් තොරතුරු හෙළිදරව් කිරීමේ වගකීම පිළිබඳ නොදැනුවත්භාවය බවට නිරීක්ෂණය විය. එබැවින්, රක්ෂණ ඔප්පුහිමියා වෙත පැවරෙන වැදගත් කරුණු හෙළිදරව් කිරීමේ වගකීම හා එසේ කිරීමට අපොහොසත්වීමෙන් සිදුවන අහිතකර ප්‍රතිවිපාක පිළිබඳව ඔවුන්ව නිසි පරිදි දැනුවත් කළ බව තහවුරු කරගැනීමට අවශ්‍ය පියවර රක්ෂකයා විසින් ගත යුතුය. වැදගත් කරුණු හෙළිදරව් නොකිරීම හෝ කරුණු වරදවා දැක්වීම හිතාමතා හෝ නොසැලකිල්ලෙන් නොවන අවස්ථාවන් කිහිපයකදී පමණක් අදාල රක්ෂණ හිමිකම්පාන්නන්ට සහාය වීමට කොමිෂන් සභාවට හැකිවිය.

රක්ෂණ ඔප්පුවේ දක්වා ඇති කාලවකවානුව තුළ හා නියමිත පරිදි වාරික ගෙවීම රක්ෂණ ඔප්පුහිමියාගේ ගිවිසුම්ගත යුතුකමක් වේ. අලාභය සිදුවන විට වාරික නොගෙවීම හේතුවෙන් රක්ෂණ ඔප්පුව අප්‍රාණිකව පැවති අවස්ථාවලදී රක්ෂණ වන්දි ප්‍රතික්ෂේප වී ඇත. නියමිත වේලාවට රක්ෂණ වාරික ගෙවා රක්ෂණ ඔප්පුව පවත්වාගෙනයාම රක්ෂණ ඔප්පුහිමියාගේ වගකීමක් වන අතර ආරවුලකදී ඉදිරිපත් කිරීමට සිදුවුවහොත් ගෙවීම් තහවුරු කිරීමට සාක්ෂි ඔවුන් සතුවීම අවශ්‍ය වේ. ඒ අනුව, නියමිත කාලසීමාව තුළ වාරික ගෙවන ලද බව තහවුරු කළ හැකි හෝ ගෙවීමේදී සිදු වූ ප්‍රමාදය සාධාරණීකරණය කළ හැකි අවස්ථා වලදී පමණක් කොමිෂන් සභාවට සහාය වීමට හැකි විය.

රක්ෂණ ආරවුල් වලට බලපෑ තවත් ප්‍රධාන හේතුවක් වන්නේ පූර්ණත්ව හා පවාරණ ප්‍රතිලාභ ලබාගැනීම (24%) සම්බන්ධවයි. මෙවැනි ආරවුල් සඳහා ප්‍රධාන හේතුව වන්නේ රක්ෂණ ඔප්පුවල වගන්ති පිළිබඳ අනවබෝධය සහ රක්ෂකයන් විසින් ලබාදෙන පැහැදිලි කිරීම් ප්‍රමාණවත් නොවීමයි. රක්ෂණ ඔප්පුහිමියන්ට ලිඛිතව සහ කොමිෂන් සභාවේ දී පවත්වන ලද සාකච්ඡාවන්හි දී අවශ්‍ය පැහැදිලි කිරීම් සැපයීමෙන් මෙවැනි බොහොමයක් ආරවුල් විසඳාගත හැකි විය. හිමිකම්පාන්නන්ට තමන්ගේ යෝජිත මුදල දැනුම් දීමේදී ප්‍රමාණවත් පැහැදිලි කිරීම් හෝ විස්තර ලබානොදීම් මෙවැනි යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවූ ආරවුල් (13%) සියල්ලෙහිම පාහේ හේතුව බවට නිරීක්ෂණය විය.

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාල වෙනත් පැමිණිලි (57.3%) සඳහා ප්‍රධාන හේතුව වූයේ රක්ෂණ ඔප්පු අවලංගු කිරීම සහ ගෙවන ලද වාරික මුදල් ආපසු ලබාගැනීම හෝ පුනස්ථාපනය සඳහා වන ඉල්ලීම් සම්බන්ධයෙන් වන පැමිණිලි වේ. අවලංගු කිරීමේ කාලසීමාව (එනම්, රක්ෂණ ඔප්පුව ලැබුණු දින සිට දින 21 ක් ඇතුළත) ඉකුත් වීමෙන් අනතුරුව රක්ෂණ ඔප්පුහිමියාට එවැනි අයිතියක් නොමැති වීම නිසා රක්ෂණ ඔප්පු අවලංගු කිරීම සහ ගෙවන ලද වාරික මුදල් ආපසු ලබාගැනීම සම්බන්ධයෙන් වන පැමිණිලි සඳහා සහාය වීමට හැකියාවක් නොලැබුණි. කෙසේවුවත්, රක්ෂණ ඔප්පුහිමියන් හෝ හිමිකම්පාන්නන් මුහුණ පෑ දුෂ්කරතා පිළිබඳ පැහැදිලි සාක්ෂි තිබෙන විටදී සහනයක් සැලසීමට රක්ෂකයන් එකඟ විය. රක්ෂණ ඔප්පුව පුනස්ථාපනය කිරීමට පියවර ගැනීමට ප්‍රමාද වූ කරුණු සාධාරණීකරණය කළ හැකි විටකදී පමණක් නියමිත කාලය ඉකුත්වීමෙන් පසුව සිදුකරන ලද පුනස්ථාපනය සඳහා වන ඉල්ලීම් වලට රක්ෂණ ඔප්පුහිමියන්ට සහාය වීමට හැකිවිය. ගෙවූ රක්ෂණ මුදල් නැවත ලබාගැනීම සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රධාන හේතුව ලෙස රක්ෂණ වාරික මුදල් අඛණ්ඩව ගෙවා රක්ෂණ ඔප්පුව පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳව අනවබෝධය සහ ආර්ථික දුෂ්කරතා බව නිරීක්ෂණය විය.

විමර්ශනයන්හි දී අනාවරණය වූ කරුණු මත පදනම්ව අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාදීම තුලින් තොරතුරු ලබාදීම (8.2%) සම්බන්ධයෙන් වන පැමිණිලි නිරාකරණය කිරීමට හැකි විය. වාරික ගෙවීම සහ සාවද්‍ය පරිහරණය සම්බන්ධයෙන් වන පැමිණිලි ලැබුණේ 5% පමණකි. වාරික මුදල් සාවද්‍ය පරිහරණය පිළිගතහැකි සාක්ෂි මගින් තහවුරු කළහැකි අවස්ථා වලදී පමණක් රක්ෂණ ඔප්පුහිමියන්ට සහාය වීමට හැකියාව ලැබුණි. වෙනත් පැමිණිලි (29.5%) රක්ෂණ ඔප්පු වලින් ලබාගත් ණය, වාරික ගෙවන ආකාරය හා ශාඛා කාර්යාල වල කටයුතු සම්බන්ධයෙන් ලැබුණු අතර විමර්ශනයන්හි දී අනාවරණය වූ කරුණු මත පදනම්ව එකී සියළු පැමිණිලි සම්බන්ධයෙන් පියවර ගනු ලැබීය.

### වෙනත් පැමිණිලි

සමාලෝචිත වසර තුළදී මූලිකවම රක්ෂණ නියෝජිතයන්ව අසාධාරණ ලෙස සේවය අවසන් කිරීම/ අසාදුලේඛනගත කිරීම සහ එකී නියෝජිතයන්ගේ අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධයෙන් පැමිණිලි (32) ලැබුණි. පනතේ විධිවිධාන යටතේ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, පැමිණිලිකරුවන්ට සහාය වීමට හෝ පැමිණිලි නිරාකරණය කිරීමට හැකි අවස්ථා වලදී පියවර ගන්නා ලදී.

### රක්ෂණ ආරවුල් නිරාකරණය කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම

ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් ප්‍රාග්ධන වෙළඳපල සංවර්ධනය කිරීමේ වැඩසටහන (CMDP) සඳහා ශ්‍රී ලංකා රජයට අදියර දෙකකින් සමන්විත ප්‍රතිපත්ති මත පදනම්වූ ණය මුදලක් අනුමත කර ඇත. මෙම වැඩසටහන (CMDP) මගින් ප්‍රාග්ධන වෙළඳපලෙහි මූල්‍යමය මැදිහත්වීමේ භූමිකාව වර්ධනය කිරීමට සහ ආයෝජක පදනම විවිධාංගීකරණය සහ ව්‍යාප්තිය තුළින් ඉතිරිකිරීම හා ආයෝජන අතර වෙන් කරන ලද කාර්යාක්ෂමතාවය වැඩිදියුණු කිරීම මගින් සම්පත් බලමුළුගැන්වීමට මූල්‍යමය සහාය සලසාදෙයි. කොමිෂන් සභාවද ඇතුළුව ක්‍රියාත්මකවන නියෝජිත ආයතන මගින් නියමිතව හඳුනාගත් ප්‍රතිපත්තිමය කටයුතු මුදුන්පමුණුවා ගැනීම මත අරමුදල් මුදාහැරීම රඳා පවතී. ප්‍රතිපත්තිමය කටයුතු මුදුන්පමුණුවා ගැනීම සඳහා බැංකුව (ADB) මගින් නියෝජිත ආයතනවලට තාක්ෂණික සහාය ලබාදෙයි.

දෙවන වාරිකය අනුව, කොමිෂන් සභාව වෙත සිය නිර්දේශයන් ඉදිරිපත් කරනු ලබන රක්ෂණ ක්ෂේත්‍රයට අදාල ආරවුල් විසඳීමේ මණ්ඩලයක් සහ කාර්ය මණ්ඩලයක් පිහිටුවීමට නියමිතය. 2018 ජූලි මාසයේ දී අන්තර්ජාතික උපදේශකවරුන් විසින් දෙන ලද නිර්දේශයන්ට අනුව, 98 වගන්තිය යටතේ පැවති බලතල අභිනියෝජනය කිරීමට රක්ෂණ ඔම්බුඩ්ස්මන් යෝජනා විධිමත් කිරීමට හා වැඩි දියුණු කිරීමට තීරණය කරන ලදී. 2018 නොවැම්බර් මාසයේ දී යෝජිත රක්ෂණ කර්මාන්තයේ ඔම්බුඩ්ස්මන් මධ්‍යස්ථානය සඳහා වූ මූලික රාමුවේ සහ ක්‍රියාවට නැංවීමේ සැලසුමේ කෙටුම්පත පිළිබඳව මූලික වටයේ සාකච්ඡාවක් කර්මාන්තයේ නියැලෙන්නන් සමග පවත්වන ලදී. කොමිෂන් සභාව කර්මාන්තයේ ප්‍රතිචාර අනුව මූලික කෙටුම්පතෙහි වෙනස්කම් සිදුකර කොමිෂන් සභාවෙහි අනුමැතිය සඳහා යොමු කරන ලදී. 2019 මැයි මාසයේ සැලසුමෙහි කෙටුම්පත සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය හිමි වූ අතර අදාල කෙටුම්පතට රක්ෂණකරුවන්ගේ සංගමය විසින් කර්මාන්තයේ එකඟතාවය දන්වා ඇති අතර කොමිෂන් සභාව විසින් මේ වනවිට කර්මාන්තයේ සහ උපදේශකවරු සමග යොමු කිරීමේ අනුදේශ සකසමින් පවතී.

# වෙළඳපොල සංවර්ධන සහ බාහිර සබඳතා සමාලෝචනය

දැනුවත්කිරීම රක්ෂණ කර්මාන්තයේ වර්ධනයට සහ සංවර්ධනයට බලපාන ප්‍රධාන අංගයක් ලෙස සැලකේ. රක්ෂණය පිළිබඳ සංකල්පය සහ අවදානම් අවම කිරීමේ මෙවලමක් ලෙස රක්ෂණයේ ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාව විසින් තවමත් සම්පූර්ණයෙන් වටහාගෙන නොමැත. වෙළඳපොල සංවර්ධන සහ බාහිර සම්බන්ධතා කටයුතු පිළිබඳ කොමිෂන් සභාවේ අවධානය යොමුවී ඇත්තේ රක්ෂණයට අදාල කරුණු පිලිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම හා එමගින් රක්ෂණ කර්මාන්තයේ වර්ධනයට පහසුකම් සැලසීම සහ රක්ෂණ වෙළඳපොළ කෙරෙහි මහජන විශ්වාසය ගොඩනැගීමය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කොමිෂන් සභාව දැනුවත්කිරීමේ වැඩසටහන් කීපයක් පවත්වන ලදී. එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ කොමිෂන් සභාවේ පරමාර්ථය වන්නේ රක්ෂණයේ වැදගත්කම, රක්ෂණ කර්මාන්තය සහ එහි නවතම ප්‍රවණතා, සුදුසු රක්ෂණ ඔප්පු තෝරාගැනීම, රක්ෂණ ඔප්පුහිමියන් වෙනුවෙන් ක්‍රියාත්මක වන දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයන් යනාදිය පිළිබඳව දැනුම වැඩිදියුණු කිරීම මගින් වර්තමාන සහ අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ගේ සුභසිද්ධිය ආරක්ෂා කිරීමයි.

මෙම පරමාර්ථය සාර්ථක කරගැනීම සඳහා කොමිෂන් සභාව විවිධ සන්නිවේදන මාර්ග උපයෝගී කර ගනිමින් ඉලක්කගත ප්‍රේක්ෂකයින් වෙත ළඟාවිය. සමාලෝචනය කරන ලද වර්ෂය තුළ භාවිතා කරන ලද සන්නිවේදන නාලිකා සහ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර පහත පරිදි වේ:

## රක්ෂණය පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන්

### ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩසටහන්

මෙම වැඩසටහන් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහයෝගයෙන් සංවිධානය කරන ලදී. එවැනි වැඩසටහන් වල පරමාර්ථය වූයේ මහජනතාව සමග නිතරම උරෙන් උර ගැටී වැඩකරන රජයේ නිලධාරීන් වන ග්‍රාමසේවා නිලධාරීන්, පොලිස්, සුරාබදු දෙපාර්තමේන්තු නිලධාරීන්, සමෘද්ධි, ක්‍රීඩා, සංවර්ධන, කෘෂිකාර්මික හා වෙනත් ක්ෂේත්‍ර නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ රක්ෂණය පිළිබඳ දැනුම වැඩිකිරීමයි. කොමිෂන් සභාවේ කාර්යභාරය (රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය ලෙස) ජීවිතවලට හෝ දේපළවලට ඇති අවදානම් ආවරණය කිරීම සඳහා සුදුසු රක්ෂණ ඔප්පුවක් තිබීමේ වැදගත්කම, රක්ෂණ ඔප්පුහිමියෙකුගේ අයිතිවාසිකම් සහ යුතුකම්, රක්ෂණ ඔප්පුවක් මිලදීගැනීමේදී හා පවත්වාගෙන යාමේදී සලකා බැලිය යුතු වැදගත් කරුණු, රක්ෂණ ඔප්පුවක් යටතේ හිමිකම් පෑම් සහ රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරවුල් විසඳීමේ යාන්ත්‍රණය ආදිය සම්බන්ධව මෙහිදී සහභාගීවන්නන් දැනුවත්කරන ලදී.

ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාශ 471 ක් ආවරණය වන පරිදි යටවත්ත, ගලෙන්බිඳුනුවැව, ඉඹුල්පෙ, බිබිල, වීරකැටිය, කඩුවෙල, වලපනේ සහ වව්නියාව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල "කොට්ඨාශ දින රැස්වීම්" වලදී රක්ෂණය පිලිබඳව දැනුවත්කිරීමේ වැඩසටහන් අටක් (8) පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා අදාල ප්‍රදේශවල රජයේ නිලධාරීන් 743 ක් පමණ සහභාගී විය.



ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩසටහන්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පවත්වන ලද ප්‍රධාන දැනුවත්කිරීමේ වැඩසටහන් වලට අමතරව, කොමිෂන් සභාව ගාල්ල සහ රත්නපුර දිස්ත්‍රික් වාණිජ හා කර්මාන්ත මණ්ඩල සාමාජිකයන් සඳහා දැනුවත්කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

### එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ජාතික ප්‍රදර්ශනය

අනුරාධපුරයේ සහ යාපනයේ පැවති "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" ජාතික ප්‍රදර්ශනයට කොමිෂන් සභාව සහභාගී විය. කොමිෂන් සභා කුටිය තුළ රක්ෂණය සම්බන්ධ තොරතුරු ප්‍රදර්ශනය කරන ලදී. රක්ෂණයට අදාළ විවිධ තොරතුරු ලබාගැනීමේ අරමුණින් ප්‍රදර්ශන කුටියට අමුත්තන් විශාල ප්‍රමාණයක් සහභාගී විය. ප්‍රදර්ශන කුටියට පැමිණි අය අතර රක්ෂණය සම්බන්ධ ප්‍රශ්න මාලාවක් ලබා දී නිවැරදි පිළිතුරු සැපයූ ජයග්‍රාහකයන්ට සිහිවටන ලබාදෙන ලදී. තවද, අනුරාධපුර ප්‍රදර්ශන භූමියේදී මහජනතාව දැනුවත්කිරීම සඳහා විශේෂිත පණිවිඩකරුවන් දෙදෙනෙකුද යොදවා තිබුණි.



එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ජාතික ප්‍රදර්ශනය

### පාසල් ළමුන් සඳහා වූ චිත්‍ර තරඟය

අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සහාය ඇතිව "ජාතික රක්ෂණ දිනය" සැමරීම සඳහා පාසල් ළමුන් අතර දීප ව්‍යාප්ත චිත්‍ර තරඟයක් කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලදී. "අපගේ ජීවිත සහ දේපළ සඳහා රක්ෂණයේ ඇති වැදගත්කම" යන තේමාව යටතේ මෙම තරඟය පවත්වන ලදී. 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා කාණ්ඩ 4ක් යටතේ මෙම තරඟය පවත්වන ලදී. කොමිෂන් සභාවට පාසල් ළමුන්ගෙන් චිත්‍ර 6000 කට ආසන්න ප්‍රමාණයක් ලැබී තිබුණු අතර ජයග්‍රාහකයන් තෝරාගනු ලැබුවේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත්කරන ලද විනිශ්චය මණ්ඩලයක් විසිනි.

පත්කරන ලද විනිශ්චය මණ්ඩලය විසින් ජයග්‍රාහකයින් 136 දෙනෙකු තෝරාගන්නා ලදී. "රන්", "රිදී", "ලෝකඩ" සහ "කුසලතා" යන කාණ්ඩ යටතේ ත්‍යාග ප්‍රදානය කරන ලදී. ජයග්‍රාහකයන්ට සහතික, මුදල් ත්‍යාග සහ සිහිවටන ප්‍රදානය කරන ලදී. ත්‍යාග ප්‍රදානෝත්සවය කොළඹ නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේදී සම්භාවනීය ආරාධිතයන් රැසකගේ සහභාගීත්වයෙන් දෙසැම්බර් මාසයේදී පැවැත්විණි.

### ජංගම දුරකතන භාවිතා කරන්නන් මාර්ගයෙන් දැනුවත්භාවය ඇතිකිරීම

ජාතික රක්ෂණ දිනය සැමරීම සඳහා තෝරාගත් ජංගම දුරකථන සේවාවක් මාර්ගයෙන් රක්ෂණයේ වැදගත්කම පිළිබඳව කෙටි පණිවිඩයක් (SMS) 2019 සැප්තැම්බර් 01 වන දින විශේෂිත පාරිභෝගික කොටසක් වෙත ලබාදෙන ලදී.

### මුද්‍රිත මාධ්‍ය හරහා තොරතුරු බෙදාහැරීම

සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ කොමිෂන් සභාව පහත සඳහන් පුවත්පත් නිවේදන හා පුවත්පත් දැන්වීම් නිකුත් කරන ලදී.

#### පුවත්පත් නිවේදන

- රක්ෂණ නියාමන ආයතනය විසින් රක්ෂණකරුවන් සඳහා ආයතනික පාලන රාමුවක් නිකුත් කිරීම
- රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය පළමුවන කාර්තුව 2019
- 2018 වර්ෂය සඳහා රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය
- 2019 වර්ෂයේ පළමු අර්ධය තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය
- 2019 වර්ෂයේ තුන්වන කාර්තුවේ රක්ෂණ කර්මාන්තයේ කාර්ය සාධනය

#### පුවත්පත් දැන්වීම්

- රක්ෂණ උපදේශකවරුන්ගේ කාර්යභාරය
- පාසල් ළමුන් සඳහා දීප ව්‍යාප්ත චිත්‍ර තරඟය



පුවත්පත් දැන්වීම්

#### දැනුවත් කිරීමේ මුද්‍රිත අත් පත්‍රිකා

ජීවිත රක්ෂණය පිළිබඳ දැනට පවත්නා අත්පත්‍රිකාව සහ මෝටර් රථ රක්ෂණය



දැනුවත් කිරීමේ මුද්‍රිත අත් පත්‍රිකා

පිළිබඳ අත්පත්‍රිකාව සමාලෝචිත වර්ෂය තුළ නැවත මුද්‍රණය කර ප්‍රධාන වශයෙන් දැනුවත්කිරීමේ වැඩසටහන් වලදී බෙදාහරින ලදී.

### විද්‍යුත් මාධ්‍ය හරහා දැනුවත්භාවය ඇතිකිරීම

රක්ෂණය පිළිබඳ දැනුවත්කිරීම සඳහා පණිවිඩ ප්‍රචාරය කිරීම තුළින් මාධ්‍යයට වැදගත් කාර්යභාරයක් පැවරේ. මේ අනුව සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ කොමිෂන් සභාව රූපවාහිනී වැඩසටහන් තුනක් සහ ගුවන්විදුලි වැඩසටහන් තුනක් සංවිධානය කර පවත්වන ලදී. රක්ෂණයට අදාළ කරුණු පිළිබඳව දැනුවත් කිරීම සඳහා කොමිෂන් සභාවේ නිලධාරීන් පහත සඳහන් වැඩසටහන් වලට සහභාගී වූහ.

#### රූපවාහිනී වැඩසටහන්

- ස්වාධීන රූපවාහිනී සේවයේ (ITN) විකාශය වූ රක්ෂණය පිළිබඳ පණිවිඩයක් රැගත් ජනප්‍රිය ටෙලිනාට්‍යයක් වන "කෝපි කඩේ" හි ඒකාංගික කථාව
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ (SLRC) "අයි" නාලිකාවේ විකාශය වූ "බිස්නස් ටුඩේ" වැඩසටහනේ පටිගත කරන ලද සාකච්ඡාව
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ (SLRC) "සංහිඳ" වැඩසටහනේ විකාශය වූ සජීවී සාකච්ඡාව

#### ගුවන්විදුලි වැඩසටහන්

- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ (SLBC) සිටි FM නාලිකාවේ පැයේ පුවත් විකාශයට පෙර, පටිගතකරන ලද කෙටි පණිවිඩ දිනකට දස වාරයක් බැගින් දින 30ක කාලයක් තුළ ප්‍රචාරය වීම
- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සියලුම (12) නාලිකා වල ප්‍රධාන ප්‍රවෘත්ති විකාශයට පෙර කලින් පටිගත කරන ලද කෙටි පණිවිඩ (භාෂා තුනකින්) ප්‍රචාරය වීම
- කොමිෂන් සභාව විසින් සපයන ලද තොරතුරු මත, රක්ෂණයට අදාළ විවිධ කරුණු පිළිබඳව සජීවී සාකච්ඡාව සිරස FM හි "සූර්ය සිරස මෝනිං ෂෝ" හරහා ප්‍රචාරය වීම

### ADB ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩපිළිවෙළ (CMDP)

ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහනේ රක්ෂණ අධ්‍යාපන කොටස යටතේ කොමිෂන් සභාවේ අදහස් විමසා බැලූ ආසියානු සංවර්ධන බැංකුව අධ්‍යාපන උපායමාර්ග හා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සකස්කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට උපදෙස් හා සහාය ලබාදීම සඳහා උපදේශකයෙකු පත් කළේය. උපදේශකවරයා තමාගේ නිරීක්ෂණයන් සම්පූර්ණ කර රක්ෂණ කර්මාන්තයේ නියෝජිතයන්ද ඇතුළුව ඉලක්කගත කණ්ඩායම්, ප්‍රධාන තොරතුරු සපයන්නන් සමග සාකච්ඡා කර අධ්‍යාපන උපායමාර්ග සඳහා වන යෝජනා සම්බන්ධයෙන් 2019 මාර්තු මාසයේදී කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කිරීමක් කරන ලදී. කොමිෂන් සභාව උපදේශකවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වයේ අදහස් විමසීය.

කොමිෂන් සභාවේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අදහස් / විවේචන මත පදනම්ව ආසියානු සංවර්ධන බැංකුව, අධ්‍යාපන උපාය මාර්ග හා ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සංශෝධනය කර නැවත සකස්කරන ලද පිටපත 2019 ජූලි මාසයේදී කොමිෂන් සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. කොමිෂන් සභාවේ 2020 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති අනුමත පාරිභෝගික අධ්‍යාපන උපාය මාර්ගය, උපාය මාර්ග තුනකින් (03) සහ ක්‍රියාත්මක කිරීමේ කාල රාමුවකින් සමන්විත වේ. පාරිභෝගික අධ්‍යාපන උපාය මාර්ග 2022 හතරවන (04) කාර්තුව වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

### වෙනත් කටයුතු

#### මහජන විමසීම් සඳහා ප්‍රතිචාර

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, කොමිෂන් සභාව, සාමාන්‍ය ජනතාව, රක්ෂණ ඔප්පුහිමියන් සහ වෙනත් විවිධ පාර්ශවකරුවන් විසින් කරන ලද තොරතුරු විමසීම් වලට ප්‍රතිචාර දැක්වීමට සහ රක්ෂණ කර්මාන්තයට අදාල මගපෙන්වීම් ලබාදීමට සහභාගී විය.

# පරිපාලනමය සමාලෝචනය

**මානව සම්පත්**

ඕනෑම සංවිධානයක සාර්ථකත්වය විශාල වශයෙන්ම රැඳී තිබෙන්නේ එහි ක්‍රියාකාරිත්වයට හවුල් වන්නා වූ පුද්ගලයින්ගේ විශේෂඥ ඥානය මතය. කොමිෂන් සභාවේ සාර්ථක උපක්‍රමවල කශේරුව (කොඳුනාරටිය) වන්නේ අපගේ මානව සම්පත් බැව් අප විශ්වාස කරන්නේ එබැවිනි.

ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය, රක්ෂණ සහතික දරන්නන්ගේ හා අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන ආකාරයෙන් කරගෙන යනු ලබන බවට වගබලා ගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූලික කාර්යන් හඳුනා ගනිමින් කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය සකස් කර ඇත.

අපේක්ෂිත වෘත්තීකයින් නිසි කලට බඳවා ගැනීම තුලින් මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර මේ වසර තුළදී කොමිෂන් සභාව විසින් ගන්නා ලදි. මෙම පියවර සාක්ෂාත් කර ගැනීම උදෙසා සමාලෝචිත වසර තුළ දී අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්, විධායක නිලධාරීන් තිදෙනෙකු සහ එක් ලේකම්වරියක ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගන්නා ලදි. 2019 දෙසැම්බර් 31 වන දිනට කාර්ය මණ්ඩලය 48 ක් විය.

කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පහත වගුවෙන් දැක්වේ.

| නිලධාරීන් සංඛ්‍යාව | අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් | | | | | |
|---|---|---|---|---|---|---|
| | පශ්චාත් උපාධිය ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා ප්‍රථම උපාධිය | ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය | වෘත්තීය සුදුසුකම් |
| 48 | 07 | 04 | 06 | 06 | 11 | 02 |

**පුහුණු කිරීම**

ආයතනික අරමුණු සහ කාර්යසාධනය වර්ධනය කර ගැනීම උදෙසා දැනුම සහ වෘත්තීයමය නිපුණතාවන් කෙරෙහි යොමුවීම ප්‍රධාන වේ. සේවක මණ්ඩලයේ හැකියාවන් ශක්තිමත් කිරීම උදෙසා දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථාවන් ඔවුන් වෙත පහත වගුවේ දැක්වෙන පරිදි ලබා දෙන ලදී.

.

| වර්ගය | 2019 (රු.) | 2018 (රු.) |
|---|---|---|
| දේශීය පුහුණු | 1,610,639 | 1,264,144 |
| විදේශීය පුහුණු | 10,375,090 | 10,589,034 |

**කාර්ය මණ්ඩල සුභසාධනය**

කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය සහ ධෛර්යය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ සුභසාධනය වැදගත් සාධකයකි. එබැවින් කොමිෂන් සභාව විසින් නේවාසික සහ බාහිර වෛද්‍ය පහසුකම්, හදිසි අනතුරු රක්ෂණාවරණ, වාහන ණය, ආපදා ණය හා උත්සව අත්තිකාරම් වැනි සිත්ගන්නා සුළු සුභසාධනයන් ලබා දෙන ලදී. තව ද, කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල අයගේ සබැඳියාවන් වර්ධනය කිරීම උදෙසා නේවාසික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.


# මූල්‍ය සමාලෝචනය

## රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල

රක්ෂණ පනතේ නියමයන්ට අනුව රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙනුවෙන් එකතුවන මුදලින් (සෙස්), නියම කොට ඇති කටයුතු සඳහා ක්ෂණිකව යොදවන්නට අවශ්‍ය නොවන මුදල් විචක්ෂණ ලෙස උපරිම ප්‍රතිලාභ ලැබෙන අන්දමින් මෙම වසර තුළ දී ද කොමිෂන් සභාව විසින් ආයෝජනය කරන ලද අතර 1 වැනි රූපසටහනෙන් වසර 2015 සිට 2019 දක්වා සෙස් බදු ආදායමත් ආයෝජන ආදායමත් විදහා දක්වයි.

1 වන රූපසටහනෙන් පසුගිය වසර පහ තුල සෙස් ආදායම වර්ධනය වූ ආකාරය නිරූපනය වේ. වාසිසහගත වෙලඳපොල තත්වයන්ගේ බලපෑම හේතුවෙන් ආයෝජන ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් 2018 වසරට සාපේක්ෂව 2019 වසරේදී දැකිය හැක.

**රූපසටහන 1: 2015 - 2019 කාලපරිච්ඡේදය සඳහා සෙස් බදු ආදායම හා ආයෝජන ආදායම**





| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| සෙස් ආදායම (රු. මිලියන) | 322 | 408 | 418 | 479 | 493 |
| ආයෝජන ආදායම (රු. මිලියන) | 145 | 229 | 372 | 455 | 574 |

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම පසුගිය වසර පහ තුළ වර්ධනය වී ඇති අන්දම 2 වැනි රූපසටහන මඟින් පෙන්නුම් කරයි.


2019 දෙසැම්බර් 31 වන දිනට රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය පහත පරිදි වේ.

**රූපසටහන 2: 2019 දෙසැම්බර් 31 වැනි දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් වර්ධනය වූ ආකාරය පහත දක්වා ඇත. (රූප සටහන 3)**




| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| අරමුදලේ වටිනාකම (රු. මිලියන) | 2,643 | 3,292 | 4,110 | 5,043 | 6,253 |

**රූප සටහන 3: 2019 දෙසැම්බර් 31 වැනි දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය**




## කොමිෂන් සභාවේ ආදායම

කොමිෂන් සභාවේ සමස්ථ ආදායම ජනනය වන්නේ පහත දැක්වෙන ප්‍රභවයන්ගෙනි:

- රක්ෂකයින්, රක්ෂණ තැරැව්කාර සමාගම් සහ අලාභ ගලපන්නන් ලියාපදිංචිය සඳහා අයකරන ලියාපදිංචි කිරීමේ ගාස්තු
- රක්ෂණ සමාගම් වලින් අය කරන වර්ෂික ගාස්තු
- වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කිරීම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම් වලින් අය කරන ගාස්තු
- අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම
- මූල්‍ය අංශය නවීකරණය කිරීමේ වැඩසටහන යටතේ ලැබෙන අරමුදල්

2015 සිට 2019 දක්වා කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ සමස්ත ආදායම බෙදී ඇති ආකාරය 4 වැනි රූප සටහන මඟින් දැක්වේ.

*රූප සටහන 4: 2015 සිට 2019 දක්වා කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ ආදායමආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය*





| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| වාර්ෂික ගාස්තු (රු. මිලියන) | 104 | 126 | 142 | 168 | 224 |
| ලියාපදිංචි හා ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු (රු. මිලියන) | 9 | 5 | 9 | 8 | 14 |
| වෙනත් ආදායම (රු. මිලියන) | 2 | 3 | 3 | 8 | 16 |
| ප්‍රදාන හඳුනාගැනීම (රු. මිලියන) | 5 | 2 | 1 | 2 | 84 |
| මුළු ආදායම (රු. මිලියන) | 119 | 136 | 155 | 186 | 339 |

## කොමිෂන් සභාවේ වියදම

2018 වසරට සාපේක්ෂව 2019 වසරේදී වියදමේ 31.56% වර්ධනයක් දක්නට ලැබේ. කොමිෂන් සභාවේ ආසන්න වශයෙන් රු. මිලියන 129.2 ක අතිරික්තයක් 2019 වසරේදී වාර්තාකර ඇත. පනතේ විධිවිධාන වලට අනුකූලව ඉහත අතිරික්තය ආරක්ෂණ අරමුදලට බැර කරනු ඇත.

රූප සටහන 5 මඟින් 2015 සිට 2019 දක්වා කාල පරිච්ඡේදයේ කොමිෂන් සභාවේ සමස්ථ වියදම පෙන්වා ඇත.

*රූප සටහන 5: 2015 සිට 2019 කාලපරිච්ඡේදය දක්වා කොමිෂන් සභාවේ සමස්ථ වියදම*




| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| මුළු වියදම (රු. මිලියන) | 123 | 124 | 125 | 143 | 188 |



# මූල්‍ය තොරතුරු

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 31.12.19 රු. | 31.12.18 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 1 | 15,691,234 | 15,689,425 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - කුලී සහ විද්‍යුත් තැන්පතු හා භාණ්ඩාගාර බැදුම්කර | 2 | 1,086,252,949 | 1,086,252,949 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 1,101,944,183 | 1,101,942,374 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 3 | 654,321 | 522,620 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන හා වෙනත් | 2 | 5,166,705,283 | 3,956,513,320 |
| අනෙකුත් ජංගම වත්කම් | 4 | 21,986,662 | 16,007,020 |
| රජයේ සුරැකුම්පත් වල ආයෝජනය - ප්‍රතිමිලදී ගැනීම් | | 162,000,000 | 70,700,000 |
| මුදල් හා මුදල් හා සමාන දෑ | 5 | 11,455,374 | 2,711,448 |
| **මුළු ජංගම වත්කම්** | | 5,362,801,640 | 4,046,454,408 |
| **මුළු වත්කම්** | | 6,464,745,823 | 5,148,396,782 |
| **සංචිත හා වගකීම්** | | | |
| **සංචිත හා අරමුදල්** | | | |
| සමුච්චිත අරමුදල් | 6 හා 20 | - | 41,337,937 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල | 7 | 6,252,958,232 | 5,042,765,873 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 17,689,652 | 17,689,652 |
| මුදල් අමාත්‍යාංශයෙන් ලද ප්‍රදාන | | 976,126 | - |
| **මුළු සංචිත හා අරමුදල** | | 6,271,624,010 | 5,101,793,462 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ප්‍රදාන | 8 | 7,966,332 | 5,389,425 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 9 | 15,839,021 | 12,155,897 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 23,805,353 | 17,545,322 |
| **ජංගම වගකීම්** | | | |
| ලද අත්තිකාරම් | | 14,332,836 | 14,161,815 |
| අනෙකුත් ජංගම වගකීම් | 10 | 154,280,881 | 14,896,183 |
| බැංකු ඍණ ශේෂය | 5 හා 21 | 702,743 | - |
| **මුළු ජංගම වගකීම්** | | 169,316,460 | 29,057,998 |
| **මුළු සංචිත හා වගකීම්** | | 6,464,745,823 | 5,148,396,782 |

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සාමාජිකයින් වෙත පැවරේ. ඉහත මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය පිටු අංක 88 සිට 98 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් සමඟ සංයෝජිතව කියවිය යුතු වේ.

රසීක් සාරුක්
සභාපති

සාමාජික

දමයන්ති ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජනරාල්

සතීෂ් කුමාර්
අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන

කොළඹ, ශ්‍රී ලංකාව
2020 පෙබරවාරි 26

# මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 31.12.19 දිනට අවසන් වන වර්ෂය සඳහා රු. | 31.12.18 දිනට අවසන් වන වර්ෂය සඳහා රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| අයභාරය | 11 | **238,813,675** | 176,168,849 |
| ලෝක බැංකු ව්‍යාපෘතිය මඟින් ලද ආදායම | 12 | **81,620,094** | - |
| ප්‍රදාන හඳුනා ගැනීම් | 8 | **2,324,391** | 1,929,052 |
| පොලී ආදායම | 13 | **15,757,900** | 7,439,303 |
| වෙනත් ආදායම් | 14 | **338,154** | 277,233 |
| **මුළු ආදායම** | | **338,854,214** | 185,814,437 |
| **වියදම්** | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 15 | **(112,323,915)** | (79,009,564) |
| වෘත්තීය ගාස්තු | 16 | **-** | (5,035,081) |
| මෙහෙයුම් වියදම් | 17 | **(73,323,241)** | (58,453,496) |
| ලෝක බැංකු ව්‍යාපෘතිය සඳහා දරණ ලද වියදම් | 18 | **(456,260)** | - |
| මූල්‍ය සහ අනෙකුත් | 19 | **(1,568,501)** | (155,451) |
| **මුළු වියදම්** | | **(187,671,917)** | (142,653,592) |
| බදු වලට පෙර ශුද්ධ අතිරික්තය /(ඌණතාවය) | | **151,182,297** | 43,160,845 |
| බදු | 22 | **(22,479,379)** | (1,822,908) |
| අතිරික්තය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කිරීම් | 7 | **(129,218,719)** | - |
| බදු වලට පසු ශුද්ධ අතිරික්තය /(ඌණතාවය) | | **(515,801)** | 41,337,937 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් මත ආයුගණන අතිරික්තය /(ඌණතාවය) | | **515,801** | - |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය** | | **-** | 41,337,937 |

පිටු අංක 88 සිට 98 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# ශුද්ධ වත්කම් හා ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 දිනට

| | ප්‍රත්‍යාගනිත සංචිත | සමුච්චිත අතිරික්ත/ (ඌණතාවය) | එකතුව |
|---|---|---|---|
| **2018 ජනවාරි 01 දිනට ශේෂය** | 7,389,652 | - | 7,389,652 |
| සමුච්චිත අරමුදලට මාරු කිරීම් | - | 41,337,937 | 41,337,937 |
| වත්කම් ප්‍රත්‍යාගණනයේ ලාභය | 10,300,000 | - | 10,300,000 |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 17,689,652 | 41,337,937 | 59,027,589 |
| **2019 ජනවාරි 01 දිනට ශේෂය** | 17,689,652 | 41,337,937 | 59,027,589 |
| වැටුප් සංශෝධනයට අදාළ පෙර වර්ෂයේ ගැලපීම | - | (11,643,186) | (11,643,186) |
| 2018 වර්ෂයට අදාළ ආදායම් බදු ගැලපීම | - | (11,190,575) | (11,190,575) |
| 2018 වර්ෂයේ අතිරික්තය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කිරීම | - | (18,504,176) | (18,504,176) |
| වර්ෂයට අදාල අතිරික්තය | - | 128,702,918 | 128,702,918 |
| ආයු ගණන අතිරික්තය/ (ඌනතාවය) | - | 515,801 | 515,801 |
| සමුච්චිත අරමුදලට මාරුකිරීම් | - | (129,218,719) | (129,218,719) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **17,689,652** | **-** | **17,689,652** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2019 දෙසැම්බර්31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | සටහන් | 31.12.19 දිනට අවසන් වන වර්ෂය සඳහා රු. | 31.12.18 දිනට අවසන් වන වර්ෂය සඳහා රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනතාවය) | | 151,182,297 | 41,337,937 |
| ක්ෂය සඳහා ගැලපීම් | 1 | 4,899,489 | 3,535,279 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන | 9 | 4,558,024 | 2,014,024 |
| දේපල පිරියත හා උපකරණ විකුණුම් ලාභය | 14 | (83,065) | - |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ගෙවීම් | 9 | (359,100) | (760,674) |
| ප්‍රදාන හඳුනාගැනීම | 8 | (2,324,391) | (1,929,052) |
| ආදායම් බදු | 22 | (17,343,545) | 1,822,908 |
| පොලී ආදායම | 13 | (15,757,900) | (7,439,303) |
| කාරක ප්‍රාග්ධනය  වෙනස් වීමට පෙර ශුද්ධ වැඩිවීම | | 124,771,809 | 38,581,119 |
| | | | |
| කාරක ප්‍රග්ධනය වෙනස්වීම | | | |
| තොගවල (වැඩිවීම)/අඩුවීම | 3 | (131,701) | (175,322) |
| ලැබිය යුතු දෑ වල (වැඩිවීම)/අඩුවීම | 4 | (7,721,734) | (4,482,480) |
| අත්තිකාරම් ලැබීම් වල වැඩිවීම/(අඩුවීම) | | 171,021 | 6,803,715 |
| ණය හිමියන් සහ උපචිතයන්හි වැඩිවීම/(අඩුවීම) | 10 | 136,025,149 | (21,397,313) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද මුදල් ප්‍රවාහය | | 128,342,736 | (19,251,399) |
| | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය | | 253,114,545 | 19,329,720 |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබූ /(ක්‍රියාකාරකම් සඳහා යෙදූ) මුදල් ප්‍රවාහය** | | | |
| රජයේ සුරැකුම්පත් වල ආයෝජනය | | (131,300,000) | (28,700,000) |
| ස්ථාවර තැන්පතු වල ආයෝජනය | | 40,000,000 | - |
| පොලී ආදායම | | 15,724,103 | 6,285,506 |
| දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල් | 14 | 83,065 | - |
| දේපල පිරියත සහ උපකරණ මිලට ගැනීම් | 1 | (4,901,298) | (1,599,945) |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | (80,394,130) | (24,014,439) |
| | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් ප්‍රවාහය** | | | |
| රක්ෂණ ඔප්පු  හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ප්‍රාග්ධන මාරු කිරීම් | 7 | 4,901,298 | 1,599,945 |
| අතිරික්තය 2019 රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරුකිරීම | | (129,218,719) | - |
| සමුච්චිත අතිරික්තය - 2018 | 6 | (41,337,937) | - |
| මුදල් අමාත්‍යාංශයෙන් ප්‍රදාන ලැබීම් | | 976,126 | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | (164,679,232) | 1,599,945 |
| | | | |
| මුදල් හා මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 8,041,184 | (3,084,774) |
| | | | |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 2,711,448 | 5,796,222 |
| | | | |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 10,752,632 | 2,711,448 |
| | | | |
| **අතැති සහ බැංකුවේ ඇති මුදල්** | 5 හා 21 | | |
| අරමුදල් කළමණාකරන ගිණුමේ ශේෂය | | 10,197,543 | 4,248,455 |
| ලංකා බැංකුව 1877 - ලෙජරයට අනුව | | (702,743) | (1,537,007) |
| ලංකා බැංකුව - ලෝක බැංකු ව්‍යාපෘති ගිණුම | | 1,257,278 | - |
| ඉතුරුම් - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | 554 | - |
| | | 10,752,632 | 2,711,448 |

පිටු අංක 88 සිට 98 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

# රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2019 දෙසැම්බර්31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | සටහන් | 31.12.19 දිනට අවසන් වන වර්ෂය සඳහා රු. | 31.12.18 දිනට අවසන් වන වර්ෂය සඳහා රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ශුද්ධ වර්ධනය | | 1,210,191,963 | 932,807,064 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම | | 1,210,191,963 | 932,807,064 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම | | | |
| රජයේ සුරැකුම්පත් වලින් ලැබිය යුතු පොලියෙහි (වැඩිවීම)/අඩුවීම | | (50,203,714) | (53,659,167) |
| ලැබිය යුතු සෙස් බදුවල (වැඩිවීම)/අඩුවීම | | 2,848,980 | (2,372,466) |
| රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරුකළ යුතු ප්‍රමාණය වැඩිවීම /(අඩුවීම) | | (125,914,867) | 29,810,751 |
| | | (173,269,601) | (26,220,882) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | 1,036,922,363 | 906,586,182 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද/(යෙදවූ) මුදල් ප්‍රවාහය** | | | |
| ස්ථාවර තැන්පතු වල ආයෝජන | | (1,019,563,000) | (906,097,000) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද/(යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | | (1,019,563,000) | (906,097,000) |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 17,359,363 | 489,182 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 1,047,306 | 558,124 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 18,406,669 | 1,047,306 |
| ජංගම ගිණුමේ ශේෂය | 2 | 1,000,000 | 47,306 |
| අරමුදල් කළමණාකරන ගිණුමේ ශේෂය | | 17,406,669 | 1,000,000 |
| | | 18,406,669 | 1,047,306 |

සටහන - රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල් මුදල් ප්‍රවාහ ප්‍රකාශය අතිරේක හෙළිදරව්වකි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 මූලික තොරතුරු

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනතෙහි වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදන අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදී.

කොමිසමේ ලියාපදිංචි ලිපිනය හා පිහිටීම 11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

කොමිෂන් සභාවේ අරමුණු සහ වගකීම් වන්නේ, ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීයමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීම.

පනතට අනුව කොමිෂන් සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය පහත පරිදි වේ.

අ) ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන තැනැත්තන් රක්ෂණකරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම;

ආ) රක්ෂණ තැරැව්කරුවන් වශයෙන් තැනැත්තන් ලියාපදිංචි කිරීම;

ඇ) රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම හා විධිමත් කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම;

ඈ) රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

ඉ) කොමිසමේ බලතල ක්‍රියාත්මක කිරීමේ, කාර්ය ඉටුකිරීමේ හා කර්තව්‍ය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යම් නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම;

ඊ) නිශ්චල වූ හෝ චංචල වූ හෝ දේපළ කිසිවක් අත්කර ගැනීම හා දැරීම, ඒ දේපළ විකිණීම, බද්දට දීම, උකස් කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

උ) කොමිසමේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය යම් ගිවිසුම්වලට ඇතුළත් වීම සහ;

ඌ) මේ පනත යටතේ යථා පරිදි කොමිසමේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටුකිරීම හා කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා කිරීම;

### 1.2 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම මත සකස් කර ඇති අතර ඒවා ඉදිරිපත් කිරීමේදී අගයන් ආසන්නම ශ්‍රී ලංකා රුපියලට දක්වා ඇත. උද්ධමනයට අදාල සැසඳුම් මෙම ගිණුම් වල සිදුකර නොමැත.

යථායෝග්‍ය පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියේ දැක්වෙන සටහන් මගින් අනාවරණය කර ඇත.

### 1.3 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඇති අතර, එම මූල්‍ය ප්‍රකාශන එම ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාවය දක්වනු ලබයි.

### 1.4 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තහවුරු කර ඇත. රක්ෂණ නියාමන කොමිෂන් සභාව චිරස්ථායී අනාගතයක් උදෙසා අඛණ්ඩව මෙහෙයුම් පවත්වාගෙන යන බවටත්, එහි ව්‍යවස්ථාපිත වගකීම් සපුරාලන බවටත් කොමිෂන් සභාවේ සාමාජිකයන් හට සාධාරණ තක්සේරුවක් ඇත. අනාගත සියලුම තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ඈවර කිරීමේ හෝ එහි මෙහෙයුම් නවතාලීමේ අවශ්‍යතාවයක් හඳුනාගෙන නොමැත. ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පදනම් කර ගෙන ඇත.

### 1.5 වාර්තා කරන දිනයෙන් පසු හට ගන්නා සිදුවීම්

වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයේ දී සැලකිල්ලට ගෙන අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණයන් කර ඇත.

### 1.6 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සියළුම විදේශීය මුදලින් සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අවස්ථාවේ දී පැවති විනිමය අනුපාතිකයන් පාදකව, වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර ඇත.

### 1.7 සංසන්දනාත්මක සංඛ්‍යාවන්

ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම හා අනුකූල විය යුතු ආකාරයට පෙර වර්ෂව, සංසන්දනාත්මක සංඛ්‍යා ගැලපීම් කර ඇත.

### 1.8 මූල්‍ය අවධානම් කළමනාකරණ අරමුණු හා ප්‍රතිපත්ති

කොමිෂන් සභාවේ මූල්‍ය වගකීම් පෙර ලැබීම් හා වෙනත් ගෙවිය හැකි දෑ වලින් සමන්විත වේ. කොමිෂන් සභාවේ මූල්‍ය වගකීම්වලට ලැබිය යුතු ආදායම් හා වෙනත් ලැබිය යුතු දෑ සහ එහි කටයුතුවලින් සෘජුවම ලැබෙන මුදල් හා වෙනත් කෙටිකාලීන ආයෝජන ඇතුළත් වේ.

#### 1.8.1 වෙළඳපොළ අවදානම

වෙළඳපොළ අවදානම යනු වෙළඳපොළ මිල වෙනස් වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයෙහි සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපොළ මිල අවදානම් වර්ග දෙකකින් සමන්විත වේ. පොළී අනුපාත අවදානම හා මුදල් අවදානම වෙළඳපොළ අවදානම මගින් බලපෑමට ලක් වන මූල්‍ය උපකරණවලට මූල්‍ය ආයතන වල තැන්පතු ඇතුළත් වේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

**1.8.1.1 පොළී අනුපාත අවදානම**

පොළී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොළී අනුපාත වෙනස් වීම හේතුවෙන් මූල්‍ය උපකරණයක සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ප්‍රවාහ උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපොළ පොළී අනුපාත වෙනස් වීමේ අවදානම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අනාවරණය මූලික වශයෙන් පාවෙන පොළී අනුපාතත් කොමිෂන් සභාවේ වගකීමට අදාළ වේ.

**1.8.1.2** ද්‍රවශීලතා අවදානමට අදාළව කොමිෂන් සභාව විසින් අඛණ්ඩ මුදල් ප්‍රවාහ පුරෝකථනයන් හා මුදල් අයවැයකරණය භාවිත කරමින් එහි අරමුදල් හිඟයක් ඇති වීමේ. අවදානම අධීක්ෂණය කරයි.

## 2. වත්කම් සහ අගය කිරීමේ පදනම

### 2.1 දේපල, පිරියත හා උපකරණ

**ස්වසන්තක අයිතිය සහිත දේපල, පිරියත හා උපකරණ**

දේපල, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන් / ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය අඩුකළ අගයට නිරූපණය කර ඇත. දේපල, පිරියත හා උපකරණ වල පිරිවැයට ඇතුළත් වන්නේ, අත්පත් කර ගැනීමේ පිරිවැය සමඟ එම වත්කම් අපේක්ෂිත භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම් වල එකතුවයි.

**ක්ෂය**

වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා පහත අනුපාත පාදකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලැබේ.

| | **වාර්ෂික (%)** |
|---|---|
| මොටර් වාහන | 25 |
| ලී බඩු, වැද්දුම සහ සවි කිරීම | 12.5 |
| කාර්යාල හා විද්‍යුත් දත්ත සැකසුම | 25 |
| පුහුණු උපකරණ | 25 |

ක්ෂය ප්‍රතිපාදන එම වත්කම් මිල දී ගත් දින සිට කරනු ලැබේ. ක්ෂය ප්‍රතිපාදනය වත්කම භාවිතයෙන් ඉවත් කරන තෙක් කරනු ලැබේ. වත්කම් විකුණුම් ලාභ/අලාභ වත්කම් විකුණුම් මුදල එකී වත්කමේ ලියා අඩුකල අගය සමඟ සංසන්දනය කිරීමෙන් නිශ්චය කෙරේ.

2018 සිට මෝටර් වාහන තෙවසරකට වරක් ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. අවසාන ප්‍රත්‍යාගණනය ඔටෝමොබයිල් ඇසෝසියේෂන් ඔෆ් සිලෝන් මගින් 2018 වසරේදී සිදු කරන ලදී.

### 2.2 ආයෝජන

ආයෝජන වල ඇතුලත් වන්නේ රජයේ සුරැකුම්පත් සහ ස්ථාවර තැන්පතු පමණක් වන අතර ඒවායේ පිරිවැය හෝ මුහුනත අගය යන දෙකෙන් අඩු අගයට සඳහන් කොට ඇත.

මෙම ආයෝජන වර්ෂය අවසානය දක්වා පිරිවැය සහ එකතු කල පොලියෙන් දක්වා ඇත. එබැවින් මූල්‍ය වර්ෂය අවසානයේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය උපකරණ වල අවධානමක් නොමැත.

### 2.3 තොග

තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් වලින් අඩු අගයට දක්වා ඇත. තොග වල පිරිවැය නිශ්චය කිරීමේදී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) ඒ සඳහා පාදක කරගෙන ඇත.

### 2.4 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ නිරූපණය කර ඇත්තේ, ඇස්තමේන්තුගත උපලබ්ධ අගයටයි.

### 2.5 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් හා මුදල් හා සමාන දෑ වලින් නියෝජනය වන්නේ බැංකුවේ මුදල් සහ අතැති මුදල්ය.

## 3. බැරකම් සහ ප්‍රතිපාදන

### 3.1 විශ්‍රාම ප්‍රතිලාභ

**3.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික**

කොමිෂන් සභාව විසින් 1983 අංක 12 දරණ පාරිතෝෂිත පනත යටතේ සියළු සුදුසුකම් ලත් සේවකයන් සඳහා අවශ්‍ය පරිදි විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමක් සකස් කරගන්නා ලදී. විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම මගින් විශ්‍රාම ගැනීමේදී සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය අර්ථ දැක්වේ.

කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 සේවක ප්‍රතිලාභ යටතේ දක්වා ඇති ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කර නිශ්චිත ප්‍රතිලාභ සැලසුමට අදාළ මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇති වගකීම වාර්ෂිකව ගණනය කරනු ලැබේ.

| | |
|---|---|
| **2019 මූල්‍ය වසර ආරම්භයේ දී** | **12,155,897** |
| වර්තමාන සේවා පිරිවැය | 1,879,168 |
| පොළී පිරිවැය | 1,409,637 |
| පූර්ව වර්ෂයේ ඌණ ප්‍රතිපාදන | 1,269,219 |
| **ආදායම් ප්‍රකාශයෙහි ලාභ හා අලාභ වලට අදාළ ගැලපීම්** | **4,558,024** |
| ආයුගණක අලාභ/(ලාභ) | (515,801) |
| ගෙවන ලද ප්‍රතිලාභ | (359,100) |
| **2019 මූල්‍ය වසර අවසානයේ දී** | **15,839,020** |

පූර්ව වර්ෂයේ ඌණ හෝ අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ඇති වූ වෙනස්කම් නිසා ලැබූ ලාභ හා අලාභ ඒවා ඇති වූ කාල සීමාවේ ආදායම් ප්‍රකාශයට අදාළ කරනු ලැබේ. වසර සඳහා වන බැඳීම ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගෙන ඇත.

භාවිත කරන ලද ප්‍රධාන ආයුගණක උපකල්පන පහත පරිදි වේ.

| | |
|---|---|
| වට්ටම් අනුපාත වසරකට | 10.5% |
| වැටුප් වැඩිවීමේ අනුපාතය | 5%-8% |
| විශ්‍රාම වයස | අවුරුදු 60 |

**3.1.2 නිශ්චිත සහභාග සැලසුම. - සේ.අ.අ. සහ සේ.නි.භා.අ.**

නිශ්චිත ව්‍යවස්ථාවන් සහ නියාමන හා අනුකූලව කොමිෂන් සභාවේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට දායකවීමට සහ සේවක භාරකාර අරමුදලට දායකවීමට සුදුසුකම් ලබති.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදලට සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත පිළිවෙළින් 12% ක සහ 3% ක මුදලක් දායක කරයි.

**3.2 බැරකම්**

බැරකම් අතරින් වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයක් තුළ දී හෝ ඉල්ලුම් කළ විටක දී ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත. වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයකින් ඔබ්බට ගෙවිය යුතු සියළුම ගෙවීම් ජංගම නොවන බැරකම් ගණයට ඇතුළත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී සියළුම දන්නා බැරකම් ඒවායේ පිරිවැයට ඇතුළත් කර ඇත.

**3.3 ප්‍රදාන**

රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් ප්‍රදාන සේ හඳුනා ගන්නා අතර එම වත්කම් වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය තුළ දී ඒවා හඳුනා ගනු ලැබේ.

**3 3 3 මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය**

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රදාන සාධාරණ වටිනාකමට අනුව හඳුනා ගැනේ. වියදමකට අදාළ ප්‍රදානය එය ක්‍රමානුකූල පදනමක් මත ගෙවීමට අදහස් කරන පිරිවැයට අනුරූප වීමට අවශ්‍ය කාල සීමාව තුළ ආදායමක් ලෙස හඳුනා ගැනේ. මූල්‍යකරණය සඳහා මුදල් අමාත්‍යාංශයෙන් ලැබුණු ප්‍රදාන (බෙදාහැරීම් සම්බන්ධිත දර්ශකය (ඩීඑල්අයි) ආදායමක් ලෙස හඳුනාගෙන ඇත.

**4.1 ආදායම. හඳුනා ගැනීම**

ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

**4.2 වියදම් හඳුනා ගැනීම**

කොමිෂන් සභාව පවත්වාගෙන යෑමේදී දරනු ලබන සියළුම වියදම් වියදමට වැඩි ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා ආදායමට එරෙහිව ලියාහරිනු ලැබේ.

**4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ වක්‍ර ක්‍රමය මතයි.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1 දේපල පිරියත හා උපකරණ

| | මෝටර් වාහන | ලී බඩු, වැද්දුම් හා සවිකිරීම් | කාර්යාල උපකරණ සැකසුම් සහ (විද්‍යුත් දත්ත වෙනත්) | පුහුණු උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය/ප්‍රත්‍යාගණන** | | | | | |
| 2019 ජනවාරි 01 දිනට ශේෂය | **10,300,000** | **14,152,432** | **26,635,537** | **141,450** | **51,229,419** |
| එකතු කිරීම් | - | 1,508,944 | 3,392,354 | - | 4,901,298 |
| බැහැර කිරීම් | - | (18,895) | (2,271,627) | - | (2,290,522) |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | 10,300,000 | 15,642,481 | 27,756,264 | 141,450 | 53,840,195 |
| **සමුච්චිත ක්ෂය** | | | | | |
| 2019 ජනවාරි 01 දිනට ශේෂය | - | 12,675,881 | 22,722,663 | 141,450 | 35,539,995 |
| වර්ෂය සඳහා අය කිරීම | 2,575,000 | 533,646 | 1,790,844 | - | 4,899,489 |
| බැහැර කිරීම් | - | (18,895) | (2,271,627) | - | (2,290,522) |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | **2,575,000** | **13,190,632** | **22,241,880** | **141,450** | **38,148,962** |
| **ලියා අඩු කළ අගය** | | | | | |
| **2019 දෙසැම්බර් 31 දිනට** | **7,725,000** | **2,451,848** | **5,514,385** | **-** | **15,691,234** |
| ලියා අඩු කළ අගය | | | | | |
| 2018 දෙසැම්බර් 31 දිනට | 10,300,000 | 1,476,550 | 3,912,875 | - | 15,689,425 |

** සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද ස්ථාවර වත්කම් පහත පරිදි වේ.

| | Amount Rs. |
|---|---|
| ලී බඩු සහ සවිකිරීම් | 5,001,628 |
| වැද්දුම් සවිකිරීම් | 6,279,006 |
| කාර්යාල උපකරණ - විද්‍යුත් දත්ත සැකසුම් | 16,741,852 |
| කාර්යාල උපකරණ - වෙනත් | 2,552,355 |
| පුහුණු උපකරණ | 141,450 |
| | **36,147,267** |

මෝටර් වාහන රු. 10,300,000 ක් ලෙස ප්‍රත්‍යාගණනය කර ඇත.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | සටහන් | 31.12.19 දිනට රු. | 31.12.18 දිනට රු. |
|---|---|---|---|
| **2 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන සහ අනෙකුත්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| කුලී සහ විද්‍යුත් තැන්පතු | | 9,593,949 | 9,593,949 |
| භාණ්ඩාගාර බැඳුම්කරයන්හි ආයෝජන | | 1,076,659,000 | 1,076,659,000 |
| | | 1,086,252,949 | 1,086,252,949 |
| **ජංගම වත්කම්** | | | |
| ස්ථාවර තැන්පතු වල ආයෝජන | | 4,619,960,000 | 3,600,397,000 |
| රජයේ සුරැකුම්පත් හා ස්ථාවර තැන්පතු වලින් ලබිය යුතු පොලිය | | 277,460,484 | 227,256,770 |
| ලැබිය යුතු සෙස් බදු | | 126,560,709 | 129,409,689 |
| අරමුදල් කළමණාකරන ගිණුමේ ශේෂය | 23 | 17,406,669 | 47,306 |
| බැංකුවේ ඇති ශේෂය | 23 | 1,000,000 | 1,000,000 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කළ යුතු අගය | | 124,317,421 | (1,597,445) |
| | | 5,166,705,283 | 3,956,513,320 |
| අඩු කළා | | | |
| රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු විය යුතු අගය | | - | - |
| | | 5,166,705,283 | 3,956,513,320 |
| මුළු වත්කම් | | 6,252,958,232 | 5,042,766,269 |
| **3 භාණ්ඩ තොග** | | | |
| මුද්‍රණ ලිපිද්‍රව්‍ය හා පරිගණක උපාංග | | 617,711 | 455,105 |
| මුද්දර | | 36,610 | 67,515 |
| | | 654,321 | 522,620 |
| **4 අනෙකුත් ජංගම වත්කම්** | | | |
| තැන්පතු | | 2,896,832 | 212,237 |
| ඉතිරි කිරීම් - ජාතික ඉතිරි කිරීමේ බැංකුව | | - | 500 |
| වෙනත් ලැබිය යුතු දෑ | | 2,185,248 | 820,886 |
| ලැබිය යුතු රඳවා ගැනීමේ බදු | | 1,208,606 | 1,551,524 |
| එකතු කල අගය මත බදු පාලන ගිණුම | | 3,794,678 | 1,874,969 |
| ලැබිය යුතු පොලී - රජයේ සුරැකුම්පත් | | 536,878 | 1,076,391 |
| සේවක ණය * | | 5,347,093 | 5,005,967 |
| අත්තිකාරම් සහ පෙර ගෙවීම් | | 5,393,700 | 1,778,025 |
| රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු විය යුතු අගය | | - | 1,597,445 |
| අත්පත් කර ගැනීම් සඳහා ප්‍රතිපාදන | | 623,626 | 2,089,077 |
| | | 21,986,662 | 16,007,020 |
| * කාර්යය මණ්ඩලය සඳහා ප්‍රදානය කළ ණය | | | |
| 2019 ජනවාරි 1 දිනට ශේෂය | | 5,005,967 | 5,769,159 |
| වර්ෂය තුළදී ප්‍රදානය කළ ණය | | 3,862,000 | 3,236,700 |
| | | 8,867,967 | 9,005,859 |
| වර්ෂය තුළ දී ණය ආපසු ගෙවීම් | | (3,520,873) | (3,999,892) |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | | 5,347,093 | 5,005,967 |
| **5 මුදල් සහ මුදල් හා සමාන දෑ** | | | |
| **බැංකුවේ ඇති මුදල්** | | | |
| අරමුදල් කළමණාකරන ගිණුමේ ශේෂය | 23 | 10,197,543 | 4,248,455 |
| ලංකා බැංකුව - ලෙජරයට අනුව (1877) | 23 | (702,743) | (1,537,007) |
| ලංකා බැංකුව - ලෝක බැංකු ව්‍යාපෘති ගිණුම (FSMP) | | 1,257,278 | - |
| ඉතුරුම් ගිණුම - ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | 554 | - |
| | | 10,752,632 | 2,711,448 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | සටහන් | 31.12.19 දිනට රු. | 31.12.18 දිනට රු. |
|---|---|---|---|
| **6 සමුච්චිත අරමුදල** | | | |
| ආරම්භක ශේෂය | 20 | 41,337,937 | - |
| වර්ෂය සඳහා අතිරික්තය | | - | 41,337,937 |
| සංශෝධිත හිඟ වැටුප් 2018 - වත්මන් සේවකයින් | | (10,237,415) | - |
| සංශෝධිත හිඟ වැටුප් 2018 - සේවය අවසන් වූ සේවකයින් | | (985,609) | - |
| 2018 වර්ෂය සඳහා සංශෝධිත අතිකාල ගෙවීම් | | (73,217) | - |
| සංශෝධිත හිඟ නිවාඩු දීමනා - 2018 | | (346,946) | - |
| 2018 වර්ෂය සඳහා ආදායම් බද්ද | | (11,190,575) | - |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරුකළ ශේෂය - 2018 | | (18,504,176) | - |
| වසර අවසානයේ ශේෂය | | - | 41,337,937 |
| **7 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල** | | | |
| ආරම්භක ශේෂය | | 5,042,765,873 | 4,109,959,205 |
| වර්ෂය තුළ දී ලද සෙස් බදු | | 493,068,161 | 479,088,491 |
| ප්‍රති මිලදී ගැනීම් සහ ඉල්ලුම් ගිණුම් මත පොළී | | 3,698,834 | 36,710 |
| භාණ්ඩාගාර බැඳුම්කර මත පොළී | | 92,882,074 | 95,120,708 |
| ස්ථාවර තැන්පතු මත පොළී | | 477,484,713 | 359,754,785 |
| අරමුදල් කළමණාකරන ගිණුමේ ශේෂය මත පොළිය | | 247,397 | 419,017 |
| කොමිෂන් සභාවේ ශුද්ධ අතිරික්තය - 2018 | | 18,504,176 | - |
| කොමිෂන් සභාවේ ශුද්ධ අතිරික්තය - 2019 | | 129,218,719 | - |
| | | 6,257,869,945 | 5,044,378,915 |
| අඩු කළා : | | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම් | | 4,901,298 | 1,599,945 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මුළු මාරු කිරීම් | | 4,901,298 | 1,599,945 |
| බැංකු ගාස්තු | | 10,414 | 13,097 |
| | | 4,911,713 | 1,613,042 |
| අවසාන ශේෂය | | 6,252,958,232 | 5,042,765,873 |
| **8 ප්‍රදාන** | | | |
| වසර ආරම්භයේ දී ශේෂය | | 5,389,425 | 5,718,532 |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් | | 4,901,298 | 1,599,945 |
| අඩු කළා : වර්ෂය තුළදී ක්‍රමක්ෂය කිරීම් | | (2,324,391) | (1,929,052) |
| වසර අවසානයේ දී ශේෂය | | 7,966,331 | 5,389,425 |
| සටහන - ප්‍රදාන හඳුනා ගැනීම<br>ප්‍රදානයන්, මෙහෙයුම් ප්‍රතිපල පිළිබඳ ප්‍රකාශයේ<br>පහත අනුපාත යටතේ හඳුනා ගෙන ඇත. | | | |
| මෝටර් රථ වාහන | | 25% | 25% |
| කාර්යාල උපකරණ - වෙනත් සහ වි.ද.සැ. | | 25% | 25% |
| ලී බඩු වැද්දුම් සහ සවි කිරීම් | | 12.5% | 12.5% |
| පුහුණු උපකරණ | | 25% | 25% |
| **9 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්** | | | |
| වසර ආරම්භයේදී ශේෂය | | 12,155,897 | 10,902,547 |
| වසර තුළ ප්‍රතිපාදන | | 3,288,805 | 2,014,024 |
| පෙර වර්ෂයේ ඌන ප්‍රතිපාදන | | 1,269,219 | - |
| ආයුගණන (අතිරික්තය)/ඌනතාවය | | (515,801) | - |
| අඩු කළා : වසර තුළ සිදුකරන ලද ගෙවීම් | | (359,100) | (760,674) |
| වසර අවසානයේ ශේෂය | | 15,839,020 | 12,155,897 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | | 31.12.19 දිනට රු. | 31.12.18 දිනට රු. |
|---|---|---|---|
| **10 අනෙකුත් ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | | 22,304,938 | 13,188,945 |
| සේවක අර්ථසාධක අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | | 1,135,994 | 710,207 |
| සේවක භාරකාර අරමුදල් සඳහා කළ යුතු ගෙවීම් | | 170,400 | 106,532 |
| උපයන විට බදු සඳහා කළ යුතු ගෙවීම් | | 151,990 | 74,014 |
| රඳවා ගැනීම් සඳහා කළ යුතු ගෙවීම් | | 36,228 | - |
| ආදායම් බදු සඳහා කළ යුතු ගෙවීම් | | 3,359,549 | - |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කළ යුතු අගය | | 124,317,421 | - |
| වෙනත් | | 2,804,361 | 816,486 |
| | | 154,280,881 | 14,896,184 |
| **11 අයභාරය** | | | |
| රක්ෂණ සමාගම් වලින් වාර්ෂික ගාස්තු | | 224,428,714 | 168,499,107 |
| ලියාපදිංචි කිරීමේ සහ අළුත් කිරීමේ ගාස්තු | | 14,384,961 | 7,669,742 |
| | | 238,813,675 | 176,168,849 |
| **12 ලෝක බැංකු ව්‍යාපෘති ආදායම** | | | |
| ප්‍රදාන - ලෝක බැංකු ව්‍යාපෘතිය | 26 | 81,096,220 | - |
| නොවන ප්‍රදාන - ලෝක බැංකු ව්‍යාපෘතිය | | 523,874 | - |
| | | 81,620,094 | - |
| **13 පොළී ආදායම** | | | |
| ස්ථාවර තැන්පතු මත පොළී | | 10,258,118 | 4,608,151 |
| අරමුදල් කළමණාකරන ගිණුමෙහි පොළී | | 286,691 | 420,782 |
| තැන්පතු ගිණුම් මත පොළී | | 57 | - |
| ප්‍රති මිලදී ගැනීම් මත පොළී | | 5,213,034 | 2,410,370 |
| | | 15,757,900 | 7,439,303 |
| **14 වෙනත් ආදායම්** | | | |
| මෝටර් වාහන ණය මත පොළී | | 30,328 | 31,406 |
| ආපදා ණය මත පොළී | | 142,586 | 143,164 |
| ස්ථාවර වත්කම් විකුණුම් ලාභ | | 83,065 | - |
| වෙනත් ආදායම් | | 82,175 | 102,664 |
| | | 338,154 | 277,233 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | 31.12.19<br>දිනට<br>රු. | 31.12.18<br>දිනට<br>රු. |
|---|---|---|
| **15 කාර්ය මණ්ඩල වියදම** | | |
| කාර්ය මණ්ඩල වැටුප | **65,968,080** | 41,676,378 |
| සේ.අ.අ. 12% | **7,913,290** | 4,987,246 |
| සේ.භා.අ. 3% | **1,978,323** | 1,246,812 |
| සභාපතිගේ වියදම් - දීමනා | **-** | 129,589 |
| සභාපතිගේ ඉන්දන වියදම් | **-** | 25,775 |
| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ ගාස්තු | **540,000** | 530,000 |
| පුහුණු වන නිළධාරි දීමනා | **344,925** | 342,600 |
| අතිකාල | **400,137** | 209,841 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම් | **1,927,480** | 1,970,211 |
| කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණය | **1,615,932** | 1,117,854 |
| ගිනි හා පුද්ගල රක්ෂණය | **339,294** | 239,222 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | **841,693** | 1,163,529 |
| කාර්ය මණ්ඩල පුහුණු - දේශීය | **1,610,639** | 1,264,144 |
| විදේශ ගමන් හා පුහුණු - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හා කාර්ය මණ්ඩලය | **10,375,090** | 10,589,034 |
| කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා | **7,178,213** | 4,561,566 |
| ප්‍රචාරනය - බඳවා ගැනීම් | **693,115** | 249,975 |
| අධ්‍යක්ෂ දුරකථන | **461,959** | 390,112 |
| නිවාඩු දීමනා | **1,218,344** | 687,638 |
| වාහන මෙහෙයුම් කල්බදු ගාස්තු | **1,455,048** | 1,455,048 |
| රියදුරු දීමනා | **500** | 26,786 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාහන දීමනා | **3,246,712** | 3,123,699 |
| අධ්‍යක්ෂවරුන්ගේ ඉන්ධන දීමනා | **1,066,755** | 1,008,482 |
| සේවක පාරිතෝෂිත | **3,148,387** | 2,014,024 |
| | **112,323,915** | 79,009,564 |
| **16 වෘත්තීමය ගාස්තු** | | |
| උපදේශක සේවා ගාස්තු | **-** | 5,035,081 |
| | **-** | 5,035,081 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | 31.12.19 දිනට රු. | 31.12.18t දිනට රු. |
|---|---|---|
| **17 මෙහෙයුම් වියදම්** | | |
| කාර්යාල කුලී | 40,474,432 | 36,423,747 |
| රථ ගාල් කිරීමේ ගාස්තු | 730,676 | 606,000 |
| දුරකථන හා අන්තර්ජාල වියදම් | 1,417,311 | 1,499,000 |
| විදුලිය | 1,859,221 | 1,503,455 |
| කාර්යාල නඩත්තු කිරීම් | 551,193 | 764,913 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 3,406,080 | 1,650,787 |
| මහජන දැනුවත් කිරීම් | 9,834,508 | 2,402,923 |
| සංග්‍රහ වියදම් | - | 4,000 |
| ගමන් වියදම් - දේශීය | 170,842 | 133,883 |
| කාර්යාල උපකරණ නඩත්තු වි.ද.සැ හා වෙනත් | 2,107,863 | 1,743,298 |
| සාමාජිකත්වය | 3,413,130 | 3,147,964 |
| ප්‍රචාරනය - වෙනත් | 128,925 | 105,050 |
| රැස්වීම් ගාස්තු | 522,852 | 336,428 |
| පුවත්පත් හා පුස්තකාල පොත් | 153,471 | 121,387 |
| තැපැල් හා පණිවිඩ ගාස්තු | 238,326 | 242,488 |
| විගණන ගාස්තු -විගණකාධිපති | 161,400 | 485,000 |
| විගණන ගාස්තු - අභ්‍යන්තර | 1,603,166 | 1,440,000 |
| ක්ෂය | 4,899,489 | 3,535,279 |
| නම වෙනස් කිරීම සම්බන්ධ වියදම් | - | 416,496 |
| පොදු වියදම් | 109,255 | 80,855 |
| නීති වියදම් | 1,210 | 98,370 |
| විමර්ශන වියදම් | 33,661 | 26,202 |
| අධීක්ෂණ වියදම් | 2,500 | 1,775 |
| වාහන නඩත්තු | 126,395 | 409,483 |
| වාහන රක්ෂණ | 67,026 | 110,693 |
| වාහන ඉන්ධන වියදම් | 287,862 | 260,688 |
| ප්‍රමාද ගාස්තු හා දඩ මුදල් | - | 1,754 |
| ජාතිය ගොඩනැඟීමේ බදු | 1,022,445 | 901,576 |
| | 73,323,241 | 58,453,496 |
| **18 ලෝක බැංකු ව්‍යාපෘතියට අදාළ වියදම්** | | |
| බඳවා ගැනීම් සඳහා දැන්වීම් | 450,760 | - |
| බැංකු ගාස්තු | 5,500 | - |
| | 456,260 | - |
| **19 මූල්‍ය හා වෙනත් වියදම්** | | |
| විශ්‍රාම ප්‍රතිලාභ මත පොලිය | 1,409,637 | - |
| බැංකු ගාස්තු | 158,864 | 155,451 |
| | 1,568,501 | 155,451 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**20. සමුච්චිත අරමුදල**

2018 වර්ෂය සඳහා වැටුප් සංශෝධන හිඟ මුදල් සහ ආදායම් බදු සකස් කිරීමෙන් පසු කොමිෂන් සභාවේ අතිරික්තය රක්ෂණ හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට මාරු කර ඇත.

**21. අරමුදල් කළමණාකරණ ගිණුම් ලෙජර් ශේෂයන් හා බැංකු ශේෂයන්**

කොමිෂන් සභාවේ ජංගම ගිණුම් 20 සම්බන්ධව අරමුදල් කලමණාකරණ ගිණුම් 2ක් පවත්වාගෙන යන අතර ජංගම ගිණුමේ ශේෂය රු.1,000,000/- ඉක්මවන විට එකී ඉක්මවූ අගය අරමුදල් කළමණාකරණ ගිණුමට මාරු කෙරේ. කොමිෂන් සභාව විසින් නිකුත් කරන චෙක්පත් සැම විටම, එසැනින්ම බැංකුවට ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන බැවින්, ඉහත අරමුදල් කළමණාකරණ ගිණුම් හා සම්බන්ධිත ගණුදෙණු කොමිෂන් සභාවේ ගිණුම්වලට ඇතුලත් කළ පසු, ලෙජරයේ දැක්වෙන බැංකු ශේෂය ඍණ අගයක් ගත හැක.

2019 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය පහත පරිදි වේ.

| | |
|---|---|
| ජංගම ගිණුමේ ශේෂය | (Rs. 702,743) |
| අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය | Rs. 10,197,543 |
| **එකතුවක** | **Rs. 9,494,800** |

**22. බදුකරණය**

බදුකරණය සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලවයි.

| | **2019 (රු.)** |
|---|---|
| බදුකරණයට පෙර ගිණුම් ලාභය | 151,182,297 |
| එකතු: අනුමත කළ නොහැකි වියදම්වල බදු බලපෑම<br>බදු අය කළ හැකි ආදායම තීරණය කිරීම/(අලාභය) | 14,820,771 |
| අඩු: තීරණය කිරීමේදී ඉඩදිය හැකි වියදම්වල බදු බලපෑම<br>බදු අය කළ හැකි ආදායම/(අලාභය) | (21,366,888) |
| ආදායම් බදු වලට අය කළ හැකි ගිණුම් ලාභය/(අලාභය) | 144,636,179 |
| පොලී ආදායම | 15,930,814 |
| බදු අය කළ හැකි මුළු ආදායම | 160,566,993 |
| වර්ෂය සඳහා බදු අනුපාතය | 14% |
| වර්ෂය සඳහා බදු | 22,479,379 |
| අඩු: බදු බැර | (1,776,285) |
| ස්වයං තක්සේරු ගෙවීම් | (17,343,545) |
| ගෙවිය යුතු ශේෂ බදු | 3,359,549 |

**23. ප්‍රාග්ධන බැඳියාව**

2019 දෙසැම්බර් 31 දිනට කිසදු ප්‍රාග්ධන බැඳියාවකට එළැඹ නොමැත.

**24. අසම්භාව්‍ය බැරකම්**

වත්කම් අත්පත් කර ගැනීම සඳහා රු. 623,626 2019 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාව විසින් වෙන් කර ඇත.

**25. වාර්තා කරන දිනෙන් පසු හටගත් සිදුවීම්**

මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් කළ යුතු හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන කිසිදු සිද්ධියක් වාර්තා කරන දිනට පසු සිදු වී නොමැත.

**26. ශ්‍රී ලංකා මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය**

මූල්‍ය අංශය සංවර්ධනය කිරීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් සඳහා කාර්මික හා මූල්‍ය සහාය ලබා දීමට ශ්‍රී ලංකා රජය විසින් ලෝක බැංකුව වැනි සංවර්ධන හවුල්කරුවන්ගේ සහාය අපේක්ෂා කරන ලදී. වසර පහක (5) කාලයක් පුරාවට ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවන් ලෙස මූල්‍ය අංශ නියාමකයන් තිදෙනෙක් (3) සමග ශ්‍රී ලංකා මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය සඳහා සහාය ලබා දීමට ලෝක බැංකුව එකඟ විය.

ව්‍යාපෘති සංවර්ධන අරමුණ වන්නේ ඉහළ යන මූල්‍ය වෙළඳපොළ හා රක්ෂණ අංශ කාර්යක්ෂමතාව සඳහා දායක වීම සහ ක්ෂුද්‍ර කුඩා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් හා පුද්ගලයන් අතර මූල්‍ය/ රක්ෂණ සේවාවන් භාවිතා කිරීමයි. මෙම ව්‍යාපෘතිය මගින් මූල්‍ය වෙළඳපොළ යටිතල පහසුකම් නවීකරණය, මූල්‍ය පද්ධතිය සඳහා නෛතික සහ නියාමන රාමුව උත්ශ්‍රේණිගත කිරීම සහ මූල්‍ය අංශ නියාමකයන්ගේ, එනම් ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම් පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යන ආයතන වල ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම හරහා ව්‍යාපෘති සංවර්ධන අරමුණු ළඟා කරනු ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ණය අංකය 6006-ඛණ) අතර මූල්‍ය ගිවිසුමක් අත්සන් කරන ලද අතර එය 55,400,000 ක් වූ විශේෂ ගැණුම් හිමිකම් වලට සමාන ණයකි. (ඇ. ම. ඩො. මි. 75 ක් පමණ) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අදාළ විසැඳුම් සම්බන්ධිත දර්ශක (Disbursement Linked Indicators) ළඟා කර ගන්නා බැවින් 6,650,000 ක් (ඇ. ම. ඩො. මි. 9 ක් පමණ) විශේෂ ගැණුම් හිමිකමෙහි හා 708,333 ක් (ඇ. ම. ඩො. මි. 1ක් පමණ) විශේෂ ගැණුම් හිමිකමෙහි ප්‍රදානයක් ලෙස ලබා දීම සඳහා

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ණය මුදලට අදාළව රජය විසින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමග අතිරේක ගිවිසුමක් අත්සන් කරන ලදී.

ලෝක බැංකුව විසින් පහත දෑ මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය වෙත පර්යේෂණය කරන ලදී.

(i) FSMP ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණය

| **දිනය** | **වටිනාකම (ඇ.ඩො.)** |
|---|---|
| 14/01/2019 | 523,000 |

(ii) ප්‍රතිපල පාදක මූල්‍යකරණය

| **දිනය** | **වටිනාකම (ඇ.ඩො.)** |
|---|---|
| 27/03/2019 | 261,163.13 |
| 25/05/2019 | 64,677.66 |
| 09/10/2019 | 64,039.69 |
| 17/12/2019 | 64,803.28 |

### 27. සම්බන්ධිත පාර්ශව අනාවරණ

මනෝ තිත්තවැල්ල මහතා (සභාපති) 2019 ජනවාරි 01 සිට 2019 නොවැම්බර් 17 දක්වා
ටී.ඒ.ඩී. පෙරේරා මහතා 2019 ජනවාරි 01 සිට 2019 නොවැම්බර් 22 දක්වා
වයි. කනගසබේ මහතා 2019 ජනවාරි 01 සිට 2019 නොවැම්බර් 25 දක්වා
උපුල් දේශප්‍රිය මහතා 2019 ජනවාරි 01 සිට 2019 දෙසැම්බර් 2 දක්වා
එච්.ඒ. කරුණාරත්න මහතා 2019 ජනවාරි 01 සිට 2019 දෙසැම්බර් 31 දක්වා
ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා 2019 ජනවාරි 01 සිට 2019 දෙසැම්බර් 31 දක්වා
ඒ.එම්.පී.එම්.බී.අතපත්තු මහතා 2019 පෙබරවාරි 7 සිට 2019 දෙසැම්බර් 13 දක්වා

# විගණකාධිපති වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. TRE/C/IRCSL/01/2019/FA/08 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021 ජනවාරි 29 දින

සභාපති,

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව.

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව නැවත සමාලෝචනය කර ඒ අනුව අනාවරණය වන ඇස්තමේන්තුගත දෝෂ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ට අනුව නැවත සංශෝධනය කළ යුතු වුවත් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනට ප්‍රයෝජනයට ගන්නා එකතුව රු 36,147,267 ක් වූ වත්කම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# විගණකාධිපති වාර්තාව

(ආ) වර්ෂ 05 කින් නැවත ආපසු ලබා ගත හැකි වන පරිදි පෞද්ගලික ආයතනයක තැන්පත් කර තිබුණු ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කල යුතු රු.12,282,195 ක මුදලින් රු. 2,674,746 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි.

(ඇ) 2019 වර්ෂයේ මිලදී ගන්නා ලද රු.4,723,000 ක් වටිනා පරිඝනක මෘදුකාංගයක් ශ්‍රීලරාඅගි ප්‍රමිත අංක 20 ට අනුව ආයතනයේ අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කිරීමටත් එම වත්කම ක්‍රමක්ෂය කිරීමටත් කටයුතු කර නොතිබුණු අතර මෙම මෘදුකාංගය සඳහා 2019 වර්ෂයෙහි දරන ලද රු.844,167 ක ගෙවීමක් කලින් ගෙවීම් යටතේ දක්වා තිබුණි.තවද මෙම මෘදුකාංගය සම්බන්ධයෙන් අදාල සැපයුම්කරු සමග ඇති කර ගන්නා ලද ලිඛිත ගිවිසුමක් ද විගණනයට ඉදිරිපත් නොවුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහවංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී. කොමිෂන් සභාවඅඛණ්ඩවපවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර. කළමනාකාරිත්වය කොමිෂන් සභාවඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේඅඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීනමූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

# විගණකාධිපති වාර්තාව

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේඅඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

  මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

# විගණකාධිපති වාර්තාව

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද 1.2 (අ) , ඡේදයෙහි දැක්වෙන කරුණ හැර නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව .
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති රීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි 6 (2) (ඈ) වගන්තිය | කොමිෂන් සභාව විසින් එහි බලතල,කාර්ය,කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටුකිරීමේ දී, කොමිෂන් සභාවට ලැබෙන සියලු මුදල් එහි ආදායම් ලෙස හඳුනාගත යුතු වුවද 2019 වර්ෂයේදී සෙස් බදු ලෙස ලැබී තිබුණු රු.493,068,161 ක් සහ 2019 වර්ෂයෙහි රක්ෂණ භාර දරන්නන්ගේ ආරක්ෂණ අරමුදලට අදාල රු.574,313,018 ක් වූ පොළී ආදායම කොමිෂන් සභාවෙහි සමාලෝචිත |

# විගණකාධිපති වාර්තාව

| | | |
|---|---|---|
| | | වර්ෂයෙහි ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණු අතර පසුගිය වර්ෂයේ දී ද මෙම තත්ත්වය එලෙසම පැවති බව නිරීක්ෂණය විය. |
| (ආ) | 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 48(1) වගන්තිය | සෑම රක්ෂණකරුවෙකු විසින්ම, ඒ ව්‍යාපාරයේ රක්ෂණකරුගේ වත්කම් හා බැරකම් තක්සේරු කිරීමක්ද ඇතුළුව, එක් එක් මුදල් වර්ෂය අවසානයේදී ජීවගණකයෙකු ලවා විමර්ශනයක් කිරීමට සලස්වනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් සාදන ලද රීති වලට අනුකූලව උද්ධෘතයක් පිළියෙල කිරීමටද මණ්ඩලය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතුය. එසේ වුවද, කොමිෂන් සභාවේ ජීවගණක තනතුර දිගින් දිගටම පුරප්පාඩුව පැවතීම හේතුවෙන් රක්ෂණකරුවන් විසින් වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන ජීවගණක වාර්තා සමාලෝචනය කිරීම සඳහා ස්ථිර වැඩපිළිවෙලක් යෙදීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය | පරිපාලන අත්පොතක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර එකඟතාවය ලබා ගත යුතු වුවද 2020 ජූලි 31 දින වන විටත් කොමිෂන් සභාව භාවිතා කරනු ලබන අත්පොත සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය ලැබී නොතිබුණි. එසේ වුවද, අත්තිකාරම් ගෙවීම්, වාහන ණය ලබාදීම් ඇතුළු කටයුතු අනුමැතිය නොලත් පරිපාලන අත්පොත ප්‍රකාරවම සිදුකෙරෙමින් පවතින බව නිරීක්ෂණය විය. |
| (ඇ) | 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 07 වගන්තිය | කොමිෂන් සභාවේ තක්සේරු වර්ෂයට අදාල ආදායම් බද්දට යටත් වියයුතු ඉහත සඳහන් කරන ලද එකතුව රු. 1,067,381,178 ක් වූ සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් බදු බැරකම් ගණනයේදී සලකා බලා නොමැති බව නිරීක්ෂණය විය. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීති වලට අනුකූල ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

# විගණකාධිපති වාර්තාව

**3. වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි 13 (1) (ඇ) වගන්තිය පරිදි අලුතින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන ලබන රක්ෂණ සමාගම් විසින් මන්ඩලය විසින් නිශ්වය කරනු ලබන මුදලක් මහා භාණ්ඩාගාරයෙහි තැන්පත් කළ යුතුය.එලෙස තැන්පත්කරන ලද මුදල් පිළිබඳව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන උපලේඛණය හා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන උපලේඛනය අතර රු.3,700,000 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව අදාල වෙනසට හේතු සැසඳීමක් කර තැන්පතු ලේඛණ යාවත්කාලිනව පවත්වාගෙන ගොස් නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) තවද 2007 වර්ෂයට පෙර ලියාපදිංචි කරන ලද රක්ෂණ ආයතන 11 ක් සම්බන්ධයෙන් ඉහත (අ) ඡෙදයෙහි සඳහන් තැන්පතු පිළිබඳව තොරතුරු කොමිෂන් සභාව පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයට පෙර සිට ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු. 1,208,602 ක රඳවාගත් බදු ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) කොමිෂන් සභාව 2016 වර්ෂයේ ආරම්භයේ සිට රක්ෂණ සමාගම්වල නුබුන්වත් නීති රාමුව වෙනුවට හඳුන්වාදුන් අවධානම් පාදක ප්‍රාග්ධනය මූලික කරගත් සුපරීක්ෂණ ක්‍රමයකට (RBC) යොමුවීම නිසා ජීවගණක ඒකකයක් ඇති කිරීමට 2016 වර්ෂයේදී අනුමත කළ විධායක මට්ටමේ තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# 2019 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

<table>
<tr><th colspan="3">2019 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභවේ ප්‍රතිචාර දැක්වීම</th></tr>
<tr><th colspan="2">විගණකාධිපති වාර්තාව</th><th>ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම</th></tr>
<tr><th colspan="2">තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</th><th></th></tr>
<tr><td colspan="2">- වත්කම් වල ඵලදායි ජීවකාලය වාර්ෂිකව නැවත සමාලෝචනය කර ඒ අනුව අනාවරණය වන ඇස්තමේන්තුගත දෝෂ රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිත අංක 3 ට අනුව නැවත සංශෝධනය කල යුතු වුවත් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනට ප්‍රයෝජනයට ගන්නා එකතුව රු 36,147,267 ක් වූ වත්කම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.</td><td>ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතකරණ 07 අනුව වත්කම් වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව බැලිය යුත්තේ එහි සාධාරණ අගය (fair value) නිරන්තරයෙන් (Volatile) ප්‍රාමාණික ලෙස උච්චාවචනය සිදු වේ නම් පමණි. කළමණාකරනාකාරීත්වයේ සහ විගණන කමිටුවේ තීරණය වූයේ ඒවා සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් එසේ නිරන්තරයෙන් ප්‍රාමාණික ලෙස උච්චාවචනය නොවන බවයි. තවද එවැනි ප්‍රත්‍යාගණනය සඳහා වැය වන්නා වූ වියදමද සැලකිල්ලට ගෙන මෝටර් රථ පමණක් ප්‍රත්‍යාගණනයට විගණන කමිටුව තීන්දු කරන ලදි.<br>එම නිසා අප ආයතනය ප්‍රමිත අංක 07 ට අනුව ක්‍රියා කර ඇති බව අපගේ මතයයි.</td></tr>
<tr><td colspan="2">- වර්ෂ 05 කින් නැවත ආපසු ලබා ගත හැකි වන පරිදි පෞද්ගලික ආයතනයක තැන්පත් කර තිබුණු රු.12,280,195 ක මුදලින් රු. 2,674,746 ක මුදලක් ජංගම වත්කම් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා තිබුණි.</td><td>කුලී ගිවිසුමට අනුව ගෙවා ඇති තැන්පතු මුදල් අනුව රු.9,607,449 ක තැන්පතුව වසරකට වඩා වැඩි කාලයකට පෙර ගෙවා ඇති අතර ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීම නිවැරදි වේ. රු. 2,674,946 ක තැන්පතුව 2019 වසරේදී ගෙවා ඇති අතර එය වසරකට වඩා අඩු කාලයක් බැවින් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම් ගත කරනු ලබයි 2020 වසරේදී ජංගම නොවන වත්කම් වලට ආදල වටිනාකම මාරු කරනු ලැබේ.</td></tr>
<tr><td colspan="2">- 2019 වර්ෂයේ මිලදී ගන්නා ලද රු.4,723,000 ක් වටිනා පරිඝනක මෘදුකාංගයක් ශ්‍රීලරාඅගි ප්‍රමිත අංක 20 ට අනුව ආයතනයේ අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගෙන ගිණුම්ගත කිරීමටත් එම වත්කම ක්‍රමක්ෂය කිරීමටත් කටයුතු කර නොතිබුණු අතර මෙම මෘදුකාංගය සඳහා 2019 වර්ෂයෙහි දරන ලද රු.844,167 ක ගෙවීමක් කලින් ගෙවීම් යටතේ දක්වා තිබුණි.තවද මෙම මෘදුකාංගය සම්බන්ධයෙන් අදාල සැපයුම්කරු සමග ඇති කර ගන්නා ලද ලිඛිත ගිවිසුමක් ද විගණනයට ඉදිරිපත් නොවුණි.<br>-වර්ෂ 05 කින් නැවත ආපසු ලබා ගත හැකි වන පරිදි පෞද්ගලික ආයතනයක තැන්පත් කර තිබුණු රු.12,280,195 ක මුදලින් රු. 2,674,746 ක මුදලක් ජංගම වත්කම් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා තිබුණි.</td><td>මෙය Board Pac මෘදුකාංගය සම්බන්ධ ගෙවීමකි. මෙම මෘදුකාංගය සඳහා ගෙවා ඇති රු. 844,167/- ක් පෙර ගෙවුම් ලෙස සඳහන් කර මාසිකව ආදායම් හා වියදම් ගිණුමට හර කරනු ලැබේ. මෙසේ කරනු ලබන්නේ මෙය වාර්ෂිකව ගෙවන බලපත්‍ර ගාස්තුවක් (License Fee) බැවින්, මෙම බලපත්‍ර ගාස්තුව අවුරුද්දකට වලංගු වන අතර එම බලපත්‍රය ලබාගතහොත් පමණක් මෘදුකාංගය භාවිතා කල හැකි බැවින් ඔබ සඳහන් කර ඇති රු. 4723,000/- අවුරුදු පහකට ගෙවිය යුතු මුදලයි. එසේ ගිවිසුම්ගතව ඇත්තේ මිල උච්චාවචනය පාලනය කර ගැනීමට මිස එම මුදල ගෙවීම් කර නොමැත. එසේ ගෙවා තිබුණි නම් ඔබ සඳහන් කරන පරිදි අස්පෘශ්‍ය වත්කමක් (Intangible Assets) ලෙස ගිණුම්ගත කර හැකිව තිබුණි. නමුත්, මෙය වාර්ෂිකව ගෙවීම් කරන නිසාත් වර්ෂයකට වැඩි කාලයකට ප්‍රතිලාභය නොලැබෙන නිසාත් මෙය අස්පෘශ්‍ය වත්කමක් ලෙස ගිණුම්ගත කල නොහැක. එමනිසා, මෙය ආදායම් හා වියදම් ගිණුමට හර කරනු ලබයි.</td></tr>
<tr><th colspan="3">වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා</th></tr>
<tr><td>දරන රක්ෂණ 43 අංක 2000 කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි 6 (2) (ඈ) වගන්තිය</td><td>කොමිෂන් සභාව විසින් එහි බලතල,කාර්ය,කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටුකිරීමේ දී, කොමිෂන් සභාවට ලැබෙන සියලු මුදල් එහි ආදායම් ලෙස හඳුනාගත යුතු වුවද 2019 වර්ෂයේදී සෙස් බදු ලෙස ලැබී තිබුණු රු.493,068,161 ක් සහ 2019 වර්ෂයෙහි රක්ෂණ භාර දරන්නන්ගේ ආරක්ෂණ අරමුදලට අදාල රු.574,313,018 ක් වූ පොළී ආදායම කොමිෂන් සභාවෙහි සමාලෝචිත වර්ෂයෙහි ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණු අතර පසුගිය වර්ෂයේ දී ද මෙම තත්ත්වය එලෙසම පැවති බව නිරීක්ෂණය විය.</td><td>2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 103 (1) වගන්තියට අනුව සෙස් (Cess) බද්දෙන් ලැබෙන සියළු මුදල් බැර කල යුත්තේ රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ආරක්ෂණ අරමුදලට බව පැහැදිලිව සඳහන් වේ. 2000 අංක 43 දරණ පනතේ 6 වගත්තියට අනුව කොමිසම සතුව වෙනම අරමුදලක් පිහිටුවා ගෙන එයට පහත සඳහන් ආදායම් බැර කල හැකිය.<br>• පාර්ලිමේන්තුවෙන් අනුමත මුදල්<br>• ලියාපදිංචි ගාස්තු<br>• වාර්ෂික ලියාපදිංචි අළුත්කිරීමේ ගාස්තු<br>• වෙනත්<br>එමනිසා පනතේ විධිවිධාන අනුව පැහැදිලිව අරමුදල් 2කට බැර විය යුතු ආදායම් මොනවාදැයි සඳහන් වන අතර කළමණාකාරීත්වයට ඒ අනුව ක්‍රියා කර ඇත. තවද මෙවැනි Cess බදු අයකරන අනෙකුත් රාජ්‍ය ආයතනද පිළිපදින්නේ මෙම ක්‍රමය බව දැනුම්දීමට කැමැත්තෙමි. එබැවින් මෙම ගිණුම්ගත කිරීමේ කිසිඳු වැරැද්දක් නැති බව අපගේ මතයයි.</td></tr>
<tr><td>(ආ) 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 48(1) වගන්තිය</td><td>සෑම රක්ෂණකරුවෙකු විසින්ම, ඒ ව්‍යාපාරයේ රක්ෂණකරුගේ වත්කම් හා බැරකම් තක්සේරු කිරීමක්ද ඇතුළුව, එක් එක් මුදල් වර්ෂය අවසානයේදී ජීවගණකයෙකු ලවා විමර්ශනයක් කිරීමට සලස්වනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් සාදන ලද රීති වලට අනුකූලව උද්ධෘතයක් පිළියෙල කිරීමටද මණ්ඩලය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතුය. එසේ වුවද, කොමිෂන් සභාවේ ජීවගණක තනතුර දිගින් දිගටම පුරප්පාඩුව පැවතීම හේතුවෙන් රක්ෂණකරුවන් විසින් වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන ජීවගණක වාර්තා සමාලෝචනය කිරීම සඳහා ස්ථිර වැඩපිළිවෙලක් යෙදීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.</td><td>ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක මූල්‍ය ක්ෂේත්‍රය නවීකරණ ව්‍යාපෘතිය (Financial Sector Modernization Project) මඟින් ජීවගණක උපදේශකවරයෙකු පත් කර ජීවගණක ඒකකය වෙත විධායක නිළධාරීන් දෙදෙනාද සමග මේ වන විට මෙම කටයුතු කරගෙන යනු ලබයි.</td></tr>
</table>

# 2019 වාර්තාවේ විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට කොමිෂන් සභාවේ ප්‍රතිචාර දැක්වීම

| | | |
|---|---|---|
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය | පරිපාලන අත්පොතක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර එකඟතාවය ලබා ගත යුතු වුවද 2020 ජූලි 31 දින වන විටත් කොමිෂන් සභාව භාවිතා කරනු ලබන අත්පොත සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය ලැබී නොතිබුණි. එසේ වුවද, අත්තිකාරම් ගෙවීම්, වාහන ණය ලබාදීම් ඇතුළු කටයුතු අනුමැතිය නොලත් පරිපාලන අත්පොත ප්‍රකාරවම සිදුකෙරෙමින් පවතින බව නිරීක්ෂණය විය. | පරිපාලන අත්පොත භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා 2017.03.30 වන දින ඉදිරිපත් කර ඇති නමුත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් අංක PE/REG/IRCSL/PR හා 2018/4/5 ලිපිය මඟින් අපට දන්වා ඇත්තේ එම ඇගයීමට අවශ්‍ය මානව සම්පත් පිළිබඳ ගැටළුවක් හේතුකොට ගෙන එය පමා වන බවයි.<br>කොමිසම විසින්ද එදිනෙදා පරිපාලනයේදී මෙම පරිපාලන අත්පොත භාවිතා කිරීමට සුදුසු යැයි අනුමත කරන ලදි.<br>කොමිෂන් සභාව ලෙස අපට කල හැකි උපරිමය අප විසින් සිදු කර ඇති අතර භාණ්ඩාගාර අනුමැතිය ප්‍රමාද වීම අපට පරිබාහිර වූ හා අප පාලනයෙහි නොපවතින කටයුත්තක් බව අපගේ විශ්වාසයයි. එහෙයින් කොමිෂන් සභාවේ කටයුතු පවත්වාගෙන යායුතු බැවින් සියලු ගෙවීම එලෙසම සිදු කිරීම ප්‍රායෝගික හා ප්‍රඥාගෝචර බව අපගේ විශ්වාසයයි. |
| (ඈ) 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 07 වගන්තිය | කොමිෂන් සභාවේ තක්සේරු වර්ෂයට අදාල ආදායම් බද්දට යටත් වියයුතු එකතුව රු. 1,067,381,178 ක් වූ සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් බදු, බැරකම් ගණනයේදී සලකා බලා නොමැති බව නිරීක්ෂණය විය. | රක්ෂණ භාර අරමුදල ආදායම් බද්දෙන් නිදහස් කර ගැනීමට මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇති අතර අරමුදලේ පොලී ආදායමෙන් පමණක් රඳවා ගැනීමේ බදු අඩු කර ඇත. මුදල් අමාත්‍යාංශයෙන් මේ සඳහා නිසි පිළිතුරක් ලැබෙන තෙක් සෙස් බද්ද හා පොලී ආදායම මත ආදායම් බදු නොගෙවීමට තීරණය කරන ලදි. |
| **වෙනත් විගණන නිරීක්ෂණ** | | |
| (අ) රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි 13 (1) (ඇ) වගන්තිය පරිදි අලුතින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කරන ලබන රක්ෂණ සමාගම් විසින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන මුදලක් මහා භාණ්ඩාගාරයෙහි තැන්පත් කළ යුතුය. එලෙස තැන්පත්කරන ලද මුදල් පිළිබඳව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන උපලේඛණය හා කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන උපලේඛනය අතර රු.3,700,000 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව අදාල වෙනසට හේතු සැසඳීමක් කර තැන්පතු ලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොමැති බව නිරීක්ෂණය විය. | | භාණ්ඩාගාර තැන්පතු දෙපාර්තමේන්තුවේ මීට අදාළ තැන්පතු වාර්තාවේ මුදල් ගෙවූ අය පිළිබඳ නම් හෝ වෙනත් විස්තර සඳහන් නොවේ. එබැවින් මෙම තැන්පතු මේ සඳහා ලැබුණු තැන්පතු දැයි තහවුරු කල නොහැක. නමුත් කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාවේ නම් ඇතුළු සියලු විස්තර ඇතුළත්ව ඇති නිසා අප විසින් පවත්වාගෙන යනු ලබන වාර්තාව නිවැරදි බව අපගේ විශ්වාසයයි. |
| (ආ) තවද 2007 වර්ෂයට පෙර ලියාපදිංචි කරන ලද රක්ෂණ ආයතන 11 ක් සම්බන්ධයෙන් ඉහත (අ) ඡේදයෙහි සඳහන් තැන්පතු පිළිබඳව තොරතුරු කොමිෂන් සභාව පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ලබා ගෙන තොරතුරු යාවත්කාලීන කිරීමට බලාපොරොත්තු වෙමු. |
| (ඇ) 2016 වර්ෂයට පෙර සිට ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති රු. 1,208,602 ක රඳවාගත් බදු ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි. | | 2016 වර්ෂයට පෙර කොමිෂන් සභාව බදු ගෙවීමට යටත් නොවූ බැවින් 2016 වර්ෂයට පෙර ගෙවූ 1,208,602 රඳවා ගැනීමේ බදු හිලව් කර ගැනීමට IRD අනුමැතිය නොදුන් අතර මින් පෙර ඒ සඳහා E&Y ගණකාධිකාරීවරු හරහා කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප විය. |
| (ඈ) කොමිෂන් සභාව 2016 වර්ෂයේ ආරම්භයේ සිට රක්ෂණ සමාගම්වල නුබුන්වත් නීති රාමුව වෙනුවට හඳුන්වාදුන් අවධානම් පාදක ප්‍රාග්ධනය මූලික කරගත් සුපරීක්ෂණ ක්‍රමයකට (RBC) යොමුවීම නිසා ජීවගණක ඒකකයක් ඇති කිරීමට 2016 වර්ෂයේදී අනුමත කළ විධායක මට්ටමේ තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතුණි. | | ජීව ගණක ඒකකයේ විධායක තනතුරු දෙක සඳහා බඳවා ගැනීම් සිදුකර ඇති අතර පුරප්පාඩුව පවතින ජීව ගණක සහ සහකාර ජීව ගණක තනතුරු සඳහා පුවත්පත් දැන්වීම් පලකර, බඳවා ගැනීමට කටයුතු සිදුකරමින් පවතී.<br><br>මීට ඉහත 2018.02.26 දින ජීවගණක හා සහකාර ජීවගණක යන තනතුර දෙක සඳහාද 2019.09.01 දින සහකාර ජීවගණක තනතුර සඳහාද පුවත්පත් දැන්වීම් පළ කර අයදුම් පත් කැඳවූවද අයදුම් කළ සීමිත අයදුම්කරුවන් අතරින් බලාපොරොත්තු වන මට්ටමේ නිපුණතාවක් සහිත අයදුම්කරුවන් නොසිටීමත්, එසේ නිපුණතාවය පෙන්වීම මත 2018 වසරේ දී තෝරා ගත් සහකාර ජීවගණක කොමිෂන් සභාවේ වැටුපට කැමති නොවීමෙන් වැඩි වේතනයක් බලාපොරොත්තු වූ බැවින් එම බඳවා ගැනීමේ කටයුතු සිදු කළ නොහැකි විය.<br><br>එමෙන්ම දැනට ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන FSMP වැඩපිළිවෙළ යටතේ විදේශීය ජීවගණකවරයකු ගේ සේවය ලබාගන්නා අතර ඔහු සමඟ සේවය කිරීම සඳහා ජීවගණකවරයකු සහ සහකාර ජීවගණක වරයෙකු බඳවා ගැනීම පිණිස මේ වන විට පුවත්පත් දැන්වීම් ද පල කර අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී. එමෙන්ම දැනටමත් ජීවගණක ඒකකය සඳහා විධායක නිළධාරීන් දෙදෙනෙකු බඳවා ගෙන එහි රාජකාරී කටයුතු ඉටු කරමින් පවතී.<br><br>විදේශීය ජීවගණකවරයා විසින් සැපයිය යුතු සේවාවන් අතර ජීවගණක අංශයක් ස්ථාපනය කිරීම ද ඇතුලත් කර ඇති අතර ඔහුගේ ද උපදෙස් ලබාගෙන ඉහත තනතුරු සඳහා කාර්යය විස්තරය සාදන ලදී. (Job Description) |

# පරිශිෂ්ඨය 1

2019 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම්

| අංකය | රක්ෂණ සමාගම | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 2 | ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ්* | සාමාන්‍ය රක්ෂණය |
| 3 | ඇලියොන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 4 | ඇලියොන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 5 | අමානා තකාෆුල් පීඑල්සී | සාමාන්‍ය රක්ෂණය |
| 6 | අමානා තකාෆුල් ලයිෆ් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 7 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 8 | සොෆ්ට් ලොජික් ලයිෆ් ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 9 | ෆෙයාර් ෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 10 | සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 11 | සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 12 | කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 13 | කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 14 | කෝප්ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 15 | එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 16 | එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 17 | ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |
| 18 | ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 19 | එල්ඕඑල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 20 | එල්ඕඑල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 21 | එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 22 | ජාතික රක්ෂණ භාර අරමුදල | සාමාන්‍ය රක්ෂණය |
| 23 | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 24 | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | සාමාන්‍ය රක්ෂණය |
| 25 | සණස ජෙනරාල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 26 | සණස ලයිෆ් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය |
| 27 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 28 | යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී | දිගුකාලීන රක්ෂණය |

* මේ වන විට, ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර කටයුතු වලින් ඉවත් වීම අරඹා ඇති අතර, තවදුරටත් නව රක්ෂණ ඔප්පු නිකුත් කරනු නොලැබේ.

# පරිශිෂ්ඨය II

2019 දෙසැම්බර් 31 දිනට පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ තැරැව්කාර සමාගම්

| අංකය | රක්ෂණ සමාගම | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 1 | 3 ඩී එච් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 2 | ආසියාන් ඉන්ටර්නැෂනල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 3 | ඒඑම්ඩබ්ලිව් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 4 | ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 5 | එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 6 | ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 7 | ඇලියෝන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 8 | ඇම්ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 9 | ඇක්විලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 10 | අසෙකි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 11 | ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 12 | ඇක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 13 | බිමා ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 14 | බ්‍රිලියන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 15 | සියෙක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 16 | සීලෑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 17 | සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 18 | සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 19 | කලම්බුරේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 20 | කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 21 | ඩී එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 22 | ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 23 | ඊගල් ඕ වී ආර් එස් ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රිඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 24 | ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 25 | එස්නා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 26 | එසාජි කරීම්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 27 | ෆෙයාර්වේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 28 | ෆයින්ඩ් මයි ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රිඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 29 | ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 30 | ෆෝර්මෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 31 | ජෝර්ජ් ස්ටුව(ර්)ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 32 | ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 33 | ග්‍රෑන්ඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 34 | ගාඩියන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 35 | අයිකොන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් *** | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 36 | ඉන්ෂුවර්මී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 38 | ජේ එෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 39 | ලක් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |

# පරිශිෂ්ඨය II

| අංකය | රක්ෂණ සමාගම | ව්‍යාපාර කටයුතු වර්ගය |
|---|---|---|
| 40 | ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 41 | එම් ආර් යු එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 42 | මැක්ස්වෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 43 | මර්කන්ටයිල් ෆෝර්චූන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 44 | මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 45 | මියුචුවල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 46 | එල්එම් ඇන්ඩ් ඒ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 47 | මයි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 48 | නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 49 | ප්ලැසිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 50 | ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 51 | ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 52 | ප්‍රයෝරිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 53 | රෙඩ්මෝ ස්විස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 54 | රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 55 | රින්කුන් ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 56 | ආර් එම් එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 57 | සැම්සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 58 | සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 59 | සෙංකඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 60 | ස්ට්‍රැටර්ජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 61 | එස් වයි එම් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් **** | සාමාන්‍ය රක්ෂණය |
| 62 | ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 63 | යූඑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 64 | යුනයිටඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය |
| 65 | වෙරාසිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 66 | වික්ටර් එමානුවෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 67 | වොලන්කා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |
| 68 | සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය |

*** අයිකොන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය යටතේ තැරැව්කාර ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා ලබා දී තිබූ ලියාපදිංචිය 2019 දෙසැම්බර් 17 දින සිට අත්හිටුවන ලදි

**** එස් වයි එම් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - සාමාන්‍ය රක්ෂණය යටතේ තැරැව්කාර ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා ලබාදී තිබූ ලියාපදිංචිය 2019 අගෝස්තු 29 දින සිට නැවත දැනුම් දෙන තෙක් අත්හිටුවන ලදි.

# පරිශිෂ්ඨය III

2019 දෙසැම්බර් 31 දිනට පනත යටතේ ලියාපදිංචි වී ඇති අළාභ ගැළපුම්කරුවන්

| අංකය | අළාභ ගැළපුම්කරු | බලපත්‍රය ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| 1 | උදිතමාලා පිනාදරී කුරුකුලසූරිය මිය | 2018 ජුනි 13 |
| 2 | රන් බණ්ඩා තෙන්නකෝන් මයා | 2018 ජුනි 25 |
| 3 | විජිතසේන ලීලාරත්න ප්‍රනාන්දු මයා | 2018 ජුනි 25 |
| 4 | ගාමිණී කීනිගම මයා | 2018 ජුනි 25 |
| 5 | අහමඩ් නසීම් නස්වි රහුමාන් මයා | 2018 ජුනි 25 |
| 6 | ගුණවර්ධන මුදියන්සේලාගේ ආනන්ද උදය කුමාර ගුණවර්ධන මයා | 2018 ජුනි 25 |
| 7 | මහබාලගේ දොන් සිසිර උපාලි පෙරේරා මයා | 2018 ජුනි 26 |
| 8 | නිරෝෂ් සංජීව වතුකාරවත්ත මයා | 2018 ජුනි 26 |
| 9 | සුසන්ත මහින්දරත්ත වීරකෝන් මයා | 2018 ජුනි 26 |
| 10 | රාජපක්ෂ පතිරගේ දොන් කාන්චන සුරංගික මයා | 2018 සැප්තැම්බර් 10 |
| 11 | ද ෂීල්ඩ් අජස්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2019 මාර්තු 29 |
| 12 | ඒ ඩබ් එම් බන්දුල විජේකෝන් මයා | 2019 මාර්තු 29 |
| 13 | ලාලින්ද්‍ර ක්‍රිෂාන්ත කරුණාරත්න මයා | 2019 මාර්තු 29 |
| 14 | රාජපක්ෂ මුදියන්සේලාගේ හේරත් රාජපක්ෂ මයා | 2019 සැප්තැම්බර් 26 |
| 15 | රාසිං බස්තියන් ආරච්චිගේ රවිනාත් නිරෝෂණ මයා | 2019 සැප්තැම්බර් 26 |
| 16 | කීර්ති දෙල්වත්ත මයා | 2019 සැප්තැම්බර් 26 |

# පාරිභාෂික ශබ්ද මාලාව

### සමුච්චිත වීම
එක් සමාගමක් සමග පවතින සැලකිය යුතු රක්ෂිත හෝ ප්‍රතිරක්ෂිත අවදානම් සංඛ්‍යාවක් පාඩු ලබන සිදුවීමක් නිසා එක්වර පීඩාකාරී බවට පත්වන තත්වයකි.

### අත්කර ගැනීමේ වියදම්
අභිනව රක්ෂණ ගිවිසුම අත්කර ගැනීම සහ දැනටමත් පවත්නා රක්ෂණ ගිවිසුම් අළුත්කිරීම (උදා:-කොමිස් මුදල්) යන අවස්ථාවල දී වෙනස්වීම්වලට ලක්වන සහ එයට මූලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන සියළු වියදම්.

### ජීවගණකඥ
ජීවගණකඥයෙක් යනු අවිනිශ්චිත අවස්ථාවන්හි මූල්‍යමය ප්‍රතියමාන්‍යයන් ඇගයීම සඳහා පුහුණුව ලබා ඇති වෘත්තියවේදියෙකි. රක්ෂණයේ සහ අනිකුත් මූල්‍ය සේවාවන්හි අනුමානික ස්වභාවය, වත්කම්වලට ආවේණික අවදානම් සහ සංඛ්‍යාලේඛන ආකෘතීන් පිළිබඳ අවබෝධයක් ජීවගණකඥයින් සතුවිය යුතුය. මේ අනුව උදාහරණයක් ලෙස වාරික, තාක්ෂණික ප්‍රතිපාදන සහ ප්‍රාග්ධන මට්ටම තහවුරු කිරීම සිදු කරනු ලැබෙයි.

### පරිපාලන වියදම්
දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන සහ සේවක පිරිවැය සහිතව වාරික එකතු කිරීමේදී ආයෝජන කළඹ පරිපාලනයේ දී ජනනය වන පරිපාලන ස්වභාවයේ වියදම්.

### ආවේශ්‍යතා දැක්විය හැකි වත්කම්
ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය නිශ්චය කිරීමේ දී ඇතුලත් කරනු ලැබෙන වත්කම් වේ. මෙවැනි වත්කම් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතෙහි නිශ්චිතව දක්වා තිබේ.

### වාර්ෂිකය
යම් කිසි නිශ්චිත කාලසීමාවක් සඳහා වර්ෂිකලාභියාගේ ආයු කාලය මුළුල්ලේ හෝ වාරමය වශයෙන් ආදායම් ප්‍රතිලාභ ගෙවන ජීවිත රක්ෂණයකි.විලම්භිත හා ක්ෂණිකව ක්‍රියාත්මක වන යනුවෙන් මූලික වශයෙන් වර්ග දෙකකට අයත් වාර්ෂික පවතියි. ගෙවීම් සිදුකිරීම යම්කිසි අනාගත කාලයක දී ආරම්භ වන්නේ නම් එය විලම්භිත වාර්ෂිකය නම් වේ.ගිවිසුම ආරම්භ වන අවස්ථාවේදීම අදාළ ගෙවීම් සිදුකිරීම අරඹන්නේ නම් එය ක්ෂණික වාර්ෂිකය නම් වේ.

### බැංකු රක්ෂණ සේවාව
රක්ෂකයා විසින් රක්ෂණ සහ ආයෝජන නිෂ්පාදන බැංකු පාරිභෝගිකයින් වෙත අළෙවි කිරීමේ වැඩ පිළිවෙලකි.

### ප්‍රතිලාභියා
ඔප්පු හිමියාගේ මරණයක දී රක්ෂිත මුදල් සහ අනෙකුත් ප්‍රතිලාභ ලැබිය යුතු ආදායකයා ලෙස ඔප්පු හිමියා විසින් නම් කරනු ලබන පුද්ගලයා.

### ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය (CAR)
අවශ්‍ය කරනු ලබන අවදානම් පාදක ප්‍රාග්ධනය (RCR) ට සහාය දැක්වීම පිණිස වූ පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC), ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය මගින් මණිනු ලබයි .

$$\text{ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාතය} = \frac{(\text{පූර්ණ පවත්නා ප්‍රාග්ධනය})}{(\text{නියමිත අවදානම් ප්‍රාග්ධනය})} \times 100$$

### ප්‍රතිරක්ෂිතයා
ප්‍රතිරක්ෂණ සමාගමක සේවාදායකයෙක් (ප්‍රාථමික රක්ෂණ සමාගම)
දායකය - රක්ෂණ සමාගම් විසින් ප්‍රතිරක්ෂකයින් වෙතට මාරුකරනු ලබන අවදානම් කොටස.

### හිමිකම් පෑම
දේපල විනාශ වීම හෝ හානි වීම සහ ඒ ආශ්‍රිත මරණය හෝ තුවාල සිදුවීම,ආරෝග්‍යශාලා හෝ වෛද්‍ය බිල්පත් දැරීම, රක්ෂිතයාගේ මරණය හෝ ආබාධිතවීම, උපපාදන ඔප්පුවක් කල් පිරීම, විශ්‍රාමික වයසට පත්වීම යනා දී ආකාරවලට රක්ෂණයට බඳුන් වූ කාරණය සිදුවීම හේතු කරගෙන හෝ ඔප්පුවක් පවාරණය කිරීමේදී රක්ෂණ ගිවිසුම පරිදි ගෙවිය යුතු මුදල.

### දරන ලද හිමිකම් පෑම
වර්ෂය ආරම්භයේ දී සහ වර්ෂය අවසානයේ දී හිඟ තබා ඇති හිමිකම් පෑම් සඳහා වූ ප්‍රතිපාදන වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවල දී ගැලපීම් කළ පසු ගිණුම් වර්ෂයක් තුළ හිමිකම් පෑම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට දරන වියදම සහිතව ගෙවන ලද මුළු හිමිකම් පෑම් වටිනාකම.

### සිදුවී ඇති නමුත් වාර්තා නොකරන ලද හිමිකම් පෑම් (IBNR)
දේපල, වගකීම් සහ මූල්‍ය යන රක්ෂණ පිළිබඳව සිදුවී ඇති නමුත් රක්ෂකයා වෙත තවමත් වාර්තා කරනු ලැබ නැති අලාභ ආවරණය කිරීම සඳහා දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂිත පිරිවැය නිරූපණය කරමින් වර්ෂය අවසානයේදී ඇති කරනු ලබන සංචිතයකි.

### හිඟ සිටි හිමිකම් පෑම් සංචිතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර
කටයුතු සිදු වූ නමුත් වාර්තා කරනු ලැබ නොතිබූ හිමිකම් සහ ඒවා පිළිබඳව කටයුතු කිරීමේදී දරන්නට සිදුවන පිරිවැය සහිතව ශේෂ පත්‍ර දිනය වන විට වී ඇති සිද්ධි වෙනුවෙන් ඒවා ආවරණය කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත පිරිවැයෙන් එවැනි හිමිකම් පෑම් සඳහා මේ වන විටත් ගෙවා ඇති මුදල අඩු කළ පසු ලැබෙන අගය.

### සහභාග රක්ෂණය
නිශ්චිත වාර මුදල් එකඟ වුණු අනුපාතයක් මත ගෙවීමේ පදනම මත අවදානම් ආවරණය සඳහා රක්ෂකයන් දෙදෙනෙකු හෝ කිහිප දෙනෙකු රක්ෂිතයා සමග ඇති කර ගන්නා තනි ගිවිසුමක්.

### කොමිස්
රක්ෂකයාගේ නිෂ්පාදනයක් විකිණීම හෝ සේවාකරණය වෙනුවෙන් තැරැව්කරුවකුට හෝ රක්ෂණ නියෝජිතයෙකුට කරන ගෙවීමක්.

### සංකේන්ද්‍රණ අවදානම
නෛසර්ගික ණය අවදානම යෝග්‍ය ලෙසින් අවම කරලීම පිණිස රක්ෂණ හිමියන්ගේ වතක්ම් ප්‍රමාණවත් ලෙස විවිධාංගීකරණය වී නොමැති නම්,පවතින අතිරේක ණය අවදානම.

### ණය අවදානම
ශ්‍රේණිගත සුරැකුම්පත් නිකුත් කරන්නන් (ආයෝජකයාගේ ආයෝජන කළඹෙහි),ණයගැතියන්, (උදා. උකස්කරුවන්) හෝ ප්‍රතිපාර්ශවකරුවන් (උදා. ප්‍රතිරක්ෂණ ගිවිසුම්, ව්‍යුත්පන්න ගිවිසුම් හෝ තැන්පතු මත) සහ මැදිහත්කරුවන්ගේ ණය ප්‍රමාණන පැවරීම්වල පැහැර හැරීම් හෝ සංචලනයන් නිසා ඇතිවන මූල්‍ය අලාභ අවදානම. ණය අවදානම තුළ පැහැර හැරීමේ අවදානම, අවශ්‍රේණිගතවීම හෝ සංක්‍රමණික අවදානම, වක්‍ර ණය හෝ ව්‍යාප්තවීමේ අවදානම, සංකේන්ද්‍රණ අවදානම හා සහ සම්බන්ධ අවදානම අන්තර්ගත වේ. ණය අවදානම් මූලාශ්‍රයන්ට ආයෝජන ප්‍රතිපාර්ශවකරුවන් රක්ෂණ ඔප්පුහිමියන් (හිඟ වාරික හරහා) ප්‍රතිරක්ෂණකරුවන්, මැදිහත්කරුවන් සහ ව්‍යුත්පන්න ප්‍රතිපාර්ශවකරුවන් ඇතුළත් වේ.

### විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය
වාර්ෂික පදනමට ගිණුම්කරණයේ දී එක් ගිණුම් වර්ෂයක සිට ඊළඟ ගිණුම් වර්ෂයට ගෙන යා යුතු, අවදානම හා සම්බන්ධ ගිවිසුම්වල කල් ඉකුත් නොවූ කාලය සඳහා අදාළ වන අත්පත් කර ගැනීමේ පිරිවැය.

# පාරිභාෂික ශබ්ද මාලාව

**අත්හිටවූ මෙහෙයුම්**
සමාගමක සමස්ත අංශයක්, අනුබද්ධිත ආයතනයක් හෝ කොටසක්, සමාගමෙන් ඉවත්කරලීම සඳහා විධිමත් සැලසුමක් පවතින විට ඒවායේ මෙහෙයුම්.

**ඉපැයූ වාරික**
වර්ෂය තුළ ඉපැයූ ලිඛිත වාරික වලට වර්ෂය ආරම්භයේදී සහ අවසානයේදී ඇති නොඉපයූ වාරික ආදායම ගලපා සකස්කරගත් වාරික ආදායමයි.

**උපපාදන / දායාද**
අභාග්‍ය සම්පන්න අවස්ථාවක දී රක්ෂිතයාගේ ජීවිතය පමණක් ආවරණය වනවාට අමතරව රක්ෂණ ඔප්පුව කල්පිරීමේදී ප්‍රතිලාභ හිමිකර දෙන ජීවිත රක්ෂණ ගිවිසුම්.

**සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු**
ගිනි, මුහුදු උවදුරු, මෝටර් වාහන හෝ මිශ්‍ර රක්ෂණ ව්‍යාපාර කටයුතු එකක් හෝ කිහිපයක් තනිව හෝ ඒකාබද්ධව පවත්වාගෙන යාම, ගිණුම් කාලපරිච්ඡේදයක් තුළදී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධව සියලු මූලාශ්‍ර වෙතින් ලද මුළු වාරික හෝ ලැබිය යුතු මුළු වාරික ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ලැබිය යුතු වාරිකද සහිත අගය.

**දළ ලිඛිත වාරිකය (GWP)**
වට්ටම් , ආපසු ගෙවීම් හා ප්‍රතිදාන අඩුකිරීමෙන් පසුව එහෙත් ඉඩ දෙන ලද ප්‍රතිරක්ෂණ සඳහා රක්ෂණකරුවෙකු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු වාරික කිසිවක් අඩුකිරීමට පෙර වූ වාරිකය.

**රක්ෂකයා**
2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස සංස්ථාපිත කර ඇති සහ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සමාගමකි.

**අහෝසි වූ ඔප්පුව**
වාරික මුදල් නොගෙවීම මත සහන කාලය අවසානයේදී අවලංගු වූ රක්ෂණාවරණ.

**වගකීම් ප්‍රමාණිකතා පරීක්ෂණය (LAT)**
අනාගත මූල්‍ය ප්‍රවාහයන්ගේ වර්තමාන අගය ඒවායේ රක්ෂණ ගිවිසුම් යටතේ යොදාගනිමින් එහි හඳුනාගත් රක්ෂණ වගකීම් ප්‍රමාණවත්ද යන වග වාර්තා කරනු ලබන එක් එක් කාලසීමාව අවසානයේ ඇගයීම.

**වගකීම් අවදානම**
රක්ෂකයා විසින් ස්ථාපනය කරනු ලබන තාක්ෂණික සංචිත සහ ඔප්පුහිමියාගේ වගකීම්, දැනට බලපවත්වන ඔප්පු සම්බන්ධ අනාගත හිමිකම් සහ වියදම් සඳහා ප්‍රමාණවත් වේවිද යන අවදානම.

**ජීවිත අතිරික්තය**
රක්ෂණ ඔප්පුහිමියන්ට ප්‍රසාද දීමනා බෙදා දීමෙන් පසුව, ජීවගණකඥයා විසින් තීරණය කරනු ලබන (ණය ගෙවීමේ හැකියාවේ සීමා නිර්ණයන් සැළකිල්ලට ගනිමින්) වගකීම් වලට වඩා වත්කම් වල අතිරික්තය වේ.

**දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර**
මරණයක හෝ මනුෂ්‍ය ජීවිතයට බලපාන යම් අවිනිශ්චිත සිද්ධියක් වූ විට මුදල් ගෙවීම සඳහා සහතික කෙරෙන ගිවිසුමද ඇතුළුව මනුෂ්‍ය ජීවිතය පිළිබඳ රක්ෂණ ගිවිසුම් වලට සහ මනුෂ්‍ය ජීවිතය මත රඳා සිටිමින් යම් කාල පරිච්ඡේදයක් සඳහා වාරික ගෙවීමට යටත් ගිවිසුම්වලට එළඹීමේ හෝ ඒවැනි ගිවිසුම් පවත්වාගෙන යාමේ ව්‍යාපාරයකි.

**වෙළඳපල අවදානම**
රක්ෂකයාගේ වත්කම්වල වෙළඳපල වටිනාකම අඩුවීමේ අවදානම.

**කල්පිරීම**
දීර්ඝකාලීන රක්ෂණ ඔප්පුවක් යටතේ එහි වගන්ති ප්‍රකාරව කාලය අවසන් වීමන් රක්ෂිත මුදල් ගෙවිය යුතු අවස්ථාව.

**මරණ අනුපාතය**
මුළු ජනගහනයට හෝ විශේෂිත වයස් කණ්ඩායමකට මරණ අනුපාතය. එය ගෝලීය වශයෙන් අනුපාත සංඛ්‍යාවන් ලෙසින් ප්‍රකාශිත අතර මරණ අනුපාත වගුව දක්වා ඇත.

**ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය හෝ ශුද්ධ අලාභ අනුපාතය**
ශුද්ධ හිමිකම් පෑමේ අනුපාතය, ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් අයකර ගත් පසු ශුද්ධ හිමිකම් පෑම, ප්‍රතිරක්ෂණකරුවන් වෙත වාරික ලබා දීමන් පසු ශුද්ධ වාරිකයහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරයි. දළ හිමිකම් පෑමේ අනුපාතය, ප්‍රතිරක්ෂණය සැලකිල්ලට ගැනීමට පෙර පිහිටීම පිළිඹිමු කරයි.
අලාභ අනුපාතය වශයෙන්ද මෙය හැඳින්වේ.

$$\frac{\text{(දරන ලද ශුද්ධ හිමිකම් පෑම්)}}{\text{(ඉපැයූ ශුද්ධ වාරික ආදායම)}} \times 100$$

**ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර**
ජීවිත නොවන ශුද්ධ අලාභ අනුපාතය සමග ශුද්ධ වියදම් අනුපාතය සම්බන්ධ කර රක්ෂකයාගේ මෙහෙයුම්වල ලාභදායීත්වය මෙයින් නිරූපණය වෙයි. මෙම ඒකාබද්ධ අනුපාතය ගණනය කිරීමේදී ආයෝජන ආදායම් සැලකිල්ලට නොගැනෙයි.

$$\frac{\text{(දරන ලද ශුද්ධ හිමිකම් පෑම්} \times 100)}{\text{(ඉපැයූ ශුද්ධ වාරිකය)}} + \frac{\text{(වියදම්} \times 100)}{\text{(ඉපැයූ ශුද්ධ වාරිකය)}}$$

**ශුද්ධ ඉපැයූ වාරිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර**
නොඉපැයූ වාරිකයේ අඩු වීම හෝ වැඩි වීම සහ දරන ලද ප්‍රතිරක්ෂණය අනුව සකස් කරන ලද දළ ලිඛිත වාරිකය.

**ශුද්ධ වියදම් අනුපාතය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර**
ජීවිත නොවන ආදායම් අත්පත් කර ගැනීමේ සහ පරිපාලන වියදම් (උදා. කොමිස්, බදු, සේවක පිරිවැය, අලෙවිකරණ සහ මෙහෙයුම් වියදම්) අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදා ගනු ලබන සූත්‍රයකි.

**ශුද්ධ ලිඛිත වාරිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර**

ශුද්ධ ලිඛිත වාරිකය යනු රක්ෂණ සමාග මක් විසින් යම් කාල සීමාවක් තුළ ලිඛිත වාරිකවල එකතුවෙන් ප්‍රතිරක්ෂණ සමාගම් වලට පවරා ඇති වාරික අඩු කර භාර ගන්නා ලද ඕනෑම ප්‍රතිරක්ෂකයන් එකතු කිරීම වේ.
එමෙන්ම ලියා ඇති ශුද්ධ වාරික මගින් අවදානම් උපකල්පනය කිරීම සඳහා සමාගමකට කොපමණ වාරික ප්‍රමාණයන් තබාගත හැකිද යන්න නිරූපණය කරයි.

**සහභාගීත්වය රහිත ඔප්පු - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර**
ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතුවලදී ඔප්පු හිමියාට අදාළ ජීවිත රක්ෂණ අරමුදලේ අතිරික්තයට හිමිකම ලැබීමට ගිවිසුම්මය අයිතියක් නොමැති රක්ෂණ ඔප්පු.

**එක්වරක් පමණක් ලැබෙන අතිරික්තය**
2016 ජනවාරි 01 දිනට අවදානම් පාදක ප්‍රාග්ධන රීතිය යටතේ දළ වාරික තක්සේරු ක්‍රමවේදය අනුව මුළු රක්ෂණ වගකීම් වලට වඩා 2015 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වාරික තක්සේරු ක්‍රමවේදය අනුව මුළු ඔප්පු වගකීම් වල අතිරික්තය. (ඔප්පු වගකීම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය ශුද්ධ වාරික තක්සේරුවේ සිට

# පාරිභාෂික ශබ්ද මාලාව

දළ වාරික තක්සේරුවට වෙනස්වීම නිසා ඇති වූ අතිරික්තය).

**එක්වරක් පමණක් ලැබෙන අතිරික්තය මාරුකිරීම**
ඔප්පු වගකීම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය ශුද්ධ වාරික තක්සේරුවේ සිට දළ වාරික තක්සේරුව වෙත වෙනස්වීම නිසා ඇති වූ අතිරික්තය කොටස්හිමියන්ගේ අරමුදලට මාරුකිරීම.

**මෙහෙයුම් ලාභය**
ආයෝජන ආදායම,ශුද්ධ ප්‍රාග්ධන ලාභ සහ වෙනත් ආදායම් සැලකිල්ලට ගත් පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවලින් උපයා ගන්නා ලද ලාභය.

**මෙහෙයුම් අවදානම**
මූල්‍යමය අලාභයන්ට හේතුවන අභ්‍යන්තර පද්ධතිවල, සේවක මණ්ඩලයේ කාර්ය පටිපාටි හෝ පාලනයන්හි ප්‍රමාණවත් නොවන බව හෝ අසාර්ථකවීම නිසා පැන නගින අවදානම.
මෙහෙයුම් අවදානමට භාරකාරිත්ව අවදානමද ඇතුළත් වේ.

**ඔප්පුව**
ඔප්පුහිමියා වෙත නිකුත් කරනු ලබන රක්ෂණ ගිවිසුමක නියම හා කොන්දේසි ඇතුළත් කර ඇති ලියවිල්ලකි.

**ඔප්පු හිමියා**
රක්ෂණකරු සමග අදාළ ගිවිසුමට පැමිණ අදාළ රක්ෂණ ඔප්පුවේ තත්කාලීන නෛතික හිමිකරුවන තැනැත්තා.

**ඔප්පු ණය**
ජීවිත රක්ෂණ ඔප්පුවක පවාරණ අගය ඇපයට තබමින් ඔප්පු හිමියෙකු විසින් රක්ෂකයාගෙන් ගනු ලබන ණය මුදලකි. මෙම ණය මුදල සාමාන්‍යයෙන් ඔප්පුවේ වර්තමාන පවාරන වටිනාකමේ ප්‍රතිශතයක් සඳහා සීමාවන අතර එවැනි ණය මුදල් සඳහා පොලී අය කරනු ලැබේ.

**ප්‍රතිරක්ෂණය**
එක් පාර්ශවයක් (ප්‍රතිරක්ෂකයා) විසින් කිසියම් ප්‍රතිෂ්ඨාවක් සමග අනෙකුත් පාර්ශවයක් (ප්‍රතිරක්ෂිතයා - ප්‍රාථමික රක්ෂණකරු) එළඹුණු රක්ෂණ ඔප්පුවක හෝ ඔප්පුවල වගකීම්වලින් කොටසක් හෝ මුළුමණින්ම හානිපූරණය කිරීමට ඇති කර ගනු ලබන එකඟතාවකි.

**ප්‍රතිරක්ෂණ කොමිස්**
ප්‍රතිරක්ෂකයාට ගෙවූ හෝ ගෙවිය යුතු වාරිකවලට අදාළව ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල්.

**භාර ගනු ලබන ප්‍රතිරක්ෂණ**
ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් භාර ගැනීම.
භාර දෙනු ලබන ප්‍රතිරක්ෂණ
ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් ස්ථානගත කිරීම.

**ප්‍රතිරක්ෂණ ලාභ කොමිස්**
ප්‍රතිරක්ෂිත ගිවිසුමක් යටතේ ප්‍රතිරක්ෂිතයා විසින් උපයන ලද ශුද්ධ ලාභය (ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි නිර්වචනය කර ඇති පරිදි) පාදක කරගෙන ප්‍රතිරක්ෂකයකුගෙන් ප්‍රාථමික රක්ෂණ සමාගම් වෙත ලැබිය යුතු කොමිස් මුදල්.

**සීමා කරන ලද නියාමන සංචිතය**
16 වන විධානයට අනුව සහභාගීත්ව දිගුකාලීන ව්‍යාපාරය හැර කොටස්හිමියන්ගේ අරමුදලට මාරු කරන ලද එක්වරක් පමණක් ලැබෙන අතිරික්තය.

**රඳවා ගැනීම**
භාරගනු ලැබූ අවදානමින් රක්ෂණකරු/ප්‍රතිරක්ෂණකරු විසින් ප්‍රතිරක්ෂණය කරනු නොලබන/පවරනු නොලබන කොටස හෙවත් ස්වකීය ගිණුම් වෙනුවෙන් රඳවාගත් ආදායම.

**ප්‍රතිපවරාදීම**
ප්‍රතිරක්ෂකයා එහි ඇති අවදානම වෙනත් ප්‍රතිරක්ෂකයෙකු වෙත පැවරීම සිදුකරන ගණුදෙනුවකි.

**නියමිත අවදානම් ප්‍රාග්ධනය (RCR)**
2015, ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය) රීති ප්‍රකාරව තක්සේරු කරනු ලබන සහ නිශ්චය කරනු ලබන අවදානම් ප්‍රාග්ධන ගාස්තුවේ මුළු මුදල.
නියමිත අවදානම් ප්‍රාග්ධනය සාමාන්‍ය සහ දීර්ඝකාලීන රක්ෂණය සඳහා වෙන් වෙන්ව ගණනය කරන අතර රක්ෂණය සහ කොටස් හිමියන්ගේ අරමුදල යන දෙකම ඇතුළත් වේ.

**(අ) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා**
RCR= √ [(ණය අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + සංකේන්ද්‍රණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + ප්‍රතිරක්ෂණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව) + වෙළඳපල අවදානම් ප්‍රාග්ධන ගාස්තුව) 2 + වගකීම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව2 + මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව2] සහ

**(ආ) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා**
RCR=උපරිම {SVCC, √ [(ණය අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + සංකේන්ද්‍රණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + ප්‍රතිරක්ෂණ අවදානම් ප්‍රාග්ධන ගාස්තුව + වෙළඳපල අවදානම් ප්‍රාග්ධන ගාස්තුව) 2 + වගකීම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව 2 + මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන ගාස්තුව 2]}

**ණය ගෙවීමේ හැකියවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රග්ධනය)**
රක්ෂණ ඔප්පු හිමියන්ගේ වගකීම් වලට අදාල තාක්ෂණික ප්‍රතිපාදන අවශ්‍යතාව සැපිරීමට රක්ෂණකරුවෙකු විසින් වෙන් කල යුතු නිර්බාධිය වත්කම් නිර්ණයට අමතරව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 26(1) වගන්තිය යටතේ ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය) රීති ප්‍රකාරව අර්ථ දක්වා ඇති රක්ෂණකරුවෙකු විසින් සැපිරිය යුතු පූර්ණ පවත්නා ප්‍රාග්ධන අවමය සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන අනුපාත අවමයෙහි අවශ්‍යතාවන්.

**පවාරණ අගය**
ජීවිත රක්ෂණයක් සම්බන්ධව එම රක්ෂණ ඔප්පුව කල්පිරීමට පෙර ඔප්පු හිමියකු ජීවිත රක්ෂණය අත්හිටුවීමේදී රක්ෂකයා විසින් ඔප්පු හිමියාට ගෙවනු ලැබිය යුතු මුදල. පවාරණ අගයක් ඇතිවීම සඳහා අවම වශයෙන් වසර 3ක් වත් අඛණ්ඩව එම ජීවිත රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මකව පැවතිය යුතුය.

**පවාරණ වටිනාකම් ප්‍රාග්ධන ගාස්තු (SVCC)**
සියලු රක්ෂණ ගිවිසුම් සමගාමීව පවාරණය වී ඇතිවිට, අත්‍යන්ත හානිකර වාතාවරණයක් පිළිබඳ පවත්නා අවදානම.

**කාලීන රක්ෂණය**
කිසියම් කාල පරිච්ඡේදයක් සඳහා හෝ නිශ්චිත වසර කාලසීමාවකට, ආවරණය සපයා දෙන ජීවිත රක්ෂණ ඔප්පු වර්ගයයි.ඔප්පුවෙහි සඳහන් කර ඇති කාලසීමාව තුළ රක්ෂණකරු මියයාමකදී ඔප්පුව සක්‍රියව පවතින්නේ නම් හෝ බලාත්මකව පවතී නම් මරණ ප්‍රතිලාභය ගෙවනු ලැබේ.

# පාරිභාෂික ශබ්ද මාලාව

### තාක්ෂණික ප්‍රතිපාදන
ස්වකීය රක්ෂණ බැඳියාවන් ඉටුකිරීමට සහ ඔප්පු හිමියන්ගේ සියලුම වගකීම් නිරාකරණය කිරීමට ඔප්පු වල පරිපාලන කටයුතු සඳහා, ප්‍රතිරක්ෂණය සඳහා සහ ඉතිරිව ඇති අවදානම් ආවරණය කිරීම සඳහා වන වියදම් ද වෙනුවෙන් රක්ෂණකරුවකු විසින් වෙන් කරනු ලබන මුදල් ප්‍රමාණය වේ.

### පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනය
ක්‍රියාත්මකව පවතින විට සහ ඈවර කිරීමේදී යන අවස්ථා දෙකෙහි සියලු අවස්ථාවන්හි දී රක්ෂණකරුවෙකුගේ අලාභ ආවරණය කිරීම සඳහා පූර්ණ වශයෙන් පවතින ස්ථිර ප්‍රාග්ධනය.

### දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය
පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනයේ සමහරක් අන්තර්ග්‍රහණ ලක්ෂණ මෙහි නොමැති වුවද, ක්‍රියාත්මකව පවතින විට සහ ඈවර කිරීමේදී කිසියම් අලාභ අවශෝෂණයක් සපයා දෙන ප්‍රාග්ධනය.

### පූර්ණ පවත්නා ප්‍රාග්ධනය (TAC)
පළමුවන ස්ථරයේ ප්‍රාග්ධනය සහ දෙවන ස්ථරයේ ප්‍රාග්ධනය එකතු කර, 2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය) රීති ප්‍රකාරවල කිසියම් නියමිත අඩුකිරීම් සිදුකිරීමෙන් පූර්ණ පවත්නා ප්‍රාග්ධනය නිර්ණය කරනු ලබයි .

### ප්‍රාරක්ෂණ ලාභය
ආයෝජන ආදායම සහ අනෙකුත් අදායම් සැලකිල්ලට නොගෙන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ගනුදෙනු මගින් උත්පාදනය කර ගනු ලබන තාක්ෂණික ලාභය.

### නොඉපැයූ වාරිකය
ගෙවීමට නියමිත ඇතැයි ගිණුම්වලට මේ වන විටත් ඇතුළත් කරනු ලැබ ඇති නමුත් ශේෂ පත්‍ර දිනට අනතුරුව එළඹෙන යම් අවදානම් කාල සීමාවකට අදාළ වාරික මුදල්වල කොටසක් මෙයින් නියෝජනය වෙයි.

### නොඉපැයූ වාරික සංචිතය
දැනටමත් ක්‍රියාත්මකව පවතින රක්ෂණ ඔප්පු යටතේ අනාගතයේදී උද්ගත විය හැකි හිමිකම් පෑම් සදහා ප්‍රතිපාදනය කිරීම අරඹයා සාමාන්‍ය රක්ෂණකරු විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලකි.

### කල් ඉකුත් නොවූ අවදානම් සංචිතය
ශේෂ පත්‍ර දිනට පෙර ගිවිසුම් හමාර කළ නමුත් ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති විය හැකි හිමිකම්පෑම් වල වන්දි සහ වියදම් සඳහා ඇස්තමේන්තු කළ අගයෙන් මේ දක්වා නොඉපැයූ වාරික වශයෙන් (කිසියම් විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එය අඩු කළ පසු) ප්‍රතිපාදනය කරන ලද අගය ඉක්මවා යන ප්‍රමාණය.

### සර්වත්‍ර ආයුකාලය
ආයෝජන ඉතිරිකිරීමේ සංරචකය සහ අඩු වාරික සහිත කාලීන ජීවිත රක්ෂණය වැනි ස්ථිර ජීවිත රක්ෂණය, බොහොමයක් සර්වත්‍ර ජීවිත රක්ෂණ ඔප්පුවල නම්‍යශීලී වාරික විකල්පයන් අඩංගු වේ. තවද, සමහරක් තනි වාරිකයක් (එක්වර ගෙවන තනි වාරිකය) හෝ ස්ථිර වාරික (නියමිත ස්ථිර වාරික) අවශ්‍ය කෙරේ.

### පූර්ණ ජීවිත රක්ෂණය
පූර්ණ ජීවිත රක්ෂණය, රක්ෂණය වූ තැනැත්තාගේ ජීවිතය සඳහා ආවරණය සපයයි. මරණ ප්‍රතිලාභයක් ලබාදීමට අමතරව, මුදල් වටිනාකම ක්‍රමයෙන් එක් රැස්වන ඉතිරි කිරීමේ සංරචකයක්ද පූර්ණ ජීවිත රක්ෂණයයෙහි අන්තර්ගත වේ. මෙම ඔප්පු ස්ථිර හෝ සාම්ප්‍රදායික ජීවිත රක්ෂණ ලෙසින්ද හඳුන්වනු ලබයි.

# පොදු තොරතුරු

## කාර්යාල ලිපිනය

11 වන මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01,
ශ්‍රී ලංකාව.

දුරකථන : +94 11 2396184-9
ෆැක්ස් : +94 11 2396190
ඊ - මේල් : info@ircsl.gov.lk
වෙබ් අඩවිය : www.ircsl.gov.lk

## නෛතික ආකෘතිය

2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදන අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදී.

## කොමිෂන් සභාවේ අරමුණ හා වගකීම

ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීයමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීම.

## ගිණුම්කරණ වර්ෂය

දෙසැම්බර් 31 දක්වා

## විගණකවරුන්

විගණකාධිපති

## බැංකුකරුවන්

ලංකා බැංකුව

## විගණන කමිටුව

යුධිෂ්ටිරන් කනගසබෙයි මයා
ඩබ්ලිව්.එම්.පී.එම්.බී. අතපත්තු මයා
ජී.ඩබ්.ඩී. පෙරේරා මයා

Designed & Printed By Ceylon Printers PLC

ශ්‍රී ලංකා
රක්ෂණ
නියාමන
කොමිෂන් සභාව


11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9 | ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ircsl.gov.lk | වෙබ් අඩවිය : www.ircsl.gov.lk